සෑම ඉන්ධන

# බිඳක්ම

තිරසාර සංවර්ධනය සඳහා



# වාර්ෂික වාර්තාව 2020

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මෙම QR කේතය මගින් ඔබගේ ස්මාර්ට් උපාංගය හරහා මෙම වාර්තාව අන්තර්ජාලයෙන් ලබාගත හැක.

# සෑම ඉන්ධන බිඳක්ම තිරසාර සංවර්ධනය සඳහා

ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම මගින් සංස්ථාව ජාතික ආර්ථිකය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. රටේ සමස්ත සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන ලබා ගැනීමේ සහ මිලෙහි ඇති අතිශය වැදගත්කම සහ සංවේදීතාව සැලකිල්ලට ගනිමින්, අපි සෑම විටම බලශක්ති සුරක්ෂිතභාවය තහවුරු කිරීමට කැපවී සිටිමු.

දේශයේ ආර්ථික වර්ධන ඉලක්ක වෙත ළඟාවීම සඳහා අඛණ්ඩ ඉන්ධන සැපයීම සහතික කිරීමට අපි දැඩි ලෙස කැපවී සිටින අතර අප සපයන සෑම ඉන්ධන බින්දුවක්ම රටේ තිරසාර සංවර්ධනයට දායක වේ.

# පටුන

## අප ගැන I 02


අප ගැන I 02
අපගේ ගමන් මඟ I 05
අපගේ වාර්තාව පිළිබඳව I 07


## සුවිශේෂතා I 09


මූල්‍ය සුවිශේෂිතා I 09
මෙහෙයුම් සුවිශේෂිතා I 11


## පණිවිඩ I 13


සභාපතිතුමාගේ පණිවිඩය I 13
කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය I 16


## අපගේ නායකත්වය I 20


අධ්‍යක්ෂ මණ්ඩලය I 21
සංස්ථායික කළමනාකාරීත්වය I 25
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය I 29
ආයතනික සංයුතිය I 31


## සමාලෝචන වාර්තා I 33


වෙළඳපල සමාලෝචනය I 33
මෙහෙයුම් සමාලෝචනය I 37
අපගේ උපාය මාර්ග I 49


## අගය නිර්මාණය කිරීම I 51


ව්‍යාපාර මාදිලිය I 51
මූල්‍ය ප්‍රාග්ධනය I 53
නිපැයුම් ප්‍රාග්ධනය I 58
බුද්ධිමය ප්‍රාග්ධනය I 63
මානව ප්‍රාග්ධනය I 66
සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය I 73
ස්වභාවික ප්‍රාග්ධනය I 78
පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය I 81
SDG සඳහා දායකත්වය I 83


## අවදානම් කළමනාකරණය I 85


අවදානම් කළමනාකරණ වාර්තාව I 85


## පාලන වාර්තා I 91


සංස්ථාපිත පාලනය I 91
කළමනාකරණ කමිටු වාර්තාව I 96
විගණන කමිටු වාර්තාව I 97
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව I 99
අධ්‍යක්ෂ වාර්තාව I 104


## මූල්‍ය ප්‍රකාශන I 105


විගණකාධිපති වාර්තාව I 106
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය I 131
මූල්‍ය තත්ව ප්‍රකාශනය I 132
ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය I 133
මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශන I 134
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් I 135


## අතිරේක තොරතුරු I 174


දස වසරක සාරාංශය I 175
සංස්ථායික තොරතුරු I 176

# අප ගැන

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංස්ථාව) යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම සහ විකිණීමේ අරමුණින් සංස්ථාපිත කරන ලද රාජ්‍ය සංස්ථාවකි. අපගේ දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය රට පුරා විසිරී ඇති අතර එමඟින් ජාතියට ඉන්ධන සඳහා ප්‍රවේශවීමේ හැකියාව ලබා දේ. සංස්ථාව පිරිපහදුව, ජාතියට වටිනාකමක් ඇති කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ප්‍රධාන උපායමාර්ගික වත්කමකි. වෙළඳපල කොටසෙන් 80% කට වඩා ඇති වෙළඳපල ප්‍රමුඛයා අප වන අතර ඉන්ධන සඳහා පහසු ප්‍රවේශයක් සහතික කිරීම සඳහා අපගේ ඉන්ධන පිරවුම්හල් 1322 ක බෙදා හැරීමේ ජාලය රටේ සෑම ප්‍රදේශයකම පවතී.

අපි අපගේ පිරිපහදුව හරහා අපගේ විකිණීම් අවශ්‍යතාවලින් 30% ක් පිරිපහදු කරන අතර හිඟ ප්‍රමාණය පිරිපහදු කළ නිෂ්පාදන ලෙස ආනයනය කෙරේ. රජය සතු සංස්ථාවක් ලෙස, අපගේ නිෂ්පාදන බොහොමයක් සහන මිලට ලබා දීමෙන් අභ්‍යන්තරව ජනනය කරන ලද සියලුම පිරිවැය වාසි ජාතික ආර්ථිකයට මාරු කරන අතරම, හැකි හොඳම දේශීය බලශක්ති මිල ගණන් පොරොන්දු වීමට අපි කැපවී සිටිමු.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) යනු 2/3 ක කොටස් හිමි අපගේ අනුබද්ධ ආයතනයයි. CPSTL ස්ථාපිත කර ඇත්තේ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම අරමුණු කර ගෙන ය.





## දැක්ම

ඛනිජ තෙල් ක්ෂේත්‍රය හා අදාළ කර්මාන්ත සඳහා තිරසාර භාවයක් ලබාදීම මෙන්ම නව අවස්ථාවන් මඟින් සේවාදායකයින්ට නිරන්තර වටිනාකම් සැපයීම.

## මෙහෙවර

**තරඟකාරීත්වය** - ඛනිජ තෙල් සහ ඒ හා බැඳුණු නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ ලබාදෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ප්‍රයත්න දැරීම.

**තිරසාරබව** - ආර්ථිකමය සමාජමය සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපාරයක් ලෙස දීර්ඝකාලීන අනාගත ප්‍රතිලාභ උදා කරදීම.

**නිරන්තර වර්ධනය** - මානව සම්පත සහ ක්‍රියාදාමයන්හි සංවර්ධනය මත සංස්ථාවේ වර්ධනය තහවුරු කිරීම මෙන්ම අදාළ සියලු අංශයන්හි වර්ධනයන් ගැන සුපරික්ෂාකාරී වීම.

**අවංක බව** - සංස්ථාවේ යහපත සහතික කරනු සඳහා සියලු අවස්ථාවන්හිදී විශ්වාසදායී ලෙස කටයුතු කිරීම.

**පොදු යහපත** - රටේ සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබාදීමේ ඉලක්ක සපුරා ගැනීම.

## අගයන්

තරඟකාරීත්වය

තිරසාර බව

අඛණ්ඩ දියුණුව

අඛණ්ඩත්වය

පොදු යහපත

# අපගේ ව්‍යාපාරය

## ප්‍රවාහන අංශය



සමස්ත ආදායමෙන් 70% කට වඩා වැඩි ප්‍රමාණයක් මෙම අංශය විසින් සපයන අතර දිවයිනේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි 1322ක් වූ පුළුල් අලෙවි නියෝජිත ජාලය හරහා පෙට්‍රල් 92, පෙට්‍රල් 95, ඔටෝ ඩීසල් සහ සුපර් ඩීසල් සාමාන්‍ය ජනතාව වෙත සපයනු ලැබේ. අපගේ බොහෝ පිරවුම්හල් සාමාන්‍ය ජනතාවගේ පහසුව සඳහා දින 7 දිම පැය 24 පුරා සේවය සපයයි.

## බලශක්ති උත්පාදන



අපි ලංවිම සහ ස්වාධීන තාප බලාගාර (IPPs) සඳහා ඔටෝ ඩීසල්, දැවි තෙල් සහ නැෆ්තා සපයන අතර, සංස්ථාවෙහි දෙවන ඉහළම ආදායම් උත්පාදක ලෙස මෙම අංශය වාර්තා කරයි.

## කෘෂි රසායන



දශක 5කට අධික වෙළඳපල පැවැත්මක් ඇති සිපෙට්කෝ කෘෂි රසායන අංශය ගොවීන් තරඟකරුවන්ගේ සූරාකෑම් වලින් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ මිලකට උසස් තත්වයේ කෘෂි රසායන නිෂ්පාදන අඛණ්ඩව සපයනු ලබයි.

## ගුවන්තෙල් අංශය



ගුවන් ඉන්ධන ව්‍යාපාරයේ එකම සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාව තුළ ඇති සියලුම ජාත්‍යන්තර ගුවන් තොටුපලවල ක්‍රියාත්මක වේ. ගුණාත්මකභාවයෙන් යුත් ඉන්ධන සැපයීම අපගේ ප්‍රධානතම කයීයක් වන බැවින් අපි දේශීය සහ ජාත්‍යන්තර ගුවන් සේවා පාරිභෝගිකයින්ට ජාත්‍යන්තර මට්ටමේ තත්ව ප්‍රමිතීන් සමඟ ගුවන් ඉන්ධන සපයන්නෙමු.

## කර්මාන්ත



මෙම අංශය මඟින් ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන කර්මාන්ත පාරිභෝගිකයන් සඳහා දැවි තෙල්, කාර්මික භූමිතෙල්, SBP, තාර සහ ලිහිසි තෙල් සපයයි. පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා සාධාරණ මිලකට ගුණාත්මක නිෂ්පාදන ලබා දීමෙන් සංස්ථාව ලිහිසි තෙල් සහ තාර වෙළෙඳපොළ තුළ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

## ගෘහස්ත අංශය



ගෘහස්ත අංශය භූමිතෙල් සහ ගෑස් (LPG) වලින් සමන්විත වේ. අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන සැලසීම සඳහා භූමිතෙල් ඉහළ සහනදායී මිලකට ලබා දෙන අතර පිරිපහදුව මඟින් නිෂ්පාදනය කරන ලද LPG ලංකාවේ සිටින සැපයුම්කරුවන් දෙදෙනාට සපයනු ලැබේ.

# අපගේ ගමන්මඟ

**1961**

1961 අංක 28 දරන පනත යටතේ රජය සතු ව්‍යාපාරයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලදි.

**1962**

එවකට මෙරට ක්‍රියාත්මක වූ අනෙකුත් තෙල් සමාගම් සමඟ තරඟ කරමින් සංස්ථාව තම ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

**1964**

රට තුළ ඛනිජ තෙල් නිෂ්පාදනය ආනයනය කරනු ලබන, අලෙවි කරන සහ බෙදාහරින එකම ව්‍යාපාරය බවට පත්විය.

**1968**

දිනකට බැරල් 38,000 ක් පිරිපහදු කළ හැකි පිරිපහදුවක් සංස්ථාව විසින් ඉදිකර ඇත.

**1969**

පිරිපහදු මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි. කොලොන්නාව නිමාව තුළම ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් එක් කරන ලදි. කෘෂි රසායන අංශය වෙත ප්‍රවේශ විය.

**1971**

සංස්ථා පනතට සිදු කරන ලද සංශෝධන හරහා නැව්තෙල් මෙහෙයුම් කටයුතු සහ ගුවන්තෙල් පිරවීම් මෙහෙයුම් කටයුතු සංස්ථා විෂය පථයට එකතු කරන ලදී.

**1978**

රෙදිපිළි, ටයර් සහ ධීවර කර්මාන්තය සඳහා නයිලෝන් 6 නූල් නිෂ්පාදනය සඳහා යන්ත්‍රාගාරයක් පිහිටුවන ලදි.

**1979**

බොරතෙල් පිරිපහදු ධාරිතාවය වැඩි කරමින් දිනකට බැරල් 50,000 ක් පිරිපහදු කළ හැකි වන පරිදි පිරිපහදු ධාරිතාවය ඉහළ නංවන ලදි.

**1987**

ඔරුගොඩවත්ත ප්‍රදේශයේ බොරතෙල් ගබඩාකරණ ටැංකි සංකීර්ණයක් අතරමැදි පහසුකමක් ලෙස ස්ථාපිත කරමින්, කොළඹ වරායේ සිට 9.2 Km පිටතින් එක ලක්ෂික පාවෙන නැව් නැවැත්වීමේ පහසුකමක් ස්ථාපිත කරන ලදී.

**1992**

පිරිපහදු ක්‍රියාවලියේ නම්‍යතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා බොරතෙල් පිරිපහදු ඒකකය පුනර්ජීවනය කරන ලදි.

**1994**

ද්‍රවිකරණ සහ ලිහිසි තෙල් ආනයනය කිරීම සහ බෙදාහැරීම නියාමනය කරන ලදී.

**1995**

ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් හානි වූ කොලොන්නාව සහ ඔරුගොඩවත්ත ටැංකි සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරීම.

**1999**

සපුගස්කන්ද ගින්නෙන් හානි වූ ටැංකි නව බෙදාහැරීම් පර්යන්තයක් සමඟ නැවත ඉදි කරන ලදි. ඊයම් රහිත පෙට්‍රල් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව වැඩි කිරීම සඳහා පෙට්‍රල් මුසු තොග නිෂ්පාදනය කිරීමට හැකිවන පරිදි ප්ලැට්ෆෝමර් ඒකකයේ ධාරිතාව වැඩි කරන ලදි.

**2002**

ඔටෝ ඩීසල් තුළ ඇති ගෙන්දගම් අගය අඩු කිරීම සඳහා නවීකරන කටයුතු සිදු කිරීම. පවත්නා ඩීසල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 04) පුනර්ජීවනය කිරීම සහ භූමිතෙල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 07) ඩීසල් හයිඩ්‍රෝට්‍රීටර් පද්ධතියක් ලෙස පරිවර්තනය කිරීම.

**2003**

සංස්ථාව, ශ්‍රී ලංකා රජය සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් සමාන අයිතියක් දරනු ලබන අළුතින් පිහිටුවනු ලැබූ පොදු පරිශීලක පහසුකම වෙත ගබඩාකරණ සහ බෙදාහැරීම් ව්‍යාපාරය පවරන ලදි. බණ්ඩාරනායක ගුවන්තොටුපල පරිශ්‍රය තුළ නවතම සංවර්ධන උපාංග සහිත ගුවන් තෙල් පහසුකම් සංකීර්ණයක් සහ ඉන්ධන නළ පද්ධතියක් ආරම්භ කරන ලදි.

**2010**

පිරවුම්හල් 107 ක් සහ තොග ගබඩා පර්යන්ත සමාගමේ 1/3ක සංස්ථාව වෙත ලබාදීමට කැබිනට් මණ්ඩලය තීරණය කරන ලදි. සංස්ථාව විසින් සුපර් ඩීසල් (10 ppm) වෙළඳපල වෙත හඳුන්වා දෙන ලදි.

**2011**

කොළඹ 09 ප්‍රදේශයේ නව ගොඩනැගිල්ලක් වෙත සංස්ථා ප්‍රධාන කාර්යාලය ගෙන යන ලදි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලේ 1 වන අදියර යටතේ ඉන්ධන නල පද්ධතියක් ඉදිකිරීම ආරම්භ කරන ලදි.

**2012**

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, කොළඹ වරාය තුළ සබ්මැරීන් බොරතෙල් නල මාර්ගය සහ නල සම්බන්ද වන කෙළවර ගමන් මග වෙනස් කිරීම/ ආදේශ කිරීම සම්පූර්ණ කිරීම. මත්තල පිහිටා ඇති හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දෙවන අදියර යටතේ ගුවන්තෙල් පර්යන්තයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදි.

**2013**

පෙට්‍රල් ඔක්ටේන් 90 පෙට්‍රල් ඔක්ටේන් 92 දක්වා වන ඉහළ ශ්‍රේණියට ගෙන එන ලදි.

**2014**

මත්තල, හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්තෙල් පිරවුම් පර්යන්තය සහ ඉන්ධන නළ පද්ධතිය ස්ථාපිත කරන ලදි. ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායමේ (JIG) වාර්ෂික විගණනයේදී “හොඳයි” යන තත්වය (“සාමාන්‍ය” යන තත්වයෙන් ඉහළ තත්වය) සංස්ථාවේ ගුවන් තෙල් අංශයට ලබා දෙන ලදි. ආනයනය සඳහා 500 ppm ඉන්ධන පිරිවිතර හඳුන්වා දෙන ලදි.

**2016**

ඉදිකිරීම්, ක්‍රියාකරවීම සහ පවරා දීම යන පදනම යටතේ ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා හයිරැක්ස් සමාගම සමඟ සංස්ථාව ගිවිසුමකට එළඹෙන ලදි.

**2018**

ගුවන්තෙල් පිරවුම් පද්ධතිය සහ පවත්නා ඉන්ධන නළ පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියරේ 11 පියවර සමඟ යමින් නව ඒප්‍රන් 4 ඊ කොටසේ ඉන්ධන නළ පද්ධතියක් ස්ථාපිත කිරීම, දැව් තෙල් භාවිතා කරමින් දියර තාර නිෂ්පාදනයට නැවත ප්‍රවේශ විය. ලංකා සුපර් ඩීසල් යූරෝ 4 සහ පෙට්‍රල් 95 යූරෝ 4 හඳුන්වා දෙන ලදී.

**2019**

පිරිපහදුවේ වසර 50ක සංවත්සරය සමරන ලදි. සංස්ථාව විසින් ලබා ගන්නා ලද ඉහළම ආදායම වාර්තා කරන ලදී.

**2020**

ස්වාභාවික ද්‍රවීකෘත වායු (LNG) අංශයේ ආරම්භය. වසර සඳහා ලාභය රු. බිලියන 2.37 කි.

# අපගේ වාර්තාව පිළිබඳව

සංස්ථාවේ මූලෝපාය, කාර්ය සාධනය, පාලනය, අවදානම සහ වටිනාකම් නිර්මාණය පිළිබඳ වඩාත් විනිවිදභාවයක් ඇති කිරීම සඳහා අපගේ ක්‍රියාකාරකම් වාර්තා කිරීම සඳහා අපි ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කර ඇත.

## වාර්තා කිරීමේ ක්‍රමවේදය සහ සීමාවන්

මෙම වාර්ථාව මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2020 වසරේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලයේ ව්‍යාපාර ආකෘතිය මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රමාණාත්මක වශයෙන් අවදානම් මෙන්ම පරිපාලනය සහ පාලන ක්‍රියාවලිය තුළ පිහිටා තොරතුරු ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාවෙන් මූලිකවම අපගේ උපාය මාර්ගික ව්‍යාපාර ක්‍රියාදාමේ ජයග්‍රහණයන් ඉදිරිපත් කිරීම අදහස් කෙරේ. ඊට අමතරව අප විසින් විගණන වාර්තාව සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් ද ප්‍රකාශයට පත් කර තිබේ. අපගේ වාර්තාකරණ ක්‍රියාවලියේදී පහත දක්වා ඇති මූලාශ්‍රවල සඳහන් මූලධර්ම සහ අවශ්‍යතා අන්තර්ගත කර ඇත.

මීට අමතරව, අපි විගණන වාර්තාව සමඟ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. මූල්‍ය තොරතුරු නියාමන අවශ්‍යතා සහ වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන තොරතුරුවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ, පැහැදිලිව ප්‍රකාශ කර නොමැති නම්, සංස්ථාව වෙත පමණක් අදාළ තොරතුරු වෙත යොමු වන අතර සංස්ථාව මුළු මෙහෙයුම් ආදායමෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා දායක වන බැවින් අනුබද්ධිත ආයතනය මේ සඳහා සලකා බලනු නොලැබේ.

අපගේ සියලුම වාර්තා සඳහා වාර්තාකරණ රාමුව මෙහෙයවනු ලබන්නේ එහි අඩංගු මූලධර්ම සහ අවශ්‍යතා සහ බාහිර පරිසරය සහ ප්‍රාග්ධන සමඟ අන්තර්ක්‍රියා කෙටි, මධ්‍ය හා දිගු කාලීන වටිනාකමක් නිර්මාණය කිරීමේ හැකියාව කෙරෙහි බලපෑ ආකාරය මඟිනි.

| වාර්තා කිරීමේ මාදිලිය |
|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) |
| යහපාලනය සඳහා පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ |
| 1971 අංක 28 දරන මුදල් පනත |
| 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත |
| ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ (IR) රාමුව |
| තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් සංග්‍රහය |

## ප්‍රමාණාත්මකතාව

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකම් උත්පාදනය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු හැකියාව සංස්ථාව සමඟ දැනට කටයුතු කරන පාර්ශවයන් මෙන්ම අනාගත පාර්ශවයන්ද අත්‍යවශ්‍ය හා වැදගත් තොරතුරු මෙම වාර්තාවේ අන්තර්ගත කර තිබේ. මෙහි ඇති සියලු තොරතුරු සංස්ථාවේ අගයන් වර්ධනය කිරීම වෙනුවෙන්ම ඉදිරිපත් කර ඇති බවට අපි සහතික වන්නෙමු.

අපගේ ව්‍යාපාරය (පිටු 2 සිට 12 දක්වා), අපගේ ව්‍යාපාර ආකෘතිය (පිටුව 51 සිට 52 දක්වා) සහ අපගේ ක්‍රියාකාරකම් සහ අපගේ වටිනාකම් දාමය හරහා ඇති බලපෑම් (පිටු 53 සිට 80 දක්වා) අවබෝධ කර ගැනීම සංස්ථාව අගය නිර්මාණය කරන ආකාරය අගය කිරීමට සහ බලපාන ගැටළු හඳුනා ගැනීමට පදනම වේ. අපගේ මෙහෙයුම් සන්දර්භය (පිටු 33 සිට 36 දක්වා) සහ අවදානම් සහ අවස්ථාවන්ට අපගේ ප්‍රතිචාරය (පිටු 85 සිට 90 දක්වා) මඟින් වටිනාකමක් නිර්මාණය කිරීමේ අපගේ හැකියාව තීරණය වේ. අපගේ කාර්ය සාධනය (පිටු 37 සිට 48 දක්වා), අපගේ නායකත්ව කණ්ඩායම (පිටු 21 සිට 30 දක්වා), සහ අපගේ පාලන භාවිතයන් (පිටු 91 සිට 104 දක්වා) ද

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත. පාර්ශවකරුවන්ට උනන්දුවක් දැක්විය හැකි අමතර තොරතුරු, අපගේ වාර්ෂික වාර්තාවේ සපයා ඇත.

අපගේ විගණන කමිටුව විසින් ඒකාබද්ධ සහතික කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාලානුරූපීව අධ්‍යක්ෂ මණ්ඩලයට අභ්‍යන්තර සහතිකයක් ලබා දේ. විගණන කමිටු වාර්තාව පිටු 97 සිට 98 දක්වා ඇත. විගණකාධිපති විසින් අපගේ 2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව ලබා දී ඇත (පිටු 106 සිට 130 දක්වා බලන්න).

ස්ථාපිත ක්‍රියාවලින් අපගේ 2020 ඒකාබද්ධ වාර්තාව මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු පිළිබඳ සහතිකයක් සපයයි.

## ප්‍රතිචාර

අපගේ වාර්තාවේ අදාලත්වය සහ කියවීමේ පහසුව සම්බන්ධව සංස්ථාව කැප වී ඇත.  2020 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වන යෝජනා, විමසීම් සහ ප්‍රතිචාර ඉතා අගය කරනු ලැබේ.  ඔබගේ ප්‍රතිචාර පහත ලිපිනයට යොමු කරන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09.

finadminsec@ceypetco.gov.lk

0094115455147

## අපගේ වාර්තාව වෙත ප්‍රවේශය

### ප්‍රාග්ධනයන්

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

### පාර්ශවකරුවන්

- හිමිකරුවන්
- පාරිභෝගිකයින්
- නියාමකයින්
- සේවකයන්
- ප්‍රජාව
- සැපයුම්කරුවන්


### උපායමාර්ග


- ලාභ වර්ධනය
- තිරසාර බව
- මෙහෙයුම් විශිෂ්ටත්වය
- තාක්ෂණික දියුණුව
- මානව ප්‍රාග්ධනයේ ආයෝජනය


# මූල්‍ය සුවිශේෂතා


| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 | 2019 යළි ප්‍රකාශිත | 2020 | 2019 යළි ප්‍රකාශිත |
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| මෙහෙයුම් ප්‍රතිඵල | | | | |
| ආදායම - (දළ) | 518,870.925 | 646,591.538 | 519,093.098 | 646,747.434 |
| දළ ලාභය/(අලාභය ) | 55,250.865 | 4,260.657 | 48,333.939 | (3,701.023) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | 33,935.151 | (19,060.577) | 35,732.795 | (16,605.200) |
| මූල්‍ය ආදායම | 11,187.890 | 13,525.966 | 11,497.173 | 13,848.996 |
| වර්ෂය සඳහා වන ලාභය/(අලාභය) | 2,370.955 | (11,856.600) | 4,269.073 | (10,240.722) |
| මුළු විස්තීර්ණ ආදායම | 20,562.123 | (11,757.103) | 22,345.490 | (10,239.003) |
| මූල්‍ය තත්වය | | | | |
| මුළු වත්කම් | 324,572.346 | 328,282.069 | 347,136.524 | 351,641.630 |
| තොගය | 52,507.840 | 65,757.217 | 53,206.909 | 66,432.827 |
| මුදල් හා මුදල් සමාන දෑ | 64,563.572 | 32,559.409 | 68,005.593 | 36,559.120 |
| ස්කන්ධය | (275,561.146) | (296,123.269) | (252,644.368) | (274,914.690) |
| ජංගම නොවන වගකීම් | 8,973.494 | 8,524.671 | 12,585.687 | 12,316.684 |
| ජංගම නොවන ණය හා ණය ලබාගැනීම් | 4,776.927 | 3,928.702 | 4,776.927 | 3,928.702 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | 391,039.545 | 310,010.734 | 391,039.545 | 310,010.734 |
| මුළු ණය ගැනීම් | 395,816.472 | 313,939.436 | 395,816.472 | 313,939.436 |

| ප්‍රධාන අනුපාත - සංස්ථාව | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | 10.83% | 0.68% | -0.72% | 6.05% |
| මෙහෙයුම් ලාභාන්තිකය | 6.65% | -3.02% | -4.21% | 1.61% |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.46% | -1.88% | -18.45% | 0.24% |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | 10.46% | -5.81% | -7.28% | 3.29% |
| තොග පිරිවැටුම් අනුපාතය | 8.66 | 9.53 | 9.51 | 9.49 |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | 1.57 | 1.93 | 1.73 | 2.04 |
| ජංගම අනුපාතය | 0.45 | 0.47 | 0.44 | 0.38 |
| ද්‍රවශීලතා අනුපාතය | 0.36 | 0.36 | 0.34 | 0.27 |
| පොලී ආවරණය | 1.62 | (1.30) | (2.01) | 0.68 |




| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ආයෝජන<br>**2,098**<br>(රු. මි.) | රජයට දායකත්වය<br>**152,311**<br>(රු. මි) | ශුද්ධ ලාභය<br>**2,371**<br>(රු. මි) |
| මූල්‍ය ආදායම<br>**11,188**<br>(රු. මි) | මුළු විස්තීර්ණ ආදායම<br>**20,562**<br>(රු. මි) | |

# මෙහෙයුම් සුවිශේෂතා

| | ඒකකය | 2020 | 2019 |
|---|---|---|---|
| විකුණුම් | මි. ලීටර | 5,029 | 6,082 |
| වසර අවසානයේ තොගය | මි. ලීටර | 410.251 | 438.687 |
| මුළු පිරවුම්හල් ගණන | ප්‍රමානය | 1,322 | 1,302 |
| නව පිරවුම්හල් ගණන | ප්‍රමානය | 25 | 23 |
| | | | |
| සේවකයන් | ප්‍රමානය | 2,508 | 2,616 |
| කාර්ය මණ්ඩල පිරිවැය | රු. මි. | 5,719 | 5,865 |
| පුහුණු කිරීම් පිරිවැය | රු. මි. | 4.47 | 12.24 |
| සමුච්චිත සේවා පළපුරුද්ද | වර්ෂ | 38,350 | 38,800 |
| | | | |
| මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවය - බොරතෙල් පෙරනය | % | 99.03 | 97.68 |
| මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවය - තාර සාදනය | % | 30.44 | 42.11 |
| පිරිපහදු අපේක්ෂිත හානිය | මෙ.ටො. | 4,325 | 5,266 |
| විශේෂිත බලශක්ති පරිභෝජනය | MMK Cal/Crude T | 0.493 | 0.520 |
| ජල පරිභෝජනය . | මෙ.ටො. | 843,590 | 926,536 |
| | | | |
| **පිරිපහදුවේ සෞඛ්‍ය සහ ප්‍රවේසම්** | | | |
| සේවා කාලය තුළ සිදු වූ අනතුරු | ප්‍රමානය | - | - |
| ප්‍රථමාධාර අනතුරු | ප්‍රමානය | - | 7 |
| වාර්තා වූ සුළු ගිනි ගැනීම් | ප්‍රමානය | - | - |
| අහිමි වූ දින ගණන | ප්‍රමානය | - | - |

| පිරිපහදු මෙහෙයුම් | බොරතෙල් ගැනීම් - මෙ. ටො. | වර්ෂයට දින | කැලැන්ඩර් දිනකට ටොන් ගණන |
|---|---|---|---|
| 2020 | 1,685,441 | 362 | 4,605 |
| 2019 | 1,864,817 | 357 | 5109 |
| 2018 | 1,675,245 | 327 | 5141 |
| 2017 | 1,646,041 | 351 | 4510 |
| 2016 | 1,746,180 | 362 | 4771 |
| 2015 | 1,692,074 | 324 | 4636 |

# බොරතෙල් යෙදවුම්

**1,685**

(000' MT)

## විකුණුම් ප්‍රමාණය

**5,029**

(මි. ලීටර)

## පිරවුම්හල්

**1,322**

## මුළු සේවක සංඛ්‍යාව


**2,508**


(රු. මි)


## කාර්ය මණ්ඩල පිරිවැය


**5,719**

(රු. මි)




# සභාපතිතුමාගේ පණිවුඩය



ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සියලුම අංශයන් විශාල වශයෙන් අභියෝගවලට මුහුණ දීමට සිදු වුවද, සංසථාව 2019 වසරේ වාර්තා වූ පාඩුව 2020 වසරේදී රුපියල් බිලියන 2.37ක ලාභයක් බවට පත් කිරීමට හැකි විය. රටේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීම පිණිස අපගේ ව්‍යාපාරික මෙහෙයුම් ශක්තිමත් කිරීමට අපි උපරිම ප්‍රයත්නයන් දැරීමට වසර තුළදී අවධානය යොමු කරන ලද අතර ඒ තුලින් ඛනිජ තෙල් නිෂ්පාදන සාමාන්‍ය ජනතාව වෙත අඛන්ඩව ලබාදීමට හැකිවිය.

## ගෝලීය සන්දර්භය

ජාත්‍යයන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික දැක්ම (WEO) ට අනුව, 2019 වසරේ වාර්තා වූ සියයට 2.8 ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2020 දී ගෝලීය ආර්ථිකය සියයට 3.3 කින් හැකිලී ඇත. කොවිඩ්-19 වසංගතය නිසාවෙන් ගෝලීය ඛනිජ තෙල් ඉල්ලුම පහත වැටීමක් සහ බොරතෙල් වෙලඳපොලවල අස්ථාවරත්වයක් සිදු විය. ලෝක ආර්ථිකයන් ප්‍රකෘතිමත් වීමත් සමඟ විශේෂයෙන් චීනය අපේක්ෂා කළ වේගයට වඩා ප්‍රකෘතිමත් වීම හේතුවෙන් ඉල්ලුම ප්‍රකෘතිමත් වීමත් සමඟ වසරේ දෙවන භාගය සාපේක්ෂව ස්ථාවර ඛනිජ තෙල් මිල ගණන් වාර්තා කරන ලදි. වසංගතය හේතුවෙන් ඛනිජ තෙල් ඉල්ලුම පහත වැටුණු අතර එක්සත් ජනපදයේ බොර තෙල් තොග වැඩි වශයෙන් වර්ධනය වීම නිසා ජාත්‍යන්තර තෙල් මිල 2020 අප්‍රේල් මාසයේදී කැපී පෙනෙන අඩු අගයක් දක්වා පහත වැටෙන ලදි. ඔපෙක් සංවිධානයට අනුව ලෝක ඛනිජ තෙල් ඉල්ලුම දිනකට බැරල් මිලියන 9.6 කින් අඩු වී 2020 වර්ෂයේදී සාමාන්‍ය ඛනිජ තෙල් ඉල්ලුම දිනකට බැරල් මිලියන 90.4 දක්වා අඩු විය. කෙසේ වෙතත්, ඉල්ලුම වැඩිවීම හා මිල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ඔපෙක් සංවිධානය විසින් ඉන්ධන සැපයුම් කප්පාදු කිරීමත් සමඟ වසර අවසානයේදී මිල ගණන් ක්‍රමයෙන් පූර්ව වසංගත මට්ටම දක්වා යථා තත්වයට පත් විය.

## දේශීය පරිසරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, 2019 වර්ෂයේදී සියයට 2.3 ක වර්ධනයක් වාර්තා කලද 2020 වසර තුළදී ආර්ථිකය සියයට 3.6 කින් හැකිලී ඇත. කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ අරමුණින් දේශීයව පනවන ලද සංචරනය සීමා කිරීම් සහ අනෙකුත් ක්‍රියාමාර්ග තුලින් සියලුම අංශවල ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධාවන් ඇති විය. විදේශ ණය ගෙවීම් සහ සීමිත විදේශ විනිමය ගලා ඒම නිසාවෙන් 2020 වර්ෂය අවසානය වන විට දළ නිල සංචිත එක්සත් ජනපද ඩොලර් බිලියන 5.7 දක්වා අඩු විය.

කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමත් සමඟ මාර්තු සහ අප්‍රේල් මාසවලදී විනිමය අනුපාතිකය ඉහළ උච්චාවචනයන් වාර්තා කලේය. වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 2019 වර්ෂයේදී රු. 178.78 වූ අගය 2020 වර්ෂයේදී රු. 185.52 දක්වා අගය අඩුවී ඇත. වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස, සංස්ථාව රුපියල් බිලියන 152 ක් (2019- බිලියන 126) 2019 වසරට සාපේක්‍ෂව 20% ක වැඩිවීමක් සමඟින් ජාතික ආර්ථිකයට බදු හා තීරු බදු ලෙස දායකත්වයක් ලබා දෙමින් ප්‍රධාන දායකයෙකු ලෙස දිගටම ක්‍රියාත්මක වන අතර මෙම අරමුදල් රජය විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෙන්ම සාමාන්‍ය ජනතාවට ආර්ථික සහන සැලසීම සඳහා යොදවා ඇතැයි අපි විශ්වාස කරමු.

## සෑම ඉන්ධන බිඳක්ම තිරසාර සංවර්ධනය සඳහා

සංස්ථාව වෙත පැවරී ඇති ආයතනික සහ ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කිරීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම තුළින් ජාතික ආර්ථිකය තුළ සංස්ථාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින්, අප සපයන සෑම ඉන්ධන බින්දුවක් තුලින්ම අඛන්ඩ බලශක්ති සැපයුමක් සහතික කිරීම තුලින් රටෙහි ආර්ථික වර්ධනයට ළඟා වීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු.

## සන්දර්භය තුළ කාර්ය සාධනයන්

අපගේ ප්‍රධාන උපායමාර්ගික වත්කම වන පිරිපහදුව වසර තුළ බොරතෙල් මෙට්‍රික් ටොන් 1,685,441ක් සකස් කර ඇති අතර පිරිපහදු කල ඉන්ධන ආනයනය මගින් ඉල්ලුමෙහි ඉතිරි ප්‍රමාණය සපයා ඇත. කොවිඩ්-19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා රජය විසින් පනවන ලද රට අගුලු දැමීම් සහ සංචරනය සීමා කිරීම හේතුවෙන් සියලුම ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පහත වැටී ඇත.

අගුලු දැමීම් සහ සංචරන සීමා කිරීම් සමඟ දෙවන කාර්තුවේදී ආදායම පහත වැටුණද, තුන්වන කාර්තුවේදී එය යම් ප්‍රමාණයකට නැවත යථා තත්වයට පත් විය. කෙසේ වෙතත්, වසංගතයේ දෙවන රැල්ල වසරේ අවසාන කාර්තුවේ ආදායම පහත වැටීමට හේතු විය. කොවිඩ්-19 වසංගතය පාලනය සඳහා ජාත්‍යන්තර සංචරනය සීමා කිරීම සඳහා රජය විසින් ගුවන් තොටුපළ කටයුතු සීමා කිරීම ගුවන් ඉන්ධන අංශයෙන් උපයන ආදායම තියුනු ලෙස පහත වැටීමට හේතු විය.

ජාත්‍යන්තර බනිජ තෙල් මිල පහත වැටීම සහ අනෙකුත් උපාය මාර්ගික ක්‍රියාදාමයන් සමඟින් රුපියල් බිලියන 55 (2019 - රු. බිලියන 4.) ක දළ ලාභයක් වර්ෂය තුළ ලබා ගැනීමට හැකි විය. එමෙන්ම  දැවැන්ත විනිමය අනුපාත විචලනය සහ මූල්‍ය පිරිවැය නොතකා 2019 දී වාර්ථා කල රු. බිලියන 11.8 ක  ශුද්ධ අලාභය 2020 වර්ෂයේදී රු. බිලියන 2.37 ක ශුද්ධ ලාභයක් දක්වා වර්ධනය විය.

## තිරසාර මෙහෙයුම්

අපගේ උපාය මාර්ග සඳහා තිරසාර ප්‍රතිපත්ති ඇතුළත් කර ඇති බැවින්, ව්‍යාපාර මෙහෙයුම්වල තිරසාර බව සඳහා අපගේ උපරිම ප්‍රමුඛතාවය ලබා දී ඇත. මහජනතාවගේ තිරසාර පරිභෝජනය සහ පරිසර සංරක්ෂණය සහතික කිරීම සඳහා යූරෝ 4 පෙට්‍රල් සහ යූරෝ 4 ඩීසල් වැනි පරිසර හිතකාමී ඉන්ධන ප්‍රවර්ධනය කිරීමට අපි සැමවිටම කැපවී සිටිමු. අපගේ පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි මඟින් සියලුම නිෂ්පාදන වඩාත් තිරසාර ලෙස ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. අපගේ මෙහෙයුම් පිළිවෙත් විශේෂයෙන් අපද්‍රව්‍ය කළමනාකරණය සහ බැහැර කිරීම් ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරනු ලබයි.

## ඉදිරි දැක්ම

සංස්ථාව සැම විටම අභියෝගවල විශාලත්වය නොසලකා අනාගතය තුල නිසි පරිදි කටයුතු කිරීමට සූදානමින් සිටී. ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීම සහ පාරිභෝගිකයින්ට ගුණාත්මක බනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබඳව සංස්ථාව ආඩම්බර වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි දීප ව්‍යාප්ත පිරවුම්හල් ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින ඉන්ධන පිරවුම්හල් වැඩිදියුණු කිරීම හා අලුතින් එකතු කිරීම මගින් අපගේ වටිනාකම් දාමය ප්‍රශස්ත කිරීමට කටයුතු කරන්නෙමු. සංස්ථාව අස්ථාවර දේශීය හා ජාත්‍යන්තර ව්‍යාපාරික පරිසරය සහ ගෝලීය සහ දේශීය ආර්ථික හා දේශපාලන පරිසරයේ බලපෑම් පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කරන අතරම සංස්ථාව සිය පිරිපහදු ධාරිතාව සහ පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම දිගටම කරගෙන යනු ඇත.

ව්‍යාපාරයේ වටිනාකම් උත්පාදනය කිරීමේ හැකියාව සහ තිරසාර බව ඉහළ නැංවීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන උපාය මාර්ගික ව්‍යාපෘති සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා සංස්ථාව අඛණ්ඩව ආයෝජනය කරන ලදි. අපි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (BIA) පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, මුතුරාජවෙල සිට BIA දක්වා ගුවන් තෙල් නල මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පිරිපහදුව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කළෙමු. රටේ සංවර්ධනය තීරණය වන සන්ධිස්ථානයක් ලෙස සංස්ථාව දිගටම පවතිනු ඇතැයි අපි ඉතා ශුභවාදී වෙමු.

## ස්තුතිය

අපගේ විශාලතම වත්කමක් වන සංස්ථාව හි කාර්ය මණ්ඩලය විසින් සංස්ථාව ඉහල කාර්යසාධනයක් ලබා දී ඇති අතර, මෙම සංස්ථාවේ අභිවෘද්ධිය සහතික කිරීම සඳහා ලබා දුන් සහයෝගය සඳහා සංස්ථාව අපගේ ආයතනික කණ්ඩායමට හා කාර්‍යමණ්ඩලයට බෙහෙවින් ස්තුතිවන්ත වේ.

ගරු බලශක්ති අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම් තුමිය සහ එම නිලධාරීන් සෑම අවස්ථාවකදීම උපදෙස් සහ මහ පෙන්වීම් ලබා දෙමින් අපට මඟ පෙන්වූ අතර ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම වෙනුවෙන් සංස්ථාව අපගේ අවංක ස්තුතිය පිරිනමනු ලැබේ.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නොමඳ සහයෝගය සහ උපදෙස් සඳහා සෑම විටම ඇගයීමට ලක් කෙරේ. පවත්නාවූ මිල කළ නොහැකි මානව ප්‍රාග්ධනය මගින් අනාගතයේ ඇති විය හැකි අභියෝගවලට මුහුණ දෙමින් ඒවා ජය ගනිමින් තිරසාර රාජ්‍ය ව්‍යවසායක් බවට පරිවර්තනය කිරීමට අපට හැකි වනු ඇතැයි සංස්ථාව විශ්වාස කරයි.



ඩබ්.ඩබ්.ඩී. සුමිත් විජේසිංහ
සභාපති
04.01.2022

# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය




2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ අපගේ 2020 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටකි .

2020 වර්ෂය තුළ මුහුණ දුන් අභ්‍යන්තර හා බාහිර අභියෝග මධ්‍යයේ වුවද, කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා රට අගුලු දැමීම් සහ සංචරනය සීමා කිරීම් කාළය තුල පවා සෞඛ්‍ය සහ ආරක්ෂිත පියවරයන් නිසිපරිදි පිළිපදීමින් සංස්ථාව රටේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීමට කටයුතු කරන ලදි. අපගේ ව්‍යාපාරික පරිසරය තුල පෙර නොවූ විරූ උච්චාවචනයන් පැවතියද, 2019 වර්ෂයේ වාර්තා වූ අලාභය 2020 වර්ෂය වන විට රු. බිලියන 2.37 ක ලාභයක් දක්වා පරිවර්ථනය කිරීමට හැකිවිය.

## මෙහෙයුම් පරිසරය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, ලොව පුරා පැවති කොවිඩ්-19 වසංගතයහි බලපෑම් හේතුවෙන් 2019 හි වාර්තා වූ සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව 2020 දී ගෝලීය ආර්ථිකය සියයට 3.3 කින් හැකිලී ගියේය. ඔපෙක් (OPEC) සංවිධානය අනුව කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් ලෝක ඛනිජ තෙල් දෛනික ඉල්ලුම දිනකට බැරල් මිලියන 9.6 කින් පමණ වැටුනු අතර එම නිසා 2020 වර්ෂයේ සාමාන්‍ය ඉල්ලුම දිනකට බැරල් මිලියන 90.4 දක්වා තියුනු ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත්, වසර අවසන් කාලය වන විට ඉල්ලුම වැඩිවීම මෙන්ම මිල මට්ටම් පවත්වා ගැනීම සඳහා ඔපෙක් සංවිධානය විසින් සිදු කරන ලද සැපයුම කප්පාදු කිරීමත් සමඟ වසර අවසානයේ දී පහත වැටුණු මිල ගණන් ක්‍රමයෙන් පෙර මට්ටමට පත් විය. සංස්ථාව විසින් භාවිතා කරන බොරතෙල් (මර්බන්) මිල 2019 වසරේ වාර්තා වූ බැරලයක් ඇමරිකානු ඩොලර් 65.00 ට සාපේක්ෂව 2020 වර්ෂයේදී දී බැරලයක් ඩොලර් 42.45 දක්වා අඩු විය. ගෝලීය ඛනිජ තෙල් මිල පහත වැටීම සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට විශාල වශයෙන් දායක විය.





කොවිඩ්-19 වසංගතයහි ව්‍යාප්තිය මැඩලීමේ අරමුණින් දේශීයව සහ ජාත්‍යන්තරව පනවන ලද සංචරනය සීමා කිරීම් සහ අනෙකුත් ක්‍රියාමාර්ග තුලින් වසර තුළ සියලුම අංශවල ආර්ථික කටයුතු හැකිලීමක් වාර්තා විය.

රජය විසින් ගනු ලැබූ කොවිඩ්-19 පාලනය කිරීමේ ක්‍රියාකාරකම් සමඟ ඉදිකිරීම් සහ නිෂ්පාදන කටයුතුවල සැලකිය යුතු පසුබෑමක් වාර්ථා විය.

වර්ථමාන වෙළෙඳපොළ මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) හැකිලීම සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම තුලින් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පෙර වසරේ පැවති ඇමරිකානු ඩොලර් 3,852 සිට 2020 දී ඇමරිකානු ඩොලර් 3,682 දක්වා පහත වැටීමත් සමඟ මහජනතාවගේ පරිභෝජන හැකියාව අඩු වීය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම තුලින් සංස්ථාවට 2020 වසර සඳහා දැවැන්ත විනිමය අනුපාත විචලන අලාභයක් දරා ගැනීමට සිදුවිය.

## දේශීය මිල යාන්ත්‍රණය

රජයේ පැවති ප්‍රතිපත්තියට අනුව, ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර විකුණුම් මිල 2020 වර්ෂය තුළ නොවෙනස්ව පැවතුනි.





## අපගේ මෙහෙයුම්

කොවිඩ්-19 වසංගතය මැඩපැවැත්වීම සඳහා රජය විසින් පනවන ලද අගුලු දැමීම් සහ සංචරන සීමා කිරීම් අපගේ සියලුම ව්‍යාපාරික අංශවලට බලපෑමක් එල්ල කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂය තුළ සමස්ත ආදායම 19.75% කින් පහත වැටී ඇත.

මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල ඉන්ධන සඳහා වන ඉල්ලුම අඩු වූ අතර ඒ තුලින් පිරිපහදුව අඩු යෙදවුම් අනුපාතයන් යටතේ ක්‍රියාත්මක වීමත් ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් අඩුවීමත් තුලින් 2020 වර්ෂය තුළ බොරතෙල් ආනයනය සඳහා දරන ලද පිරිවැය 39.94% කින් පහත වැටී ඇත.

සමස්ත පිරිපහදු කළ බනිජ තෙල් සහ බොරතෙල් ආනයන වියදම 2019 වසරට සාපේක්ෂව 45.04% (එක්සත් ජනපද ඩොලර් බිලියන 1.29) කින් ඩොලර් බිලියන 1.55 දක්වා පහත වැටුණු අතර, ඒ තුලින් ජාතික ආර්ථිකයට විදේශ විනිමය ඉතිරියක් ජනනය විය.

ජාත්‍යන්තර බනිජ තෙල් මිල අඩුවීම සහ පිරිපහදුවෙන් ලද දායකත්වය සමඟින් දළ ලාභය පෙර වසරේ වාර්තා වූ රු. මිලියන 4,261 සිට රු. මිලියන 55,251 ක් දක්වා රු. මිලියන 50,990 (1196%) කින් වර්ධනය විය.




සංස්ථාව වර්ෂය තුළ දැවැන්ත පොලී වියදමක් සහ විනිමය අනුපාත විචලන අලාභයක් දැරුවද, 2019 වර්ෂයේ වාර්ථා කරන ලද රු. මිලියන 11,857 ක ශුද්ධ අලාභය 2020 වන විට රු. මිලියන 2,371 ක ශුද්ධ ලාභයක් දක්වා වර්ධනය කිරීමට හැකිවිය. පිරිපහදුවේ හා සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තයේ පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම මගින් රුපියල් මිලියන 17,676 ක නැවත තක්සේරු ලාභයක් ජනනය වූ අතර ඒ මගින් සංස්ථාවෙහි මූල්‍ය තත්ත්වය වර්ධනය විය.

සංස්ථා පිරිපහදුව මඟින් 2020 වර්ෂයේදී බොර තෙල් මෙට්‍රික් ටොන් 1,685,441 ක් පිරිපහදු කරන ලදි. පිරිපහදුවේ සාමාන්‍ය බොරතෙල් පරිභෝජනය දිනකට ටොන් 4650 ක් සහ දින දර්ශන දිනකට ටොන් 4605 ක් විය. පිරිපහදුව දින 362.44 ක් ක්‍රියාත්මක වූ අතර බොරතෙල් ඩිස්ට්ලර් ඒකකයේ 99.03% ක මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවයක් වාර්ථා කරන ලදි. සංස්ථා සැපයුමෙන් 30% ක් දළ වශයෙන් පිරිපහදු නිෂ්පාදනයෙන් සපුරා ගන්නා ලද අතර, ඉතිරිය ආනයනය කිරීම මඟින් සපුරා ගන්නා ලදි.

රු. බිලියන 377.5 (2019 දී රුපියල් බිලියන 430.4) ක දායකත්වයක් ලබා දෙමින් ප්‍රවාහන අංශය මඟින් වර්ෂයේ ආදායම වෙත ඉහළම දායකත්වය ලබා දෙන අතර, එය 2019 වර්ෂය සමඟ සැසඳීමේදී 12.29 ක පහත වැටීමකි. පෙට්‍රල් 92 මගින් මුළු ආදායම සඳහා ඉහළම දායකත්වය ලබා දුන්නද පෙට්‍රල් 92 මගින් ජනනය වන ලද ආදායම 8.72% ක අඩුවීමක් වාර්තා කරන ලදි. ජාත්‍යන්තර බනිජ තෙල් මිල පහත වැටීම තුලින් ප්‍රවාහන අංශයෙන් ජනනය වන අලාභය රු. බිලියන 25.9 සිට රු. බිලියන 3.5 දක්වා 2020 වර්ෂයේදී පහත වැටෙන ලදි. මෙම නිෂ්පාදන මත සංස්ථාව විශාල අලාභයක් දැරුවද, සහන මිල ගණන් යටතේ බනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මඟින් සහ රජය වෙත සංස්ථාවේ ආදායමින් 29% ක් බදු ලෙස ගෙවීම මඟින් සංස්ථාව විසින් රටේ ආර්ථික සහ සමාජ සුභසාධනයට දායක වී ඇත.

ප්‍රවාහන අංශය සඳහා ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා අපගේ දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලයට නව පිරවුම්හල් 25 ක් අලුතින් එකතු කරන ලද අතර ඒ සමඟින් මුළු පිරවුම්හල් ගණන 1322 දක්වා වැඩි විය.

සමාලෝචිත වර්ෂය තුළ බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන ඉල්ලුම අඩු වූ අතර ඒ තුලින් මෙම අංශයෙන් ජනනය වන ලද ආදායම රු. බිලියන 81.1 (2019-රු. බිලියන 118.6) දක්වා 31.62% කින් පහත වැටී ඇත. කොවිඩ්-19 වසංගතයහි බලපෑම හේතුවෙන් අනපේක්ෂිත ජාත්‍යන්තර මිල පහත වැටුණු අතර ඒ අනුව 2020 මාර්තු සිට බලපැවැත්වෙන පරිදි දැවි තෙල් මිල ලීටරයක් රු. 70.00 දක්වා රු. 26.00 කින් අඩු කරන ලදි.

වර්ෂය තුළ ගුවන් තෙල් අංශය වැඩිපුරම බලපෑමට ලක් වූ අංශය වූ අතර ගුවන් ඉන්ධන සඳහා ඇති ඉල්ලුම 60.15% කින් පහත වැටීමෙන් අංශයෙන් ලද ආදායම රු. බිලියන 19.4 (2019-රුපියල් බිලියන 58.9) දක්වා 66.97% ක තියුණු අඩුවීමක් වාර්තා විය. කොවිඩ්-19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා ගුවන් තොටුපළ වසා දැමීම හේතුවෙන් ආදායම අඩු වුවද, සංස්ථාවෙහි අලාභය 2019 වසරේ වාර්තා කළ රු. මිලියන 1,224 වර්ෂ 2020 වන විට රුපියල් මිලියන 109 දක්වා අලාභය අඩු විය.

කොවිඩ්-19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා රජය විසින් පනවන ලද සංචරන සීමා පැනවීම මගින් ලිහිසි තෙල් සඳහා වන සමස්ත ඉල්ලුම පහත වැටීමට හේතු වූ නමුත්, අපගේ උපාය මාර්ගික ක්‍රියාකාරකම් මගින් සංස්ථාවේ ලිහිසි තෙල් විකුණුම් ප්‍රමාණය 2019 ට සාපේක්ෂව 0.26% ක ආන්තික ලෙස ඉහළ නැංවීමට හැකි විය.

ප්‍රධාන වශයෙන් භූමිතෙල් අලෙවියෙන් ගෘහස්ථ අංශයෙන් වසර තුළ රු. බිලියන 2.1 අලාභයක් වාර්ථා කළද අඩු ආදායම් ලාභීන්ට මෙම සහනාධාරය ඔවුන්ගේ ජීවිතවල උන්නතිය සඳහා සමාජයට අපෙන් දෙනු ලබන ලොකුම දායකත්වයක් බව අපි විශ්වාස කරමු.

## ආයෝජන

සංස්ථාවේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් දේපල, පිරියත සහ උපකරණ වල රු. මිලියන 2,097ක් වර්ෂය තුල ආයෝජනය කරන ලදි. අනාගතයේ දී වැඩි වනු ඇතැයි අපේක්ෂිත ඉල්ලුම සපුරාලීම සඳහා නවීනතම තාක්ෂණය භාවිතා කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිහිටා ඇති ගුවන්තෙල් පරිශ්‍රය සහ ඉන්ධන ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කර වැඩි දියුණු කිරීමේ ප්‍රධානතම ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කරන ලදී.


පිරිපහදුවේ මනා ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා පිරිපහදුව ආශ්‍රිත ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. අපගේ ප්‍රාදේශීය කාර්යාල සහ සංචාරක බංගලා සූර්ය බලයෙන් ක්‍රියාකරන ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීම මඟින් තිරසාර පැවැත්මක් උදෙසා සංස්ථාව ක්‍රියාමාර්ග ගනිමින් සිටියි.

වගකීම් සහිත සංස්ථාපිත පුරවැසියෙක් ලෙස සංස්ථාව විසින් කීර්තිනාමය සහ නියාමක අනුකූලතාවය කෙරේ ඉහළ වැදගත්කමක් ලබා දී ඇත. ජාතියේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය දෙමින් එහි ඉලක්ක මනා ලෙස සපුරාලීම සඳහා කාර්මික සම්බන්ධතා, සෞඛ්‍ය සහ ප්‍රවේශම් ප්‍රමිතීන් හොඳින් පවත්වාගෙන යයි. සමස්ථ රටම ආවරණය වන පරිදි අවශ්‍ය සේවා සැපයීම මෙන්ම රු. මිලි. 152,311 ක් විවිධ බදු ලෙස රජය වෙත ලබා දී රටේ විශාලතම බදු ගෙවන්නෙක් ලෙස දායක වෙමින් තිරසාර ආර්ථික සංවර්ධනයට පහසුකම් සපයයි.

## ස්තුතිය

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා මා වෙත ඉමහත් සහයෝගයක් ලබා දුන් සංස්ථාවේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. මෙම අවිනිශ්චිත සහ අස්ථාවර දේශීය හා ජාත්‍යන්තර පරිසරයට මුහුණ දීමට මගේ ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායමට මගේ අවංක ප්‍රශංසාව ද ප්‍රකාශ කරමි. සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා ඔවුන්ගේ කැපවීම සහ සියලුම කාණ්ඩවල සිටින අපගේ සමස්ත කාර්ය මණ්ඩලයට මගේ කෘතඥතාව පුද කරමි.


අපගේ ගමන් මග උදෙසා අඛණ්ඩ සහයෝගයක් ලබා දෙන ගරු බලශක්ති අමාත්‍යතුමා, බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන්, බැංකුකරුවන්, සේවාදායකයන් සහ සැපයුම්කරුවන් වෙත මාගේ කෘතඥතාවය පල කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.



බුද්ධික මබිහේවා
කළමනාකාර අධ්‍යක්ෂ
04.01.2022

# අපගේ නායකත්වය

ආයතනයේ සාර්ථකත්වය සඳහා නායකත්වය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින්, අපගේ කළමනාකාරීත්වය පත් කරනු ලබන්නේ උපාය මාර්ගික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දිය හැකි කුසලතා සහ පලපුරුද්ද මත දැක්ම සහ මෙහෙවර වෙත ළඟා වීම සඳහා ය. අපගේ සංස්ථාපිත සංස්කෘතිය අපගේ ගමනට ඵලදායි ලෙස දායක වීම සඳහා බොහෝ හැකියාවන් ඇති පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කරයි.



# අධ්‍යක්ෂ මණ්ඩලය



**සුමිත් විජේසිංහ මහතා**
**සභාපති**

විජේසිංහ මහතා 2020.01.03 දින සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. ඔහු නීතිඥයකු වන අතර නීතිවේදී උපාධියක් ලබා ඇත.

රටේ බලශක්ති සුරක්ෂිතතාවයේ අරමුණින් බලශක්ති අමාත්‍යාංශය යටතේ රජය සතු ප්‍රධාන උපාය මාර්ගික ව්‍යාපාරයක් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විජේසිංහ මහතා නායකත්වය ලබා දෙයි. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා යොදා ගන්නා යටිතල පහසුකම් නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාව වගකිව යුතුය. ඔහු සංස්ථාව තිරසාර ව්‍යවසායක් බවට පරිවර්තනය කරන සාර්ථක නායකයෙකි.

ඔහුගේ කීර්තිමත් වෘත්තීය කාලය තුළ 2007 ජුනි සිට 2015 දක්වා පාර්ලිමේන්තු සභානායක ලේකම් ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා ටෙලිකොම් (පීඑල්සී) (2007-2010), අපනයන සංවර්ධන මණ්ඩලයේ (2011-2012), ජාතික ඉතිරිකිරීමේ බැංකුව (2012-2014), මොබිටෙල් (පුද්ගලික) සමාගම (2007-2010), ජාතික සංවර්ධන භාර අරමුදල (ගර්) ලිමිටඩ් (2007-2010), ජාතික සංවර්ධන භාර අරමුදල් සමාගම (2007-2010), ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, එස්එල්ටී යෙලෝ පේජස් (පුද්) සමාගම සහ එස්එල්ටී මැන් පවර් (පුද්) සමාගම යන සමාගම් වල අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත.



**බුද්ධික මඩිහහේවා මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂක**

මඩිහහේවා මහතා 2020.01.16 දින සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂක ලෙස පත් කරන ලදී. මහා පරිමාන සමාගම් සමූහයක් වන ස්වර්ණකැලුම් සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි තනතුර ද එතුමා මේ වන විට හොබවනු ලබයි. රාජකීය විද්‍යාලයේ ආදී සිසුවකු වන මෙතුමා ඔස්ට්‍රේලියානු ඇඩ්ලේඩ් ආයතනයේ ව්‍යාපාරික පරිපාලනවේදී උපාධිය සහ ව්‍යාපාර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගෙන ඇත. එම්.සි.අයි.එම්. / එන්.සී.එම්.අයි./ එන්.ඒ.බි.ඊ/ අයි.එම්.එස්.එල්. වැනි දේශීය සහ ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම් රැසක් ද එතුමා විසින් දරනු ලබයි.

සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යේද මෙතුමා නායකත්වය ලබාදෙන ලදී. පුද්ගලික අංශයේ ව්‍යාපාර කළමණාකාරීත්වය පිළිබඳව වසර 29 කට වැඩි පළපුරුද්දක් සහිත සහ සාර්ථක ව්‍යවසායකයෙකු ලෙස විශේෂයෙන්ම සේවක අන්තර් සම්බන්ධතා, තාක්ෂණය, නිර්මාණශීලීත්වය සහ වෘත්තීය දක්ෂතා යන අංශ වෙත අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් සෑම තලයකම සේවකයන් සඳහා රැකියාව කිරීමට ප්‍රියතම ස්ථානයක් කිරීම මඟින් සංස්ථාව තිරසාර ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය සහාය ලබා දෙයි.

ඔහුගේ වෘත්තීය ජීවිතයේදී ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා ලෙස, ඒ.පී.එම්.එස්. හොල්ඩින්ස් (පුද්) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස, ලංකා ගල් අඟුරු සමාගමේ සහ ලංකා නැව් සමාගමේ අධ්‍යක්ෂ ලෙස විවිධ තනතුරු දරා ඇත. ලංකා පොහොර සමාගමේ සභාපති ලෙස එම සමාගම ලාභදායී සමාගමක් බවට පරිවර්තනය කර සම්මාන බොහොමයක් දිනා ගැනීමට සමත් විය.



## ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය
## අධ්‍යක්ෂක

රත්නායක මහත්මිය 2020.01.13 දින සංස්ථාවේ අධ්‍යක්ෂ ධුරයට පත් කරන ලදී. ඇය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු ලෙස මේ වන විට සේවය කරමින් සිටී. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදි උපාධිය උසුලයි. එසේම, ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය හදාරා ඇත.

ඇයගේ වෘත්තීය ජීවිතය තුළ ඇය විසින් රාජ්‍ය අංශයේ ප්‍රධාන තනතුරු බොහෝමයක් දරා ඇති අතර, ඒ අතරින් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ලෙස, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස, මහජන බැංකුවේ අධ්‍යක්ෂ ලෙස, වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ ලෙස, කෘෂිකර්ම සහ කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ ලෙස සිදු කළ රාජකාරී කැපී පෙනෙයි.



## චාමින්ද හෙට්ටිආරච්චි මහතා
## අධ්‍යක්ෂක

2020.01.17 දින හෙට්ටිආරච්චි මහතා සංස්ථා අධ්‍යක්ෂ ධුරයට පත් කරන ලදී. 2019.12.06 දින සිට 2020.01.02 දින දක්වා ඔහු සංස්ථා සභාපති ධුරයේ වැඩ බලන ලදි. මේ වන විට එතුමා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරය හොබවයි. ඔහු ශාස්ත්‍රවේදි, නීතිවේදී, විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) එම්.පී.එම්. (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) යන උපාධි සහ පශ්චාත් උපාධි දරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකි. එමෙන්ම ඔහු නීතිඥයෙකි.

ඔහුගේ දීර්ඝ කාලීන වෘත්තීය දිවිය තුළ රාජ්‍ය අංශයේ කැපී පෙනෙන තනතුරු දරන ලද අතර ඒවා අතරින් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක වරයා ලෙස, ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස, ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස කටයුතු කිරීම කැපී පෙනෙන තනතුරු අතර කීපයකි.



## බුද්ධික ඉද්දමල්ගොඩ මහතා
## අධ්‍යක්ෂක

ඉද්දමල්ගොඩ මහතා 2020.01.17 දින සංස්ථාවේ අධ්‍යක්ෂ ධුරයට පත්විය. එල්.ටී.එල්. හොල්ඩින් පුද්. ආයතනයේ සභාපති ධුරය මෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ ධුරය හෙබවීය. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති උපාධිදරයකු වන ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියක් ද දරන අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් සහ ජන සන්නිවේදන ඩිප්ලෝමා ද හොබවයි. ඔහු නීතිඥයෙකු, සමාගම් ලේකම්වරයකු මෙන්ම ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ද වේ.

ඔහුගේ වෘත්තීය දිවියේදී මේ වන විට ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස, නාරා ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස, ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයේ (ආරක්ෂක අමාත්‍යාංශයේ) ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස, ස්වාධීන රූපවාහිනී ජාලයේ විධායක අධ්‍යක්ෂකවරයා ලෙස, තරුණ සම්මාන අධිකාරියේ සභාපති ලෙස, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස, ජාතික ඔලිම්පික් කමිටුවේ මාධ්‍ය කළමනාකරු / අධ්‍යක්ෂ ලෙස, ජාතික තරුණ සම්මාන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස සහ ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත.



## තරිඳු එක්නැන්දගෙදර මහතා
## අධ්‍යක්ෂක

2020.01.17 දින එක්නැන්දගෙදර මහතා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත් විය. මේ වන විට ඒ මහතා එස් ඇන්ඩ් කේ. ඉන්ජිනියරින් එන්ටප්‍රයිසස් පුද්. සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද, එස් ඇන්ඩ් කේ. ඉදිකිරිම් ද්‍රව්‍ය පුද්. සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද, රෙනෙයිසන්ස් පුද්. සමාගමේ අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.

එම මහතා 2017 වර්ෂයේදී එංගලන්තයේ වෙර්මින්ග්හැම් සිටි විශ්වවිද්‍යාලයේ ඉදිකිරිම් කළමනාකරණය පිළිබඳව දෙවන පංතියේ ඉහල පෙල උපාධියක් ලබා ගන්නා ලද අතර 2013 වර්ෂයේ දී ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳව විශිෂ්ඨ සමාර්ථයක් සහිතව ඩිප්ලෝමාවක් ලබා ගන්නා ලදි.

ඔහුගේ වෘත්තීය දිවිය තුළ 2017 – 2018 දක්වා ලංකා ධීවර වරාය සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කර ඇත.



## තිලංග පොල්වත්තගේ මහතා
## අධ්‍යක්ෂක

2020.01.17 දින සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත් විය. පොල්වත්තගේ මහතා පෞද්ගලික අංශයේ ආයතන බොහෝමයක විවිධ තනතුරු දරන ලද අතර, ඩීසන්ට් ට්‍රේඩින් ඉන්ටර්නැෂනල් පුද්. සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුර, ජපානයේ කාලීග් සමාගමේ ජාත්‍යන්තර ව්‍යාපාර සංවර්ධන කළමනාකාර තනතුර (2011 වසරේ සිට මේ දක්වා) සහ ඩෙල්ටා ට්‍රේඩින් ජාත්‍යන්තර සමාගමේ කළමනාකරණ කොටස්කරු (2018 මාසයේ සිට මේ දක්වා) තනතුර කැපී පෙනෙන තනතුරු අතරින් කීපයකි.

ඔහු එක්සත් රාජධානියේ ග්ලවුසෙස්ටර්ශයර් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය ලබා ඇති අතර, එක්සත් රාජධානියේ බක්ස් නව විශ්වවිද්‍යාලයේ නීතිවේදී (ගෞරව) සහ නීතිපති (ගෞරව) උපාධි ලබා ගෙන ඇත. සාගර නීතිය පිළිබඳව වෘත්තීය උපාධි ඩිප්ලෝමාව සහ නීතිය පිළිබඳව ජාත්‍යන්තර උසස් ඩිප්ලෝමාව ද හදාරා ඇත.

# සංස්ථායික කළමනාකාරීත්වය



**ඊ.ඒ.එස්.එදිරිසිංහ මහතා**
**පිරිපහදු කළමනාකරු**

එදිරිසිංහ මහතා රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකි.

වසර හතරක නියමිත වැඩකොටසක් ඉටුකිරීම සඳහා ඔහු 1988 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංසථාවට බැඳුනේ වසර දෙකක කාලයක් සෞදි අරාබියේ යාන්බු හි සවුදි ඇරම්කෝ තෙල් පිරිපහදුවේ මිශ්‍රණ විශේෂ ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කිරීමට පෙරය. නැවත ඔහු 1996 සංස්ථාවට බැඳුනේ එම තනතුර සඳහාම වන අතර 2002 වසරේදී තාක්ෂණික සේවා සහකාර කළමනාකරු (ක්‍රියාමාර්ග) ලෙස උසස්වීමක් ලැබීය. 2005 වසරේදී ඔහු නියෝජ්‍ය කළමනාකාරු කාර්මික සේවා (ව්‍යාපෘති) ලෙස උසස් වීමක් ලැබීය. 2009 වසරේදි මෙහෙයුම් කළමනාකරු 2014 නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නිෂ්පාදන හා මෙහෙයුම්) ලෙසත් කටයුතු කර ඇති අතර, වර්තමානයේ සංස්ථාවේ වැඩ බලන පිරිපහදු කළමනාකරු ලෙස ඔහු සේවය කරයි.



**එස්.ඩබ්.ගමගේ මහතා.**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන)**

ගමගේ මහතා රුහුණු විශ්ව විද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති අතර පසුව නෙදර්ලන්තයේ වැගනිං කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් එම්බිඒ උපාධියක්ද, ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකාරණ ආයතනයෙන් පුහුණුව හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකයක් ද ලබා ඇත. ඔහු පුද්ගල හා සංවර්ධන පිළිබඳ වරලත් ආයතනයේ සහකාර සාමාජිකයෙකි.

කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස 1991 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුණු ඔහු කළමනාකරණ තනතුරු ගණනාවක සේවය කර ඇති අතර, සංස්ථාවේ වසර විසි අටක් අඛණ්ඩව සේවය කර තිබේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් තෙල් කටයුතු මඟින් සේවා ආරම්භ කළ ඔහු ජාත්‍යන්තර ගුවන් තොටුපලවල ගුවන් යානා ඉන්ධන පිරවීමේ මෙහෙයුම් සඳහා සහතික සහ සුදුසුකම්ලත් නිලධාරියෙකු ලෙස තහවුරු කර ඇත.

2009 වසරේදී ඔහු වර්තමාන තනතුර වන මානව සම්පත් හා පරිපාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරට උසස් කරන ලදී.



**එම්.කේ.ගරුසිංහ මහතා.**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ හා සැපයුම් දාමය)**

ගරුසිංහ මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර, ස්වීඩනයේ මැල්මෝහී ලෝක සමුද්‍රීය විශ්ව විද්‍යාලයෙන් සමුද්‍රීය කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේය. ඔහු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් එම්බිඒ උපාධියක්ද ලබා ඇත.

ඔහු වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකාවේ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ ආයතනික සාමාජිකයෙකි. ඔහු මේ වන විට වාණිජ හා සැපයුම් දාම කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාය.



**ඩබ්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)**

වික්‍රමසිංහ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් එම්බිඒ උපාධියක් ලබා ඇත. ඔහු ලංකාවේ රසායන විද්‍යා ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයෙකි. මීට අමතරව ඔහු දකුණු අප්‍රිකාවෙන් මානව සම්පත් නායකත්ව කළමනාකරණ විශිෂ්ටත්වය පිළිබඳ වෘත්තීමය පුහුණුවක් ලබා ඇත.

1999- 2008 දක්වා සීමාසහිත කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් හි ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරු ලෙස සේවය කර තිබේ. වර්තමානයේ ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි ලෙස කටයුතු කරන අතර ඔහුට පැවරි ඇති වගකීම් අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවිකරණ මෙහෙයුම් පාලනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ඇතුළුව දේශීය ඉන්ධන වෙළඳපොල, කෘෂි රසායනික ක්‍රියාකාරීත්වය, තාර, ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන කාර්යයන් සහ පාරිභෝගික සත්කාර සහ ආයතනික සන්නිවේදන ඒකකය මෙන්ම සේවා ස්ථාන උපකරණ සහිත පාලනය සහ සම්බන්ධීකරණය වේ. සංස්ථාවේ සැලසුම් සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ව්‍යාපාරික පරිසරය තුළ ඇති අභියෝගයන්ට මුහුණ දීම සඳහා අදාළ වෙනස්කම් සිදු කරමින් අවශ්‍ය ව්‍යාපාරික පරිසරය නිර්මාණය කිරීම ඔහුට පැවරුණු අමතර වගකීම් අතර වේ.



**වී.එන්. වීරසූරිය මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - (මූල්‍ය)**

වීරසූරිය මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා ඇති අතර එම විශ්ව විද්‍යාලයේම පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් එම්බිඒ උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. CPA (ASA) හි ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර, CMA(FCMA) හි අධි සාමාජිකයෙකි.

ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත්තේ 1994 දි බී.ආර්. ද සිල්වා විගණන සමාගමේ විගණන ලිපිකරුවෙකු සහ බදු පරීක්ෂකවරයෙකු ලෙසයි. පසුව ඔහු මයික්‍රොසෙල්ස් ලිමිටඩ් හි ගණකාධිකාරීවරයෙකු ලෙසත්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ මූල්‍ය කළමනාකරු ලෙසත්, තුඩාවේ බ්‍රදර්ස් හි කළමනාකරණ ගණකාධිකාරී ලෙසත්, වීකොම් ඉන්ටර්නැෂනල් හි සමූහ මූල්‍ය හා පරිපාලන කළමනාකාරු ලෙසත්, එන්කාර් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ලිමිටඩ් හි සමූහ මූල්‍ය කළමනාකරු ලෙස කටයුතු කළේය. ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි ෆෙස් ෆ්‍රීස් පුද්ගලික සමාගමේ මූල්‍ය සහ පරිපාලන කළමනාකරු ලෙසත්, 2017 ලංකා ඛනිජ තෙල් නීතිගත සංසථාවට සම්බන්ධ වීමට පෙර හන්ටර් ඇන්ඩ් කම්පනි පීඑල්සි හි මූල්‍ය කළමනාකරු ලෙස කටයුතු කර තිබේ.

ඔහු ගණකාධිකරණ හා මූල්‍ය සම්බන්ධ සියලු කටයුතු, භාණ්ඩාගාර කළමනාකරණය බදු සහ රක්ෂණ, අයවැය යෝජනා සහ රජයේ රෙගුලාසි හා වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්කරණ සහ මූල්‍ය ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරකම් සඳහා විවිධ අනුමැතීන් ලබාගැනීම සිදු කරයි.



**එම්. ඒ.ඩී.මල්ලිකාරච්චි මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු )**

මල්ලිකාරච්චි මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක් ලබා ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. එසේම ඔහු දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රමුඛ පෙළේ කළමනාකරණ නායකත්වය සම්බන්ධ වෘත්තීමය සහ කාර්මික පහසුකම් පිළිබඳ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී ඇත.

.

ඔහු තෙල් සහ ගෑස් කර්මාන්තයට අදාළ ගුවන් ඉන්ධන මෙහෙයුම් කළමනාකරණය ගුවන් ඉන්ධන තත්ව සහතික පාලනය, ගුවන් යානා ඉන්ධන නිෂ්පාදනාගාර සහ ඉන්ධන නල පද්ධති වලට අදාළ ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය, ඉංජිනේරුමය තහවුරු කිරීම් සහ ක්‍රියාවලී සැලසුම් කිරීම සහ දැනුවත් කිරීම් පිළිබඳ වසර 21කට අධික අත්දැකීම් ලබා තිබේ. 1996 ජිනසේන සමූහයේ ඉංජිනේරුවෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, පසුව ඉන්ටර්බැච් පෝසිලේන් පුද්ගලික සමාගමේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරුවරයකු ලෙස සේවය කළේය. 1999 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස බැඳුණු ඔහු පසුව ඔහු ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු වශයෙන් ද ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අයත් ගුවන් තොටුපල තෙල් අංගනයේ නියෝජ්‍ය කළමනාකරු ලෙස සේවය කර තිබේ. ගුවන් ඉන්ධන නිෂ්පාදනාගාර ව්‍යාපෘති කළමනාකරු, ගුවන් මෙහෙයුම් කළමනාකරු ලෙස සේවය කළ ඔහු අවසන් වශයෙන් 2017 සිට තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවය කරයි.



**ඩී.එම්.පී. දිසානායක මහතා**
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (නඩත්තු සහ ව්‍යාපෘති)**

දිසානායක මහතා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති අතර, වරලත් ඉංජිනේරුවරයෙකු සහ ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඔහු නීතිවේදී උපාධියක් ලබා ඇති අතර, නීතිඥවරයෙකි.

ඔහු 1988 වසරේ දී යාන්ත්‍රික ඉංජිනේරුවරයකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශයට සම්බන්ධ වූයේ ය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දශක තුනක දීර්ඝ සේවා කාලය තුළ ඔහු නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු, ඉංජිනේරු කළමනාකරු (යාන්ත්‍රික), ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) යන තනතුරු ද අවසාන වශයෙන් 2016 සිට නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) වශයෙන් කටයුතු කරයි.



**එල්.පී.එම්.ආර්.පෙරේරා මහතා**
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාරු (විදුලි සහ උපකරණ)**

පෙරේරා මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු 1992 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු උපකරණ ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

මෙහෙයුම් පාලන උපකරණ ක්ෂේත්‍රයේ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු උපකරණ ක්ෂේත්‍රයේ විවිධ තනතුරු හොබවා තිබේ. වර්තමානයේ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (විදුලි හා උපකරණ) තනතුරේ සිටින ඔහු පිරිපහදුවේ විදුලි, උපකරණ හා අමුද්‍රව්‍ය අංශවල ප්‍රධානියා ලෙස කටයුතු කරයි.



**කේ. ඩබ්. එස්. පුෂ්පලාල් මහතා**
**වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)**

පුෂ්පලාල් මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය (දේශපාලන විද්‍යාව විශේෂ) ලබා ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ AHRI හි සහතික කළ වෘත්තීය සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් වෘත්තීය කළමණාකරු ආයතනයේ සාමාජිකයෙකි. පුෂ්පලාල් මහතා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පුහුණු වැඩසටහන් ගණනාවක් සම්පූර්ණ කර ඇත.

1997 වර්ෂයේ කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සංස්ථාව හා සම්බන්ධ වී ඇති පුෂ්පලාල් මහතා වසර 21 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ ඔහු සංස්ථාවෙහි නියෝජ්‍ය පිරිස් කළමනාකරු, පරිපාලන කළමනාකරු, මානව සම්පත් කළමනාකරු ඇතුළු විවිධ තනතුරු දැරූ අතර දැනට ඔහු වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) තනතුර දරයි.



**සි.ආර්.කේ.ගමගේ මහතා**
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (තාක්ෂණික සහ උපකරණ)**

ගමගේ මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති වරලත් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකි.

තවදුරටත් ඔහු UT.PT.DT.MT,IR (දෙවන පෙළ) සහතිකලත් කම්පන විශ්ලේෂක පියවර 1 සහතික ලබා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ මොබියස් ආයතනයෙන් සහ නන් ඩිස්ට්‍රක්ටව් ටෙස්ටින්ග් සමාජයෙනි.

ඔහු 1993 වසරේ දි යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශයෙන් තාක්ෂණික ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

පිරිපහදුවේ නඩත්තු, පරීක්ෂාව සහ තාක්ෂණික සේවා වැනි ඉංජිනේරු ක්ෂේත්‍රයේ ව්‍යාපෘති පිළිබඳ වසර 26කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය. 2018 ඔක්තෝබර් වැඩබලන නියෝජ්‍ය කළමනාකරු තනතුරට පත්වීමට පෙර නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු (පරීක්ෂණ) සහ ඉංජිනේරු කළමනාකරු (පරීක්ෂණ) යන තනතුරු දැරීය.  මේ වන විට ඔහු පරීක්ෂණ කටයුතු රසායනාගාර සහ තාක්ෂණික සේවා අංශය මූලික කරගෙන තාක්ෂණික සේවා අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

1

2

3

4

5

6

7

8

9

10

11

12

13

14

15


1. R A K C ආරියරත්න මහත්මිය, ප්‍රධාන නීති නිලධාරී 2. M C D පෙරේරා මෙනවිය, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) 3. මේජ. M R S P සමරසිංහ මහතා, කළමනාකරු (ආරක්ෂක සහ විමර්ශන) 4. G P K විජේකෝන් මහතා, කළමනාකරු (ඉංජිනේරු සහ පරිශ්‍ර) 5. M S R ප්‍රනාන්දු මහත්මිය, කළමනාකරු (තොරතුරු තාක්ෂණ) 6. W K S ගුණවර්ධන මහතා, කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන) 7. B S S පෙරේරා මහතා, කළමනාකරු (කෘෂි රසායන) 8. R A T I රණසිංහ මහතා, කළමනාකරු (විගණනය) 9. G M U W දොලොස්වල මහතා, කළමනාකරු (ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන) 10. K K A ජයවික්‍රම මහතා, කළමනාකරු (වාණිජ) 11. A G D බණ්ඩාර මහතා, කළමනාකරු (නාවික) 12. N B M P ජීවසිරි මහතා, කළමනාකරු (මෙහෙයුම් - තොග සහ පර්යන්ත මෙහෙයුම්) 13. W D L C අබේගුණවර්ධන මහතා, කළමනාකරු (අලෙවි) (වැඩ බලන) 14. R W S M රාජසිංහ මහතා, නියෝජ්‍ය කළමනාකරු (ගුවන් සේවා - මෙහෙයුම්) 15. A B කෝරලේගෙදර මහතා, සහ.කළමනාකරු (ලේකම් කාර්යාලය) (වැඩ බලන).

16


17


18


19


20


21


22


23


24



25



26


27


**16**. K G H කෝදාගොඩ මහතා, කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්) **17**. P F W දයානාත් මහතා, කළමනාකරු (ඉංජිනේරු - සිවිල්) **18**. R A S රාජපක්ෂ මහතා, කළමනාකරු (ද්‍රව්‍ය) **19**. K A K K කුරුප්පු මහතා, කළමනාකරු (ඉංජිනේරු - ව්‍යාපෘති) **20**. R A B තිලංග මහතා, කළමනාකරු (ඉංජිනේරු - යාන්ත්‍රික) **21**. K V J චන්ද්‍රවංශ මහතා, කළමනාකරු (ඉංජිනේරු - විදුලි) **22**. W S රේබල් මහතා, කළමනාකරු (ඉංජිනේරු - උපකරණ) **23**. W A N R වික්‍රමසිංහ මහතා, කළමනාකරු (තාක්ෂණික සේවා) **24**. A S ප්‍රේමකාන්ති මහත්මිය, කළමනාකරු (ආර්ථික සහ උපලේඛනගත කිරීම) **25**. R M M W බණ්ඩාර මහතා, නියෝජ්‍ය කළමනාකාර (ගිනි සහ ආරක්ෂාව) **26**. A I චන්සේකර මහතා, නියෝජ්‍ය කළමනාකරු (ST - මෙහෙයුම්) **27**. C N විතානආරච්චි මහත්මිය, ජ්‍යොෂ්ඨ වෛද්‍ය නිලධාරී.

# ආයතනික සංයුතිය


Chairman
Managing Director
DGM (MKT)
DGM (C &SC)
DGM (TS & CA)
DGM (F)
DGM (HR & A)
CLO
CIA
Manager (Legal)
Manager (Audit)
Manager (Investigation)
Manager (Marketing)
Manager (Agro Chemical)
Manager (Lub & Spc. Prdct)
Manager (Commercial)
Manager (Procu. & Stores)
Manager (Shipping)
Manager (Engi. & Premi.)
Manager (Operations)
Manager (R & D)
Manager (Avi. Ops.)
Snr. Manager (Finance)
Manager (IT)
Manager (HR)
Manager (Security)
Manager (Secretariat)


Refinery Manager
DRM (Elec. & Ins.)
DRM (Maint & Pro.)
DRM (Tech. Ser.)
DRM (Manu. & Ops.)
Manager (Materials)
Manager (Electrical)
Manager (Instrumental)
Manager (Civil)
Manager (Projects)
Manager (Mechanical)
Manager (Lab)
Manager (Inspection)
Manager (Technical Services)
Manager (Eco. & Sched)
Manager (Operation)
Dy. Manager (Fire & Safety)
Snr. Med. Officer
Dy. Ops. Mgr. (ST)

# වෙළඳපල සමාලෝචනය සහ ඉදිරි දැක්ම

***2020 ලෝකයට අභියෝගාත්මක වසරක් වූ බැවින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, එම වසර තුළ ගෝලීය ආර්ථිකය සියයට 3.3 ක සංකෝචනයක් වාර්තා කරන ලදි. කොවිඩ්-19 වසංගතයේ බලපෑමට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ද වර්ෂය තුළ 3.6ක සංකෝචනයක් වාර්තා කරන ලදි. අභියෝග සහ අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද, වසරේ අග භාගයේදී ආර්ථිකය යථා තත්ත්වයට පත් විය. වසංගතය පැතිරීම මැඩලීමේ ඵන්නත්කරන ක්‍රියාවලිය සමඟ ශක්තිමත් ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් සමස්ත රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ එක්ව 2021 වර්ෂයේදී දී සියයට 6 ක ඉහළ වර්ධන මට්ටමක් ලඟාකරගැනීමට අපේක්ෂිතය. 2019 වසරට සාපේක්ෂව ජාත්‍යන්තර බනිජතෙල් මිල අඩුවීම සහ විකුණුම් ප්‍රමාණය අඩුවීම තුලින් ආනයන අඩු වීමෙන් රටට ඇමරිකානු ඩොලර් බිලියන 1.29 ක දැවැන්ත විදේශ විනිමය ඉතිරියක් සිදුවිය.***

**90.39**


ලෝක ඉන්ධන ඉල්ලුම
(දිනකට බැරල් මිලියන)


**-3.3**

ලෝක ද.දේ.නි. වර්ධනය (%)

**1.29**

ආනයනය ඉතුරුම්
*(එ.ජ.ඩො. බිලියන)*







# ගෝලීය සන්දර්භය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අනුව, 2019 දී වාර්තා වූ සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව 2020 දී ගෝලීය ආර්ථිකය සියයට 3.3 කින් සංකෝචනය විය. 2020 වර්ෂය තුළ, දියුණු ආර්ථිකයන් සියයට 4.7 කින් සංකෝචනය වනු ඇතැයි ගණන් බලා ඇති අතර, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සම්බන්ධයෙන් ගත්කල සියයට 2.2ක සංකෝචනයක් ඇස්තමේන්තු කර ඇත.

පළමු අර්ධ වර්ෂය තුළ බොහෝ ආර්ථිකයන් සංකෝචනය වුවද, තුන්වන කාර්තුවේදී සුවිශේෂී මූල්‍ය හා මූල්‍ය උත්තේජක මෙන්ම තුන්වන කාර්තුවේ ආරම්භය වන විට විවිධ රටවල් අගුලු දැමීම් ලිහිල් කිරීමත් සමඟ ගෝලීය ආර්ථික වර්ධනය තුන්වන කාර්තුවේදී සැලකිය යුතු ලෙස යථා තත්වයට පත් විය.

ලෝක ද.දේ.නි. වර්ධනය





*මූලාශ්‍රය: IMF - Word Economic Outlook 2021-අප්‍රේල්*

2020 වර්ෂය මැද භාගයේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමෙන් පසුව, භාණ්ඩ අංශයේ ක්‍රියාකාරකම් සහ වෙළඳාම වැඩිදියුණු වී ඇති අතර සේවා අංශය ආර්ථික හීනතාවයෙන් පවතී. විශේෂයෙන් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය තවමත් අවපාතයට ලක්ව ඇත. දැඩි අගුලු දැමීම් ක්‍රමයෙන් ඉවත් කිරීම සහ ඉල්ලුම යථා තත්වයට පත්වීම වීම නිසා බොහෝ භාණ්ඩ මිල 2020 මැද භාගයේ සිට යථා තත්වයට පත්විය.

2020 පළමු භාගයේදී, කෝවිඩ්-19 වසංගතය ගෝලීය බනිජ තෙල් ඉල්ලුමේ දැඩි පහත වැටීමකට සහ බොරතෙල් වෙලඳපොලවල් අස්ථාවරත්වයට මෙන්ම විචලතා වලට හේතු විය. ආර්ථිකයන් ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉල්ලුම යථා තත්වයට පත් වීමත් සමඟ වසරේ දෙවන භාගයේදී මිල ගණන් සාපේක්ෂව ස්ථාවර විය. විශේෂයෙන් චීනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගයෙන් ප්‍රකෘතිමත් වීම මේ සඳහා බලපාන ලදි. බනිජතෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුම පහත වැටුනු ලද අතර එක්සත් ජනපද බොර තෙල් තොග වැඩි වීමත් සමඟ බොරතෙල් (WTI) 2020 අප්‍රේල් මාසයේදී සෘණ අගයන් යටතේ වෙළඳාම් විය. ඔපෙක් (OPEC) සංවිධානයට අනුව, ලෝක බනිජතෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුම 2020 වර්ෂයේදී දෛනික සාමාන්‍ය අගය බැරල් මිලියන 90.4 දක්වා දිනකට බැරල් මිලියන 9.6 කින් අඩු විය.

කෝවිඩ්-19 බලපෑම නිසාවෙන් 2020 වර්ෂයේදී දී බනිජතෙල් වෙලඳපොලවල් පෙර නොවූ විරූ උච්චාවචනයන් සහිත පරිසරයකට මුහුණ දුන් අතර, එය වෙලඳපොලවල් වෙත දැවැන්ත ලෙස බලපෑමට ලක් වූ අතර ඉන් පසුව ඇති වූ ඉල්ලුම කඩාවැටීම නිසා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සැලකිය යුතු අවධානයක් හා ප්‍රතික්‍රියාවන් අවශ්‍ය විය.


ලෝක බනිජ තෙල් ඉල්ලුම




*මූලාශ්‍රය : OPEC මාසික තෙල් වෙළෙඳපොළ වාර්තාව - මාර්තු 2021*

ඔපෙක් සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, වෙළඳපොලේ පෙර නොවූ විරූ විචලතා හා කැළඹීම් අඩු කිරීමේ උත්සාහයක් ලෙස හා වෙළඳපොලවල් නැවත තුලනය කිරීමේ මාවතකට ගෙන ඒමේ අරමුණින් ඔපෙක් සාමාජික රටවල් සහ අනෙකුත් තෙල් සැපයුම් රටවල් 2020 අප්‍රේල් මාසයේ සිට වසර දෙකක කාලයක් තුළ නිෂ්පාදනය ගෝලීය සැපයුමෙන් 10% ක් පමණ එනම් දිනකට බැරල් මිලියන 9.5 සාමූහිකව කපා හැරීමට පියවර ගනිමින් සහයෝගීතා ප්‍රකාශනයක් (DoC) ඇතිකර ගත්හ.

ලෝක බනිජ තෙල් සැපයුම





*මූලාශ්‍රය : OPEC මාසික තෙල් වෙළෙඳපොළ වාර්තාව - මාර්තු 2021*

කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන්, ජාත්‍යන්තර බොරතෙල් (WTI) මිල ගණන් 2020 තුළ කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. සාමාන්‍ය වාර්ෂික WTI තෙල් මිල 2019 දී වාර්තා වූ බැරලයට ඩොලර් 56.98 ට සාපේක්ෂව බැරලයකට ඩොලර් 39.22 දක්වා පහත වැටුණි. සංස්ථාව විසින් භාවිතා කරන ලද බොර තෙල් (මර්බන්) මිල 2019 දී වාර්තා වූ බැරලයකට ඩොලර් 65.00 සිට 2020 දී බැරලයකට ඩොලර් 42.45 දක්වා අඩුවීමක් වාර්තා කරමින් 2020 දී 34.68% කින් මිල පහත වැටීමක් ඇති විය.

# දේශීය සන්දර්භය

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි, 2019 දී 2.3% ක වර්ධනයක් ලබා ඇති නමුත් 2020 වසර තුළදී ආර්ථිකය මූර්ත අගය අනුව සියයට 3.6 කින් සංකෝචනය වී ඇත. කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ අරමුණින් දේශීයව සහ ජාත්‍යන්තරව පනවන ලද අගුලු දැමීම්, සංචරන සීමා කිරීම් සහ අනෙකුත් ක්‍රියාමාර්ග නිසාවෙන් 2020 වර්ෂය තුළ ආර්ථික සංකෝචනයක් වාර්තා කරමින් සියලුම අංශවල සැබෑ ආර්ථික ක්‍රියාකාරීත්වයට බාධාවක් විය. රට අගුලු දැමීම් සහ සංචරන සීමා පැනවීම හේතුවෙන් ඉදිකිරීම් සහ නිෂ්පාදන කටයුතුවල සැලකිය යුතු මන්දගාමිත්වය හේතුවෙන් වසර තුළ කර්මාන්ත අංශයෙහි ක්‍රියාකාරකම්වල තියුණු අඩුවීමක් නිරීක්ෂණය විය. වර්ෂය තුළ යහපත් දේශගුණ හා වර්ෂාව සහිත තත්ත්වයක් පැවතියද, රටේ පැවති වසංගත තත්වය හේතුවෙන් කෘෂි අංශයේ කැපී පෙනෙන හැකිලීමක් නිරීක්ෂණය විය.

ද.දේ.නි. වර්ධනය





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශයට පත් කර ඇති පරිදි ආර්ථිකයේ සමස්ත වටිනාකම 2019 වර්ෂයේදී පැවති ඇමෙරිකානු ඩොලර් බිලියන 84.0 සිට 2020 වර්ෂයේදී දී ඩොලර් බිලියන 80.7 දක්වා සංකෝචනය වී ඇත. වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) සංකෝචනය හා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ක්ෂයවීම මගින් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පෙර වසරේ පැවති ඇමරිකානු ඩොලර් 3,852 සිට 2020 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් 3,682 දක්වා පහත වැටී ඇත.

2020 දෙවන කාර්තුවේදී අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර වසර අවසානය වන විට වසංගතට පෙර මට්ටම් දක්වා ළඟා වෙමින් වේගයෙන් යථා තත්වයට පත් විය. වසර තුළ අත්‍යවශ්‍ය නොවන ආනයන අඩු කිරීම සහ අඩුවූ ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල මගින් අපනයන අඩු වීමට වඩා වැඩි අගයකින් ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2020 වර්ෂයේදී වෙළඳ හිඟය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,989 කින් ඩොලර් මිලියන 6,008 දක්වා අඩු විය.

කොවිඩ්-19 බලපෑම් හේතුවෙන් මාර්තු සහ අප්‍රේල් මාසවල විනිමය අනුපාතිකය ඉහළ උච්චාවචනයන් වාර්තා කළ අතර වසරේ අග භාගයේදී ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතාව අඩු වීම හේතුවෙන්ද උච්චාවචනයන් වාර්තා වන ලදි. මේ හේතු නිසාවෙන් වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 2019 වර්ෂයේ රු. 178.78 ක අගය 2020 වසරේදී රු. 185.52 දක්වා පහත වැටී ඇත.


ආර්ථිකයේ වටිනාකම




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

විදේශ ණය සේවා ගෙවීම් සහ සීමිත විදේශ විනිමය ගලා ඒම මධ්‍යයේ දළ නිල සංචිත 2019 අවසානයේ වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් බිලියන 7.6 හා සැසඳීමේ දී 2020 අවසන් වන විට ඩොලර් බිලියන 5.7 දක්වා අඩු විය. 2020 ඔක්තෝම්බර් මාසයේදී ඩොලර් බිලියන 1 ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) පියවීම ඇතුළුව රජය සිය ණය සේවා වගකීම් 2020 දී පියවා ඇති බව සඳහන් කිරීම කැපී පෙනෙන කරුණකි.

උද්ධමන අනුපාතය





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

පෙර වසරේ වාර්තා වූ සියයට 4.8 සිට විරැකියා අනුපාතය 2020 දී සියයට 5.5 දක්වා වැඩි වී ඇති අතර වසංගතයේ බලපෑම සමඟ ගෘහස්ථ පරිභෝජන වියදම් අඩුවීමක් ඇතිවිය. ආර්ථික කටයුතු පවත්වාගෙන යාම සඳහා ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා රජය විසින් විවිධ ආර්ථික උත්තේජක පැකේජ ලබා දෙන ලදී.

මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවලදී කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා පැනවූ අගුලු දැමීම් සහ සංචරන සීමා කිරීම් ප්‍රවාහන අංශයෙන් වාහන ඉන්ධන සඳහා ඇති ඉල්ලුම අඩුවීමට හේතුසාධක වූ අතර වියදම් දැරීමට ඇති අඩු හැකියාව වාහන ඉන්ධන භාවිතය අඩු වීමට බලපානු ලබයි. කර්මාන්ත ක්‍රියාකාරකම්වල තියුනු අඩුවීම් හේතුවෙන් කර්මාන්ත අංශයෙහි ඉල්ලුම මෙන්ම අඩු විදුලි ඉල්ලුම හේතුවෙන් බලශක්ති උත්පාදනය සඳහා වූ ඉන්ධන ඉල්ලුමද අඩුවීමක් වාර්තා විය.

ශ්‍රී ලංකා ආර්ථිකය බොහෝ දුරට සංචාරක ව්‍යාපාරය හා බද්ධ වී ඇතත්, ශ්‍රී ලංකාව තුලට වසංගතය ඇතුළු වීම වැළැක්වීම සඳහා ජනතාවගේ ජාත්‍යන්තර සංචරනය සීමා කිරීමට ගුවන් තොටුපළ වසා දමන ලදී. මාස ගණනාවක් පුරා ගුවන් තොටුපළ මෙහෙයුම් සීමා කිරීම නිසාවෙන් දේශීය හා ජාත්‍යන්තර ගුවන් සමාගම් සඳහා වන ගුවන් ඉන්ධන අලෙවිය අවම විය. වසර අවසාන වන විටත් ගුවන් මෙහෙයුම් පූර්ණ සාමාන්‍ය තත්ත්වයට නොපැමිණි බව විශේෂයෙන් සඳහන් කල යුතුය. රජය විසින් විවිධ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ ගුවන් සේවා මෙහෙයුම් ඉක්මනින් සාමාන්‍ය තත්වයට පත් වනු ඇතැයි ශුභවාදී වන අතර ඒ තුලින් විකුණුම් වසංගතයට පෙර මට්ටමට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.




2020 වසරේ ජාත්‍යන්තර බනිජ තෙල් මිල පහත වැටීම සංස්ථාවට මෙන්ම ජාතික ආර්ථිකයට වඩා ආර්ථික වාසි ජනනය කරන වසරක් විය. කොවිඩ්-19 හේතුවෙන් ඇතිවූ අඩු ඉල්ලුමත් සමඟ වර්ෂය තුළ ජාත්‍යන්තර මිල අඩුවීම නිසාවෙන් ආනයන පිරිවැය තියුනු ලෙස පහත වැටුණි. බනිජ තෙල් ආනයන වියදම ඩොලර් බිලියන 1.55 දක්වා පහත යන ලද අතර, එය 2019 වසරට සාපේක්ෂව 45.81% (ඇමරිකානු ඩොලර් බිලියන 1.29) කින් අඩුවීමකි.

| වර්ගය | විචලනය | හේතුව |
|---|---|---|
| බොරතෙල් | -39.91% | මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල ඉන්ධන සඳහා ඇති අඩු ඉල්ලුම හේතුවෙන් පිරිපහදුවේ අඩු නිෂ්පාදන අනුපාතය සමඟ ජාත්‍යන්තර බොරතෙල් මිල අඩු කිරීම. |
| පිරිපහදු කළ නිෂ්පාදන | -48.89% | සංචරනය සීමා කිරීම්, රට අගුලු දැමීම් හේතුවෙන් පරිභෝජනය පහත වැටීම සහ ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීම. |
| **එකතුව** | **-45.81%** | |

ජාත්‍යන්තර තෙල් මිල අඩුවීමත් සමඟ පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා රජය අය කරන බදු ඉහළ දැමීම හේතුවෙන් පිරිවැය ඉහළ ගියේය. කෙසේ වෙතත්, වසර අග භාගයේදී ජාත්‍යන්තර බනිජ තෙල් මිල ඉහළ යාමට සමගාමීව සංස්ථාව වෙත සිදුවන පාඩුව අවම කිරීම සඳහා බදු සංශෝදනයන් කරන ලදී.

දෙවන කාර්තුවේදී ජාත්‍යන්තර බනිජ තෙල් නිෂ්පාදන මිල තියුනු ලෙස පහත වැටුනද, ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති නිසාවෙන් ජාත්‍යන්තර මිල අඩුකිරීම් වල ආර්ථික ප්‍රතිලාභ රටට ලබා ගැනීම සීමා විය.

## ඉදිරි දැක්ම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, කොවිඩ්-19 සඳහා එන්නත්කරනය වසර පුරා පුළුල් ලෙස ව්‍යාප්ත වේ යැයි උපකල්පනය කර ඒ අනුව 2021 වර්ෂයේදී ගෝලීය ආර්ථිකය 6% කින් ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ උවද වසංගතය පාලනය කිරීමට සහ අතිරේක ආයෝජන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් පියවර නොගන්නේ නම්, ආර්ථික වර්ධන අපේක්ෂාවන් යටපත් වනු ඇතැයි අනුමාන කෙරේ.

ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වර්ෂයේදී ශක්තිමත් ලෙස ප්‍රකෘතිමත් වේ යැයි අපේක්ෂා කරන අතර ඒ මගින් 2021 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතය 6.0% කින් වර්ධන වේගයක් වාර්තා කරනු ඇතැයි අනුමාන කෙරේ. දේශීය හා ජාත්‍යන්තර එන්නත්නරණ ක්‍රියාවලියන් සමඟ ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති මගින් ආර්ථිකය සාමාන්‍ය තත්වයට පැමිණ ඉහළ ආර්ථික වර්ධන මට්ටමට ළඟා වේ. එන්නත් කිරීමේ ක්‍රියාවලිය වසංගතය පැතිරීම මැඩපැවැත්වීමට උපකාරී වන අතර ඒ තුලින් ආර්ථික කටයුතු වසංගතට පෙර මට්ටමට පැමිණෙතැයි අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා ගුවන් තොටුපළ සාමාන්‍ය තත්වයට පත් වනු ඇති අතර ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාමෙන් ඉල්ලුම වසංගතයට පෙර මට්ටමට ළඟාවීමට මාවතක් නිර්මාණය වනු ඇත. කෙසේ වෙතත්, දියුණු සහ නැගී එන ආර්ථිකයන් යලි සක්‍රිය වීමත් සමඟ ජාත්‍යන්තර බනිජ තෙල් මිල තියුනු ලෙස වැඩි වෙමින් පවතින අතර ඒ තුලින් විනිමය පිටතට ගලායාමට නිසාවෙන් විනිමය අනුපාතිකය සහ උද්ධමනය මත ඉහළ පීඩනයක් ඇති කරයි.


# මෙහෙයුම් සමාලෝචනය


*කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා රජය විසින් පනවන ලද අගුලු දැමීම් සහ සංචරනය සීමා කිරීම් හේතුවෙන් පැනනගින ලද අභියෝග මධ්‍යයේ වුවද, සංස්ථාව 2020 වර්ෂයේදී රුපියල් බිලියන 519 ක ආදායමක් වාර්තා කල අතර ජාත්‍යන්තර බනිජ තෙල් මිල අඩු වීම සහ කෙටි හා මධ්‍යම කාලීන උපාය මාර්ග සමඟ , සංස්ථාව රු. බිලියන 55 ක දළ ලාභයක් හා රු. බිලියන 2.37 ක ශුද්ධ ලාභයක් ලබන ලදී. පිරිපහදුව විසින් බොරතෙල් මෙට්‍රික් ටොන් 1,865,441ක් පිරිපහදු කරන ලදී. රට තුල කොවිඩ්-19 ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද පාලන යාන්ත්‍රණයන් හේතුවෙන් සියලුම අංශවලින් ජනනය කරනු ලබන ආදායම් අඩු වී ඇත. ව්‍යාපාර කටයුතු වසංගතයට පෙර මට්ටමට නැවත ගෙන ඒම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයන් කඩිනමින් ක්‍රියාත්මක කර ඇත.*

**5,029**
විකුණුම්
(ලී. මිලියන )

**1,685**
බොරතෙල් යෙදුම්
(000' මෙ. ටො.)

**518.8**
ආදායම
(රු. බි.)






කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් පනවන ලද අගුලු දැමීම් සහ සංචරන සීමා කිරීම් අපගේ සියලුම ව්‍යාපාරික අංශවලට අහිතනර ලෙස බලපෑම් එල්ල කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර සඳහා උපයා ඇති සමස්ත ආදායම 2019 වසරට සාපේක්ෂව 19.75% කින් අඩු විය. දෙවන කාර්තුවේදී ආදායම තියුනු ලෙස පහත වැටුණද, තුන්වන කාර්තුවේ දී එය නැවත කිසියම් ප්‍රමාණයකට යථා තත්ත්වයට පත් විය. කොවිඩ්-19 හි දෙවන රැල්ල අවසාන කාර්තුවේදී බලපෑමක් එල්ල කලද, සංස්ථාව විසින් ගන්නා ලද ක්‍රියාශීලී පියවරයන් සමඟින් යම් දුරකට ආදායම් උත්පාදනය පවත්වා ගැනීමට හැකිවීමෙන් අපගේ ලාභදායිතාවයට සිදු වීමට තිබූ අහිතකර බලපෑම් අවම කර ගැනීමට හැකිවිය.


ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල අඩු වීම සංස්ථාවේ ලාභදයීතාවයට හිතකර ලෙස බලපෑ අතර 2020 වර්ෂය සඳහා රු. බිලියන 2.37 ක ලාභයක් වාර්තා කරන ලදි. අපනයන සහ කෘෂි රසායන අංශ හැර අනෙකුත් සියලුම අංශ සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් අඩුවීමක් වාර්තා කර ඇත. වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් ගුවන් තොටුපළ වසා දැමීම නිසා ගුවන් සේවා අංශයේ කැපී පෙනෙන ආදායම් අඩුවීමක් වාර්තා විය.

| වර්ගය | ආදායම - 2020 රු. මි. | ආදායම - 2019 රු. මි. |
|---|---:|---:|
| ප්‍රවාහන අංශය | 377,536 | 430,425 |
| බලශක්ති උත්පාදන | 81,147 | 118,675 |
| ගුවන්තෙල් අංශය | 19,486 | 58,990 |
| කර්මාන්ත | 11,308 | 13,497 |
| ගෘහස්ත අංශය | 17,563 | 20,211 |
| කෘෂි රසායන | 570 | 457 |
| අපනයන | 11,261 | 4,336 |
| **එකතුව** | **518,871** | **646,591** |

## ප්‍රවාහන අංශය

කොවිඩ්-19 වසංගතයේ බලපෑම සෑම අංශයකම මෙහෙයුම් කටයුතු සඳහා බලපාන ලද බැවින් 2020 අභියෝගාත්මක වසරක් වුවද, ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල පහත වැටීම හේතුවෙන් වර්ෂය තුළ සංස්ථාවේ ලාභදායිතාවය සැලකිය යුතු ලෙස වර්ධනය විය. මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවලදී පනවන ලද සංචරන සීමා නිසාවෙන් මෙම අංශයේ විකුණුම් ප්‍රමාණය අඩු විය. වසංගතය පාලනය කිරීමත් සමඟ තුන්වන කාර්තුවේදී විකුණුම් ප්‍රමාණය යළිත් ඉහළ යන ලදි. සියලු අභියෝග මධ්‍යයේ වුවද, අඛණ්ඩව ඛනිජ තෙල් සැපයුම තහවුරු කිරීමෙන් සංස්ථාව 2020 වර්ෂයේදී සිය වෙළඳපල කොටස සුරක්ෂිත කරගන්නා ලදි.

රු./ලී. **දේශීය විකුණුම් මිල**





රජයේ විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තියට අනුව, මෙම වර්ෂය තුළ මෝටර් රථ සඳහා භාවිතා කරනු ලබන ඉන්ධන (පෙට්‍රල් 92, පෙට්‍රල් 95, ඔටෝ ඩීසල් සහ සුපර් ඩීසල්) විකුණුම් මිල නොවෙනස්ව පැවතිණි. සමස්ථ ආදායමට වැඩිම දායකත්වය ලෙස රු. බිලියන 377.5 ක් (2019 දී රු. බිලියන 430.4) මෙම අංශයෙන් ලබාදෙන අතර, කොවිඩ්-19 බලපෑමත් සමඟ 2020 වර්ෂයේ ආදායම පෙර වසරට සාපේක්ෂව 12.29% ක පහත වැටීමක් වාර්තා විය. මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවලදී රට අගුලු දැමීම සහ කොවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා සංචරන සීමා කිරීම විකුණුම් සහ ආදායම අඩු වීමට ප්‍රධාන

| විකුණුම් ප්‍රමාණයෙහි අඩුවීම | |
|---|---|
| පෙට්‍රල් 92 | 10.74% ▼ |
| පෙට්‍රල් 95 | 21.83% ▼ |
| ඔටෝ ඩීසල් | 14.80% ▼ |
| සුපර් ඩීසල් | 18.55% ▼ |
| ප්‍රවාහන අංශය | 13.57% ▼ |

රටේ ප්‍රවාහනය ප්‍රධාන වශයෙන් ඔටෝ ඩීසල් මගින් සිදුවන බැවින් එය සමස්ථ ආර්ථිකය තුල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර එබැවින් ඔටෝ ඩීසල් මිල ගණන් රටේ සමස්ථ මිල මට්ටම හා ඉතා සංවේදී වේ. රට අගුලු දැමීම් සහ සංචරන සීමා පැනවීම හේතුවෙන් පොදු ප්‍රවාහනය, පාසල් ප්‍රවාහනය, සංචාරක ප්‍රවාහනය යනාදිය සඳහා ඇති ඉල්ලුම පහත වැටීම නිසාවෙන් ඔටෝ ඩීසල් විකිණීම මගින් උපයාගත් ආදායම 2019 වසරට සාපේක්ෂව 14.39% ක පහත වැටීමක් වාර්තා කළේය.


**ආදායම් මිශ්‍රණය - වාහන ඉන්ධන**





තිරසාර පරිභෝජන රටාවක් සහ පරිසර සංරක්ෂණය සහතික කිරීම සඳහා පරිසර හිතකාමී යූරෝ 4 පෙට්‍රල් සහ යූරෝ 4 ඩීසල් ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. මෙම නිෂ්පාදන ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම සඳහා උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කරන ලදි. අනෙකුත් ඉන්ධන වෙනුවට පරිසර හිතකාමී යූරෝ 4 පෙට්‍රල් සහ යූරෝ 4 ඩීසල් භාවිතය දිරිමත් කිරීමට හා ප්‍රචලිත කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම සිදුකෙරිණි.

ඉහත දිරිගැන්වීම් තිබියදීත්, කොවිඩ්-19 පාලනය කිරීම සඳහා පනවන ලද සංචරන සීමා කිරීම් සහ අගුලු දැමීම් නිසාවෙන් වර්ෂය තුළ යූරෝ 4 පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය ඉහළ අගයකින් පහත යන ලදි.

**ප්‍රවාහන අංශයේ ඉල්ලුම හැසිරීම**






ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල පහත වැටීමෙන් මෙම අංශයෙන් ජනනය වන ලද අලාභය 2019 වර්ෂයේ පැවති රු. බිලියන 25.9 සිට රු. බිලියන 3.5 දක්වා වසර තුළ අඩු වන ලදි. කොවිඩ්-19 හේතුවෙන් මුහුණ දෙනලද අභියෝග සහ ඇතැම් නිෂ්පාදනවලින් ජනනය වූ අලාභ නොතකා, වෙළෙඳපොළ ප්‍රමුඛයා ලෙස හා රටේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීමේ වගකීම ඉෂ්ඨ කිරීම වෙනුවෙන්, අපි ජාතියට අඛණ්ඩ ඉන්ධන සැපයීමක් තහවුරු කළෙමු.

මෙම වසර තුළ අපගේ ඛනිජ තෙල් නිෂ්පාදන රට පුරා බෙදා හැරීමට සඳහා රු. බිලියන 2.96 ක ප්‍රවාහන වියදමක් දරණ ලදි.

ඉන්ධන පිරවුම්හල් 1322කින් සමන්විත අපගේ දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය මගින් වසර තුළ අඛණ්ඩව රට පුරා ඉන්ධන සැපයීම සහතික කරන ලදි. මහජනතාවට ඛනිජ තෙල් නිෂ්පාදන වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට ඇති හැකියාව වර්ධනය කිරීමට දැනට පවතින බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා වසර තුළ නව පිරවුම්හල් 25 ක් ආරම්භ කරන ලදී. 2019 සහ 2020 වසර තුළ අවසර ලබාදෙන ලද නව ඉදිකිරීම් තවදුරටත් අවසන් කිරීමට නියමිතව ඇති අතර, ඒවා ආරම්භ කළ පසු, මෙම ඉන්ධන පිරවුම්හල් ස්ථාන වඩා හොඳ පහසුකම්වලින් සමන්විත වනු ඇත.

කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ විකුණුම් ප්‍රමාණයෙහි අඩුවීම අපගේ ඉන්ධන පිරවුම්හල්වල වාණිජ තිරසාරභාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන ලදි. කොවිඩ්-19 වසංගතය අතරතුර ඉන්ධන පිරවුම්හල්වල ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු මෙන්ම ජීවනෝපායන් ආරක්ෂා කර ගැනීමට සහ පවත්වාගෙන යාමට විවිධ පහසුකම් සංස්ථාව විසින් සපයා ඇත.

**"ඔබේ වාහනයට ඉන්ධන ලබාදීම තහවුරු කිරීම සඳහා අපගේ බවුසර් රථ ධාවකයන් පිරවුම්හල් වෙත ක්ෂණිකයෙන් ළඟා වේ.."**




මනා පරිසරයක් සහ සේවා සැපයුම වැඩිදියුණු කිරීමේ අරමුණින් සංස්ථාව සතු පිරවුම්හල් (CODO) ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. අදාල ප්‍රතිසංස්කරණය අවසන් වීමෙන් පසු, මෙම පිරවුම්හල් තාක්ෂණික හා පරිසර හිතකාමී පිරවුම්හල් වලින් සමන්විත වේ.


සංස්ථාව විසින් CPSTL ආයතනයේ බෙදාහැරීමේ (බවුසර් රථ) ඇණිය හරහා සහ බෙදාහරින්නන් සතු බවුසර් රථ ඇණිය හරහා දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් වෙත ඉන්ධන බෙදා හරිනු ලැබේ. රට පුරා සෑම විටම ජනතාවට ඛනිජ තෙල් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම සඳහා මෙම බවුසර් රථ ධාවකයන් විශාල කාර්යභාරයක් ඉටු කරයි.

විකුණුම් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් බෙදුම්කරුවන් හට අඩු කොමිස් ආදායමක් ලැබීම නිසා මුහුණ දීමට සිදුවන මූල්‍ය බර අවම කිරීමට සංස්ථාව විසින් විවිධ ණය පහසුකම් ලබා දෙන ලදි. කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා වීමට සහ සාමාන්‍ය ජනතාවට අඛණ්ඩව ආරක්ෂිතව ඉන්ධන සැපයුම තහවුරු කිරීමට ඉන්ධන පිරවුම්හල්වල සෞඛ්‍ය සහ ආරක්ෂිත පරිසරය පවත්වාගෙන යාමට අඛණ්ඩ උපදෙස් සහ මාර්ගෝපදේශ ලබා දෙන ලදී.


## බලශක්ති උත්පාදන

සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ විදුලි අවශ්‍යතාව උත්පාදනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (IPPs) වෙත ඔවුන්ගේ තාප බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා ඔටෝ ඩීසල්, දැවි තෙල් සහ නැප්තා සපයනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2020 වසර තුළ ඉන්ධන භාවිතය මගින් විදුලි ජනනය 5016 GWh සිට 4182 GWh දක්වා 16.6% කින් පහත වැටී ඇත. සමස්ත විදුලි ඉල්ලුම අඩු වීම සහ විදුලි ජනන මිශ්‍රණය ඉන්ධන වලින් ජල විදුලි හා ගල් අඟුරු වෙත මාරු වෙමින් ඉන්ධන සඳහා ඉල්ලුම අඩුවීමක් පෙන්නුම් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම සහ IPPs විසින් ඉන්ධන සඳහා ඉල්ලුම 2020 වර්ෂයේදී 31.5% සිට 26.6% දක්වා පහත වැටී ඇත.




සංස්ථාවේ සමස්ථ ආදායමට දෙවන වැඩිම දායකත්වය ලෙස රු. බිලියන 81.1 (2019-රු. බිලියන 118.6) මෙම අංශයෙන් ලබාදෙන ලද අතර බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන ඉල්ලුමේ සංයුතිය දැවි තෙල්වලින් 75.81% ක් සහ ඔටෝ ඩීසල්වලින් 24.19% ක් වන අතර වසර තුළදී ලංවිම විසින් නැප්තා මිලදී ගෙන නොමැත.




කොවිඩ්-19 බලපෑමට ලක්වීම නිසාවෙන් රටේ කර්මාන්ත ක්‍රියාත්මක වීම අඩු වීමෙන් විදුලිය සඳහා ඉල්ලුම අඩු වූ අතර ඒ තුළින් විදුලිය උත්පාදනය සඳහා ඉන්ධන ඉල්ලුම පෙර වසරට සාපේක්ෂව 23.07% කින් අඩුවීමෙන් මෙම අංශයෙන් උපයන ආදායම 31.62% කින් පහත වැටුණි.

කොවිඩ්-19 බලපෑම හේතුවෙන් අනපේක්ෂිතව ජාත්‍යන්තර බනිජ තෙල් මිල අඩුවීම් සැලකිල්ලට ගනිමින්, දැවි තෙල් (වැඩි සල්ෆර්), දැවි තෙල් (අඩු සල්ෆර්) සහ දැවි තෙල් සුපර් මිල ලීටරයක් රු. 96.00 සිට ලීටරයක් රු. 70.00 දක්වා ලීටරයට රු. 26.00 කින් මාර්තු මාසයේ සිට අඩුකරන ලදි. 2020 වසර අවසානයේදී ජාත්‍යන්තර බනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියද, ඉහත අඩු කරන ලද දේශීය මිල ගණන් නොවෙනස්ව පැවතුණි.

බලශක්ති අංශයේ ඉන්ධන ඉල්ලුම සතිපතා තොග සමාලෝචන කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලබන අතර සම්පූර්ණ ඉල්ලුම සපුරාලීම සඳහා උපාය මාර්ග සකස් කර ඇති බවට වග බලා ගනී. රටට අඛණ්ඩව බලශක්තිය සහ විදුලිය සැපයීමේ සමස්ත ඉලක්කය සපුරා ගැනීම සඳහා ලංවිම සහ IPPs සමඟ සුහද සබඳතාවයක් පවත්වාගෙන යනු ලැබේ.


ලංකා විදුලිබල මණ්ඩලය සහ IPPs විසින් දූර්වල පියවීම් රටාවක් පැවතීම තුළින් විශාල ණයගැති ශේෂයක් පැවතියද රටේ ආර්ථික වර්ධනය සඳහා ජාතික විදුලි අවශ්‍යතා කෙරෙහි දැඩි සැලකිල්ලක් දක්වන බැවින්, සංස්ථාව විසින් කිසිදු බාධාවකින් තොරව විදුලිය නිෂ්පාදනය සඳහා වර්ෂය පුරා අඛණ්ඩව ඉන්ධන සැපයීම තහවුරු කරන ලදි.

# ගුවන්තෙල් අංශය


මෙරට ගුවන් යානා ඉන්ධන සපයනු ලබන එකම සැපයුම්කරු ලෙස ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව කටුනායක, මත්තල, රත්මලාන සහ යාපනය ගුවන් තොටුපළ හරහා ගුවන් යානා ඉන්ධන සපයනු ලැබේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් පුහුණු පාසල් යනාදී අනෙකුත් ගුවන් යානා ඉන්ධන පාරිභෝගිකයන් සඳහා වන ඉන්ධන අවශ්‍යතාවය ඉල්ලුම මත සපයනු ලබයි. සියලුම දේශීය සහ ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා ගුවන් යානා ඉන්ධන සැපයීම ජාත්‍යන්තර ප්‍රවාහනය සඳහා අතිශයින් වැදගත් වන බැවින් මෙම අංශය කෙරෙහි උපායමාර්ගිකව අවධානය යොමු කරනු ලැබේ.

කොවිඩ්-19 වෛරසය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා රජය විසින් ගුවන් තොටුපළ මෙහෙයුම් සඳහා සීමාවන් පැනවූ බැවින් 2020 වසරේ සංස්ථාවේ වඩාත්ම බලපෑමට ලක්වූ අංශය මෙම ගුවන්තෙල් අංශය වේ. පනවන ලද සීමාවන් 2020 මාර්තු සිට දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක වුවද වසරේ අග භාගයේදී රජය විසින් සීමාවන් ලිහිල් කරන ලදි. ගුවන් ගමන්වල සීමිත ක්‍රියාකාරිත්වය හේතුවෙන් විකුණුම් ආදායම තියුනු ලෙස පහත වැටුණි.

ගුවන් යානා ඉන්ධන අංශයෙන් ඇතිවිය හැකි අලාභය නොතකා, ජාත්‍යන්තර ගුවන් සමාගම් ශ්‍රී ලංකාවට පියාසර කිරීම දිරිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ගුවන් සේවා සහ අනුබද්ධ සේවාවන් සඳහා සහන සැලසීමේ රජයේ ප්‍රතිපත්තිවලට සමගාමීව සංස්ථාව විසින් ගුවන් යානා ඉන්ධන මිල අඩු කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.




ගුවන් යානා ඉන්ධන සඳහා ඇති ඉල්ලුම 60.15% කින් තියුනු ලෙස පහත වැටීම හේතුවෙන් මෙම අංශයේ ආදායම 2019 වර්ෂයේ පැවති රුපියල් බිලියන 58.9 සිට රු. බිලියන 19.4 දක්වා සමාලෝචිත වර්ෂය තුළ 66.97% ක තියුණු පහත වැටීමක් වාර්තා කරන ලදි. ජාත්‍යන්තර ගමනාගමනය මගින් කොවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා ගුවන් තොටුපළ වසා දැමීම හේතුවෙන් ආදායම සීඝ්‍ර ලෙස අඩු වුවද, සංස්ථාවේ මෙම අංශයේ මෙහෙයුම් අලාභය රු. මිලියන 1,224 සිට රුපියල් මිලියන 109 දක්වා අඩුවී ඇත.




ආරක්ෂාව මූලික අවධානයට ලක්වන බැවින් ගුවන් මෙහෙයුම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට අපි කැපවී සිටිමු. තත්ව සහතික අවශ්‍යතා සපුරාලන බවට සහතික වීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායම (JIG) විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලදැයි පරීක්ෂා කිරීම සඳහා වාර්ෂික විගණන සිදු කරන ලදී. අපගේ ගුවන් සේවා මෙහෙයුම්වල මෙහෙයුම් විශිෂ්ටත්වය පෙන්නුම් කරමින් 'හොඳ' (සාමාන්‍යයට වඩා වැඩි) තත්වය අත්කර ගැනීමට සංස්ථාව සමත් වූ බව ප්‍රශංසනීය ලෙස සඳහන් කළ හැක.

ඉහත ජයග්‍රහණයන් සඳහා එක් එක් සේවක මට්ටමින් අඛණ්ඩ පුහුණුවීම් සපයනු ලබන අතර මෙහෙයුම් විශිෂ්ටත්වය කරා ළඟාවීම සඳහා තාක්ෂණික දියුණුව සඳහා ආයෝජනය කිරීමට උපාය මාර්ගික ප්‍රමුඛතා ලබා දී ඇත.

# ඉදිරි දැක්ම

- සංස්ථාව විසින් 2018 ජනවාරි මාසයේ දී ගුවන් තොටුපළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ නව හයිඩ්‍රන්ට් පද්ධතිය සහ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වුවද, එය 2020 අවසානය වන විට භෞතික ප්‍රගතියෙන් 60%ක් ළඟා කර ගෙන ඇත.

- අවම මුදලකට ගුවන් යානා ඉන්ධන ලබාදීම සඳහා ජෙට් ඒ-1 ඉන්ධන ගබඩා පහසුකම් ඇතිකිරීම සහ මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ දක්වා නළ මාර්ගය ඉදිකිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.


මෙම ව්‍යාපෘති මගින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කෙරෙන අතර මෙහෙයුම් පිරිවැය අඩු කිරීමටත්, ඒ අනුව ජෙට් ඒ-1 ඉන්ධන මිල තවදුරටත් අඩු කිරීමටත් හැකි වනු ඇත.

ගුවන් යානා ඉන්ධන ඉල්ලුම සපුරාලීම සඳහා අලුතින් සංවර්ධනය වෙමින් පවතින යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සංස්ථාව ආයෝජනය කරන ලදි. ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන කටයුතු 2019 වසරේ ආරම්භ විය.

# කර්මාන්ත

මෙම අංශය කාර්මික භූමිතෙල්, කර්මාන්ත සඳහා දැවි තෙල්, ලිහිසි තෙල්, තාර සහ සොල්වන්ට් (SBP) වලින් උපයන ආදායමෙන් සමන්විත වේ. මෙම අංශයේ ඉල්ලුම් ප්‍රමාණය 15.47% කින් පහත වැටී ඇති අතර උපයාගත් ආදායම රු. බිලියන 13.4 සිට රු. බිලියන 11.3 දක්වා පෙර වසරට සාපේක්ෂව 16.22 % කින් අඩු වී ඇත. මාර්තු සහ අප්‍රේල් මාසවල රට අගුලු දැමීමේ බලපෑම සහ කොවිඩ්-19 වසංගතය මැඩපැවැත්වීම සඳහා වෙනත් සංවරන සීමා කිරීම් හේතුවෙන් ඉහත පරිදි ආදායම් අඩුවී ඇත.

ආදායම




වසර තුළ බොහෝ කර්මාන්තශාලා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආදායම පෙර වසරට සාපේක්ෂව 15.31% ක පහත වැටීමක් වාර්තා වුවද දැවි තෙල් මගින් රු. බිලියන 8.3 ක ආදායමක් අංශය තුල ප්‍රධාන දායකයා ලෙස ලබා දෙන ලදි. කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා පනවා ඇති සීමාවන් ලිහිල් කිරීමත් සමඟ 2020 වසර දෙවන භාගයේදී දැවි තෙල් සඳහා ඇති ඉල්ලුම යළිත් ඉහළ යන ලදි.


ආර්ථිකය සාමාන්‍ය තත්වයට පත් වූ පසු අනාගතයේදී දැවි තෙල් සඳහා ඇති ඉල්ලුම යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපි ඉතා ශුභවාදී වෙමු.

**විකුණුම් ප්‍රමාණයෙහි අඩුවීම**

| | |
|---|---|
| දැවි තෙල් - සුපර් | 13.77% |
| දැවි තෙල් - 1500 | 19.92% |

රට අගුලු දැමීම් සහ සංවරනය සීමා 2020 වර්ෂයේදී දී සිදු වෙමින් පවතින මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති මන්දගාමී වීමට හේතු වූ අතර ඒ මගින් සංස්ථාවේ තාර විකුණුම් ප්‍රමාණය 8.48% කින් අඩුවීමක් වාර්තා කළේය. වෙළඳපල කොටස නැවත අත්පත් කර ගැනීමට සහ පවත්වා ගැනීමට මිල අඩු කිරීමේ උපාය මාර්ගය අනුගමනය කරමින් ජාත්‍යන්තර මිල ගණන්වලට සමගාමීව විකුණුම් මිල අඩු කළ අතර ඒ තුලින් වෙළඳපොලේ අඩුම විකුණුම් මිල පවත්වා ගැනීමට හැකි විය.

තාර විකුණුම් මිල




තාර සඳහා ඉල්ලුම අඩුවීම හා මිල අඩුවීමත් සමඟ 2019 වසරට සාපේක්ෂව 20.08% කින් ආදායම් අඩුවීමක් වුවද, අපගේ උපාය මාර්ග මගින් වෙළඳපල කොටස පවත්වා ගැනීමට හැකි විය. තාර මිල අඩු කිරීම් හේතුවෙන් අලවියෙන් ලද ලාභය රු. මිලියන 129 සිට රු. මිලියන 43 දක්වා වසර තුළ පහත වැටී ඇත.

රජයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා සංස්ථාව විසින් ඉහළම තත්වයේ ද්‍රව තාර සහ තාර බැරල් සපයනු ලබයි. ආනයනය කරන ලද තාර බැරල් මුතුරාජවෙල තාර අංගනය හරහා නිකුත් කරනු ලැබේ.

යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ රජයේ අරමුණු වෙනුවෙන් දායක වීමට සංවර්ධන ව්‍යාපෘති සඳහා සාධාරණ මිලකට ගුණාත්මක ද්‍රව තාර සැපයීමේ අදහසින් සංස්ථාව විසින් 2018 මැද භාගයේදී දැවි තෙල් භාවිතයෙන් පිරිපහදුව හරහා ද්‍රව තාර නිෂ්පාදනය කිරීම ආරම්භ කළේය.


කුඩා පාරිභෝගිකයින්ගේ තාර ඉල්ලුමද සැපයීමේ අරමුණින් අතිරික්ත නිෂ්පාදනය බැරල් වෙත පිරවීම සඳහා තාර බැරල් පිරවුම් කම්හලක් ස්ථාපනය කිරීමට අපි කටයුතු කරමින් සිටිමු.

ලිහිසි තෙල් ව්‍යාපාරය අපගේ කර්මාන්ත අංශයේ පවතින ඉතා තරඟකාරී ව්‍යාපාරයක් වේ.

අපගේ සියලුම ලිහිසි තෙල් ISO 9001/2000 සහතිකය සහිත ලිහිසි තෙල් නිෂ්පාදනාගාරයක් මගින් නිෂ්පාදනය කර ඇත. එමෙන්ම අපගේ සියලු ලිහිසි තෙල් වර්ග සිපෙට්කෝ (Ceypetco) සන්නාමය යටතේ කාර්මික සහ මෝටර් රථ යෙදුම් යන දෙඅංශය සඳහාම ආවරණය වන පරිදි ලිහිසි තෙල් සපයනු ලබන අතර ඒවා ඇමරිකන් පෙට්‍රෝලියම් ආයතනය (API), MTU Friedrichshafen SmbH සහ යුරෝපීය මෝටර් රථ නිෂ්පාදකයින්ගේ සංගමය (ACEA) වැනි අදාළ ජාත්‍යන්තරව පිලිගත් පිරිවිතරයන් සපුරා ඇත.

ඛණිජ තෙල් පිරිපහදු කිරීම, උසස් තත්ත්වයේ නිෂ්පාදන අලෙවිය සහ අලෙවිකරණයේ විශිෂ්ටත්වය අත්කර ගැනීමට සහ කැපවූ වෘත්තිකයන් කණ්ඩායමක් සහ විශ්වාසවන්ත සහ කාර්යක්ෂම අලෙවි නියෝජිත ජාලයක් හරහා පාරිභෝගිකයින් අභිබවා යන සම්පූර්ණ විසඳුම් සහ සේවාවන් සැපයීම තුළින් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා අපි අපගේ උපායමාර්ග ක්‍රියාවට නංවා ඇත.

කොවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා රජය විසින් පනවා ඇති සංචරන සීමාවන් හේතුවෙන් ලිහිසි තෙල් සඳහා සමස්ත වෙළඳපල ඉල්ලුම පහත වැටුණි. කෙසේ වෙතත්, අපගේ උපාය මාර්ග නිසි පරිදි ක්‍රියාවට නැංවීම නිසාවෙන් විකුණුම් ප්‍රමාණය 2019 වර්ෂයට ට සාපේක්ෂව 0.26% කින් ආන්තික ලෙස වැඩි කිරීමට සංස්ථාවට හැකි විය.




විකුණුම් ප්‍රමාණය ආන්තික වැඩිවීමක් වාර්තා කලද, විකුණුම් මිල අඩුකිරීම හේතුවෙන් ආදායම 10.06% කින් පහත වැටීමක් වාර්තා කළේය.

සැපයුම් දාමයේ අවිනිශ්චිතතාවයන් අවම කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ලිහිසි තෙල් නිෂ්පාදනාගාරය 2019 දී සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. ලිහිසි තෙල් නිෂ්පාදනාගාරය හරහා නිෂ්පාදන වෙළඳපොළට බෙදා හරින ලද අතර නිෂ්පාදනාගාරය මගින් ජනනය වන ලද ප්‍රතිලාභ ප්‍රධාන වශයෙන් අවසාන පාරිභෝගිකයින් වෙත විතැන් කරන ලදී.




ලිහිසි තෙල් නිෂ්පාදනාගාරය හරහා අපේක්ෂිත ප්‍රතිලාභ අවසාන පාරිභෝගිකයින් වෙත ලබා දීමෙන් වෙළඳපල කොටස නැවත ගොඩනැගීම සඳහා අගෝස්තු මාසයේදී ලිහිසි තෙල් විකුණුම් මිල තියුනු ලෙස පහත දමන ලදි. ඉහත මිලකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම මගින් විකුණුම් ප්‍රමාණය ඉහළ නැංවීමටත් ඒ සමඟම වෙළඳපල කොටස නැවත අත්පත් කර ගැනීමටත් හැකි විය.

සැපයුම්කරු විසින් සපයනු ලබන පිරිවැය වාසිය සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා වෙනත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන් ලිහිසි තෙල් අංශයෙන් ලද ලාභදායිතාවය රු. මිලියන 123 සිට රු.මි.199 දක්වා වර්ෂය තුලදී වර්ධනය විය.


කොවිඩ්-19 හේතුවෙන් කාර්මික මෙහෙයුම් අඩුවීම නිසාවෙන් කාර්මික භූමිතෙල් සහ SBP හි විකුණුම් ප්‍රමාණය අඩු වීමට හේතු විය. කාර්මික භූමිතෙල් සහ SBP වෙතින් වර්ෂය තුළදී පිළිවෙලින් රු. මිලියන 267 ක හා රුපියල් මිලියන 244 ක ආදායමක් උපයා ඇත.

# ගෘහස්ත අංශය

ගෘහස්ත අංශය භූමිතෙල් සහ ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) යන නිෂ්පාදන වලින් සමන්විත වේ. භූමිතෙල් අඛණ්ඩව ඉහළ සහනදායි මිලකට අලෙවි කිරීම නිසා මෙම අංශය දිගින් දිගටම පාඩු ලබන ලදි. මෙම අංශයේ 2020 වසර තුල වාර්තා කරන ලද අලාභය රු. බිලියන 2.1 කි.

රජය විසින් තීරණය කරන ලද ලීටරයකට රු. 70/- බැගින් වූ ඉහළ සහනාධාරයක් යටතේ අඩු ආදායම්ලාභී පවුල් සහ ධීවර ප්‍රජාවට සහන සැලසීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භූමිතෙල් සපයනු ලබයි. භූමිතෙල්වලින් රු. බිලියන 2.1 ක් සංස්ථාවට පාඩුවක් සිදු වුවද, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සමාජ යහපැවැත්ම සහ තිරසාර පරිභෝජනය සඳහා වන දායකත්වය මෙම සහනාධාරය තුලින් ලබාදෙන බව අපි විශ්වාස කරමු.

භූමිතෙල් අලාභය





වසර තුළ අත්විඳින ලද කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් විකුණුම් ආදායම 13.84% කින් පහත වැටී ඇත. ඩීසල් සහ භූමිතෙල් අතර පවතින මිල පරතරය නිසා බස් රථ, ලොරි වැනි සමහරක් බර ප්‍රවාහනය කරන්නන් භූමිතෙල් සහනාධාරය අවභාවිත කරයි. මෙම ඇතැම් බර ප්‍රවාහනය කරන්නන් විසින් කරනු ලබන භූමිතෙල් මිශ්‍ර කිරීම පාලනය කිරීමට දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇත. භූමිතෙල් සහනාධාරය අනපේක්ෂිත පාර්ශ්ව වෙත කාන්දු වීම අවම කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමේ අවධානය ද යොමු කර ඇත. මෙම ක්‍රියාවන් සංස්ථාවේ භූමිතෙල් මගින් ඇති වන අලාභ අවම කර ගැනීමට උපකාරී වේ.

LPG විකුණුම් ආදායම වර්ෂය තුළ රු. මිලියන 2,613 සිට රු. මිලියන 2,400 දක්වා 8.13% ක අඩුවීමක් වාර්තා කර ඇත. පිරිපහදු පිරිවැය සහ විනිමය අනුපාත ක්ෂයවීම් හේතුවෙන් ලාභය ද රු. මිලියන 207 රු. මිලියන 9 දක්වා 2020 වර්ෂයේදී අඩු වී ඇත.

# අපනයන

සෘජු අපනයන අංශයෙන් රු. බිලියන 11.3 ක ආදායමක් වර්ෂය තුළ වාර්තා කළ අතර එය පෙර වර්ෂයේදී රු. බිලියන 3.4 කි. වර්ෂය තුළ නැප්තා සඳහා විදුලිබල අංශයෙන් ඉල්ලුමක් නොතිබූ බැවින් සහ ගබඩා ධාරිතාව සීමිත බැවින් නැප්තා අපනයනය කිරීමට සිදුවිය.

අපනයන





පිරිපහදු නිෂ්පාදන ක්‍රියාවලිය දිගටම කරගෙන යාම සඳහා පිරිපහදු නිෂ්පාදන ගබඩා කිරීමට ගබඩා ධාරිතාව සීමිත වූ බැවින් නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් පවා නැප්තා අපනයනය කිරීමට සිදුවිය. අපනයන විකුණුම් ආදායම් ඇමෙරිකානු ඩොලර් මගින් උත්පාදනය වුවද, මෙම අංශයෙන් ජනනය වන ලද අලාභය 2019 වර්ෂයේදී වූ බිලියන 1.8 සිට 2020 වර්ෂයේදී රු. බිලියන 4.5 දක්වා වර්ධනය විය.

# කෘෂි රසායන

පෞද්ගලික සැපයුම්කරුවන්ගේ සූරාකෑමෙන් ගොවීන් ආරක්ෂා කිරීම සහ සාධාරණ මිලකට ගුණාත්මක කෘෂි රසායන නිෂ්පාදන සැපයීම සඳහා මිල පාලන පාර්ශවයක් ලෙස ක්‍රියා කිරීමේ අරමුණින් සංස්ථාව කෘෂි රසායන වෙළඳපොල තුල ක්‍රියාත්මක වේ.

කොවිඩ්-19 පැතිරීම හා අදාල පාලනයන් අනෙකුත් අංශවලට බලපෑම් එල්ල කලද, කෘෂිකර්මාන්තය සුමටව ක්‍රියාත්මක වීමට රජය ඉඩ සලසා දෙන ලදි.

කෘෂිරසායන නිෂ්පාදන හරහා උපයන ලද විකුණුම් ආදායම 2019 දී රු. මිලියන 456 වූ අතර එය රු. මිලියන 570 දක්වා 24.78% කින් 2020 වර්ෂයේදී වර්ධනය විය.




සමාලෝචිත වර්ෂය තුළ කෘෂි රසායන අලෙවිය 15.40% කින් වැඩි වූ අතර සංස්ථාව විසින් ලීටර් මිලියන 0.517 ක අලෙවියක් සිදුකර ඇත.

නව කෘෂිරසායන ද්‍රව්‍ය (කෘමිනාශක) දෙකක් වෙළෙඳපොළට හඳුන්වාදීමත් සහ ග්ලයිෆොසේට් අලෙවිය නිසාවෙන් විකුණුම් ආදායම 24.78% කින් ඉහළ ගියේය.

කෘෂිරසායන  අංශයේ ලාභය රු. මිලියන 106 සිට රු. මිලියන 171 දක්වා කැපී පෙනෙන වැඩිවීමක් වාර්තා කරන ලද අතර ග්ලයිෆොසේට් අලෙවිය සහ නව නිෂ්පාදන දෙකක් හඳුන්වාදීම මෙම ජයග්‍රහණය සඳහා බෙහෙවින් දායක විය.

සංස්ථාව ශ්‍රී ලංකාව තුළ ග්ලයිෆොසේට් ආනයනය කර බෙදා හැරීම සඳහා අනුමත එකම පාර්ශවය වන අතර සියලුම රෙගුලාසිවලට අනුකූලව තේ සහ රබර් වතුකරයේ පාරිභෝගිකයින්ට සැපයීම සංස්ථාව විසින් සිදු කරනු ලබයි. නිෂ්පාදිත අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ හානිකර භාවිතයන් අවම කිරීම සඳහා නියාමන බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදිමින් ග්ලයිෆොසේට් සැපයුම සිදු කරනු ලැබේ.

කෘෂි රසායන ස්වාභාවිකවම අවදානමට නිරාවරණය වන බැවින් නිෂ්පාදනවල ගුණාත්මකභාවය මෙන්ම සෞඛ්‍ය සහ ආරක්ෂිත පරිසරය සහතික කිරීම සඳහා සම්මත ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට අපි කැපවී සිටිමු. ISO 9001-2015, ISO 14001-2015 සඳහා මෙන්ම OHSHAS 18001—2007 සඳහා ISO කාර්ය සාධන සමාලෝචන පවත්වන ලදී.

### වසර 2020 තුලදී අප කළ දේ

- නව කෘෂි රසායන (කෘමිනාශක) දෙකක් වෙළෙඳපොළට හඳුන්වාදීම.
- කෘෂි රසායන බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීමට සහ ඉහළ විභව ප්‍රදේශ කරා ළඟා වීමට දැනට පවතින බෙදාහැරීමේ ජාලයට නව අලෙවි නියෝජිතයන් එකතු කරන ලදී.

### ඉදිරි දැක්ම

මුතුරාජවෙල ප්‍රදේශයේ සියලුම පහසුකම්වලින් සහ නවීන තාක්ෂණයෙන් යුත් කෘෂි රසායන කම්හලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එමෙන්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා නවීන තාක්ෂණයෙන් යුත් රසායනාගාරයක් ඉදිකිරීමටද අපේක්ෂා කෙරේ.

## පිරිපහදුවේ මෙහෙයුම්

සපුගස්කන්ද පිරිපහදුව 1969 වසරේ සිට අප ජාතියට ඉමහත් අගය එකතු කිරීමක් ඇති කරන අපගේ ප්‍රධාන උපාය මාර්ගික වත්කමයි. 1970 වසර වන විට පිරිපහදුව රටේ සමස්ථ ඉල්ලුම සපුරාලන ලද නමුත් වර්තමානයේ එය සමස්ත සංස්ථාවේ අලෙවියෙන් 30%-35% පමණ ප්‍රමාණයක් ආවරණය කරයි.

| පිරිපහදුව වැදගත් වන්නේ ඇයි? |
|---|
| • 100% ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය සමඟ ක්‍රියාත්මක වේ. |
| • පුරවැසියන් 1100 කට වැඩි පිරිසකට සෘජු රැකියා අවස්ථා සපයයි. |
| • සමස්ත සංස්ථාව විකුණුම් ප්‍රමාණයෙන් 30%-35% ක් සපයයි. |
| • විදේශ මුදල් පිටතට ගලා යාමේ ඉතිරි කිරීම්. |
| • වසර 51 ක අඛණ්ඩ මෙහෙයුම් සාර්ථකව නිම කරන ලදී. |
| • විදේශ රටවලදී පිරිපහදු පුහුණුව පිළිබඳ ඉහළ පිළිගැනීමක් තිබීම. |

පිරිපහදුව වැඩි දියුණු කිරීම සඳහා නව ව්‍යාපෘති සක්‍රීය කිරීම, ලාභාංශ වැඩි කිරීම, පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය අවම කිරීම, පරිසර සංරක්ෂණය, ප්‍රමිතිගත නිෂ්පාදන සැපයීම සහ සේවක සහභාගිත්වය ඉහළ මට්ටමක තබා ගැනීම වැනි විවිධ දිශාවන් ඔස්සේ රටට අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට සංස්ථාව කැපවී සිටී.


| විස්තරය | 2020 | 2019 |
|---|---|---|
| මෙහෙයුම් දින ගණන | 362.44 | 356.6 |
| සාමාන්‍ය නිෂ්පාදනය - TPSD (MT) | 4650 | 5230 |
| මෙහෙයුම් කාර්යක්ෂමතාවය | 99.03% | 97.68% |

පිරිපහදුව වසර තුළ සම්පූර්ණයෙන්ම එනම් 100% මර්බන් බොරතෙල් පිරිපහදු කල අතර බොරතෙල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 1,685,441 (MT) විය. සාමාන්‍ය ප්‍රවාහ දිනකට ටොන් 4650 ක් (TPSD) සහ දින දර්ශන දිනකට ටොන් 4605 ක් (TPCD) පිරිපහදු කරන ලදි. පිරිපහදුව දින 362.44 ක් ක්‍රියාත්මක වූ අතර, බොරතෙල් ඩිස්ටිලර් ඒකකයේ 99.03% ක මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවයක් පවත්වා ගන්නා ලදි. ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති අඩු ඉල්ලුම සහ පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය කරන ටැංකිවල පවතින ගබඩා ධාරිතාවයේ හිඟවීම් හේතුවෙන් වන නැව් ප්‍රමාද ගාස්තු වැලැක්වීමට 2020 අප්‍රේල් සහ මැයි මාසවලදී ප්‍රවාහ දිනකට බොරතෙල් පිරිපහදුව 3500 දක්වා අඩු විය.

2019 වසරේ බොරතෙල් යෙදවුම් මෙ.ටොන් 1,864,817 හා සසඳන විට 2020 වසරේ බොරතෙල් යෙදවුම් මෙ.ටොන් 1,685,441 දක්වා 10% කින් අඩු වී ඇත.

ප්‍රධාන වශයෙන් මාර්තු සහ අප්‍රේල් මාසවලදී අඩු බොරතෙල් ප්‍රමාණයක් සැකසීම හේතුවෙන් පිරිපහදුව හරහා ජනනය කරන ලද පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන වර්ෂය තුළදී 9.35% කින් පහත වැටුණි.

පිරිපහදු නිෂ්පාදනය




වසර තුළ, පිරිපහදු ක්‍රියාවලිය හරහා ඛනිජ තෙල් නිෂ්පාදන අටකින් මෙට්‍රික් ටොන් 1,630, 586ක් නිෂ්පාදනය කරන ලදී. වසර තුළ නිෂ්පාදනය කරන ලද ඔටෝ ඩීසල් 2020 වසරේ 35% සිට 33% දක්වා අඩු වූ අතර දැව් තෙල් නිෂ්පාදනය 27% සිට 29% දක්වා වැඩි විය. පෙට්‍රල් 92 ප්‍රමාණය නොවෙනස්ව පැවති අතර ඉතිරි නිෂ්පාදන ලෙස භූමිතෙල්, නැප්තා, තාර, SBP සහ ජෙට් ඒ1 යන නිෂ්පාදන පහ නියෝජනය කරයි.

## ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම

පිරිපහදුව විසින් කොලොන්නාව නිමාව සහ සපුගස්කන්ද නව පර්යන්තය වෙත නිෂ්පාදනය කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදන අලෙවිකරුවන්ට සහ පාරිභෝගිකයින්ට බෙදා හැරීම සඳහා මාරු කරනු ලැබේ.

පිරිපහදුව සෘජුවම බලශක්ති උත්පාදන පාරිභෝගිකයින් සඳහා වන ඛණිජ තෙල් නිෂ්පාදන, ද්‍රව තාර සහ LPG පාරිභෝගිකයින්ට සපයනු ලබයි.

| නිෂ්පාදිතය | 2020 MT | 2019 MT |
|---|---|---|
| LPG | 25,210 | 27,050 |
| දැවි තෙල් - ලංවිම | 162,392 | 112,911 |
| දැවි තෙල් - ඒෂියා පවර් | 35,628 | 18,152 |
| **එකතුව** | **223,230** | **158,113** |

## සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය

සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය සංස්ථාව සතු එකම වාහන ඉන්ධන බෙදා හැරීමේ පර්යන්තය වන අතර එය දැවි තෙල් සහ ජෙට් ඒ-1 ද බෙදා හරිනු ලැබේ. පිරිපහදුව මගින් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන වලින් අඩක් පමණ මෙම පර්යන්තයට මාරු කරනු ලැබේ.



සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය

## ඉදිරි දැක්ම

කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පිරිපහදුව විසින් සිදු කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘති පහත පරිදි සාරාංශගත කර ඇත.

- බොර ආසවනය තීරුව, ගෑස් තෙල් හයිඩ්‍රොට්‍රේටර් ඒකකය ප්‍රතික්‍රියාකාරකය සහ වේදිකා ඒකකය ප්‍රතිස්ථාපනය කිරීම
- අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම
- O2K1 සඳහා නව හයිඩ්‍රජන් සම්පීඩකය
- ලංවිම ස්ථාවරය සැපයුම වැඩිදියුණු කිරීම
- ජල පවිත්‍රාගාරයේ සිට පිරිපහදුව දක්වා ජල මාර්ගය ප්‍රතිස්ථාපනය කිරීම.
- O4 ඒකකය සඳහා නව සම්පීඩකය සවිකිරීම

සංස්ථාව සිය මෙහෙයුම්වල තිරසාරත්වය කරා ගමන් කරන බැවින්, නවතම තාක්ෂණික දියුණුව කරා ගෙන ඒම සඳහා සහ පරිසර සංරක්ෂණයට මුහුණ දීම සඳහා පිරිපහදුව වැඩිදියුණු කිරීමට සංස්ථාව සැලසුම් කළ පරිදි ආයෝජනය කරයි.

# අපගේ උපාය මාර්ග


ජාතික ආර්ථිකයට ඛනිජ තෙල් නිෂ්පාදනවල ඇති අතිමහත් වැදගත්කම නිසාවෙන්ම අභියෝග ජය ගැනීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග පෙළගස්වා ගැනීමටත්, නිතර වෙනස්වනසුලු පරිසරයකදී පවා ඉලක්ක සහ අරමුණු කරා ළඟා වීමටත් අපට මග පෙන්විය.

## දැක්ම හා මෙහෙවර

### උපාය මාර්ගික



#### ලාභ වර්ධනය



#### මෙහෙයුම් විශිෂ්ටත්වය

### උපාය මාර්ග

**ලාභ වර්ධනය**

- අපගේ ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන යාන්ත්‍රණ, නවෝත්පාදන සහ උපාය මාර්ගික සම්පත් යෙදවීම් අපගේ මෙහෙවර සහ දැක්ම කරා ළඟා වීමට අපගේ ප්‍රධාන උපායමාර්ගිකයක් වේ. අපගේ පාර්ශවකරුවන්ට සන්නාම **සමානාත්මතාවය** සහ අගය එකතු කිරීම ගොඩනැගීම සඳහා සංස්ථාව සිය ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සතුටු කිරීමට අවධානය යොමු කරයි.
- උපාය මාර්ගික ස්ථානවල නව පිරවුම්හල් එකතු කිරීම.
- නව ලාභදායී නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීම.
- ගබඩා ධාරිතාව වැඩි දියුණු කිරීම.
- නැප්තා සහ දැවි තෙල් වැනි පහළ මට්ටමේ නිෂ්පාදන ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සඳහා පිරිපහදුව වැඩිදියුණු කිරීම.

**මෙහෙයුම් විශිෂ්ටත්වය**

- සංස්ථාව සිය අරමුණු සහ උපාය මාර්ගික අරමුණු කරා ළඟාවීම සඳහා කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීම වෙනුවෙන් සියළුම ක්‍රියාකාරකම්වල මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීමට ආයෝජනය කරයි. අඛණ්ඩ ක්‍රියාවලි සහ වත්කම් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම මගින් ක්‍රියාවලි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ  පිරිවැය ප්‍රශස්ත කිරීම හරහා පාර්ශවකරුවන්ට වැඩි වටිනාකමක් ජනනය කිරීම.
- මෙහෙයුම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම.
- දෘශ්‍යතාව සහ මෙහෙයුම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා දැනට පවතින පිරවුම්හල් සමූහය වැඩි දියුණු කිරීම.
- CODO පිරවුම්හල්වල නව බෙදාහැරීමේ පොම්ප ස්ථාපනය කිරීම.
- අතිරික්ත ද්‍රව තාර පිරවීම සඳහා තාර බැරල් පිරවුම් කම්හලක් ස්ථාපනය කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන ඒකකය හඳුන්වාදීම.

### ප්‍රධාන අභියෝග

**අබලන් වූ නල මාර්ග**

මෙම නල මාර්ග ඉන්ධන ගොඩබෑමේ ක්‍රියාවලිය මන්දගාමී කරන අතර නැංගුරම්පළේ තදබදය මෙන්ම ඉන්ධන ගොඩබෑමේ කාලය වැඩි වීම නිසා සංස්ථාව හට ප්‍රමාද ගාස්තු දැරීමට සිදුවීම.

**සහනාධාර මිලට සැපයීම**

සමස්ථ පිරිවැයට වඩා අඩුවෙන් රජය විසින් මිල තීරණය කරනු ලබන සහනදායී මිල ගණන් යටතේ දැඩි අලාභ යටතේ සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කරයි.

**ඩොලරය මත සීමා කිරීම්**

විදේශ මුදල් වෙළෙඳපොළේ නොතිබීම නිසාවෙන් සංස්ථාවට ඩොලර් මිලදී ගෙන ණය පියවීමට නොහැකි වීමෙන් ණය එකතු වන නිසාවෙන් විනිමය අනුපාතික උච්චාවචනයන් සඳහා යොමුවීම හා අවසානයේ පාඩුව කරා තල්ලු වීම.

## මානව ප්‍රාග්ධනයේ ආයෝජනය

වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අපගේ සේවකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අපි ඉතා කැපවී සිටින අතර අඛණ්ඩව ආයෝජනය කළෙමු. සංස්ථාව අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට පුහුණු කිරීම සහ පාරිභෝගිකයින් සතුටු කිරීම සඳහා විශේෂඥ දැනුම ගොඩනැගීම සඳහා පුහුණුව සහ අඛණ්ඩ සන්නිවේදනය ලබා දෙන ලදි.

- සේවකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම.
- වඩා හොඳ පාරිභෝගික සත්කාර සහ තෘප්තිමත් මට්ටම් සඳහා අඛණ්ඩ අලෙවි නියෝජිත පුහුණුව.

## තාක්ෂණික දියුණුව

තාක්ෂණික ප්‍රගතිය අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් එකතු කිරීමට හැකියාව ඇති කරයි. එය මෙහෙවර සහ දැක්ම කරා ළඟා වීමට සහ අපගේ ඉලක්ක සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වඩාත් නිවැරදි මෙහෙයුම් සහ වාර්තාකරණ භාවිතයන් ලබාදෙයි.

- ඩිජිටල් යටිතල පහසුකම් සහ පුහුණුව සඳහා ආයෝජනය කිරීම.
- ERP-SAP පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කිරීම තීරණය කිරීම සඳහා තත්‍ය කාලීන දත්ත සැපයීම.
- අන්තර්ජාල බැංකු පහසුකම් වැඩි දියුණු කිරීම.
- අවශ්‍ය තොග මට්ටම් සහතික කිරීම සඳහා බෙදාහරින්නාගේ තොග මට්ටමේ අධීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.

## තිරසාර බව

තිරසාර සංවර්ධනය සඳහා ඉදිරියට යාමට ප්‍රතිපත්ති සහ භාවිතයන් සහතික කිරීම සඳහා කාබන් විමෝචනය අවම කිරීම, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට අනුව අපද්‍රව්‍ය බැහැර කිරීම, ඵලදායී පරිභෝජන රටාවෙහි නිරත වීමට අපි කැපවී සිටිමු.

- ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට අනුව කසළ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- බලශක්ති පරිභෝජනය ප්‍රශස්ත කිරීම සහ තිරසාර ලෙස ද්‍රව්‍ය/නිෂ්පාදන ලබා ගැනීම.
- පාරිභෝගික තෘප්තිය සහ නෛතික අනුකූලතාව ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සඳහා විවිධ අනුකූලතා පරීක්ෂණ හඳුන්වාදීම.

### ණය ගැනීමේ පිරිවැය

සමුච්චිත අලාභයන් බැංකුවලින් ලබාගත් කෙටි කාලීන ණය මගින් මූල්‍යණය කර ඇති බැවින් ණය පොලී ලෙස විශාල ප්‍රමාණයක් ගෙවීමට සිදුවීම (රු. බිලියන 20).

### ගබඩා හිඟය

සීමිත ගබඩා ධාරිතාවක් තිබීම ගෝලීය මිල පහත වැටෙන විට විශාල සංචිත මිලදී ගැනීමට සහ ගබඩා කිරීමට ඇති හැකියාව සීමා කළ අතර සීමිත ගබඩා පහසුකම් පැවතීම පිරිපහදුව පවත්වාගෙන යාම සඳහා ගබඩා ධාරිතාවයන් පවත්වා ගැනීමට අලාභ මත පවා අතිරික්ත පිරිපහදු කළ නිෂ්පාදන අපනයනය කිරීමට සංස්ථාව යොමු කරයි.

### මිල ගැණුම්කරුවෙකු වීම

සංස්ථාව ලෝක වෙළඳපොලෙන් කුඩා ප්‍රමාණයක් මිලදී ගන්නා බැවින්, සංස්ථාව යනු ජාත්‍යන්තර ඛනිජ තෙල් වෙළඳපොලේ අස්ථාවරත්වයට නිරාවරණය වෙමින් වෙළඳපොලේ මිල ගන්නෙකු වේ.

# ව්‍යාපාර මාදිලිය

## යෙදවුම්

### මූල්‍ය ප්‍රාග්ධනය

කොටස්කරුවන්ගේ අරමුදල්
ණය ගැනීම්
ප්‍රාග්ධන කළමනාකරනය

### නිපැයුම් ප්‍රාග්ධනය

පිරවුම්හල් ජාලය
දේපළ, පිරියත සහ උපකරණ

### මානව ප්‍රාග්ධනය

අපගේ සේවකයන්
පළපුරුද්ද
දක්ෂතා හා නිපුණතා
පුහුණුව හා සංවර්ධනය

### සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

පරදු දරන කණ්ඩායම් කළමනාකරණය
සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග
පාරිදූෂ්‍ය මිලදී ගැනිම් ක්‍රමවේදය

### බුද්ධිමය ප්‍රාග්ධනය

තාක්ෂණික නිපුණතා
සන්නාම ක්‍රියාවලිය
ක්‍රියාවලි සංවර්ධනය

### ස්වාභාවික ප්‍රාග්ධනය

බලශක්ති කළමනාකරනය
ජල කළමණාකරනය
වෙනත් ස්වාභාවික සම්පත්

## ක්‍රියාකාරකම්

### දැක්ම සහ මෙහෙවර

### ක්‍රමෝපායන්

ලාභදායී වර්ධනය
තිරසාර බව
මෙහෙයුම් විශිෂ්ඨත්වය
තාක්ෂණික දියුණුව
මානව ප්‍රාග්ධනයේ ආයෝජනය

### ප්‍රාථමික ක්‍රියාකාරකම්

### සංස්ථායික පාලනය

### බාහිර පරිසරය

ව්‍යාපාරය

ප්‍රවාහන ඉන්ධන

විදුලිබලය උත්පාදනය සඳහා ඉන්ධන

ගුවන් තෙල්

කර්මාන්ත

දේශීය

තාර

කෘෂි රසායන

ලිහිසි තෙල්

අපනයන

සහාය සේවා

අවදානම් කළමනාකරණය

## නිමැයුම්

දළ ආදායම
රු.බි. 519

විකුණුම් ධාරිතාව
ලී. මි. 5,029

දළ ලාභය
රු. බි. 55.25

ශුද්ධ ලාභය
රු. බි. 2.37

කාර්ය මණ්ඩල පිරිවැය
රු.බි. 5.72

රජයට දායකත්වය
රු.බි. 152.31

නව පිරවුම්හල්
25

මුළු පිරවුම්හල් ගණන
1,322

## ප්‍රතිඵල

**කොටස් හිමියන්**
සම්පත් නිර්මාණය කිරීම
මූල්‍ය වර්ධනය

**සේවාදායකයන්**
ගුණාත්මකබවෙන් යුතු නිෂ්පාදන රටපුරා ලබාගැනීමේ හැකියාව
සාධාරණ මිල

**සේවකයන්**
දක්ෂ සහ කාර්යක්ෂම සේවක බලඇණිය
ආරක්ෂාකාරී සහ සමාන පරිසරය

**රජය / නීති සම්පාදකයන්**
බලශක්ති සුරක්ෂිතතාවය සඳහා දායකවීම
ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය

**ප්‍රජාව**
තිරසාර සම්බන්ධතා

**සැපයුම්කරුවන්**
තිරසාර අගය දාමය

# මූල්‍ය ප්‍රාග්ධනය



මූල්‍ය ප්‍රාග්ධනය

*කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම් හේතුවෙන් වාර්තා කරන ලද රු. බිලියන 20.91 ක දැවැන්ත පොලී වියදම් මෙන්ම විනිමය අනුපාත විචලන අලාභ වන රු. බිලියන 21.84 ක් මධ්‍යයේ වුවද 2020 වර්ෂය තුළ සංස්ථාව රු. බිලියන 2.37 ක ශුද්ධ ලාභයක් උපයන ලද අතර එය 2019 වර්ෂයේ වාර්තා කරන ලද අලාභයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයකි. ජාත්‍යන්තර ඉන්ධන මිල අඩුවීම තුලින් රටට විදේශ මුදල් ඉතුරුවීම මෙන්ම සංස්ථාවෙහි ලාභදායිතාවද ඇතිවීමට හේතු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම වගකීම් රු. බිලියන 24.72 කින් 2019 වසරට සාපේක්ෂව අඩු වූ අතර එය 4% ක අඩු වීමකි.*

**518.8**

ආදායම
(රු. බි.)

**55.2**

දළ ලාභය
(රු. බි.)

**2.4**

ශුද්ධ ලාභය
(රු. බි.)

**20.5**


මුළු විස්තීර්ණ ආදායම
(රු. බි.)

**31.6**

ශුද්ධ මුදල් ප්‍රවාහය
(රු. බි.)

## ආදායම

සමස්ථ ඛනිජ තෙල් නිෂ්පාදන පරිභෝජනය පහත වැටීම නිසාවෙන් දළ ආදායම 2019 වසරට සාපේක්ෂව 19.75% කින් පහත වැටී ඇත. දේශීය විකුණුම් සමස්ථ ආදායමින් ප්‍රමුඛ ආදායම් මාර්ගය ලෙස පැවතුනි. රජයේ ප්‍රතිපත්තියට අනුව, මෝටර් රථ ඉන්ධනවල විකුණුම් මිල වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුනි.




| අංශය | ආදායම (රු. මි.) |
|---|---|
| ප්‍රවාහනය | 377,536 |
| විදුලිබල උත්පාදනය | 81,147 |
| ගුවන් තෙල් | 19,487 |
| කාර්මික | 11,308 |
| ගෘහස්ත සහ වෙනත් | 18,132 |
| අපනයන | 11,261 |
| **එකතුව** | **518,871** |


සංස්ථාවේ සමස්ථ ආදායමින් 2020 වසරේ ඉහළම ආදායම් දායකත්වය ඔටෝ ඩීසල් මගින් ජනනය වූ අතර දෙවැනි ඉහළම ආදායම් දායකත්වය පෙට්‍රල් 92 මගින් උත්පාදනය විය. කොවිඩ් -19 බලපෑම නිසාවෙන් වාහන සඳහා භාවිතා කරන ඉන්ධන අලෙවි ප්‍රමාණය 13.57% කින් පහත වැටීම හේතුවෙන් ඒ මඟින් ජනනය වන ලද ආදායම 12.29% කින් අඩු විය.

2020 මාර්තු මාසයේ සිට ගුවන් තොටුපළ කටයුතු සීමා කරන ලද අතර, වසරේ දෙවන භාගය තුළ ගුවන් තොටුපළ සේවා සීමිත මෙහෙයුම් සඳහා පමණක් අවසර ලබා දීම නිසාවෙන් සංස්ථාවේ වඩාත්ම බලපෑමට ලක් වූ අංශය වූ අතර එම හේතුවෙන් විකුණුම් ප්‍රමාණය 60% කින් අඩුවීමෙන් ආදායම පෙර වසරට සාපේක්ෂව 66.97% කින් පහත වැටී ඇත. සංස්ථාව විසින් පිරිපහදුවේ නිෂ්පාදනය කරන ලද නැප්තා සඳහා වසර තුළ දේශීය වෙළෙඳපොළෙන් ඉල්ලුමක් නොමැති වීම හේතුවෙන් එම නැප්තා අපනයනය කිරීම හරහා රුපියල් බිලියන 11.2 ක විදේශ විනිමයක් රටට උත්පාදනය කිරීමට හැකිවිය.

## දළ ලාභය

කොවිඩ්-19 බලපෑම හේතුවෙන් අනපේක්ෂිත ලෙස ජාත්‍යන්තර මිල අඩුවීම සහ ජාත්‍යන්තර බොරතෙල් මිල අඩුවීම හේතුවෙන් ජනනය වූ පිරිපහදු ලාභදායීතාව තුලින් සමාලෝචිත වර්ෂය තුළ දළ ලාභය කැපී පෙනෙන ලෙස පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 50,990 (1196%) වර්ධනය වූ අතර ඒ මගින් සංස්ථාව ඉහත කැපී පෙනෙන ලෙස ජයග්‍රහණ කරා ගෙන යන ලදි.

| වර්ෂය | දළ ලාභය (රු. මි.) | දළ ලාභ ආන්තිකය (%) |
|---|---|---|
| 2016 | 96,620 | 20.34 |
| 2017 | 26,989 | 5.23 |
| 2018 | (4,124) | (0.70) |
| 2019 | 4,261 | 0.66 |
| 2020 | 55,251 | 10.65 |



## වෙනත් ආදායම්

CPSTL වෙතින් ලැබුණු ලාභාංශය 2019 වර්ෂයේ වූ රු. මිලියන 150 සිට 2020 වසර තුළදී රු. මිලියන 240 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. අප්‍රේල් සහ මැයි මාසවල සේවක ණය වාරික දෙකක් අයකර ගැනීම කල් දැමීම නිසාවෙන් ණය පොලී ආදායම රු. මිලියන 239 සිට රු. මිලියන 195 දක්වා අඩුවිය.


දිගුකාලීනව පැවති හිඟ ණය ශේෂයන් ආපසු ගැලපීමෙන් එම අගයන් වෙනත් මෙහෙයුම් ආදායමට එකතු කරන ලදි. ආයෝජන දේපලවල ආදායම, කුලී ආදායම සහ පිරවුම්හල් උපකරණ අලෙවිය හරහා ලද ආදායම අනෙකුත් මෙහෙයුම් ආදායම් තීරුවෙහි දක්වා ඇත.

## විනිමය අනුපාත විචලනය

කොවිඩ්-19 හේතුවෙන් විනිමය අනුපාතයෙහි ඉහළ අස්ථාවරත්වයක් ඇතිවූ අතර ශ්‍රී ලංකා රුපියල තියුනු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් සංස්ථාව 2020 වර්ෂයේදී රුපියල් මිලියන 21,840 ක විනිමය අනුපාත අලාභ (2019 ලාභය රුපියල් මිලියන 8,397 කි) වාර්තා කරන ලදි. ශ්‍රී ලංකාව තුළ සීමිත විදේශ මුදල් ප්‍රමාණයක් තිබීම හේතුවෙන් බැංකු දෙක සඳහා විදේශ මුදල් ණය පියවීම සීමිත වීම ඉහත අලාභය සඳහා තවදුරටත් දායක විය.

## මූල්‍ය ආදායම

මූල්‍ය ආදායම භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතු, ඇමතුම් තැන්පතු සහ ගණුදෙනුකරුවන්ගේ ප්‍රමාද වූ පියවීම් සඳහා අය කරන ගාස්තු ආදායමෙන් සමන්විත වේ. දෛනික අතිරික්ත මුදල් ඉහළ පොලී ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කරන ලදී. වෙළෙඳපොළ පොලී අනුපාත අඩුවීම හේතුවෙන් 2019 වසරට සාපේක්ෂව පොලී ආදායම 16.27% කින් පහත වැටී ඇත.




වෙළඳපල පොලී අනුපාත අඩුවීම  මෙන්ම 2020 මාර්තු මාසයේදී ලංකා විදුලිබල මණ්ඩලය සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (IPPs) විසින් බිල්පත් සඳහා ගෙවීම් කිරීම නිසාවෙන් කල් ඉකුත් වූ ඉන්වොයිස්පත් ප්‍රමාද වූ පියවීම් සඳහා වන පොලී ගාස්තු රු. මිලියන 1,388 කින් අඩු විය.

## මූල්‍ය වියදම්

ප්‍රධාන වශයෙන් ලංවිම, IPPs සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම වැනි රාජ්‍ය ව්‍යවසායන් වලින් ලැබිය යුතු වෙළඳ ලැබීම් නිසි පරිදි නොගෙවීම, කොවිඩ්-19 හේතුවෙන් විකුණුම් අඩුවීම නිසා මුදල් ලැබීම් අඩු වීම සහ විදේශ මුදල් මිලදී ගැනීමට සහ ණය පියවීමට වෙළඳපොලේ විදේශ මුදල් නොතිබීම හේතුවෙන් හිඟ විදේශ මුදල් ණය වටිනාකම මෙන්ම පොලී වියදම් වැඩි වීමට අහිතකර ලෙස බලපාන ලදි.

තවද, ණය පොලීය එක්සත් ජනපද ඩොලර් වලින් පියවීම කලයුතු බැවින් ශ්‍රී ලංකා රුපියලේ තියුණු අවප්‍රමාණය පොලී පිරිවැය වැඩිවීම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදි. මෙම හේතූන් මත මූල්‍ය පිරිවැය සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 20,911 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 42.27% කින් ඉහළ යාමකි.

| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| මූල්‍ය වියදම් | 20,911 | 14,698 |
| විනිමය අනුපාත වියදම් | 21,841 | (8,397) |


## ආදායම් බදු වියදම්

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාර බදු ගෙවිය යුතු ආදායමෙන් ඉදිරියට ගෙන එන ලද බදු  අලාභය ඉල්ලා සිටීමට සංස්ථාව හිමිකම් කියති.  ඒ අනුව මෙම වසරේදී කිසිදු බදු ගෙවීමක් පැන නොනගිනු ලැබීය.

ඉදිරියට ගෙන යනු ලබන  බදු  ව්‍යාපාර අලාභ හේතුවෙන් සංස්ථාව මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත බදු හඳුනා ගනු නොලැබේ. කෙසේ වෙතත්, දේශීය ආදායම් පනතට අනුව ඉඩම් විකිණීමේදී ප්‍රාග්ධන බදු වලට යටත් වන බැවින්, සංස්ථාවේ ඉඩම් නැවත තක්සේරු කිරීම් සඳහා විලම්භිත බදු වගකීම් මූල්‍ය ප්‍රකාශන තුල ගලපා ඇත.

## ලාභදායිත්වය

ජාත්‍යන්තර මිල අඩු වීම සහ කාර්ය සාධනය වර්ධනයට උපායමාර්ගික අවධානය යොමු වීම සමඟින් සංස්ථාව 2019 වසරේ වාර්තා කරන ලද රු. මිලියන 11,836 අලාභය 2020 වර්ෂයේ දී රුපියල් මිලියන 2,371 ශුද්ධ ලාභයක් දක්වා වර්ධනය කරගනිමින් ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කළේය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ තියුණු අවප්‍රමාණය වීම සහ කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ ආදායම් අඩුවීම සෘණාත්මක ලෙස බලපෑවද, සංස්ථාව ඉහත සඳහන් කළ ලාභදායී තත්වයට ළඟා වීමට සමත් විය.




සංස්ථාව විසින් පිරිපහදුවේ වත්කම් වල සාධාරණ වටිනාකම වාර්තා කිරීම සඳහා ඉන්දියාවේ ලියාපදිංචි කර ඇති තක්සේරුකරු විසින් සපුගස්කන්ද පිහිටි ඛනිජ තෙල් පිරිපහදුව සහ බෙදා හැරීමේ පර්යන්තය නැවත ඇගයීමට ලක් කර තක්සේරු කරන ලදී. එම තක්සේරු කිරීම තුලින් නැවත තක්සේරු කිරීමේ ලාභය ලෙස වසර තුළදී රුපියල් මිලියන 17,676 හඳුනාගෙන ඇති අතර ඒ මගින් සමස්ථ විස්තීරණ ආදායම රුපියල් මිලියන 20,562 ක් ලෙස වාර්තා කරන ලදි.

## වෙළඳ ලැබීම්

සංස්ථාව විසින් රාජ්‍ය ආයතනවලට සහ අනෙකුත් පාර්ශව වෙත ඛණිජ තෙල් නිෂ්පාදන ණය පදනම මත සපයනු ලබන අතර ආර්ථිකයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීමට ඒ මගින් පහසුකම් සපයනු ලබයි. ලංවිම විසින් 2020 මාර්තු මස ප්‍රමාණාත්මක ලෙස හිඟ පියවීම සහ වර්ෂය තුළ විකුණුම් අඩුවීම හේතුවෙන් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් වසර අවසානයේදී රුපියල් මිලියන 13,099 කින් පෙර වසරට සාපේක්ෂව අඩු විය.

| | 2020 රු. මි. | 2019 රු. මි. |
|---|---|---|
| රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල් සඳහා රජයට ගෙවිය යුතු බදු සහ තීරුබදු වලට හිලව් කිරීම | 11,208 | 12,340 |

හිඟ ඉන්වොයිස්පත් වෙනුවෙන් වන මුදල් අයකර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් අඛණ්ඩව සාකච්ඡා පවත්වනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්ගෙන් දැවැන්ත හිඟ වෙළඳ ශේෂයන් තිබියදීත්, ආර්ථික සංවර්ධනයට අඛණ්ඩ දායකත්වයක් ලබා දීම සඳහා සහ රටේ කීර්ති නාමයට වන හානිය වළක්වා ගැනීම සඳහා මෙම ආයතනවලට අඛණ්ඩ ඉන්ධන සැපයීම සහතික කරන ලදි.

## ණය සහ ණය ගැනීම්

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව නව හයිඩ්‍රන්ට් පද්ධතියක් ඉදිකිරීම හා පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ආයෝජනය සඳහා ලබාගත් ස්වයං මූල්‍ය ණය හේතුවෙන් දිගුකාලීන ණය ගැනීම් රුපියල් මිලියන 848 කින් ඉහළ යන ලදි.

| වර්ගය | 2020 රු. බි. | 2019 රු. බි. |
|---|---|---|
| දිගුකාලීන ණය | 5.06 | 4.01 |
| කෙටිකාලීන ණය | 390.75 | 309.93 |
| **එකතුව** | **395.81** | **313.94** |

සංස්ථාව විසින් පිරිපහදු කළ ඛනිජ තෙල් සහ බොර තෙල් ආනයනය කිරීම සඳහා විවෘත කරන ලද ණයවර ලිපි කල්පිරීමේදී කෙටි කාලීන ණය බවට පරිවර්තනය කරන අතර ඒ අනුව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා රාජ්‍ය බැංකු දෙක මගින් ලබා ගන්නා කෙටි කාලීන ණය මගින් සපයා ගනු ලබයි.

- විකුණුම් ආදායම අඩු වීමෙන් මුදල් රැස් කිරීම් අඩු වීම, ණය පියවීමට වෙළඳපොලේ විදේශ මුදල් නොමැතිවීම සහ ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් රාජ්‍ය බැංකු දෙකින් ගන්නා ලද කෙටි කාලීන ණය ගැනීම් වසර තුළදී රුපියල් මිලියන 80,815 කින් වැඩි වී ඇත.

- කෙසේ වෙතත්, ණයවර ලිපිද ඇතුළුව වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු හිඟ මුදල් රු. මිලියන 105,749 කින් අඩුවීම තුලින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා වැය වන මුදල අඩුවීම පිළිබිඹු කරයි.

## ස්කන්ධ ප්‍රාග්ධනය

රජය විසින් තීරණය කරනු ලබන ඉහළ සහන මිල ගණන් යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කිරීම දැවැන්ත සමුච්චිත අලාභ තත්වයට ප්‍රධානතම හේතුව වී ඇති අතර, එම අලාභය පියවා ගැනීම සඳහා කෙටි කාලීන විදේශ මුදල් ණය බැංකු මගින් ලබා ගැනීම සිදුවෙයි. සංස්ථාවේ සෘණ ස්කන්ධ ප්‍රාග්ධනය රු. බිලියන 296.1 සිට වසර අවසානයේදී රු. බිලියන 275.5 දක්වා වර්ධනය විය.

| සෘණ ස්කන්ධ ප්‍රාග්ධනය වර්ධනය වීමට හේතු |
|---|
| • වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. මිලියන 2,371 කි. |
| • නැවත තක්සේරු කිරීමේ සංචිතය රු. මිලියන 17,676 කි |
| • අනෙකුත් විස්තීරණ ආදායම රු. මිලියන 515 කි. |

## මුදල් ප්‍රවාහ


කාලීන ආයෝජන මුදල් බවට පත්කිරීම නිසාවෙන් මුදල් සහ මුදල් සමාන දෑ රු. බිලියන 27.5 සිට රු. බිලියන 59 දක්වා වර්ධනය විය.

- වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අඩු වීම සහ පියවීම හේතුවෙන් ශුද්ධ මෙහෙයුම් මුදල් පිටතට ගලායාම රු. බිලියන 78.2 කි.
- භාණ්ඩාගාර බැඳුම්කර මුදල් කිරීම සහ පොලී ලැබීම මගින් ආයෝජන කටයුතු වලින් රු. බිලියන 32.5 ක මුදල් ප්‍රවාහයන් උත්පාදනය විය.
- සංස්ථාව විසින් වර්ෂය තුල රු. බිලියන 77.2 ක ශුද්ධ ණයක් ලබාගෙන ඇත.

## අගය එකතු කිරීම

| කාණ්ඩය | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| විකුණුම් ආදායම | 510,131 | 630,860 |
| වෙනත් ආදායම් | 12,007 | 14,055 |
| මිලදී ගන්නා ලද ද්‍රව්‍ය සහ සේවා | (338,156) | (512,561) |
| ක්ෂය වීම් | (2,669) | (983) |
| අගය එකතු කිරීම් | **181,313** | **131,371** |
| **අදාල වනුයේ** | | |
| **සේවකයන් වෙත ගෙවීම්** | | |
| වැටුප් සහ ප්‍රතිලාභ | 5,719 | 5,865 |
| **ප්‍රාග්ධන ලැබීම් සඳහා** | | |
| ණය මත පොළිය | 20,911 | 14,699 |
| **සංස්ථාව** | | |
| රඳවා ගන්නා ලද ලාභය | 2,371 | (11,857) |
| **රජය** | | |
| බදු සහ තීරු බදු | 152,311 | 122,664 |
| අගය එකතු කිරීම් | **181,313** | **131,371** |

# නිපැයුම් ප්‍රාග්ධනය



නිපැයුම් ප්‍රාග්ධනය

*අපගේ නිපැයුම් ප්‍රාග්ධනය ප්‍රධාන වශයෙන් පිරිපහදුව, සපුගස්කන්ද බෙදා හැරීමේ පර්යන්තය, පිරවුම්හල් 1,322 ක හැරීමේ පුළුල් ජාලය සහ ගුවන් සේවා උපකරණ යන ප්‍රධාන උපායමාර්ගික වත්කම් වලින් සමන්විත වේ. නිපැයුම් ප්‍රාග්ධනයේ නිසි කළමනාකරණය සහ එහි පෙළගැස්ම සංස්ථාව හි අරමුණු සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ තිරසාර ඛනිජ තෙල් කර්මාන්තයක් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා උපාය මාර්ගික ප්‍රමුඛතා ලබා දී ඇත. සංස්ථාව විසින් වර්ෂය තුලදී රු. බිලියන 2.1 ක් වටිනා ස්ථාවර වත්කම අලුතින් එකතු කර ඇත.*

**2.1**

ස්ථාවර වත්කම් මත ආයෝජනය
(රු. බි.)


**1,322**

පිරවුම්හල් ගණන

**25**

නව පිරවුම්හල් ගණන

SDGs සඳහා අපගේ දායකත්වය



**324.6**

මුළු වත්කම්
(රු. බි.)

**17.7**

නැවත අගය කිරීමේ ලාභය
(රු. බි.)

සංස්ථාවේ නිපැයුම් ප්‍රාග්ධනයට දේපළ, පිරියත සහ උපකරණ, ආයෝජන දේපළ, තොරතුරු තාක්ෂණය සහ පද්ධතීන් මෙන්ම මෘදුකාංග සහ පිරවුම්හල් ජාලය අන්තර්ගත අස්පෘෂ්‍ය වත්කම් අයත් වේ. බොරතෙල් පිරිපහදු කිරීම රටපුරා ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීම් මෙන්ම සැපයීම් යන ක්‍රියාවලින් සඳහා මෙම ප්‍රාග්ධනය යොදා ගනු ලබයි. සංස්ථාව විසින් ස්ථාපිත මූලෝපායික අරමුණු ඉටුකර ගැනීමට සහ රටේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මෙම ප්‍රාග්ධනය ඉතා වැදගත් වේ.

ආයෝජන දේපළ ඇතුළුව සමස්ථ දේපළ, පිරියත සහ උපකරණ වල වටිනාකම වසර තුළදී රුපියල් මිලියන 57,841 ක් දක්වා වර්ධනය වූ අතර ශුද්ධ පොත් වටිනාකම රු. මිලියන 26,490 සිට රුපියල් මිලියන 43,595 දක්වා වර්ධනය විය.

### 2020 සමාලෝචනය

- සංස්ථාව විසින් වසර 50ක් පැරණි සිය පිරිපහදුව වසර තුළදී නැවත තක්සේරු කළ අතර ඒ තුලින් ගලපන ලද නැවත තක්සේරු ලාභය රු. මිලියන 17,676 කි.
- වර්ෂය සඳහා වාර්තා කරන ලද ක්ෂයවීම් රු. මිලියන 2,670 කි.
- සංස්ථාව විසින් වර්ෂය තුල රු. මිලියන 2,099ක ස්ථාවර වත්කම් වල ආයෝජනය කරන ලදි.
- සංස්ථාව විසින් වර්ෂය තුල රුපියල් මිලියන 43 ක් වටිනා ස්ථාවර වත්කම් විකුණන ලදි.
- ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර නව ව්‍යාපෘති සැලසුම් කර ඇත.

ආයෝජන දේපළ අතරට තර්ස්ටන් පාර සහ කොළඹ මල්පාර යන ස්ථාන වල පිහිටි දේපළ සහ රටපුරා පවතින කුලී පදනම මත ලබා දී ඇති පිරවුම්හල් ද ඇතුළත් වේ. මෙම වසරේදී, ආයෝජන දේපළ මත රු.මිලියන 1.4 ක් ආයෝජනය කරන ලද අතර අතර වර්ෂය සඳහා ක්ෂයවීම් රු. මිලියන 1.88 කි. ආයෝජන දේපල මගින් රු. මිලියන 41.89 ක ආදායමක් වසර තුලදී උපයා ගන්නා ලදී.

| ආයෝජන දේපල පිළිබඳ විස්තර |
|---|
| සංස්ථාව සතු පිරවුම්හල් |
| කොළඹ 07, මල් පාර, අංක 80 දරන ස්ථානයේ පිහිටි ඉඩම |
| කොළඹ 03 තර්ස්ටන් පාරේ අංක 22/1 දරන ස්ථානයේ පිහිටි ඉඩම |

කැලණිය සපුගස්කන්ද පිහිටි පිරිපහදුව සංස්ථාවේ ප්‍රධානතම උපායමාර්ගික වත්කමයි. පිරිපහදුව 1969 දී ආරම්භ කර ඇති අතර එය ස්ථාපනය කරන අවස්ථාවේ රටේ සමස්ථ ඉල්ලුමට සරිලන සේ බොර තෙල් පිරිපහදු කර ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමට හැකි විය. පිරිපහදුව දිනකට බොරතෙල් බැරල් 50000 ක් පිරිපහදු කිරීමට ප්‍රමාණවත් ධාරිතාවයකින් සමන්විත වන අතර වර්තමානය වන විට සංස්ථාවේ මුළු ඉල්ලුමෙන් 30%ක් පමණ පිරිපහදුව හරහා ඛනිජ තෙල් නිෂ්පාදනය සැපයීම සිදුකරන කරන බැවින් විදේශ විනිමය ගලායාම් අඩු කිරීමට හැකිවී ඇත.

බලශක්ති සුරක්ෂිතතාව ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර පිරිපහදුව රටේ අඛණ්ඩ බලශක්ති සුරක්ෂිතභාවය සඳහා දායකත්වය සපයනු ලබයි. පිරිපහදුව සංස්ථාවේ හදවත බඳු වන බැවින් පිරිපහදු කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමට සහ පිරිපහදුව වැඩිදියුණු කිරීමට බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

### තොරතුරු තාක්ෂණය වැඩිදියුණු කිරීම්


- පාරිභෝගික මාර්ගගත පියවීම් පද්ධතිය වැඩිදියුණු කර ඇති අතර ඒ මගින් ගෙවීම් තත්‍ය කාලීනව පද්ධතියට යාවත්කාලීන වන අතර ඒ තුලින් බෙදාහරින්නන්ගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහසු කරනු ලැබේ. මෙම ක්‍රමය මගින් දීප ව්‍යාප්ත අලෙවිකරුවන්ගේ ගෙවීම් සරල කර නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව සහතික කරයි.
- කූපන් පත් මිලදී ගන්නා ආයතන තෘප්තිමත් කරන අතරම වෙළඳුන්ට නිරවද්‍යතාවය සහ කඩිනමින් මුදල් ගෙවීම සඳහා ස්වයංක්‍රීය කූපන් පද්ධතිය තවදුරටත් සංවර්ධනය කර ඇත. මෙම ස්වයංක්‍රීයකරණය හරහා විශ්වාසය සහ පහසුව වැඩි කරන බව අපි විශ්වාස කරමු.

## බෙදා හැරීමේ ජාලය

දීප ව්‍යාප්ත පිරවුම්හල් ජාලය අවසාන ඛනිජ තෙල් පාරිභෝගිකයන් සමඟ සබඳතා ඇතිකරගනු ලබන ප්‍රධාන උපායමාර්ගික ස්ථානයක් වේ. පුළුල් පිරවුම්හල් ජාලය හරහා සාමාන්‍ය ජනතාවට පහසුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව සහතික කෙරේ.

| කාණ්ඩය | පිරවුම්හල් ගණන |
|---|---|
| CODO | 243 |
| DODO | 1,079 |
| **එකතුව** | **1,322** |

# අපගේ බෙදාහැරීම් ජාලය




**උතුරු පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 1 | යාපනය | 22 | 65 | 87 |
| 2 | කිලිනොච්චිය | 4 | 15 | 19 |
| 3 | මුලතිව් | - | 23 | 23 |
| 4 | වවුනියාව | 1 | 22 | 23 |
| 5 | මන්නාරම | 5 | 29 | 34 |
| | එකතුව | 32 | 154 | 186 |

**වයඹ පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 6 | පුත්තලම | 7 | 75 | 82 |
| 7 | කුරුණෑගල | 14 | 91 | 105 |
| | එකතුව | 21 | 166 | 187 |

**උතුරු මැද පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 8 | අනුරාධපුරය | 12 | 45 | 57 |
| 9 | පොළොන්නරුව | 8 | 19 | 27 |
| | එකතුව | 20 | 64 | 84 |

**බස්නාහිර පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 10 | ගම්පහ | 17 | 125 | 142 |
| 11 | කොළඹ | 39 | 87 | 126 |
| 12 | කළුතර | 11 | 41 | 52 |
| | එකතුව | 67 | 253 | 320 |

**දකුණු පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 13 | ගාල්ල | 11 | 58 | 69 |
| 14 | මාතර | 9 | 35 | 44 |
| 15 | හම්බන්තොට | 7 | 28 | 35 |
| | එකතුව | 27 | 121 | 148 |

**නැගෙනහිර පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 23 | ත්‍රිකුණාමලය | 4 | 37 | 41 |
| 24 | මඩකලපුව | 4 | 46 | 50 |
| 25 | අම්පාර | 6 | 55 | 61 |
| | එකතුව | 14 | 138 | 152 |

**සබරගමු පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 21 | කෑගල්ල | 6 | 25 | 31 |
| 22 | රත්නපුර | 9 | 43 | 52 |
| | එකතුව | 15 | 68 | 83 |

**මධ්‍යම පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 18 | මාතලේ | 3 | 21 | 24 |
| 19 | මහනුවර | 18 | 47 | 65 |
| 20 | නුවරඑළිය | 13 | 5 | 18 |
| | එකතුව | 34 | 73 | 107 |

**ඌව පළාත**

| | දිස්ත්‍රික්කය | CODO | DODO | මුළු |
|---|---|---|---|---|
| 16 | මොණරාගල | 6 | 20 | 26 |
| 17 | බදුල්ල | 7 | 22 | 29 |
| | එකතුව | 13 | 42 | 55 |

සංස්ථාව සතු කාණ්ඩයේ පිරවුම්හල් (CODO) සහ බෙදුම්කරු සතු කාණ්ඩයේ පිරවුම්හල් (DODO) ලෙස පිරවුම්හල් වර්ග දෙකක් පවතී. මෙම වසරේ නව පිරවුම්හල් 25ක් පිරවුම්හල් ජාලයට එක් කිරීමෙන් බෙදාහැරීමේ ජාලයට එක් වූ නව පිරවුම්හල් සමඟ මුළු පිරවුම්හල් සංඛ්‍යාව 1322 දක්වා ඉහළ ගොස් ඇත.

ඉහත දැක්වූ ආකාරයට පිරවුම්හල්වල භූගෝලීය ව්‍යාප්තිය මඟින් සංස්ථාවට රට පුරා සිටින සාමාන්‍ය ජනතාවට නිෂ්පාදන ලබා ගැනීමේ සමාජ වගකීම ඉටු කිරීමට හැකි වී ඇත. මෙම භූගෝලීය පියසටහන රටේ ඉල්ලුමෙන් 80% කට වඩා වැඩි වෙළඳපල කොටස සාක්ෂාත් කර ගනිමින් වෙළඳපල ප්‍රමුඛයා ලෙස පවත්වා ගැනීමට පහසුකම් සපයයි. සංස්ථාවේ සමස්ථ ආදායමෙන් 73% කට වැඩි ප්‍රමාණයක් මෙම බෙදා හැරීමේ ජාලය හරහා උපයා ඇත.

- සංස්ථාව විසින් නවීනතම ඉන්ධන සැපයීමේ පොම්ප 500 ක් ආනයනය කර දිවයින පුරා පිහිටි සංස්ථාව සතු පිරවුම්හල්වල ස්ථාපනය කරන ලදී. නවීන බෙදාහැරීමේ පොම්ප මගින් වඩා හොඳ හා විශිෂ්ට පාරිභෝගික සේවාවක් ලබා දෙයි.
- සංස්ථාව විසින් CODO ඉන්ධන පිරවුම්හල් ප්‍රතිසංස්කරණය කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර ඒවා උසස් මට්ටමේ ප්‍රමිතීන්ට සහ ස්වයංක්‍රියකරණයට සරිලන පරිදි නවීකරණය කරන ලදී.

## ප්‍රාග්ධන ප්‍රගතිය සහ අනාගත දැක්ම

රටේ බලශක්ති සුරක්ෂිතතාව සහ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන විවිධ ක්‍රමෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බොහෝ වෙහෙස වී ඇත. තිරසාර සංවර්ධනය සහතික කරමින් තම දැක්ම හා මෙහෙවර වෙත ළඟාවීමට සංස්ථාව ක්‍රියා කරයි.

ව්‍යාපාර මෙහෙයුම් සංවර්ධනයට සහ අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙන්ම රටේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ව්‍යාපෘති සඳහා උපාය මාර්ගික අවධානය යොමු කරන ලදී.

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන අදියර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ගුවන් යානා ඉන්ධන පිරවුම් පර්යන්තය සහ දැනට පවතින ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ නව ඇප්‍රොන් හි ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතියක් ස්ථාපනය කිරීම 2018 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතියෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 60% සහ 44% ලබාගෙන ඇත. ව්‍යාපෘතිය අවසන් වන විට, සංස්ථාවට නවීනතම තාක්ෂණය සමඟින් ගුවන් තොටුපළේ අනාගතයේදී ඉහළ යන ගුවන් යානා ඉන්ධන ඉල්ලුම සපුරාලීමට හැකි වේ.



BIA ව්‍යාපෘතිය

- මුතුරාජවෙල සිට කටුනායක ගුවන් තොටුපළ දක්වා ජෙට් ඒ-1 ප්‍රවාහනය කිරීමේ නල මාර්ගයක් ඉදිකිරීම සහ දැනට පවතින මුතුරාජවෙල පර්යන්ත තුල ජෙට් ඒ-1 ගබඩා ටැංකි සංකීර්ණයක් සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. මෙමගින් කටුනායක ගුවන් තොටුපළ සඳහා බලශක්ති අඛණ්ඩතාව සහතික කිරීමටත්, ජෙට් ඒ-1 බෙදා හැරීමේ ක්‍රියාවලිය පහසු කිරීමටත් සංස්ථාව හට හැකියාව ලැබේ.




මුතුරාජවෙල ජෙට් ඒ-1 නල ව්‍යාපෘතිය

- පිරිපහදුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. එමඟින් ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් අඩු මිලට අපනයන කිරීමට සිදුවන දැවි තෙල් සහ නැප්තා ඉහළ මට්ටමේ නිෂ්පාදන බවට පත්කිරීමට හැකියාව ලැබෙනු ඇත.  එසේම ඛනිජ තෙල් සඳහා වන ඉල්ලුම බාධාවකින් තොරව සැපයීමට සහ පිරිවැය අවම කිරීමට පිරිපහදුවේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම මඟින් හැකියාව ලැබේ.  ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුල්‍යකරණ සලකා බලමින් සිටී.  සංස්ථාව සෑම විටම තිරසාර මෙහෙයුම් සඳහා ගමන් කරන බැවින් ජාත්‍යන්තර පාරිසරික ප්‍රමිතීන්ට අනුගත වෙමින් අප ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරයක් ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර ඇත.

- සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරන අතර ඒ සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා ලබාදීමෙන් වෙළඳපල ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමටත් රජයට අවශ්‍ය සහාය දෙමින් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ඉදිරියට ගමන් කරයි.


පිරිපහදු අලුත්වැඩියා කටයුතු

- සියලුම නවීන නිෂ්පාදන පිළිවෙත් සමඟ මුතුරාජවෙල ප්‍රදේශයේ නවීනතම කෘෂි රසායන කම්හලක් ඉදිකිරීමට දැනටමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. මෙම ව්‍යාපෘතියට නිෂ්පාදන මහලක්, පරිපාලනය කොටසක් සහ වඩාත් තිරසාර නිෂ්පාදන සාධාරණ මිලකට වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීමේ අරමුණින් නවීන රසායනාගාරයකින්ද සමන්විත වේ.

- උසස් තත්වයේ ද්‍රව තාර ලබාදීමේ අරමුණින් සපුගස්කන්ද පිරිපහදුවේ ද්‍රව තාර බැරල් කිරීමේ කම්හලක් ඉදිකිරීමට මූලික කටයුතු සූදානම් කර ඇත.

- අඩු ඉල්ලුමක් පවතින කාලවලදී අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීමටත්  සහ ජාත්‍යන්තර වෙළඳපොලේ තෙල් මිල පහත වැටෙන විට බොරතෙල්/ආනයනය කරන ලද පිරිපහදු කළ නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ගබඩා ධාරිතාව වැඩි කිරීම සඳහා සංස්ථාව අපේක්ෂා කරනු ලබයි.

රටේ ප්‍රධාන උපායමාර්ගික ව්‍යාපාරික ව්‍යවසායක් ලෙස සංස්ථාව සෑම විටම රටේ බලශක්ති සුරක්ෂිතතාව සුරක්ෂිත කිරීම සඳහා ආයතනයට පැවරී ඇති වගකීම් ඉටු කිරීමට ක්‍රියාත්මක වේ. අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කිරීමට සංස්ථාව විසින් දිගුකාලීන ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති සහ කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ගික ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබයි.

## ප්‍රාග්ධන හා නොගැලපීම්

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ප්‍රධාන වශයෙන් කෙටි කාලීන ණය හරහා මූල්‍යකරණය කරනු ලබන බැවින්, ඉහළ මූල්‍ය පිරිවැයක් යටතේ ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවීම ව්‍යාපෘති පිරිවැයට සහ අවසානයේදී සංස්ථාවේ ලාභදායිත්වය සඳහා අහිතකර ලෙස බලපානු ලබයි.

# බුද්ධිමය ප්‍රාග්ධනය



බුද්ධිමය ප්‍රාග්ධනය

*බුද්ධිමය ප්‍රාග්ධනය සංස්කෘතිය, ආචාර ධර්ම, සාරධර්ම, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි, ඉගෙනීම සහ සන්නාම වටිනාකම හා සම්බන්ධ අස්පෘශ්‍ය සංකල්පයන්ගෙන් සමන්විත වේ. සංස්ථාව සතුව අඛණ්ඩතාව සහතික කිරීම සඳහා සංස්කෘතිය තුළ ගොඩනඟා ඇති සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වටිනාකම් ඇත. සංස්ථාව හි අභිවෘද්ධිය සඳහා ඉතා වැදගත් වන නිහඬ දැනුම වැඩිදියුණු කිරීමට සහ අගය කිරීමට අපගේ සංස්කෘතිය පහසුකම් සපයයි. කොවිඩ් -19 හි බලපෑම පුහුණු සහ සංවර්ධන වැඩසටහන් වලට බාධාවක් වුවද, සංස්ථාව කිසියම් දුරකට පුහුණුවීම් සහ වර්ධන ක්‍රියාකාරකම් අඛන්ඩව සලසන ලදි.*

**38,350**

සමුච්චිත සේවා පළපුරුද්ද
(වසර )

**4.47**

පුහුණු කිරීමේ පිරිවැය
(රු. මි.)


**99.0%**

පිරිපහදුවේ මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවය

**900**

වසර 20 වැඩි සේවයක් ඇති සේවකයන් ගණන

SDGs සඳහා අපගේ දායකත්වය



බුද්ධිමය ප්‍රාග්ධනය සංස්කෘතිය, ආචාර ධර්ම, සාරධර්ම, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි, ඉගෙනීම සහ සන්නාම වටිනාකම හා සම්බන්ධ අස්පෘශ්‍ය සංකල්පයන්ගෙන් සමන්විත වේ. දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතා වැදගත් වන නිහඬ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අපි අපගේ සම්පත් පෝෂණය වෙන් කිරීම කරන්නෙමු. අපගේ නිෂ්පාදන රටේ ජනතාවගේ ජීවන වියදමට සහ ජීවනෝපායට බලපෑම් කරන බැවින් සංස්ථාව විසින් අප සංස්කෘතිය තුළ ගොඩනගා ඇති සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වටිනාකම් අඛන්ඩව පවත්වාගෙන යනු ලබයි.

කොවිඩ් -19 ව්‍යාප්තියත් සමඟ සෞඛ්‍ය සහ ආරක්ෂිතව දැඩි මාර්ගෝපදේශ යටතේ ව්‍යාපාරික මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමේ අභියෝගවලට මුහුණ දීම සඳහා අපි වේලාසනින්ම අවශ්‍ය මූලික පියවරයන් ආරම්භ කළෙමු. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපාය මාර්ග සහ තොරතුරු තාක්ෂණ යන ප්‍රධාන ක්ෂේත්‍රවල අවශ්‍ය වෙනස්කම් සහ හඳුන්වාදීම් සිදු කරන ලදී. සීමිත භෞතික කාර්ය මණ්ඩලයක් සහිතව රට අගුලු දමන ලද සහ සංචරන සීමා සහිත කාල සීමාව තුළ නිවසේ සිට වැඩ කිරීමට පහසුකම් සැලසීමට පද්ධතීන් සකස් කර ඇති අතර ඒ තුලින් වැඩි කාර්යක්ෂමතාවයක් සහ මෙහෙයුම් විශිෂ්ටත්වයක් තහවුරු කිරීමට හැකිවිය. අපගේ වැඩි නම්‍යශීලීභාවය සහ කාර්ය මණ්ඩලයේ කැපවීම නිසා කොවිඩ් -19 පැතිරීම හේතුවෙන් වෙනස් වූ පරිසරයට නිසි ලෙස අපගේ ප්‍රතිචාර දැක්වීම සහ අනුවර්තනය වීම තුලින් පිළිබිඹු කරයි.

## අපගේ සන්නාමයන්

අපගේ “අනාගතය බලගන්වමින්” නැමැති සන්නාම ආදර්ශ පාඨය වසර 59 ට වඩා වැඩි ඉතිහාසයක් ඇති අතර, එය මෙරට ජනතාවගේ හදවතට ඉතා සමීප වනුයේ අපගේ නිෂ්පාදන මෙරට ජනතාවගේ ජීවන වියදම සහ සාධාරණ වෙළඳාම කෙරේ මෙම ව්‍යාපාරය සෘජු බලපෑමක් ඇති කරන බැවින් සහ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය උසස් කිරීමට ද අප සෘජු දායකත්වයක් ලබා දෙන බැවිනි.

සිපෙට්කෝ ලිහිසි තෙල් යනු ජනතාවට ඉතා සමීපව පිළිගත් සන්නාමයකි. අපගේ සියලුම ලිහිසි තෙල් ISO 9001/2000 සහතිකය සහිත ලිහිසි තෙල් නිෂ්පාදනාගාරයක් මගින් නිෂ්පාදනය කර ඇත. එමෙන්ම අපගේ සියලු ලිහිසි තෙල් වර්ග සිපෙට්කෝ (Ceypetco) සන්නාමය යටතේ සපයනු ලබන අතර ඒවා ඇමරිකන් පෙට්‍රෝලියම් ආයතනය (API), MTU Friedrichshafen SmbH සහ මෝටර් රථ නිෂ්පාදකයින්ගේ සංගමය (ACEA) වැනි අදාළ ජාත්‍යන්තරව පිලිගත් පිරිවිතරයන් සපුරා ඇත.

සිපෙට්කෝ (Ceypetco) කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවියද උපාය මාර්ගික ව්‍යාපාරික ඒකකයක් ලෙස දශක 5ක් පුරා කෘෂි රසායන වෙළඳපොලේ නොකැළැල් සේවාවක් ලබා දී ඇත. සිපෙට්කෝ කෘෂි රසායනයට ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO) සහතිකය පිරිනමා ඇත, එනම්; 9001:2015 (තත්ත්ව කළමනාකරණ පද්ධතිය); ISO 14001:2015(පරිසර කළමනාකරණ පද්ධතිය) යන පිරිවිතරයන් 2008 වසරේ සිට කෘෂි රසායන ව්‍යාපාරයේ සහතික කර ඇත. ගොවිබිම් සකස් කරන අවස්ථාවේ සිට අස්වැන්න නෙළන තෙක් ගොවිබිම් සඳහා ඵලදායි විසඳුම් සැපයීම සඳහා දිලීර සහ වල් පැලෑටි සම්පූර්ණයෙන්ම පාලනය කිරීමෙන් හෝ තුරන් කිරීමෙන් ගොවියාගේ වගාව සමෘද්ධිමත් කිරීම සඳහා සිපෙට්කෝ කෘෂි රසායන සන්නාමය කැපවී ඇත.

## අපගේ වටිනාකම්

සංස්ථාවේ සංස්කෘතිය මගින් ගොඩනැගූ අපගේම සාරධර්ම සහ වටිනාකම් සංස්ථාව සතු වේ. සෑම ජන කොටසකගේම ජීවන වියදම සහ ජීවන තත්වය වෙත අපගේ නිෂ්පාදන බලපෑමක් ඇති කරන හෙයින්, වඩාත් හොඳ නිෂ්පාදන වඩා පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ඇති කිරීමට ඇප කැප වී සිටිමු. අපගේ නිෂ්පාදන සෞඛ්‍ය හා ප්‍රවේශම කෙරේ දැඩි බලපෑමක් ඇති කරන නිෂ්පාදනය වීම හේතුවෙන් ඒවායේ ප්‍රමිතිය පිළිබඳව මනා අවධානයක් යොමු කෙරේ. අපගේ සේවය වටිනා ලෙස ලබා දීම සඳහා කැපවුණු ප්‍රවීණයන් බිහි කිරීම සඳහා පුළුල් පරාසයක තාක්ෂණික, මෙහෙයුම් සහ සේවාදායකයන් මෙහෙයවීම වැනි අංශවල පුහුණුව ලබා දෙයි. අපගේ තොග මෙහෙයුම් සහ පර්යේෂණ අංශය පරිසරයට හානියක් නොවී නිෂ්පාදන හා සේවා සංවර්ධනය කිරීමට ක්‍රියාකාරී දායකත්වයක් ලබා දෙයි.


## ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

කූපන් පත් නිකුත් කිරීමේ සහ ඒවා සඳහා ප්‍රතිපූරණය කිරීමේ ක්‍රියාවලියේ ආරක්ෂාව සහ නිරවද්‍යතාවයේ මට්ටම ඉහළ නැංවීම සඳහා ණය කූපන් බෙදා හැරීමේ ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩිදියුණු කර ඇත. මෙම පද්ධතිය මගින් ඉතා කෙටි කාල පරිච්ඡේදයක් තුළ බෙදුම්කරුවන් වෙත අරමුදල් නිදහස් කිරීමේ සහ ප්‍රතිපූර්ණය කිරීමේ පද්ධතිය කඩිනම් කරයි.

## අඛණ්ඩ ඉගෙනීම සහ සංවර්ධනය


වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ දැනුම් පදනමක් වැදගත් අස්පෘශ්‍ය වත්කමක් සාදයි. දැනුම පදනම් කර ගත් ආයතනයක් බිහි කිරීම ප්‍රධානතම ක්‍රමෝපායක උපාය මාර්ගයක් වන බැවින් තම රාජකාරී සහ වගකීම් ශක්‍යතාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් පුහුණු හා සංවර්ධන අවස්ථා ලබා දෙයි. සංස්ථාව රු. මිලියන 4.47 ක් නිපුණතා වැඩිදියුණු කිරීම සහ සේවකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කර ඇත.

**සේවකයින්ගේ පලපුරුද්ද අනුව වර්ග කිරීම**




අපගේ දැනුම් පදනම වසර 20 කට වැඩි අඛණ්ඩ සේවා පළපුරුද්දක් ඇති සේවකයින් 900 කින් පමන සමන්විත වේ. දැනට පවතින ශ්‍රම බලකායේ සමුච්චිත සේවා පළපුරුද්ද වසර 38,350 ඉක්මවයි. සංස්ථාවේ ඉගෙනුම් සහ පහසුකම් සැපයීමේ සංස්කෘතිය මගින් දැක්ම සහ මෙහෙවර වෙත ළඟා වීම සඳහා වඩා හොඳ මෙහෙයුම් විශිෂ්ටත්වයක් ගොඩනැගීම සඳහා දැනුම පවත්වා ගැනීමට ක්‍රියා කරයි.

# මානව ප්‍රාග්ධනය



මානව ප්‍රාග්ධනය

*අපගේ මානව ප්‍රාග්ධනයට ස්ථීර සහ කොන්ත්‍රාත් සේවකයින් සහ අභ්‍යාසලාභීන් ඇතුලුව **2508** ක් ඇතුළත් වන අතර ඔවුන් සංස්ථාවේ ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තනි තනිව මෙන්ම සාමූහිකව දායක වන උපාය මාර්ගික වත්කම් වේ. අප සංස්ථාවෙහි අභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය වන පාරිභෝගික සහ පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම සඳහා සේවක නියැලීම ගතික කාර්යභාරයක් ඉටු කරයි. දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සහ යතාර්ථයක් කිරීම සඳහා අපගේ උපාය මාර්ග සමඟ සමපාත කිරීමට හැකි වන ලෙස මනා පුහුණුව සහ සංවර්ධනය සහිතව අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය ගොඩනඟා ඇත.*

**2330**
සේවකයන් ගණන

**143**
සේවා තිළිණ

**56**
බඳවා ගැනීම්

**5.72**
කාර්ය මණ්ඩල පිරිවැය
(රු. බි.)

**176**
පුහුණුවන්නන් ගණන

SDGs සඳහා අපගේ දායකත්වය



අපගේ මානව ප්‍රාග්ධනය යනු අපගේ දැක්ම සහ මෙහෙවර යථාර්ථය කරා ළඟා කර ගැනීම සඳහා යොදා ගන්නා උපාය මාර්ගික වත්කමකි. මනා නිපුණ, සම්බන්ධිත සහ නියැලී සිටින ශ්‍රම බලකාය සංස්ථාව ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ වෙළඳපල ප්‍රමුඛයා ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරයි. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය යහපත් සේවා පරිසරයක් සහතික කරන අතරම වඩා හොඳ ප්‍රතිලාභ, සෞඛ්‍ය සහ ආරක්ෂාව සපයමින් වෘත්තීය ප්‍රගතියක් අත්පත්කරගැනීමට ලබාදීමෙන් ඔවුන් වඩාත් සතුතට පත්කරනු ලැබේ.

මානව ප්‍රාග්ධනය පිළිබඳ අපගේ ප්‍රතිපත්තිය සේවකයින් ආකර්ෂණය කර ගැනීමට, රඳවා තබා ගැනීමට සහ සංවර්ධනය කිරීමට සංස්ථාව හට හැකියාව ලබා දෙන අතර ඒ තුලින් පාර්ශ්වකරුවන්ට ඉහල වටිනාකමක් එක් කිරීමට හැකි වනු ඇත.

## පාලනය

සංස්ථාවේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති සැකසීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ සංස්ථාවේ සමස්ත මානව සම්පත් ප්‍රාග්ධනය මානව සම්පත් කාර්යංශය මගින් මෙහෙයවනු ලැබේ. මානව සම්පත් කාර්යංශය විසින් ආයතනික උපායමාර්ගික දිශාවට යොමුකිරීමට සහාය වීම සඳහා මානව සම්පත් උපායමාර්ග සමාලෝචනය කිරීම සහ නැවත සකස් කිරීමේ කාර්යයන් සිදු කරනු ලබයි.


| වර්ගය | සේවකයන් ගණන |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 2,330 |
| කොන්ත්‍රාත් සේවකයින් | 2 |
| පුහුණුවන්නන් - කාර්මිකයන් | 76 |
| පුහුණුවන්නන් -(බාහිර අධ්‍යාපන ආයතන) | 100 |
| එකතුව | **2,508** |

## විවිධත්වය

අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය විවිධත්වය මත වූ කණ්ඩායමක් නිර්මාණය කිරීමට දිරිමත් කරන අතර ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, ආගම හෝ වෙනත් ඕනෑම සාධකයක් මත පදනම් වූ ඕනෑම ආකාරයක වෙනස්කම් කිරීම්වලට එරෙහිව දැඩි ලෙස ප්‍රතිපත්ති සකසා ඇත.

වඩා හොඳ පාරිභෝගික ප්‍රවේශයක් සහ පාරිභෝගික සේවාවක් ලබා දීම සඳහා විවිධත්ව මාර්ගෝපදේශ සක්‍රීය කිරීම සඳහා සේවකයන් විවිධ පළාත්වල ස්ථානගත කර ඇත. අපි කාන්තාවන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය පුරාවට සම මට්ටමේ අවස්ථාවන් සැපයීමට උත්සාහ කරමින් රැකියා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරන්නෙමු.

ගැහැණු පිරිමි අනුව සේවකයන්




සංස්ථාවේ සෑම සේවක කාණ්ඩයකම කාන්තාවන් නියෝජනය වන අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් සහ ඉන් ඉහල කාණ්ඩවලින් 13%ක් කාන්තාවන් බව සටහන් කිරීමට කැමැත්තෙමු.

| පළාත අනුව සේවකයන් | පිරිමි | ගැහුණු | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර | 1675 | 305 | 1980 |
| නැගෙනහිර | 23 | 1 | 24 |
| උතුර | 16 | 4 | 20 |
| ඌව | 16 | 2 | 18 |
| වයඹ | 34 | 12 | 46 |
| මධ්‍යම | 54 | 20 | 74 |
| සබරගමු | 23 | 11 | 34 |
| දකුණ | 84 | 10 | 94 |
| උතුරු මැද | 33 | 7 | 40 |
| එකතුව | **1958** | **372** | **2330** |

අපගේ කාන්තා සේවිකාවන් සඳහා යහපත් සේවා පරිසරයක් සහතික කිරීම සඳහා සංස්ථාව විසින් මානව සම්පත් ප්‍රතිපත්ති අඛන්ඩව සමාලෝචනය කරනු ලබයි. දැනුවත් කිරීමේ සැසි, දැඩි ප්‍රතිපත්ති සහ ශක්තිමත් දුක්ගැනවිලි යාන්ත්‍රණයක් හරහා පිළිගැනීමේ සංස්කෘතියක් සහ වෙනස් නොකොට සැලකීම අපි දිගටම ක්‍රියාත්මක කරන්නෙමු. වසර තුළදී කිසිදු වෙනස් කොට සැලකීමේ සිදුවීමක් වාර්තා වී නොමැත.

## තිළිණ සහ පිළිගැනීම

අපගේ සේවකයින් හඳුනා ගැනීම සහ ප්‍රතිලාභ ලබා දීම අපගේ මෙහෙයුම් සඳහා අපගේ සේවකයින්ගේ දායකත්වය පිළිගැනීමේ මාර්ගයයි. තවද, සිත් ඇදගන්නා සුළු ප්‍රතිලාභ ලබා දීම මගින් සේවකයන් තම රාජකාරිය සහ වගකීම් වඩා උද්යෝගයෙන් ඉටු කිරීමට පෙළඹෙනු ඇති බවට සහ සේවකයන් තම සේවා ස්ථානය වෙත පක්ෂපාතී වනු ඇති බවට සංස්ථාව විශ්වාස කරයි

සියලුම ස්ථිර සේවකයන්ට ප්‍රසාද දීමනා, ඇතැම් ශ්‍රේණි සඳහා ගමන් දීමනා, නිවාඩු බංගලා, සේවක ණය, වෛද්‍ය ප්‍රතිලාභ, සකසුරුවම් සමිතිය හරහා පාරිතෝෂිත දීමනා, මාතෘ නිවාඩු සහ විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළු රැකියා කාණ්ඩය මත පදනම්ව මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ රැසක් ලබා දෙනු ලබයි.

සංස්ථාව විසින් වෙළෙඳපොළ අනුපාතවලට සමගාමීව මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභවලින් සමන්විත ප්‍රතිලාභ පැකේජයක් පිරිනමයි. සංස්ථාව විසින් රැකියාවේ ස්වභාවය සහ වගකීමට අනුකූලව සාධාරණ හා තරඟකාරී වේතනයක් 2,330 ක් වූ සියලුම සේවකයින්ට සහතික කරයි. අපගේ වැටුප් සහ ප්‍රතිලාභ ව්‍යුහයන් සමාන පෞද්ගලික අංශ සමඟ තරඟකාරී බව සහතික කිරීම සඳහා හොඳ ප්‍රතිලාභ ප්‍රතිපත්තියක් අප සතුව ඇත. සේවකයාගේ කාර්ය සාධනය මත ප්‍රතිලාභ ක්‍රමවේදය සකස් කර ඇති අතර ඔවුන්ගේ සමස්ත කාර්ය සාධනය මත පදනම්ව වාර්ෂික කාර්ය සාධන ඇගයීම සිදු කරයි.

සාමූහික ගිවිසුම මුළු සේවක සංඛ්‍යාව ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන අතර, සෑම වසර තුනකට වරක්ම අලුත් කිරීමේ චක්‍රය හරහා සියලුම වැටුප් / ප්‍රතිලාභ වැඩි කිරීම් ඇතුළත් වේ. දැනට පවතින ගිවිසුම 2018 ජනවාරි මාසයේදී 2018 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා වන අතර එය 2021 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි අලුත් කිරීමට නියමිතය.

| සේවා කාණ්ඩය | ත්‍යාග සංඛ්‍යාව |
|---|---|
| වසර 20 ක සේවාව | 119 |
| වසර 30 ක සේවාව | 12 |
| වසර 35 ක සේවාව | 11 |
| වසර 40 ක සේවාව | 01 |
| **එකතුව** | **143** |

සංස්ථාවේ මානව සම්පත් ප්‍රතිපත්තිය අනුව, සංස්ථාව වෙත තම අගනා සේවාව ලබා දෙනු ලබන සේවකයන් ඇගයීම සඳහා ඔවුන්ට සේවා තිළිණ ලබා දෙයි. මෙම වසර තුළ තිළිණ 143ක් ප්‍රදානය කෙරේ.

සංස්ථා සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. විශ්‍රාම ගැනීමෙන් පසු ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා සංස්ථාව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල වෙත පිළිවෙලින් 15% ක් සහ 3% ක් දායක වේ. මීට අමතරව, සංස්ථාව පාරිතෝෂිත පනතට අනුව විශ්‍රාම යාමේදී පාරිතෝෂිකය ලබා දෙනු ලබයි. පාරිතෝෂිකයට සමාන විශ්‍රාම ප්‍රතිලාභයක් ලබාදීමට සංස්ථාවද සකසුරුවම් සමිතියට දායක වේ.

## බඳවා ගැනීම්

රාජ්‍ය සංස්ථාවක් ලෙස, බඳවා ගැනීමේ ක්‍රියාවලිය ජාතික සහ අනෙකුත් රෙගුලාසිවලට මෙන්ම මානව සම්පත් ප්‍රතිපත්තියට අනුකූලව සිදු කෙරේ. නිශ්චිත රැකියා භූමිකාවක් සඳහා අපේක්ෂකයාගේ යෝග්‍යතාවය, ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව අපි බඳවා ගන්නෙමු. විනිවිදභාවයෙන් යුත් බඳවා ගැනීමේ ක්‍රියාවලියක් සඳහා පූර්ව අවශ්‍යතා ලෙස විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් සහ නිපුණතා පරීක්ෂණ මගින් අනුමත සේවක සංඛ්‍යා අවශ්‍යතාවලට අනුකූල බඳවා ගැනේ. එබැවින් වෘත්තීය දියුණුව සඳහා අවස්ථාවක් ඇති සහ වැඩි වගකීමක් සමඟ කටයුතු කිරීමට හැකියාව ඇති සුදුසුකම් ලත් පුද්ගලයින් අපි බඳවා ගනිමු.

සංස්ථාව විවිධත්වය මත වෙනස්කම් නොකරන සේවා යෝජකයෙකි. සියලු ව්‍යවස්ථාපිත හා වෙනත් අවශ්‍යතාවයන්ට අනුකූලව එකම රැකියා කාණ්ඩ සඳහා එකම ප්‍රතිලාභ කාණ්ඩයන් සඳහා සුදුසුකම් ලබන දෙපාර්ශවයටම නායකත්වය දෙන පිරිමින් සහ කාන්තාවන් අතර වෙනස් කොට සැලකීමකින් තොරව ප්‍රතිලාභ සමානව (1: 1) ලබා දෙන ප්‍රතිපත්තියක් සමඟ කටයුතු සිදු කරන ලදී. සංස්ථාව කිසිදු භේදයකින් තොරව වයස අවුරුදු 18 ට වැඩි සේවකයින් පමණක් බඳවා ගනු ලබයි.

වර්ෂය තුළ සංස්ථාව අපගේ ශ්‍රම බලකායට සේවකයින් 56 දෙනෙකු බඳවා ගන්නා ලදී.

## උසස්වීම්

අපගේ සේවකයින්ගේ අපේක්ෂාවන් සහ වෘත්තීය ප්‍රගතිය ඉහළ නැංවීමට උපකාරී වන සිරස් සහ පාර්ශ්වික වෘත්තීය චලනය සඳහා පහසුකම් සැලසීම සඳහා අපගේ උසස්වීම් ප්‍රතිපත්ති සැලසුම් කර ඇත. සියලුම උසස්වීම් සිදු කිරීම කුසලතා සහ කාර්ය සාධනයමත පදනම්ව කර ඇති බව සහතික කිරීම සඳහා විස්තීරණ මාර්ගෝපදේශ මාලාවකින් ප්‍රතිපත්තිය සමන්විත වේ.

## පුහුණුව සහ සංවර්ධනය

සෑම මට්ටමකම සේවකයන්ගේ කාර්ය සාධනය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ පුහුණු කිරීම් සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය කිරීම් සිදු කරයි. සංස්ථාවේ වාර්ෂික පුහුණු හා සංවර්ධන සැලැස්ම පැවරී ඇති කාර්යයේ කාර්යක්ෂමතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

කොවිඩ් -19 ව්‍යාප්තිය හේතුවෙන් මුහුණ දෙන සීමාවන් සහ අභියෝග පුහුණු හා සංවර්ධන අවස්ථා සීමා කළද, සංස්ථාව විසින් රැකියා පුහුණුව ඇතුළු අභ්‍යන්තර පුහුණු වැඩසටහන් මෙන්ම ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා තාක්ෂණික සහ මෘදු කුසලතා වලින් සන්නද්ධ කිරීම හා කාර්ය සාධනය සහ වෘත්තීය දියුණුව සඳහා බාහිර ව්‍යුහගත පුහුණු වැඩසටහන් ද සපයන ලදී. වෘත්තීය දියුණුව සඳහා අදාළ සේවක මට්ටම් සඳහා නායකත්ව පුහුණුවක් ද ලබා දෙන අතර එමඟින් සංස්ථාව වඩා හොඳ තත්ත්වයකට මඟ පෙන්වනු ඇත.


ප්‍රධාන කාර්යාලයේදී පුහුණුව

සංස්ථාව විසින් 2020 වසර තුල පුහුණු වැඩසටහන් හරහා දැනුම යාවත්කාලීන කිරීමට රු. මිලියන 4.47 ක ආයෝජනයක් කර ඇත. මෙම පුහුණුව ඵලදායිතාව ඉහළ නැංවීම, පාලනය ශක්තිමත් කිරීම, වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ අනුකූලතා සංස්කෘතියක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. වසංගතය සඳහා විසඳුම් සැපයීමේදී බොහෝ අභියෝග සඳහා මුහුණ දීමට සිදුවිය.


මූල්‍ය කාර්යමණ්ඩලය සඳහා පුහුණුව

සංස්ථාවේ මෙහෙයුම් විශිෂ්ටත්වයට හේතු විය හැකි ඔවුන්ගේ දැනුම සහ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා විදේශීය විශ්ව විද්‍යාල සහ ආයතන ඇතුළුව උසස් අධ්‍යාපන අවස්ථා සඳහා සේවකයින් සඳහා මාර්ග සංස්ථාව ප්‍රවර්ධනය කරයි. මෙම කාර්යය සඳහා, සංස්ථාව විසින් ශාස්ත්‍රපති උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හැදෑරීමට කිරීමට මූල්‍ය ආධාර සපයයි.

වාර්ෂික කාර්ය සාධන ඇගයීම් සිදු කර එහි ප්‍රතිඵලය සේවකයින්ට දැනුම් දෙනු ලැබේ. වර්ෂය තුළ ලබා ඇති ජයග්‍රහණ ද වාර්ෂික ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

## සදාචාරාත්මක හැසිරීම සහ අනුකූලතාව

අඛණ්ඩතාව සහ වෘත්තීයභාවය මූලික වන අතර සංස්ථාව සංස්කෘතියට ආවේණික වූ අපගේ සියලුම සේවකයින් තුළ අගයන් සහ වටිනාකම් ගොඩනැගීමට සංස්ථාව උත්සාහ කරයි. ඵලදායිතාව සහ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා සංස්ථාව විසින් පුහුණු කිරීම් සහ දේශන අඛණ්ඩව ලබා දෙන ලදී. සංස්ථාව අල්ලස් සහ දූෂණය සම්බන්ධයෙන් ශුන්‍ය ඉවසීමේ ප්‍රවේශයක් ගනී. සංස්ථාව අවධාරනය කරන්නේ අපගේ සියලුම සේවකයින් ඔවුන්ගේ සියලුම ව්‍යාපාරික ගනුදෙනු සහ නිල මට්ටමින් පවත්වාගෙන යන සබඳතාවලදී වෘත්තීයමය වශයෙන්, සාධාරණව සහ අවංකව කටයුතු කරන ලෙසයි.

රටේ වගකිවයුතු ක්‍රමෝපාය ව්‍යාපාරයක් ලෙස සංස්ථාව සියළුම කම්කරු සහ අනෙකුත් නීතිරීති සහ රෙගුලාසි වෙත අනුගත වී ක්‍රියා කරයි. කිසිදු භේදයකින් තොරව වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන් බඳවා ගනු ලබයි. වගකීම් සහ ආචාරධර්ම රැක ගනු වස් ළමයින් සේවයේ යෙදවීම, ශ්‍රමය බලෙන් ගැනීම හෝ අනිවාර්ය සේවය සිදු කරනු නොලබයි.

## විශ්‍රාම ගැනීම

ආයතනය තුළ දක්ෂතා රඳවා තබා ගැනීම ශක්තිමත් කණ්ඩායමක් ගොඩනැගීමේ වැදගත් අංගයක් වන අතර, රැකියා මට්ටම්වල සෑම තරාතිරමකම ඉහළ මට්ටමේ සේවක රඳවා තබා ගැනීමක් අප දිගටම කරගෙන යන බව පෙන්වීමට හැකිවීම පිලිබඳව ආඩම්බර වෙමු. කොවිඩ් -19 නිසා ඇති වූ අහිතකර තත්වයන් යටතේ වුවද කිසිදු සේවකයෙක් රැකියාවෙන් ඉවත් නොකළ බවට අපි සහතික වෙමු.

මෙම වසර තුළදී, විශ්‍රාම ලැබීම, මරණයට පත්වීම, ඉල්ලා අස්වීම සහ සේවයෙන් පහ කිරීම වැනි කරුණු මත සේවකයන් 97 ක් සේවය අවසන් කරන ලදී.

| විශ්‍රාම ගැනීම් / මරණ / ඉල්ලා අස්වීම් | | | |
|---|---|---|---|
| කාණ්ඩය | පිරිමි | ගැහුණු | එකතුව |
| වයස 18-30 | - | - | - |
| වයස 31-40 | 1 | - | 1 |
| වයස 41-50 | 4 | - | 4 |
| වයස 51-60 | 83 | 9 | 92 |
| **එකතුව** | **88** | **9** | **97** |

## සෞඛ්‍යය සහ ආරක්ෂාව

ඛනිජ තෙල් නිෂ්පාදනවල ස්වාභාවයෙන්ම පවත්නා ගිනි ගන්නා සුළු ආවේනික ස්වභාවය හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මඟින් සෞඛ්‍ය හා ආරක්ෂාවට අවදානමක් පවතින අතර සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානමට බෙහෙවින් නිරාවරණය වන ඛනිජ තෙල් නිෂ්පාදනවල ගිනි අවුලුවන ස්වභාවය තුල අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම අපගේ ප්‍රමුඛතම කාර්යභාරය විය. ජාත්‍යන්තරව පිළිගත් සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිතීන් සහ සේවකයන් මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් ආරක්ෂා කිරීමට හැකි වන පරිචයන් අනුගමනය කරන සේවකයින් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂිත පරිසරයක් පවත්වා ගැනීමට සෑම උත්සාහයක්ම ගන්නා ලදී.

පිරිපහදුව සලකා බැලීමේදී ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර සුළු හා ප්‍රධාන උපද්‍රව වළක්වා ගැනීම සඳහා සැලසුම්ගත ව්‍යුහගත පද්ධති පිහිටුවා ඇත. පිරිපහදුවෙහි සියලුම සේවකයන්ට සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ පුහුණුව ඇතුළුව ආරක්ෂිත පුහුණු නිසි පරිදි ලබාදෙනු ලැබිණි. " මාසයේ විශේෂිතම පුද්ගලයා" සම්මානය ඇතුළුව අතීතයේ දී මෙන් මුදල් සම්මාන සහිත ඉලක්ක පදනම් කරගත් ආරක්ෂිත සම්මාන යෝජනා ක්‍රමය දිගටම පැවතුනි. පිරිපහදුව සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා නිත්‍ය ආරක්ෂිත විගණන, පරීක්ෂණ සහ හොඳ තත්වයක් තබා ගැනීමේ සමීක්ෂණ සිදු කරන ලදී. වසරේ සෑම කාර්තුවකදීම මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණ ආරක්ෂණ රැස්වීම් පවත්වන ලදී.

කොවිඩ් -19 වසංගතය 2020 වර්ෂය තුළ අමතර සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති කළේය. වසංගතය අතරතුර ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට සහ කාර්ය මණ්ඩලය ආරක්ෂා කිරීමට පිරිපහදුව සහ ප්‍රධාන කාර්යාලය යන දෙකටම විශේෂ කොවිඩ් -19 පාලන කමිටු පිහිටුවන ලදී. අගුලු දැමීමේ කාල සීමාව තුළ දැඩි සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ යටතේ සංස්ථාව අවම කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් සමඟ ක්‍රියාත්මක විය.

කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව අපගේ මූලික අවධානය යොමු කරන බැවින් මෙම කාලය තුළ වාර්තා කළ සේවකයින් සඳහා කාර්යාල ප්‍රවාහන පහසුකම් සපයන ලදී. රජය විසින් මෙහෙයවනු ලබන පරිදි, ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම රටට අත්‍යවශ්‍ය සේවාවක් බැවින් සංස්ථාව මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂිත පිළිවෙත් සහතික කරමින් කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පයක් ද සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

| පිරිපහදුවේ සෞඛ්‍ය හා ප්‍රවේසම් | | |
|---|---|---|
| සෞඛ්‍ය හා ප්‍රවේශම් | 2020 | 2019 |
| අනතුර හේතුවෙන් සේවය අහිමි වීම | - | - |
| ප්‍රථමාධාර අනතුරු | - | 7 |
| වාර්තා වූ සුළු ගිනි ගැනීම් | - | - |

## සුභසාධනය

සංස්ථාවට පක්ෂපාතී සහ සම්බන්ධිත සේවකයින් ගොඩනැගීම සඳහා කාර්ය මණ්ඩල සුභසාධනය ඉතා වැදගත් වන අතර සේවකයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට එය ඉවහල් වේ. සෞඛ්‍ය සම්පන්න සහ කැපවූ ශ්‍රම බලකාය සහතික කිරීම සඳහා සුභසාධන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

කොවිඩ් -19 වසංගතයේ බලපෑම හේතුවෙන් 2020 වර්ෂය සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු විශේෂ වසරක් විය. වසංගත කාලසීමාව තුළ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ යහපැවැත්මට සහ ජීවනෝපාය නංවාලීමට සංස්ථාව විසින් කාර්ය මණ්ඩල ප්‍රවාහනය, රාජකාරී සහ පුද්ගලික භාවිතය සඳහා විෂබීජනාශක, ණය පියවීම් කල්දැමීම යනාදී විවිධ පහසුකම් සපයන ලදි.

සියලුම සේවකයන්ට ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ සංස්ථාවට ඔවුන්ගේ දායකත්වය හඳුනා ගැනීමට සහනදායී පොලී අනුපාත යටතේ ණය යෝජනා ක්‍රම ගණනාවක් ලබා දෙන ලදී. සංස්ථාව විසින් වසර තුළ ණය සහ අත්තිකාරම් පහසුකම් ගණනාවක් ලබා දී ඇත.

රාජකාරී දිවිය සහ සාමාන්‍ය දිවිය සමබර කිරීම සඳහා මෙන්ම සේවකයන්ගේ සේවය ඇගයීම සඳහා සංස්ථාව සේවකයින්ගේ දරුවන්ට සිය දායකත්වය ලබා දෙන ලදි. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට තේරුණු දරුවන් ආදී අධ්‍යාපනික ජයග්‍රහණ කරා ළඟා වූ දරුවන් සඳහා මෙම වැඩසටහන යටතේ නව ශිෂ්‍යත්ව 36ක් ලබා දෙන ලදී.



ශිෂ්‍යත්ව ප්‍රදානය

සේවකයන් සහ සේවකයාගේ පවුලේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව සහතික කිරීම සහ යහපැවැත්ම පවත්වා ගෙන යාමේ අරමුණින් වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

කාර්ය මණ්ඩලය අතර ආත්මීය හා අධ්‍යාත්මිකත්වය වැඩි දියුණු කිරීම සඳහා සංස්ථාව ජනවාරි මාසයේදී පිරිත් සහ දානමය පිංකමක් සංවිධානය කළේය. සියලුම ආගමික සේවකයන්ට තම ආගමට අනුව වන්දනාමාන කිරීමට අවස්ථාව සලසා දී ඇත.

අවදානම් රහිත පරිසරයක් පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂාව පවත්වා ගැනීමට අදාළ සේවකයින් සඳහා නිල ඇඳුම් ලබා දෙනු ලැබේ.

## සේවක කටයුතු

අපගේ සේවකයින් සංස්ථාවේ ක්‍රියාන්විතය කෙරෙහි බලපෑමක් ඇති කරමින් නිරතව සිටිනු ඇතැයි අපි අපේක්ෂා කරන අතර අපගේ සංස්කෘතියට එය සම්බන්ධ වී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ කොවිඩ් -19 වසංගතය හේතුවෙන් මතු වූ අභියෝගාත්මක තත්වයන් යටතේ ක්‍රියාත්මක වීමට ඉහළ මට්ටමේ සේවක නියැලීම ප්‍රධාන අංගයක් විය.විවිධ ක්‍රමවේද හරහා විධිමත් සන්නිවේදනයක් සහතික කරමින් රට අගුලු දැමීමේ කාලය තුළ සංස්ථාව විසින් අපගේ සේවකයින් සමඟ නිරන්තර සංවාදයක් පවත්වා ගෙන යන ලදි. වසංගතය අතරතුර කාර්යන් කළමනාකරණය කිරීමේ කොටසක් ලෙස, එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීමට සහ මෙහෙයුම් වාර්තා සැකසීම් සංස්ථාවේ ක්‍රියා පටිපාටිවලට අනුකූලව නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය පහසු කිරීම සඳහා විවිධ මෙවලම් හඳුන්වා දී ඇත.



මූල්‍ය කාර්යමණ්ඩලයේ බාහිර පුහුණුව

රාජකාරී දිවිය සහ සාමාන්‍ය දිවිය සමතුලිත කිරීම සඳහා ක්‍රීඩා කටයුතු වල නිරත වීමට සංස්ථාව දායකත්වය ලබා දෙයි.

## කාර්මික සබඳතා සහ අනුකූලතාව

ව්‍යාපාර මෙහෙයුම්වල අඛණ්ඩ පැවැත්ම සඳහා කාර්මික සබඳතා අත්‍යවශ්‍ය සාධකයක් වේ. කාර්මික සම්බන්ධතාවය සේවකයින්, මුදල් සහ ද්‍රව්‍ය ඵලදායී ලෙස භාවිතා කිරීමට උපකාරී වේ. සංස්ථාවේ මෙහෙයුම් උපාය මාර්ග සමඟ කාර්මික සබඳතා ගැලපීමට සංස්ථාව ක්‍රියා කරයි. සංස්ථාව වෙළඳපල ප්‍රමුඛයා වන බැවින්, සංස්ථාවේ සුමට ක්‍රියාකාරිත්වය සහ අඛණ්ඩ පැවැත්ම සඳහා හොඳ සම්බන්ධතාවයක් සහතික කිරීමට සංස්ථාව කාර්මික සබඳතා මනා ලෙස පවත්වාගෙන යනු ලබයි.

සේවකයන් විසින් පිහිටුවාගෙන ඇති සෑම වෘත්තීය සමිතියක්ම සංස්ථාව විසින් පිළිගනු ලබයි.  සංස්ථාව එවැනි වෘත්තීය සමිතිවල ප්‍රයෝජනවත් නිර්මාණාත්මක මතයන්  සංවාද සහ හැසිරීම් පිළිගනු ලබන අතර,  වෙනත් පාර්ශවයන්ට ද වැඩදායී වන ලෙස ඔවුන් සමඟ කාර්මික සබඳතා පවත්වයි.

සියලුම සේවකයන්ට සේවක අවශ්‍යතා අනුව වෘත්තීය සමිතිය සමඟ එක්වීමේ නිදහසක් ලබාදී තිබෙන අතර අඛණ්ඩ මෙහෙයුම් සහතික කිරීම සඳහා සංස්ථාව සියලුම වෘත්තීය සමිති සමඟ සුහද සබඳතාවක් පවත්වයි.

සේවකයන්ගේ අවශ්‍යතාවය අනුව ඕනෑම වෘත්තීය සමිතියකට සම්බන්ධවීමේ නිදහස ලබා දී ඇත.  2020.12.31 වන විට ලියාපදිංචි වෘත්තීය සමිති අටක් පැවති අතර, බාධාවකින් තොරව ආයතනයේ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමට සෑම වෘත්තීය සමිතියක් සමඟම අපක්ෂපාතිව කටයුතු කරයි.

සේවක ගැටළු අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් ආමන්ත්‍රණය කිරීම සහතික කිරීම සඳහා සංස්ථාව වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ සමීපව සම්බන්ධ වන අතර සියලුම මෙහෙයුම් වෙනස්කම් ප්‍රමාණවත් කාලරාමුවක් තුල දැනුම් දෙනු ලැබේ. වර්ෂය තුළ කාර්මික ක්‍රියාකාරකම් වාර්තා වී නොමැත.

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

***කොවිඩ් -19 පැතිරීම සම්බන්ධයෙන් අපගේ ඵලදායී ප්‍රතිචාරය තුලින් ව්‍යාපාරික හවුල්කරුවන් සහ ප්‍රජාව ඇතුළු අපගේ පාර්ශවකරුවන් සමඟ සබඳතා මනා ලෙස පුළුල් කිරීමට සංස්ථාව හට හැකියාව ලැබී ඇත. මෙම කාල සීමාව තුළ සුවිශේෂී අභියෝගවලට මුහුණ දෙමින් ඛනිජ තෙල් බෙදාහැරීමේ පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂිත ආකාරයෙන් අඛණ්ඩව නිෂ්පාදන සැපයීම සඳහා අපි අපගේ පිරවුම්හල් සමඟ සමීපව කටයුතු කළෙමු. සංස්ථාවේ ආදායම පහත වැටුණද, බදු සහ තීරු බදු වශයෙන් රු. බිලියන 152 ක් මෙම වසරේ රජයට දායකත්වය ලබාදෙන ලදී.***

**152.31**
රජයට දායකත්වය
*(රු. බි.)*

**1,533**
ඉන්ධන ආනයන පිරිවැය
*(USD මි.)*

**102**
ප්‍රසම්පාදන ගණන

**1,667**
බොරතෙල් ආනයන
*(000 MT)*

**2.12**
භූමිතෙල් සහනාධාරය
*(රු. බි.)*

SDGs සඳහා අපගේ දායකත්වය



පාර්ශවකරුවන් සමඟ ඵලදායී සබඳතාවයක් මගින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සිදුවේ. මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුකරුවන්, බොරතෙල් සහ නිමි නිෂ්පාදන සැපයුම්කරුවන්, නැව් සමාගම්, දේශීය සැපයුම්කරුවන්, බෙදුම්කරුවන් වැනි ක්‍රමෝපායික පාර්ශවයන් සමඟ සංස්ථාව ඉතා සුහද සම්බන්ධතාවයක් පවත්වයි.

ශ්‍රී ලංකාව ඛනිජ තෙල් සම්පතක් නොමැති රටක් බැවින් සියලුම ඛනිජ තෙල් නිෂ්පාදන බාහිර මූලාශ්‍රවලින් ලබාගත යුතුය. පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියක් සහතික කිරීම සඳහා මනාව නිර්වචනය කරන ලද ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ. තොග අවශ්‍යතාවය, ගුණාත්මකභාවය සහ පහසුවෙන් ලබා ගත හැකි නිෂ්පාදන ලබාදීම වැනි කාර්යයන් සඳහා තොග සමාලෝචන කමිටුව සෘජුවම දායක වේ.

ඉරානය වෙත සම්බාධක පැනවීමත් සමඟ සංස්ථා පිරිපහදුව "මර්බන්" නැමති බොරතෙල් වර්ගය භාවිතයට යොමු වූ අතර එය වැඩි ඵලදාවකින් යුත් ඇව්තෙල් වැනි අතුරු නිෂ්පාදන අවම වන වඩා ඵලදායී බොර තෙල් වර්ගයක් ලෙස හඳුන්වා දිය හැකියි.

## ඛනිජ තෙල් ආනයනය

ශ්‍රී ලංකාවට මේ දක්වා භාවිතයට ගතහැකි ඛනිජ තෙල් නිධි නොමැති බැවින්, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන අංශයන්ගෙන් එකක් පිළිබිඹු කරයි. රජය මගින් හඳුන්වා දී ඇති ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම තුළින් ප්‍රසම්පාදන සඳහා වඩාත් විනිවිදභාවයක් ලබා දෙමින් ගුණාත්මක නිෂ්පාදන ආනයනය කිරීමට හොඳම සැපයුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමෙන් සංස්ථාව විසින් බොර තෙල් හෝ නිමි නිෂ්පාදන ලෙස ඛනිජ තෙල් නිෂ්පාදන මෙරටට ආනයනය කරනු ලබයි.

සපුගස්කන්ද පිරිපහදුවෙහි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සංස්ථාව විසින් වර්ෂය තුළ මර්බන් බොරතෙල් මෙට්‍රික් ටොන් 1,666,807 (2019 -මෙට්‍රික් ටොන් 1,842,737) ක ප්‍රමාණයක් බොරතෙල් නැව්ගත කිරීම් 18 ක් මගින් ආනයනය කරන ලදී.

| ඛනිජ තෙල් ආනයනය | | |
|---|---|---|
| වර්ගය | 2020 USD මි. | 2019 USD මි. |
| බොරතෙල් | 583.34 | 970.70 |
| පිරිපහදු කරන ලද නිෂ්පාදන | 949.83 | 1,858.41 |
| **එකතුව** | **1,533.17** | **2,829.11** |

රටේ ඛනිජ තෙල් නිෂ්පාදන අවශ්‍යතාවයෙන් 30% ක ප්‍රමාණයක් පමණක් පිරිපහදුවෙන් නිෂ්පාදනය වන බැවින් ඉතිරි අවශ්‍යතාවය නිමි නිෂ්පාදන ලෙස සෘජුවම ආනයනය කරනු ලැබේ. සංස්ථාව විසින් ඉහත සඳහන් කළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ඩොලර් මිලියන 949.83 (2019 දී ඩොලර් මිලියන 1,858) (DAP පදනම) වටිනා පිරිපහදු කළ නිෂ්පාදන රටට ආනයනය කරන ලදී. ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම සහ කොවිඩ්-19 බලපෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීමෙන් විදේශ විනිමය වියදම 45.81% කින් අඩුවී ඇත.


| ඛනිජ තෙල් නොවන ප්‍රසම්පාදන | | |
|---|---|---|
| ප්‍රසම්පාදන කාණ්ඩය | අවසන් කරන ලද ප්‍රසම්පාදන ගණන | වටිනාකම (රු.මි.) |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | 101 | 161 |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | - | - |
| කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව | 1 | 286 |
| **එකතුව** | **102** | **447** |

ප්‍රසම්පාදන සඳහා වඩාත් විනිවිදභාවයක් ලබා දෙමින් සහ හොඳම තත්ත්වයේ නිෂ්පාදන සහ සේවාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා සියලුම ඛනිජ තෙල් නොවන දේශීය හා ජාත්‍යන්තර ප්‍රසම්පාදන රජය විසින් ස්ථාපිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවලට අනුව සිදු කරනු ලබයි. තිරසාර පරිභෝජනය සඳහා නිෂ්පාදනයේ/සේවාවේ අවශ්‍යතාවය, අදාළත්වය, ගුණාත්මකභාවය සහ මිල තක්සේරු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු පත් කර ඇත.

## රජයේ දායකත්වය

සංස්ථාව විසින් යටිතල පහසුකම් සංවර්ධනය සහ ආර්ථික කටයුතු සඳහා යොදා ගන්නා රජයේ බදු ආදායමට විශාලතම බදු දායකයන්ගෙන් එක් ආතනයකි. මෙම වසර තුළ සංස්ථාව විසින් රු. මිලියන 152,311 ක් දායක වී ඇති අතර එය සංස්ථාවේ ශුද්ධ ආදායමෙන් 29.35% කි. කොවිඩ් -19 බලපෑම හේතුවෙන් ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල අඩුවීම් සැලකිල්ලට ගනිමින් රජය විසින් අමතර බදු පැනවූ අතර ඒ මගින් රජයට වැඩි බදු ආදායමක් ජනනය විය.

රජය විසින් වර්ෂය තුළ පෙට්‍රල් සහ ඩීසල් ආනයනය සඳහා රේගු ආනයන බදු (CID) වැඩි කළ අතර CID දායකත්වය 105% කින් වැඩි විය. ජාත්‍යන්තර තෙල් මිල සීඝ්‍ර ලෙස පහත වැටීමට සමගාමීව 2020 මාර්තු මාසයේදී අධිභාර බද්දක් පනවා ඇත. කෙසේ වෙතත්, දෙවන හා තුන්වන කාර්තුවල ජාත්‍යන්තර තෙල් මිල ඉහළ යාමට සමගාමීව රජය මෙම රේගු ආනයන බදු හා අධිභාර බද්ද අඩුවන ලෙස සංශෝධනය කළේය.




ආනයන අඩුවීම සහ ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල අඩුවීම නිසා නිෂ්පාදන බදු සහ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු (PAL) දායකත්වය පිළිවෙලින් 15% සහ 40% කින් අඩුවීමට හේතු විය. වැට් බදු අනුපාතය 15% සිට 8% දක්වා අඩු කිරීම හේතුවෙන් එකතු කළ අගය මත බදු දායකත්වයද අඩු විය.

ඉහත සියලු සංශෝධන සහ බලපෑම් සමඟ, 2019 ට සාපේක්ෂව මුළු බදු සහ තීරුබදු දායකත්වය 20% කින් වැඩි වී ඇත.

## ව්‍යාපාර හවුල්කාරිත්වය

පිරවුම්හල් 1,322 කින් සමන්විත දීප ව්‍යාප්ත පුළුල් අලෙවි නියෝජිත ජාලය සාමාන්‍ය ජනතාවට නිෂ්පාදන ලබාගැනීමේ හැකියාව සහතික කරයි. සංස්ථාව විසින් වෙළඳපල කොටසෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වා ගෙන යන බැවින් බලශක්ති සුරක්ෂිතතාවය පිළිබඳ අපගේ ප්‍රධාන වගකීම සාමාන්‍ය ජනතාව වෙත ඉටු කිරීම සඳහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සුහද ව්‍යාපාරික සබඳතාවක් පවත්වා ගැනීම අපගේ මූලික කාර්යයි. පිරවුම්හල් ගුණාත්මක නිෂ්පාදන සඳහා අපේක්ෂිත මට්ටමේ ප්‍රමිතීන් සමඟ පවත්වාගෙන යාම සඳහා දැඩි මාර්ගෝපදේශක ක්‍රියා පටිපාටි සහ පාලනයන් ක්‍රියාත්මක කර ඇත.

**පළාත් පිරවුම් හල්**

| පළාත | පිරවුම්හල් ගණන |
|---|---|
| බස්නාහිර | 320 |
| වයඹ | 187 |
| උතුරු මැද | 84 |
| මධ්‍යම | 107 |
| උතුර | 186 |
| දකුණ | 148 |
| ඌව | 55 |
| නැගෙනහිර | 152 |
| සබරගමු | 83 |
| **එකතුව** | **1322** |

## ව්‍යාපාර හවුල්කරුවන් සඳහා සහාය

කොවිඩ් -19 වසංගතය සමඟ සියලු ව්‍යාපාරික අංශ පීඩාවට පත් වූ බැවින්, අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් ද වසර තුළ බොහෝ අභියෝගවලට මුහුණ දෙන ලදි. කොවිඩ් -19 ව්‍යාප්තිය අතරතුර ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාමට සහ ව්‍යාපාරයේ පැවැත්ම ආරක්ෂා කිරීම සහ සහතික කිරීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාර නැවත වසංගතයට පෙර මට්ටමට පුනර්ජීවනය කිරීමට උපකාර කිරීම සඳහා සංස්ථාව අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට විවිධ ප්‍රතිලාභ ලබා දෙන ලදි. අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් ආරක්ෂා කිරීම සඳහා විවිධ නිෂ්පාදන ණය යෝජනා ක්‍රම, විවිධ ගාස්තු ඉවත් කිරීම යනාදිය ලබා දී ඇති අතර, කොවිඩ් -19 බලපෑම නිසා පසුකාලීනව ආර්ථිකය යළි ගොඩනැගීම සඳහා රජය දරන ප්‍රයත්නයන් සඳහා සහාය දැක්වීමට අපි කැපවී සිටිමු.

## කොවිඩ් -19 සඳහා දෙන ලද සහන

වගකිවයුතු ආයතනයක් වන අපි අපගේ පාර්ශවකරුවන්ගේ ජීවනෝපාය නංවාලීම සඳහා සහන සැලසීමට සැමවිටම කැපවී සිටිමු.

### සමාජය

- රජයට සහ අනෙකුත් ආයතනවලට අත් පිරිසිදුකාරක ද්‍රව්‍ය සහ පිරිසිදු කිරීමේ දියර පරිත්‍යාග කිරීම.
- කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට රුපියල් මිලියන 5.4ක් පරිත්‍යාග කරන ලදි.

### ව්‍යාපාර හවුල්කරුවන්

- විවිධ නිෂ්පාදන ණය යෝජනා ක්‍රම ලබා දීම.
- විවිධ ගාස්තු අත්හැරීම.
- සෞඛ්‍ය සහ ආරක්ෂිත මෙහෙයුම් සඳහා අඛණ්ඩ මග පෙන්වීම.

### සේවකයන්

- අත් සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ දියර සැපයීම.
- ප්‍රවාහන පහසුකම් සැපයීම.
- අප්‍රේල් සහ මැයි මාසවල කාර්ය මණ්ඩල ණය වාරික සහ පොළිය කල් දැමීම.

## නිෂ්පාදන වගකීම

අපගේ නිෂ්පාදන හා සම්බන්ධව ගිනිගැනීම් සහ ආරක්ෂිත අවදානම් වල ආවේනික ස්වභාවය නිසාවෙන්, නිෂ්පාදන වගකීම සැම විටම පාරිභෝගිකයාට ගුණාත්මක ප්‍රමිතිගත නිෂ්පාදනයක් සහතික කිරීම සඳහා අපගේ මූලික අවශ්‍යතාවලින් එකකි. ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ආරම්භ වී, නිෂ්පාදන මෙහෙයවීම, බෙදාහැරීම, ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම යන සමස්ථ ක්‍රියාවලිය පුරාම තත්ව පරීක්ෂාව අධීක්ෂණය කරයි.

නිෂ්පාදන සේවදායකයාගේ අතට පත්වන අවස්ථාවේදී ද විශේෂ අධීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කරන අතර, නිසි ක්‍රියාපටිපාටිය සහ භාවිතය අනුගමනය කරමින් නිවැරදි කිරීමේ යාන්ත්‍රණයක් ද ක්‍රියාත්මක කරයි. ගිනි උවදුරුවලින් ආරක්ෂා වීම සඳහා ආරක්ෂක පද්ධති ක්‍රියාත්මක වන අතර ගිනි නිවන යන්ත්‍ර සියලු පිරවුම්හල්වල තිබෙන බව සහතික කිරීම සඳහා අඛණ්ඩ සමාලෝචනයක් සිදු කෙරේ.

අධීක්ෂණ පද්ධතිය හරහා පිරවුම්හල් වල හඳුනාගත් අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා ඉන්ධන පිරවුම්හල් 12 සඳහා ක්ෂණික නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී. භූමිතෙල් අවභාවිතා කරනු ලබන අවස්ථා හඳුනාගෙන ගුණාත්මකභාවයෙන් යුත් නිෂ්පාදන පරිභෝජනය සඳහා ලබා දීමට සියළු පරිශ්‍රමයන් ගෙන ඇත.

කොවිඩ් -19 යටතේ විවිධ පළාත් වලින් අහඹු ලෙස තෝරා ගනු ලබන පිරිවුම්හල් අධීක්ෂණ කණ්ඩායමක් විසින් පරීක්ෂා කරමින් ක්‍රියාපිළිවෙල උල්ලංඝනය කරමින්, අනාරක්ෂිත භාවිතයන් අනුගමනය කරමින්, පරිශ්‍රය තුළ අනතුරුදායක පරිසරයක් පවතීද යන්න හසුකර ගනිමින් වඩා යහපත් ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා විගණනයන් සිදු කරයි.

ශ්‍රී ලංකාව තුළ තහනම් කර ඇති කිසිදු නිෂ්පාදනයක් සංස්ථාව අලෙවි නොකරයි. මෙරටට ග්ලයිෆොසේට් ආනයනය කර බෙදා හැරීමට ඇති එකම බලයලත් නියෝජිතයා ලෙස සංස්ථාව විසින් නියාමකයින් සහ අධිකාරීන් විසින් අනුමත කරන ලද සහ මහපෙන්වීම යටතේ අනුමත කෘෂිකාර්මික ප්‍රදේශවලට සහ ආයතනවලට පමණක් ග්ලයිෆොසේට් ආනයනය කර අලෙවි කරන ලදී.

## අධ්‍යාපනය සඳහා සහාය ලබාදීම

ශ්‍රී ලංකාවේ එකම පිරිපහදුව ලෙස, ශ්‍රී ලංකා ආර්ථිකයට අගය එකතු කිරීම පිණිස දේශීය ශිෂ්‍යයන් වෙත පිරිපහදුවේ පුහුණු අවස්ථා සලසා දෙයි. ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ පුහුණුව ලැබූ ඛනිජ තෙල් ඉංජිනේරුවන් හා ශ්‍රමිකයන් වෙත ලොව පුරා ඉහළ ඉල්ලුමක් ඇති බැවින් සංස්ථාව ආර්ථිකයට වටිනාකමක් ඇති කිරීමට හැකි උපරිම පුහුණු අවස්ථා සලසා දීමට සංස්ථාව නොපැකිළිව ඉදිරිපත් වී ඇත.

මෙරට විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යාපනික ආයතන වලින් පුහුණු අවස්ථා ඉල්ලුම් කරන දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත මූල්‍ය, තොරතුරු තාක්ෂණය, මානව සම්පත් කළමනාකරණය ආදී අංශවලට අයත් කාර්මික පුහුණු අවස්ථා ද සංස්ථාව විසින් ලබා දෙයි.

## ප්‍රජා සම්බන්ධතා

අදාළ ප්‍රජාවන් සමග යහපත් සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම අපගේ ප්‍රවේශයයි. අපගේ බෙදාහැරීම් ජාලය පිරිවුම්හල් 1,322 දක්වා පැතිර ඇති අතර, එමගින් 15,000 ට වැඩි සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සපයයි. මීට අමතරව, ප්‍රජාවගේ ආර්ථික ප්‍රගතිය සඳහා උපකාර වන දහස් ගණන් රැකියා අවස්ථා නිර්මාණය කරන කෘෂි, ලිහිසි තෙල් තොග බෙදුම්කරුවන් අප සතුව ඇත.

බෙදුම්කරුවන් සහ ගබඩාකරුවන් අවසාන පාරිභෝගිකයන් සමඟ පාරිභෝගික සබඳතා ගොඩනඟන පාර්ශවය බැවින් පාරිභෝගිකයන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම සඳහා පාරිභෝගික සබඳතා පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට බෙදුම්කරුවන්ට පුහුණු අවස්ථා සපයනු ලැබේ.

ගුණාත්මක නිෂ්පාදනයක් සාධාරණ මිලකට ලබා ගැනීමේ හැකියාව සහ එම නිෂ්පාදන වෙත පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ලබාදීම තුළින් ප්‍රජාව සමඟ මනා සෘජු හා වක්‍ර සබඳතා ඇති කරයි.

## භූමිතෙල් සහනාධාරය

සංස්ථාව ශ්‍රී ලංකාවේ භූමිතෙල් සඳහා එකම සැපයුම්කරු වේ. අඩු ආදායම්ලාභී පවුල් සහ ධීවර ප්‍රජාව තම දෛනික බලශක්ති අවශ්‍යතා සඳහා භූමිතෙල් පරිභෝජනය කරති. භූමිතෙල් මිල විකුණුම් මිල පිරිවැයට වඩා අඩු බැවින් සංස්ථාව විසින් සැලකිය යුතු අලාභයක් දරමින් 2018 ජූනි මාසයේ සිට ලීටරයකට රුපියල් 70/- බැගින් භූමිතෙල් ඉතා සහනදායි මිලකට සපයනු ලබයි.

භූමිතෙල් මිල ජනතාවට ඉතා සංවේදී වන අතර අවම බලශක්ති මිල මෙම ජනතාවගේ ජීවන තත්වය පවත්වා ගැනීමට දායක වන බැවින් සහන මිලට භූමිතෙල් අඛණ්ඩව සැපයීම තුළින් සමාජ යහපැවැත්ම සඳහා අප විශාල දායකත්වයක් සපයන බව අපි විශ්වාස කරමු.

අඩු ආදායම්ලාභී පවුල්, ග්‍රාමීය ප්‍රදේශයේ කුඩා පරිමාණ ගොවීන් තම අවශ්‍යතා සඳහා ප්‍රධාන බලශක්ති ප්‍රභවය ලෙස භූමිතෙල් භාවිතා කරයි.

| |
|---|
| වර්ෂය තුළ භූමිතෙල් අලෙවිය ලීටර් මිලියන 221 කි. |
| භූමිතෙල් සහනාධාරය ලීටරයකට රු. 9.60 කි. |
| වසර තුල ලබාදෙන ලද සහනාධාරය රු. මිලියන 2,122 කි. |

බොහෝ ධීවර බෝට්ටු භූමිතෙල් භාවිතයෙන් ක්‍රියාත්මක වන බැවින් අඩු බලශක්ති පිරිවැය ධීවර ප්‍රජාවට අඩු වියදමකින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතර එමඟින් ධීවර ප්‍රජාවට මෙන්ම ශ්‍රී ලාංකීය මත්ස්‍ය පාරිභෝගිකයින්ටද වැඩි ප්‍රතිලාභ අත්වේ.

## සමාජ යහපැවැත්ම

සංස්ථාව අපගේ බෙදාහැරීමේ ජාලය හරහා ශ්‍රී ලංකාවේ ජනතාවට ඔවුන්ගේ ජීවනෝපාය සඳහා ආර්ථික තිරසාර බවක් ලබා දෙමින් සෘජු හා වක්‍ර රැකියා 15000 කට වැඩි ප්‍රමාණයක් සපයනු ලබයි. ඛනිජ තෙල් නිෂ්පාදන බොහොමයක් සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදමට සහ ජීවන තත්ත්වයන්ට ඉතා සංවේදී බව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තේරුම් ගෙන ඇති අතර එබැවින් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පහසුවෙන් ලබාගැනීමට ඇති හැකියාව සහ ආර්ථිකය යහපත් කිරීමට සාධාරණ මිල ගණන් අනුව සැපයීම කෙරෙහි අපගේ ප්‍රධාන අවධානය යොමු වේ.

කෘෂි රසායන අංශය අඩු ආදායමක් උපදවන අංශයක් වූ නමුත්, තරඟකාරී පෞද්ගලික කෘෂි රසායන සමාගම් විසින් ගොවීන්ව සූරාකෑම්වලින් ආරක්ෂා කිරීමේ පාලක පාර්ශවය ලෙසත් ගොවීන් වෙත හොඳ ආර්ථික ප්‍රතිලාභ ලබා දීමටත් සංස්ථාව කෘෂි රසායන වෙළඳපොලේ ක්‍රියාත්මක වේ.

# ස්වාභාවික ප්‍රාග්ධනය



ස්වාභාවික ප්‍රාග්ධනය

*අප ජීවත් වෙමින් පෝෂණය වන්නේ පරිසරයේම වන අතර වායු විමෝචනය අවම කරමින් ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ද අපි අවධානය යොමු කරමු. තිරසාර මෙහෙයුම් සඳහා පරිසරය වෙත තම වගකීම අඛණ්ඩව ඉටු කිරීමට පාරිසරික අවශ්‍යතා ක්‍රමෝපායික ක්‍රියාදාමයට බද්ධ කර ඇත. අපගේ ක්‍රියාකාරකම් සමාජයේ විශාල පිරිසකට බලපාන බැවින් ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහතික කිරීමට සෑම උත්සාහයක්ම ක්‍රියාත්මක වේ.*

**0.25%**
සාමාන්‍ය අලාභය

**0**
අන්තරායකර අණතුරු ගණන

**843**
ජල පරිභෝජනය
(000 *MT*)

**81.989**
ස්වයං පරිභෝජනය
(*000 MT*)

**.493**
විශේෂිත බලශක්ති පරිභෝජන අනුපාතය

SDGs සඳහා අපගේ දායකත්වය



අපගේ මෙහෙයුම් කටයුතුවල තිරසාර බව සහතික කිරීම සඳහා අපි සැමවිටම කැපවී සිටිමු. අපගේ බොරතෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේදී බලශක්තිය සහ ජලය ආවේනිකවම පරිභෝජනය කරන නමුත්, කාබන් විමෝචනය සහ විදුලි පරිභෝජනය අවම කිරීම සඳහා සියලු උත්සාහයන් ගනු ලැබේ. අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා වන අපගේ මෙහෙයුම් සඳහා දැඩි පාලන ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ භාවිතයන් අන්තර්ගත වේ.

## ජල පරිභෝජනය

තෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය වෙත සැලකිය යුතු ප්‍රමාණයක ජලය ප්‍රමාණයක් අවශ්‍ය වේ. කැපී පෙනෙන ප්‍රමාණයක ජල ප්‍රමාණයක් ජලය සුරක්ෂිත කිරීම සහ තිරසාර පරිභෝජන ක්‍රමවේදයක් සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාව නොපැකිලිව ඉදිරිපත් වේ. අප ජලය විධිමත් ලෙස පිරිසිදු කර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බැහැර කිරීම සිදු කරයි.

පිරිපහදුවේ ජල පරිභෝජනය

| | 2020 MT | 2019 MT | අඩුවීම |
|---|---|---|---|
| සංස්ථාවේ ජල පිරිපහදුව මගින් | 672,302 | 706,480 | 4.84% |
| ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මගින් | 171,288 | 220,056 | 22.16% |
| **එකතුව** | **843,590** | **926,536** | **8.95%** |

තෙල් පිරිපහදු ක්‍රියාවලිය සඳහා පිරිපහදුව සැලකිය යුතු ජල ප්‍රමාණයක් පරිභෝජනය කරන අතර කැලණියේ ස්ථාපිත සංස්ථාවේ ජල පිරිපහදුව මගින් පිරිපහදු කර ගන්නා ලදි. ඉතිරි ජලය ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මඟින් ලබා ගන්නා ලදී. ජල සංරක්ෂණය සහ තිරසාර පරිභෝජන රටාවන් සඳහා අපි සැමවිටම කැපවී සිටිමු.

2020 වර්ෂය තුළ කොවිඩ්-19 බලපෑම හේතුවෙන් පිරිපහදුව තුළ සැකසූ බොරතෙල් ප්‍රමාණය අඩුවීම සහ අනෙකුත් පාලන යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමත් සමඟ ජල පරිභෝජනය 8.95% කින් අඩු කිරීමට හැකි විය.

ජාත්‍යන්තරව පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුව අපජලය නිසි ලෙස පිරිසිදු කර බැහැර කරනු ලැබේ.

## බලශක්ති පරිභෝජනය

බොරතෙල් පිරිපහදු කර පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන උත්පාදනය කිරීම සඳහා කිරීම සඳහා සැලකිය යුතු බලශක්තියක් අවශ්‍ය වේ.

පිරිපහදුව විසින් ජනක යන්ත්‍ර මගින් මෙහෙයුම් සඳහා විදුලිය නිපදවන අතර හිඟ ප්‍රමාණය විදුලිබල මණ්ඩලයේ සැපයුම හරහා ලබාගනු ලැබේ. පිරිපහදු විදුලිබල ජනක යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය පහත දක්වා ඇත.

| ජෙනරේටරය | ක්‍රියාකාරී පැය ගණන |
|---|---|
| TG1 | පැය 2,954 |
| TG2 | පැය 6,463 |
| DG1 | පැය 4,674.0 |
| DG2 | පැය 3,880.8 |

පිරිපහදුව විසින් සාමාන්‍ය කාල වලදී පරිභෝජනය කරන ලද විදුලිය (ලංවිම සැපයුම) මසකට 229.4MWh සහ 299.7MWh වූ අතර සහ කාර්යබහුල කාල වලදී පරිභෝජනය කරන ලද විදුලිය මසකට 70.3MWh සහ 91.3MWh අතර විය. ලංවිම විදුලි සැපයුම සඳහා උපරිම ඉල්ලුම 1153 KVA සිට 1474KVA දක්වා වෙනස් විය.

පිරිපහදුව බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා ශක්‍ය යාන්ත්‍රණයන් හඳුනා ගැනීමට අලාභ හා කාර්යක්ෂමතා සමීක්ෂණ පවත්වයි.

සංස්ථා ප්‍රතිපත්තිය තුළට තිරසාර පරිභෝජන රටාවක් හුරුකරමින් තිරසාර ඉදිරි ගමනක් සනාථ කිරීම සඳහා සංස්ථාව සතු සියළුම සංචාරක බංගලා සහ ප්‍රාදේශීය කාර්යාල සූර්ය බලශක්තිය වෙත පරිවර්තනය කිරීමට ආයෝජනය කරමින් පවතී.

පිරිපහදු මෙහෙයුම් ක්‍රියාවලියේදී සාමාන්‍ය අලාභයට මුහුණ දෙන අතර 2020 වර්ෂයේදී අපේක්ෂිත සාමාන්‍ය අලාභය 17.8% කින් (MT 5,266 සිට 4,325 MT දක්වා) අඩු වී ඇත. මෙම වසර තුළ, දහනය සඳහා යොමුකළ සම්පූර්ණ ඉන්ධන වායු ප්‍රමාණය මෙ.ටොන් 1,017 ක් ලෙස වාර්තා වූ අතර දැල්වීමට යවන ලද CDU වායු ප්‍රමාණය මෙ.ටොන් 0.1 කි.

## ද්‍රව්‍ය කළමනාකරණය

ඉන්ධන, උපකරණ වැනි ප්‍රධාන ද්‍රව්‍ය භාවිතය අපි අඛන්ඩව අධීක්ෂණය කරන අතර මෙම සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීමට ක්‍රියාමාර්ග ගන්නෙමු. පරිභෝජනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා තාක්ෂණික යාන්ත්‍රණයක් සකස් කර ස්ථාපනය කර ඇත.

## වගකිවයුතු මූලාශ්‍ර තුලින් ගැනීම

පරිසර හිතකාමී නිෂ්පාදන සහ සේවා වගකීම් සහගත ලෙස ලබා ගැනීමට අපි සෑම උත්සාහයක්ම ගනු ලබයි. සැපයුම්කරුවන්ගේ තිරසාර මූලාශ්‍ර යාන්ත්‍රණයක් සහතික කිරීම සඳහා සියලුම රෙගුලාසි සහ නීතිවලට අනුකූල වන ලෙස සැයුම්කරුවන් හඳුනාගනු ලැබේ. නිෂ්පාදන සහ සේවා සැපයීම සඳහා සැපයුම්කරුවන් වැඩි ප්‍රමාණයක් සහභාගී වීම දිරිමත් කිරීම සඳහා විනිවිද පෙනෙන ප්‍රසම්පාදන ක්‍රමයක් අපි ක්‍රියාත්මක කරමින් සිටිමු.

## අන්තරායකර ද්‍රව්‍ය බැහැර කිරීම

අන්තරායකර කෘෂි රසායන ද්‍රව්‍ය දැඩි පරිසර හිතකාමී ක්‍රියා පටිපාටි යටතේ නියාමකයන්ගේ සහ අධිකාරීන්ගේ අවශ්‍ය අනුමැතිය සහ අධීක්ෂණයන් යටතේ බැහැර කරනු ලැබේ. අන්තරායකර ද්‍රව්‍ය බැහැර කිරීම මිනිසාට හෝ පරිසරයට හානියක් නොවන පරිදි බැහැර කිරීම් බලයලත් පාර්ශවයන් විසින් සිදු කරනු ලැබේ.

පිරිපහදුව මගින් අන්තරායකර අපද්‍රව්‍ය ප්‍රමාණයක් ද ජනනය වන අතර ඒවා ජාත්‍යන්තරව පිළිගත හැකි ක්‍රමවේදයන්ට අනුව බැහැර කරනු ලැබේ. පරිසරය සමඟ මිශ්‍ර වීම වළක්වා ගැනීම සඳහා ඒවා අපද්‍රව්‍ය දැල්ලට යවා පිළිස්සීම සිදු කරන අතර මෙම වසර තුළ ගිනිදැල් සඳහා යැවූ සම්පූර්ණ ඉන්ධන වායු ප්‍රමාණය මෙ.ටොන් 1,017ක් ලෙස සටහන් වූ අතර දැල්වීමට යවා ඇති සීඩීයූ වායු ප්‍රමාණය මෙ.ටොන් 0.1ක් විය.

භාවිතා කළ ජලය පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිරිපහදු කරනු ලබන අතර පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම්/නැවත භාවිත කරයි. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අනෙකුත් ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය සඳහා අපගේ පවිත්‍රාගාර හර ප්‍රතිචක්‍රීකරණ කරන අතර සහ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සඳහා බලයලත් පාර්ශ්වයන්ට ලබා දෙනු ලබයි.

## තිරසාර සහ පරිසර හිතකාමී ආර්ථිකය

පරිභෝජනයන් තුලින් සිදුවන පාරිසරික බලපෑම අවම කිරීම සඳහා වඩාත් පරිසර හිතකාමී නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සංස්ථාව කැපවී සිටී. වඩාත් කාර්යක්ෂම හා පරිසර හිතකාමී ඉන්ධන සැපයීම සඳහා සංස්ථාව විසින් පරිසර හිතකාමී යූරෝ IV පෙට්‍රල් සහ ඩීසල් හඳුන්වා දෙන ලදී.

අවම කාබන් විමෝචනයක් සමඟ වඩාත් තිරසාර පරිභෝජන රටාවක් ඉදිරියට ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවට ද්‍රව ස්වභාවික වායුව (LNG) හඳුන්වා දීමේ කාර්යට මුලපිරීම් සූදානම් වෙමින් පවතී.

## ජෛව විවිධත්වය

තෙල් කාන්දු වීම්, ඉන්ධන දුම්, අපද්‍රව්‍ය ආදී සංස්ථා ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජෛව විවිධත්වය වෙත අහිතකර බලපෑමක් ඇති කරයි. ජෛව විවිධත්වය වෙත වන අහිතකර බලපෑම අවම කිරීම සඳහා වන පූර්ව ප්‍රවේසම් සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කිරීම පිණිස දැඩි මෙහෙයුම් ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම වසර තුළ ජෛව විවිධත්වයට බලපෑමක් කරනු ලැබූ තෙල් කාන්දු වීම් හෝ වෙනත් බලපෑම් පිළිබඳව කිසිදු වාර්තාවක් නොමැත.

## අනුකූලතාවය

පරිසරය සමඟ පෝෂණය කරන වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස, සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් මට්ටමින් මෙන්ම වාර්තාකරණ මට්ටමින් පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා නොමැත. ඒ අනුව මෙම වසරේදී කිසිදු කැපී පෙනෙන දඩ මුදලකට හෝ මුල්‍ය නොවන සම්බාධකයක් සංස්ථාව වෙත එල්ල නොවුණි. පාරිසරික අනතුරු ඇති විය හැකි ස්වාභාවික අවදානමක් සහිත මෙම ව්‍යාපාරය පරිසරය ආශ්‍රිත නීති සම්පාදකවරු සමඟ සමීපව කටයුතු කරයි.

අපගේ මෙහෙයුම්වල අහිතකර බලපෑම් මඟහරවා ගැනීමට අපි සෑම උත්සාහයක්ම ගෙන තිබෙන්නෙමු. පරිසරයට සිදුවිය හැකි බලපෑම් පාලනය කිරීම සඳහා අපි ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධ වී සිටින අතර සංස්ථාව තෙල් කාන්දුවීම් හේතුවෙන් සිදුවන පරිසර දූෂණයට වන්දි ලබා දෙන ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPCF) සාමාජිකයෙකි.


# පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ගැටළු තේරුම් ගෙන ඒවාට විසඳුම් සෙවීම මඟින් වටිනාකම් නිර්මාණය කර බෙදාහැරීම සඳහා විස්තීරණ ක්‍රියාවලියක් සංස්ථාව විසින් අනුගමනය කරයි. එබැවින්, පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වී ඔවුන් මනාව හඳුනා ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සංස්ථාව සතුව පවතින අතර, ක්‍රමෝපායික සැලසුම් පද්ධතිය හරහා ව්‍යාපාර මාදිලියක් මඟින් ඔවුන් සම්බන්ධ කර ගනිමින් අවස්ථා හඳුනා ගැනීමට මෙමඟින් හැකියාව ලැබේ. අගය එකතු කිරීමේ ක්‍රියාවලිය වෙත වඩාත් කැපී පෙනෙන බලපෑමක් ඇති කරනු ලබන පාර්ශවකරුවන් වෙත ක්‍රමෝපායික අවධාරණය ලබා දෙනු ඇත

පවතින පාර්ශ්වකරුවන්ගේ බලය සහ උනන්දුවෙහි වෙනස්කම් හඳුනා ගැනීමට මෙන්ම නව පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් හඳුනා ගැනීමට සංස්ථාව අපගේ ව්‍යාපාරික පරිසරය නිරන්තරයෙන් ඇගයීමට ලක් කරයි.

| කාණ්ඩය | හිමිකරුවන් | සේවකයන් | ප්‍රජාව |
|---|---|---|---|
| සහභාගීත්වයේ යාන්ත්‍රණය | මාසික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම<br>වාර්ෂික මූල්‍ය ප්‍රකාශන<br>වාර්ෂික වාර්තාව<br>ආයතනික වෙබ් අඩවිය | කාර්ය සාධනය ඇගයීම<br>සේවක සහභාගීත්ව ක්‍රියාකාරකම්<br>වෘත්තීය සමිති සමඟ රැස්වීම්<br>ක්‍රීඩා සහ අනෙකුත් සිදුවීම්<br>වෙනත් සුබසාධන පහසුකම් | ප්‍රාදේශීය කාර්යාල කටයුතු<br>CSR ක්‍රියාකාරකම් සහ අනුග්‍රහය<br>මාධ්‍ය සහ අනෙකුත් සමාජ සිදුවීම් |
| මතු වූ ගැටළු | කාලානුරූපී මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය<br>මූල්‍ය වාර්තා හෙළිදරව් කිරීම්<br>අනාගත වර්ධනය සහ ඉදිරි දැක්ම | තරඟකාරී වේතන යෝජනා ක්‍රමය<br>රැකියා සුරක්ෂිතභාවය<br>කුසලතා සහ දැනුම වර්ධනය<br>ආරක්ෂිත සේවා ස්ථානයක්<br>වෘත්තීය ප්‍රගතිය සහ අනුප්‍රාප්තිය | රැකියා අවස්ථා<br>නිෂ්පාදන සඳහා ප්‍රවේශය<br>ආර්ථික සහ සමාජීය බලපෑම්<br>CSR ක්‍රියාකාරකම්<br>අනුග්‍රාහකත්වය |
| අපගේ ප්‍රතිචාර | ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, නියමිත වේලාවට මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු ඉදිරිපත් කිරීම. | අපි අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන අවස්ථා, කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුකූලව ආකර්ෂණීය ප්‍රතිලාභ පද්ධතියක්, ආරක්ෂිත සේවා පරිසරයක් සහ නියැලී සිටින සේවක ශ්‍රම බලකාය සංවර්ධනය කරන්නෙමු. | ප්‍රජාවන් සමඟ සුහද සබඳතාවක් ගොඩනඟා ගැනීම. සවිබල ගැන්වීම සහ ජීවන තත්ත්වය නංවාලීම. |

# සහභාගීත්වය රාමුව




පාර්ශවකරුවන් සිතියම්ගත කිරීම මගින් සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය වෙත පවත්නා බලය සහ රුචිකත්වය හඳුනා ගැනීමට හැකි වන අතර, එමගින් සංස්ථාවට ඇති බලපෑමේ ප්‍රමාණය මැන ගැනීමට ද හැකියාව ලැබේ. බලපෑමේ ප්‍රමාණය අනුව පාර්ශවකරුවන්ගේ ගැටළු වෙත ප්‍රමුඛතාවය ලබා දීම සිදු කරන අතර, ඒ අනුව ක්‍රමෝපායන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් පාර්ශවකරුවන් සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

| නියාමකවරුන් | ගණුදෙනුකරුවන් | සැපයුම්කරුවන් |
|---|---|---|
| රජයට සහ නියාමකයින්ට වරින් වර සාකච්ඡා සහ වාර්තා කිරීම.<br>සංස්ථාවෙහි කාර්ය සාධනය සහ අනුකූලතා පිළිබඳ කාලානුරූප වාර්තාකරණ පද්ධතිය.<br>රාජ්‍ය මූල්‍ය/සාර්ව ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා කාලෝචිත තොරතුරු රජයට ඉදිරිපත් කිරීම | නිෂ්පාදන, ප්‍රවර්ධන ව්‍යාපාර<br>පිරවුම්හල් හරහා සම්බන්ධ වීම<br>පාරිභෝගික තෘප්තිමත් සමීක්ෂණ<br>අලෙවිකරණ නාලිකා හරහා සන්නිවේදනය<br>ප්‍රාදේශීය කාර්යාල මගින් මාර්ගගත සහ ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධ වීම | විනිවිද පෙනෙන ලංසු තැබීමේ ක්‍රියාවලිය<br>සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය<br>නිතිපතා රැස්වීම්, ලිඛිත සන්නිවේදනය සහ සබඳතා කළමනාකරණය |
| ඒකාබද්ධ පාලනය<br>රෙගුලාසි වලට අනුකූල වීම<br>බදු වලට අනුකූල වීම<br>පාරිසරික ආරක්ෂාව | පහසුව සහ ප්‍රවේශය<br>නිෂ්පාදන ගුණාත්මකභාවය<br>දැරිය හැකි මිල<br>පාරිභෝගික සේවා දිගුකාලීන<br>හවුල්කාරිත්වය<br>කාල සීමාව තුළ පදිංචි කිරීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීම.<br>රෙගුලාසි වලට අනුකූල වීම. |
| අපි නියාමකයින් විසින් ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කරන අතර කර්මාන්ත සංවර්ධනය දිරිමත් කිරීම සඳහා නියාමකයින් සමඟ විවෘත සංවාදයක් පවත්වන්නෙමු. | පාරිභෝගික පැමිණිලිවලට සහභාගි වී වහාම ඒවා විසඳීමට පාරිභෝගික සත්කාර ඒකකය ශක්තිමත් කිරීම. | දිගු කාලීන යහපත් සබඳතා දිරිමත් කිරීම, කාලෝචිත ලෙස නිරාකරණය කිරීම, නිෂ්පාදන සහ සේවාවන්හි තිරසාරභාවය සහ තත්ව ප්‍රමිතීන් සහතික කිරීම. |

# තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) මිහිපිට වෙසෙන ජීවින්ගේ සහ පෘතුවියේ වර්තමාන සහ අනාගත සාමය සහ සෞභාග්‍ය වෙත දිශාගත වූ සලකුණු තිරසාර සංවර්ධන අරමුණු වලින් පිළිබිඹු කරයි. සෑම රටක්ම එක්ව ගෝලීය හවුල්කාරීත්වයක් සහිතව වහාම ක්‍රියාත්මක වීමේ ඒකායන අරමුණ පෙරදැරි කර ගෙන ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් වේ. දේශගුණික විපර්යාසවලට මුහුණ දෙමින් සහ අපගේ සාගර සහ වනාන්තර සංරක්ෂණය කිරීමට කටයුතු කරන අතරතුර සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, අසමානතාවය අවම කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කරන උපාය මාර්ග සමඟ දරිද්‍රතාවය සහ අනෙකුත් අභිමිවීම් අවසන් කිරීම අත්වැල් බැඳගත යුතු බව ඔවුහු පිළිගනිති.

සංස්ථාවේ කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ක්‍රමෝපායන් සහ සංවර්ධන න්‍යාය පත්‍රයක් තුළින් මෙම තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට වගකීම් සහගත රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාව කටයුතු කර SDGs සාක්ෂාත් කර ගැනීමට දායක වේ.




2508 ක විවිධත්වය මත වූ ශ්‍රම බලකායට පෞද්ගලික අංශය හා තරඟකාරී අනුපාතයට අනුව ප්‍රතිලාභ ලබාදෙන අතර සංස්ථාව රු. බිලියන 5.72 ක් සේවකයන් වෙනුවෙන් ඔවුන්ගේ ජීවනෝපාය නංවාලීම සඳහා වැය කර ඇත. තවද, සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්වය නංවාලීමේ අරමුණින් ණය යෝජනා ක්‍රම, වෛද්‍ය පහසුකම් වැනි විවිධ සුබසාධන කටයුතු සිදු කෙරේ.

දිළිඳුකම පිටුදැකීම සඳහා සමාජයට දායක වෙමින් අපගේ බෙදාහැරීමේ ජාල හරහා දිවයින පුරා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 15,000කට අධික ප්‍රමාණයක් අපි ලබා දී ඇත.

භූමිතෙල් සපයන එකම ආයතනය සංස්ථාව වන අතර අඩු ආදායම්ලාභී පවුල්වල සහ ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය නංවාලීම සඳහා ආර්ථික සහන සැලසීමේ අරමුණින් භූමිතෙල් ඉහළ සහනදායී මිලකට සපයනු ලැබේ. 2020 වර්ෂය සඳහා සහනාධාර මුදල රු. මිලියන 2,122 කි.




ඛනිජ තෙල් නිෂ්පාදන සෞඛ්‍ය සහ ආරක්ෂිත අවදානමට නිරාශ්‍රයෙන්ම නිරාවරණය වන බැවින් සේවකයින්ට මෙන්ම සමස්ත සමාජයටම යහපත් සෞඛ්‍ය සහ ආරක්ෂිත පරිසරයක් ලබාදීමට දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇත. අවදානම් පරිසරය අවම කිරීම සඳහා පිරිපහදුවේදී ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබේ.

සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ආවරණය වන වෛද්‍ය යෝජනා ක්‍රම, පාරිතෝෂිත දීමනා, ප්‍රසූත නිවාඩු යනාදිය මගින් සංස්ථාව විසින් වෛද්‍ය ප්‍රතිලාභ ඇතුළු ප්‍රතිලාභ ලබා දී ඇත.




සංස්ථාව සමාන අවස්ථා සේවා යෝජකයෙකු වන අතර ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව වෙනස්කම් නොකරයි. සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූලව එකම රැකියා කාණ්ඩ සඳහා එකම ප්‍රතිලාභ පරිමාණයන් (1:1) ලබාදෙන අතර පිරිමින් සහ කාන්තාවන් අතර වෙනස් කොට සැලකීමකින් තොරව ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රතිපත්තියකින් ක්‍රියා කරයි.




රටේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කරන අතරම ජීවනෝපාය සහ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීම සඳහා බොහෝ නිෂ්පාදන සහනදායී මිලකට සපයනු ලබයි. අඩු ආදායම්ලාභී පවුල්වලට සහ ධීවරයින්ට ඛනිජ නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබාදීමේ අරමුණින් භූමිතෙල් ඉහළ සහනදායී මිලකට සපයනු ලැබේ. පාරිභෝගිකයින් ගුණාත්මක ප්‍රමිතිගත ඛනිජ තෙල් නිෂ්පාදන පරිභෝජනය කරන බවට සහතික වීමට ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරණු ලැබේ.




රටේ ආර්ථික වර්ධනය සඳහා රජයට විවිධ බදු සහ තීරුබදු ලෙස සංස්ථාව විසින් රු. මිලියන 152,311ක දායකත්වයක් ලබාදී ඇත. රටේ ඉන්ධන ඉල්ලුමෙන් 80% කට වැඩි ප්‍රමාණයක් සඳහා අඛණ්ඩ ඉන්ධන සැපයීම මගින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා කර්මාන්ත සඳහා අඛණ්ඩ බලශක්ති සැපයුම තහවුරු කළේය. තවද, පිරිපහදුව ජාතික ආර්ථිකයට අපගේ විකුණුම් වලින් 30% ක් සමඟින් ආර්ථික වටිනාකමක් එක් කළේය.




සැමට දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කරමින් ගුණාත්මක, විශ්වාසදායක, තිරසාර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ආර්ථික සංවර්ධනයට සහ මානව යහපැවැත්මට සංස්ථාව විසින් සහාය වීම.

සංස්ථාව මෙහෙයුම්වල මෙහෙයුම් ක්‍රියාවන් සහ කාර්යක්ෂමතාව ඉහළ නංවන මධ්‍යම හා දිගුකාලීන උපාය මාර්ගික ව්‍යාපෘති ගණනාවක් සංස්ථාව ක්‍රියාත්මක කරයි/සැලසුම් කරයි. මේ සඳහා සංස්ථාව වසර තුළ ස්ථාවර වත්කම් මත රුපියල් බිලියන 2ක් ආයෝජනය කර ඇත.




අපි රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය ඔවුන්ගේ ජීවන චක්‍රය පුරාවටම විශේෂයෙන් පිරිපහදු හා කෘෂි රසායනවල පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කරමින්, එකඟ වූ ජාත්‍යන්තර ප්‍රමිති වලට අනුකූලව, මානව සෞඛ්‍යයට සහ ඒවායේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට මුදා නොහැරීම සහතික කරමු. අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ නීති සහ රෙගුලාසිවලට අනුකූලව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති මත පදනම්වය.

තිරසාර නිෂ්පාදන රටාව සහ තිරසාර පරිභෝජනය සඳහා ගනු ලබන සෑම උත්සාහයක් සඳහාම සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කිරීමට සංස්ථාව සහතික කරයි.

තිරසාර ඉන්ධන පරිභෝජනය සඳහා පරිසර හිතකාමී කාර්යක්ෂම ඉන්ධන සැපයීම සඳහා සංස්ථාව යුරෝ 4 ප්‍රමිතියෙන් යුත් ඩීසල් සහ පෙට්‍රල් හඳුන්වා දී ඇත.




දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඇති වන බලපෑම් අවම කිරීම සහ වළක්වා ගැනීම සඳහා අපගේ උපාය මාර්ග සඳහා ක්‍රියා පටිපාටි සහ භාවිතයන් අපි ගොඩනගමු. රජය විසින් ක්‍රියාත්මක කරන ලද දේශගුණික විපර්යාස ක්‍රියාමාර්ග අපගේ උපාය මාර්ගවලට ඒකාබද්ධ කරයි. දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ක්‍රියාකාරී පියවරයන් සඳහා පිරිපහදු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සපයනු ලැබේ.




ශුන්‍ය මට්ටමේ ඉන්ධන කාන්දුවීම් හඳුනා ගැනීමට සහ සහතික කිරීමට සංස්ථාව සැලකිය යුතු තත්ව සහතික ක්‍රියා පටිපාටි භාවිතා කළේය. අවදානම් තෙල් කාන්දු වීම වළක්වා ගැනීම සඳහා ප්‍රවාහන මට්ටම, ගබඩා කිරීම මෙන්ම පිරවුම්හල් මට්ටමින් තත්ව සහ නියාමන පරීක්ෂාවන් සිදු කෙරේ.

සංස්ථාව ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPC) සාමාජිකයෙකු වන අතර එමඟින් තෙල් නැවු වලින් තෙල් කාන්දු වීම නිසා සිදුවන පරිසර දූෂණයට වන්දි ලබා දෙන අතර එමඟින් ජල දූෂණය වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට හැකි වේ.




පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුව කෘෂි රසායන නිෂ්පාදන තිරසාර නිෂ්පාදනය සහ බෙදා හැරීම අපි සහතික කරමු. ශුන්‍ය මට්ටමේ හානියක් පෘථිවියේ ජීවයට ගෙන ඒම සහ පරිසර දූෂණය ශුන්‍ය මට්ටමේ පවත්වා ගැනීම සඳහා තොරතුරු සහ අවශ්‍ය පුහුණු කිරීම් ලබා දේ.

# අවදානම් කළමනාකරණ වාර්තාව

ශක්තිමත් සමාජීය සහ පාරිසරික වටපිටාව තුළ ඛනිජ තෙල් කර්මාන්තයේ මෙරට ප්‍රමුඛයා ලෙස සංස්ථාවේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ භූමිකාවක් ගනී. මහා අධීක්ෂණයකින් යුක්තව අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන අතර ව්‍යාපාරික අවදානම අවම කිරීම සඳහා වාර්තාකරණ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක වෙයි.

**අවදානම් කළමනාකරණයේ අරමුණු**

- පාරිසරික, වෙළඳපල සහ අභ්‍යන්තර නීති කඩ කිරීම් වෙත සංස්ථාව නිරාවරණය වීමෙන් ආරක්ෂා කිරීම.
- මනාලෙස අවදානම සමබර කිරීම හා වර්ධනය කිරීම
- දිගුකාලීන පැවැත්ම සහතික කිරීම සහ අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන්, පොදු ජනතාව ආරක්ෂා කිරීම
- සිදුවිය හැකි සෘණාත්මක සිදුවීම් වලින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම.

## අවදානම් කළමනාකරණ රාමුව


සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කර ඇත්තේ සංස්ථාව වෙත බලපාන මූලික අවදානම් කල්තියා හඳුනා ගැනීමට සහ ඒවා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඵලදායී ලෙස කළමනාකරණය කරමින් ජාතියට අඛණ්ඩව බලශක්ති සැපයුමක් ලබාදීමේ අරමුණින්ය. අවදානම් ප්‍රතිපත්ති සහ නිර්වචනය කරන ලද රාජකාරී සහ වගකීම් ඇතුළත් වන ලෙස අවදානම් කළමනාකරණ රාමුව සකසා ඇත. මෙමඟින් සංස්ථාවට තම ක්‍රියාකාරකම් ස්ථාවර සහ මනා පාලනයකින් සිදු කිරීමට මග පාදන ලද අතර, ඵලදායී සහ කාර්යක්ෂම සැලසුම්කරණ ක්‍රියාවලියක් සහ තීරණ ගැනීමේ හැකියාවක් මෙමඟින් ලබා දෙයි.

සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව වෙත ස්ථාවර පදනමක් 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත 1971 අංක 38 දරන මුල්‍ය පනත, මුල්‍ය රෙගුලාසි, යහ පාලනය සඳහා වූ නිර්ණායක, පොදු ව්‍යාපාර සඳහා වන යහ මාර්ග සහ අනෙකුත් විවිධ රෙගුලාසි ආදිය මනා අත්තිවාරමක් යොදන අතර එමගින් නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට හැකිවෙයි.

සංස්ථාවේ අවදානම් කළමනාකරණ පද්ධතිය ස්ථාවර ආරක්ෂක පේළි තුනකින් සමන්විත වේ. ව්‍යාපාරික සහ මෙහෙයුම් ඒකක පළමු පෙළ ආරක්ෂණ පද්ධතියෙන් සමන්විත වන අතර දෙවන පෙළ ආරක්ෂක පද්ධතිය අභ්‍යන්තර මෙහෙයුම් පද්ධතියක් සහ අවදානම් පාලනය සහිත කළමනාකරණය කළ හැකි අධිකාරය සහිත අභ්‍යන්තර පාලන පද්ධතියකින් සමන්විත වේ. තෙවන ආරක්ෂණ පෙළ අභ්‍යන්තර විගණනය බාහිර විගණනය සහ ස්ථාපිත ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ නීතිමය අවශ්‍යතා සහ වෙනත් අනුකූලතා වලින් සමන්විත වේ.

## පළමු පෙළ ආරක්ෂණය

ව්‍යාපාරික සහ මෙහෙයුම් මට්ටමේ අංශ අවදානම් පිළිබඳ අයිතිය ඇති පාර්ශවයන් වන අතර ඔවුන් විසින් අවදානම් හඳුනා ගැනීම, ඒවා කළමනාකරණය කිරීම සහ වාර්තාකරණය සිදු කළ යුතු අතර, පළමු පෙළ ආරක්ෂණය සමඟ එක්ව සංස්ථාව නිරාවරණය වන ලද අවදානම් හඳුනා ගෙන ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සම්බන්ධව සහතික කෙරේ.



## දෙවන පෙළ ආරක්ෂණය

ඉහත සඳහන් කරන ලද පනත් අනුව නිර්මාණය කරන ලද පැහැදිලිව අර්ථ දක්වා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සමඟ අභ්‍යන්තර මෙහෙයුම් සම්බන්ධ විස්තීර්ණ පද්ධතියක් සංස්ථාව සතුව පවතී.  සංස්ථාව හා සම්බන්ධ අවදානම් තත්වයන් හඳුනා ගැනීමට,  කළමනාකරණය කිරීමට මෙන්ම වැළැක්වීම සඳහා දෙවනි පෙළ ආරක්ෂණය හරහා මෙමඟින් අවකාශ සලසයි.


## තෙවන පෙළ ආරක්ෂණය

තෙවන පෙළ ආරක්ෂණයේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාවක් අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යංශ මඟින් සිදු කරයි.  මූල්‍ය සහ මෙහෙයුම් පද්ධතිවල සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාවය අභ්‍යන්තර සහ බාහිර විගණන මඟින් අධ්‍යයනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණන කමිටුව විසින් කැපී පෙනෙන විගණන සොයා ගැනීම් සහ කළමනාකරණ ප්‍රතිචාර සමඟ ස්ථාපිත ඉලක්ක සහ අරමුණු වලට සාපේක්ෂ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලබයි.

ඉහත අවදානම් පාලන ව්‍යුහය අවදානම් හඳුනා ගැනීම, මැනීම, අවම කිරීම සහ වාර්තා කිරීම සහතික කරයි.

## අවදානම් පාලනය

අවදානම් කළමනාකරණයේ ප්‍රධාන වගකීම සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර එය විගණන කමිටුව මඟින් ශක්තිමත් කෙරේ. මැනවින් නිර්වචනය කරන ලද ක්‍රියා පටිපාටි සහ ඵලදායි අධීක්ෂණය සහිත විගණන කමිටු ක්‍රියාකාරිත්වය කලමනාකාරීත්වය වෙත වන කාලීන වාර්තාකරණය හරහා ක්‍රියාත්මක වේ.




අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව කළමනාකාර අධ්‍යක්ෂවරයා හරහා විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. කමිටුව සෑම කාර්යාංශයකින්ම සමන්විත විධායක මට්ටමේ නිලධාරීන්ගෙන් සමන්විත වේ. අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරී ඇති ප්‍රධාන රාජකාරි සහ වගකීම් පහත දක්වා ඇත.

1. ඔවුන් නිරාවරණය වන අවදානම් හඳුනා ගැනීම - එක් එක් මෙහෙයුම් සහ වාර්තා කරන ප්‍රදේශ වෙත ගොස් නිරාවරණය වන සියලුම අවදානම් හඳුනා ගැනීම අවශ්‍ය වේ.
2. ඇගයීම - නිරාවරණය වන අවදානම් සහ අවදානම් සිදුවීම් ඇතිවීමේ සම්භාවිතාව සහ වාර ගණන ඇගයීම.
3. අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකස් කිරීම - අවදානම් අවම කිරීමේ උපාය මාර්ග හඳුනාගෙන එක් එක් අවදානම් කාණ්ඩය සඳහා ඒවා සකස් කිරීම.

## අවදානම් කළමනාකරණය සඳහා උපාය මාර්ග

ඛනිජ තෙල් නිෂ්පාදනවල ආවේනික අවදානම් ස්වභාවය, විශේෂයෙන් සෞඛ්‍ය සහ ආරක්ෂිත අවදානම් හේතුවෙන් සංස්ථාව බොහෝ අවදානම්වලට මුහුණ දෙයි. අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව යොදන උපාය මාර්ග අවදානමේ වර්ගය සහ ප්‍රබලකම මත රඳා පවතී. සංස්ථාව විසින් පහත දක්වා ඇති කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගනු ලබයි.

- සිදුවීමේ සම්භාවිතාවය වලක්වා ගැනීම හෝ
- අවදානම වෙනත් පාර්ශවයකට මාරු කිරීම හෝ
- ප්‍රතිඵල පිළිගැනීම සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

## අවදානම් රුචිය

අවදානම් රුචිය මඟින් ව්‍යාපාරය කළමනාකරණ කිරීම සඳහා වන සීමාවන් සහ අවදානම් ගැටළු පිළිබඳව, මෙහෙයුම් කටයුතු සඳහා කැපී පෙනෙන ලෙස අවශ්‍ය වන ප්‍රධාන අවදානම් කාණ්ඩ වෙත දරා ගැනීමේ මට්ටම් දක්වමින් පෙන්වා දෙනු ලබයි.  ඛනිජ තෙල් නිෂ්පාදන හැසිරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේදී ඇති වන අවදානම් වල ආවේනික ස්වභාවය සැලකිල්ලට ගනිමින් දරාගැනීමේ මට්ටම ස්ථාපිත කර ඇත. සංස්ථාවට ප්‍රධාන වශයෙන් බලපාන අවදානම් කිහිපයක් සංස්ථාව හඳුනා ගනී.

| අවදානම් බලපෑම | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 5 | 10 | 15 | 20 | |
| 4 | 4 | 8 | 12 | 16 | 20 |
| 3 | 3 | 6 | 9 | 12 | 15 |
| 2 | 2 | 4 | 6 | 8 | 10 |
| 1 | 1 | 2 | 3 | 4 | 5 |
| | 1 | 2 | 3 | 4 | 5 |

අවදානම් පැවැත්ම

අපගේ මෙහෙයුම් සඳහා වැදගත්කම හඳුනා ගැනීම සඳහා ලබා දී ඇති අවදානම් රුචිය සටහනට නිරාවරණය වන සියලුම අවදානම් සිතියම්ගත කරයි. අපි ඒවා අවදානම් මට්ටම අනුව වර්ග කර, සිදුවීමේ හැකියාව වළක්වා ගැනීමට, අවදානම වෙනත් පාර්ශ්වයකට මාරු කිරීමට හෝ අවදානම් මට්ටම මත පදනම්ව ඒ සඳහා ප්‍රතිඵල පිළිගැනීම සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

## සංස්ථාව නිරාවරණය වන අවදානම්

සංස්ථාව නිරාවරණය වන අවදානම් තත්වයන් සහ ගනු ලබන අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ කෙටි විස්තරයක් උපාය මාර්ග සමඟ පහත දක්වා ඇත

| අවදානම් අනුපාතය | අවදානම් මට්ටම | සම්බන්ද වීමේ මට්ටම |
|---|---|---|
| 1 - 5 | ඉතා අඩු | සේවකයින් හා පහල කළමනාකාරිත්වය |
| 6 - 11 | අඩු | ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය |
| 12-19 | මධ්‍යම | සංස්ථායික කළමනාකාරිත්වය |
| 20 -24 | ඉහළ | කළමනාකාර අධ්‍යක්ෂ |
| 25 | ඉතා ඉහළ | අධ්‍යක්ෂ මණ්ඩලය |

## ආර්ථික අවදානම

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන්නේ ඇ.ඩො. මඟින් වන අතර ආදායම් ලැබෙනුයේ ශ්‍රී ලංකා රුපියල් වලින් වන බැවින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු රටේ උද්ධමන අනුපාතය කෙරේ පීඩනයක් ඇති කරයි. සමාජ ශුභ සාධනය අරමුණු කර ගෙන ඛනිජ තෙල් නිෂ්පාදන බොහොමයක් සහන මිළ ගණන් යටතේ අළෙවි කිරීම සිදු කරයි. ඛනිජ තෙල් නිෂ්පාදනය රටේ ආර්ථිකයේ ඉහළ වැදගත්කමක් සහිත අංශයක් වන බැවින් එම නිෂ්පාදන මිල ගණන් වෙනස් වීම ජාතික ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරයි. උද්ධමන අනුපාතය, පොළී අනුපාතය, විදේශ විනිමය අනුපාතය ආදිය වැඩිවීමෙන් වන දැඩි බලපෑම නිෂ්පාදනවල පිරිවැය වැඩි වීමටත් එමගින් ලාභය අඩුවීමටත් හේතු වෙයි. වාර්ෂික අලෙවි ධාරිතාවය ලීටර බිලියන 05 ක් පමණ වීමෙන් ආර්ථික මෙවලම් වල සුළු වෙනස්කම් ද ලාභදායිතාවය වෙත දැඩි සේ බලපායි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • ඵලදායී පිරිවැය කළමනාකරණ පියවර.<br>• පාරදෘෂ්‍ය මිල යාන්ත්‍රණය.<br>• ලිහිසි තෙල් සහ තාර වැනි තරඟකාරී නිෂ්පාදන වෙත තරඟකාරී මිල ගණන් නියම කිරීම. |
| උපාය මාර්ග | • සංස්ථාවේ ලාභදායිත්වය සහ සමාජ ආර්ථික තත්ත්වයන් යන දෙකම තුලනය වන මිලකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.<br>• රජය විසින් සංස්ථාවට ගෙවිය යුතු සහනාධාරය ප්‍රතිපූරණය කිරීම. |

## භාණ්ඩ මිල අවදානම

කැනීම් කළ හැකි ආකාරයේ ඛනිජ තෙල් ශ්‍රී ලංකාව සතුව නොපවතින බැවින්, ජාත්‍යන්තර වෙළඳපලෙන් බොරතෙල් සහ අනෙකුත් පිරිපහදු කරනු ලැබූ නිෂ්පාදන ආනයනය කරනු ලබන නමුත් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳපලේ කුඩා පරිමාණ සේවාදායකයෙකි. ජාත්‍යන්තර ඛනිජ තෙල් වෙළඳපලේ ශ්‍රී ලංකාව මිල ලබන්නෙක් වන බැවින්, ශ්‍රී ලංකාව නිරන්තරයෙන් භාණ්ඩ මිල ඉහල යාම් වෙත නිරාවරණය වෙනුවේ බොරතෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීමට/ බෙදාහැරීමට සෘජුවම මිලදී ගත යුතු බැවිනි. ගෝලීය තෙල් මිළ ගණන්වල දැඩි විචල්‍යතා හා අළෙවි පිරිවැය ලාභදායිතාවය සහ සංස්ථාවේ මුදල් ප්‍රවාහය වෙත අහිතකර බලපෑමක් එල්ල කරයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • අඛණ්ඩ මිළ අධීක්ෂණය සහ මිල විචල්‍යතාවයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම.<br>• වඩාත්ම පිරිවැය ඵලදායී ක්‍රමයකට තොග ප්‍රසම්පාදනය සහ ගබඩා කිරීම. |
| උපාය මාර්ග | • ගෝලීය වෙළඳපලේ මිල ගණන් අඩු අවස්ථාවලදී තොග පවත්වාගෙන යාමට අවශ්‍ය ගබඩාකරණ ධාරිතාවය වැඩි දියුණු කිරීම.<br>• පාරදෘෂ්‍ය මිල යාන්ත්‍රණයක් හඳුන්වා දෙමින් පිරිවැය ආවරණය කිරීම.<br>• සැපයුම්කරුවන් ගණන වැඩි කරමින් තරඟකාරීත්වය වැඩි කිරීම. |

## පොලී අනුපාත අවදානම

සමුච්ඡිත අලාභය හේතුවෙන් සංස්ථාවේ ස්කන්ධය ක්ෂය වී ඇති බැවින්, රටේ බලශක්ති සුරක්ෂිතතාවය පවත්වාගෙන යාමට ඛනිජ තෙල් නිෂ්පාදන බාධාවකින් තොරව ලබා දීමට අවශ්‍ය ක්‍රියාකාරී ප්‍රාග්ධනය සඳහා සංස්ථාව අවශ්‍ය අරමුදල් ණයට ගනී. සමාලෝචිත වර්ෂයේදී රු. මිලි. 20,911 ක මූල්‍ය පිරිවැයක් දරන ලද අතර, 2020.12.31 දිනට සංස්ථාව ඇ.ඩො.බිලියන 2.0 කට වඩා වන ණය ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි. එසේම, රාජ්‍ය වානිජ බැංකු මඟින් ලබා ගන්නා ලද ණයවර ලිපි (LC) හරහා සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරන අතර, එම ණයවර ලිපි කල්පිරීමේදී ඒවා ණය බවට පරිවර්තනය කරයි. සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය වෙත පොළී අනුපාතය කැපී පෙනෙන බලපෑමක් ඇති කරන අතර, පොළී අනුපාතයේ විචල්‍යතා අතිරේක මූල්‍ය බරක් නිර්මාණය කරමින් සංස්ථාවේ ලාභදායිත්වය කෙරේ දැඩි බලපෑමක් එල්ල කරයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • පොළී අනුපාතය අඩු කිරීම සඳහා බැංකු සමඟ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීම.<br>• පොළී ලැබෙන මූලාශ්‍ර තුළ දෛනික අතිරික්ත මුදල් ශේෂ ආයෝජනය කිරීම.<br>• මූල්‍ය පිරිවැය පාලනය කරන යාන්ත්‍රණයක් සඳහා රාජ්‍ය මැදිහත්වීම. |
| උපාය මාර්ග | • බැංකු ණය පියවීමට රජය ප්‍රමාදයකින් තොරව සහනාධාර කොටස පියවිය යුතුය.<br>• එක්සත් ජනපද ඩොලර් ණය රුපියල් ණය බවට පරිවර්තනය කිරීම සහ කර ආදායමින් ලැබෙන රුපියල් මඟින් එම ණය ගෙවීම.<br>• පිරිවැය අඩු දීර්ඝ කාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීම. |

## ද්‍රවශීලතා අවදානම

සංස්ථාවේ කෙටි කාලීන ගිවිසුම්ගත ගෙවීම් සහ අනෙකුත් ගෙවීම් කාලීනව සිදු කිරීමට නොහැකි වීමෙන් සංස්ථාව ද්‍රවශීල අවදානමකට මුහුණ පායි. සංස්ථාවේ ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා රජයේ බැංකු දෙකෙන් ලබා ගන්නා ලද ණය මඟින් පියවා ගැනීම හේතුවෙන් සංස්ථාව ඉහල ද්‍රවශීල අවදානමකට මුහුණ පා ඇත. ණය ගෙවීම් සිදු කළ යුතු නියමිත කාලයට සිදු නොකිරීමෙන් ඇතිවන අතිරික්ත පොළී පිරිවැය ද සංස්ථාව විසින් දරා ගත යුතුව ඇත. තම ණය ගෙවීම් නියමිත කාලයට සිදු කිරීමට සංස්ථාව අපොහොසත් වීමෙන් සංස්ථාවේ කීර්ති නාමයට ද හානි සිදු වේ.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • විවිධ කෙටි කාලීන සහ දිගු කාලීන අරමුදල් ක්‍රමවේද යොදා ගැනීම.<br>• ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ කල්පිරීමේ කාලය අනුව කළමනාකරණය කිරීම.<br>• ඵලදායී මුදල් එකතු කිරීමේ යාන්ත්‍රණය. |
| උපාය මාර්ග | • ණය කළමනාකරණ ප්‍රතිපත්තිය විධිමත් කිරීම.<br>• දිගුකාලීන අරමුදල් පහසුකම් සෙවීම.<br>• රජයෙන් ලැබිය යුතු සහනාධාර කොටස ලබා ගැනීම. |

## ආරක්ෂණ අවදානම

ඛනිජ තෙල් නිෂ්පාදනවල පවත්නා ගිනිගන්නා සුළු ස්වාභාවය හේතුවෙන් ඒවා සෞඛ්‍ය හා ආරක්ෂාවට අවදානමක් ඇති කරයි. පිරිපහදුව මෙම අවදානම් කෙරේ බොහෝ සෙයින් නිරාවරණය වී ඇති බැවින්, අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ජාත්‍යන්තර ලෙස පිළිගත සෞඛ්‍යාරක්ෂණ ප්‍රමිතීන් ක්‍රියාත්මක වෙමින් පවති. ආරක්ෂණ අවදානම වැලැක්වීම සහතික කිරීම සඳහා අඛණ්ඩ පරීක්ෂාවන්ට සහ පුහුණුවට ලක් කරයි. එසේම, පැය 24 පුරා ක්‍රියාත්මක ගුවන්තොටුපල තුළ රාජකාරී කරනු ලබන ගුවන්සේවා කාර්යාංශයේ සේවකයන් ද මෙම ආරක්ෂණ අවදානමට නිරාවරණය වන සේවක කොටසකි. ආරක්ෂණ ක්‍රියාපටිපාටීන් සහ ප්‍රමිතීන් වෙත අනුගත නොවීම ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට, සංස්ථාවේ වත්කම් වෙත සහ සේවක ජීවිත වෙත ද දැඩි බලපෑමක් ඇති කරනු ලබන අතර, ව්‍යාපාරයට දඩ මුදල් ගෙවීමට සිදු වීම සහ ක්‍රියාකාරීත්වය වෙත සම්බාධක පැනවීමට ලක් විය හැකිය.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • සෞඛ්‍ය හා ආරක්ෂාව වෙත වන දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්<br>• ගිනි, සෞඛ්‍ය හා ප්‍රවේසම් සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් පුහුණු කිරීම.<br>• ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටීන් වෙත ළඟා වීම සඳහා අඛණ්ඩ පැවැත්ම.<br>• වත්කම් පවත්වාගෙන යාම සඳහා වසර තුනකට වරක් ප්‍රධාන පිරිපහදු නැවතුමක් ක්‍රියාත්මක කිරීම. |
| උපාය මාර්ග | • ගෘහස්ථ / බාහිර ව්‍යුහයක් සහිත සහ ව්‍යුහාත්මක නොවන අඛණ්ඩ සේවක මණ්ඩල පුහුණු කිරීම්.<br>• නවීන තාක්ෂණික ප්‍රවර්ධන වෙත ළඟා වීම සඳහා පිරිපහදුව වැඩි දියුණු කිරීම.<br>• ISO, SLS වැනි මෙහෙයුම් ක්‍රියාවලිය හා සම්බන්ධ ගුණාත්මකභාවය හා ප්‍රවේසම් ප්‍රමිතීන් ලබා ගැනීම. |

## තොරතුරු තාක්ෂණය (IT) අවදානම්

නිරවද්‍ය කළමනාකරණ තීරණ නිසි කලට ගැනීම පිණිස විශ්වාසය තැබිය හැකි තොරතුරු පද්ධතියක් අවශ්‍ය වන අතර, වෙළඳපලේ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා සුදුසු තීරණ ගැනීමට ද වාර්තාගත සත්‍ය තොරතුරු ලබා ගැනීම ඉතා වැදගත් වේ. ලිහිසි තෙල් සහ තාර වෙළඳපල කොටස් වෙත ළඟා වීම සහ පවත්වාගෙන යාම පිණිස සත්‍ය සහ නිශ්චිත තොරතුරු පවත්වා ගැනීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • ගනුදෙනු කළමනාකරණ තොරතුරු, පද්ධතිය වාර්තා කිරීමට සහ සටහන් කිරීමට සැප් (SAP-ERP) පද්ධතිය භාවිතා කරයි.<br>• භාවිතා කරන්නන් වෙත තොරතුරු තාක්ෂණ පුහුණුව අඛණ්ඩව ලබා දීම.<br>• තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මත අඛණ්ඩව ආයෝජනය කිරීම. |
| උපාය මාර්ග | • Plant මාදිලිය වැනි ඵලදායී ERP පද්ධතියක් භාවිතය උපරිම කිරීම.<br>• SAP – ERP පද්ධතිය මනා පාලනය<br>• එම පද්ධතිය නව මාදිලියට යාවත්කාලීන කිරීම. |

## මානව සම්පත් අවදානම

සේවයේ නිරත සේවක මණ්ඩලය සංස්ථාවේ ක්‍රමෝපායික වත්කමක් වන අතර එම වත්කම්වල මනා ක්‍රියාකාරීත්වය සහ ආරක්ෂාව සේවකයන්ගේ අන්තර් සබඳතා මත රඳා පවති. දක්ෂ සේවකයන් ආකර්ෂනය කර බඳවා ගැනීමට සංස්ථාව ක්‍රියා කරන අතර, ඔවුන්ගේ අගය එකතු කිරීම වෙත ගෞරව දැක්වීමට හා නීතිමය කටයුතු අවම කිරීමට වඩාත් හොඳ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරයි. නුසුදුසු ශ්‍රම බලකායක් හෝ විනාශකාරී ගැටුම් ඇති කළ හැකි සේවකයන් නිෂ්පාදනවල ගුණාත්මකභාවයට හානි කරන අතර, පාරිභෝගිකයන් මෙහෙයවීම ද දුර්වල කරමින් සංස්ථාවේ පිරිවැය සහ ලාභදායීත්වය වෙත දැඩි බලපෑම් ඇති කරයි. සේවකයන් සමඟ ගැටුම් ඇති කර ගැනීමෙන් අතිරේක නෛතික පිරිවැයක් දැරීමට සංස්ථාවට සිදු වෙයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • දක්ෂතා පදනම් කර ගත් බඳවාගැනීමේ පටිපාටිය<br>• වඩා හොඳ ප්‍රතිලාභ ක්‍රමවේදයක්.<br>• සේවකයන් පුහුණු කිරීම හා සංවර්ධනය<br>• වෘත්තීය සමිති සමඟ සාමූහික ගිවිසුම්<br>• කාර්ය මණ්ඩල ශුභ සාධනය සහ වෙනත් ප්‍රතිලාභ යෝජනා ක්‍රම |
| උපාය මාර්ග | • කාර්ය සාධනය පදනම් කර ගත් ප්‍රතිලාභ පද්ධතියක් දියුණු කිරීම.<br>• වඩා වැඩි වෘත්තීය ප්‍රවර්ධන අවස්ථා ඇති කිරීම.<br>• තාක්ෂණික ප්‍රවර්ධන සහ නවෝත්පාදන සඳහා පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම.තාක්‍ෂණික දියුණුව සහ නවෝත්පාදන සඳහා පුහුණුවීම් සහ සංවර්ධනයන්. |

## ණය අවදානම

සේවාදායකයින් තම බිල්පත් නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීමෙන් සංස්ථාව ණය අවදානමට නිරාවරණය වේ. බොහොමයක් නිෂ්පාදන ණය පදනම යටතේ ලබා දෙන අතර පෞද්ගලික පාර්ශවයන් සුරැකුම් තැබීමෙන් අනතුරුව ඔවුන් වෙත නිෂ්පාදන ණය පදනම යටතේ ලබා දෙයි. රජයේ ආයතන වෙත ණය පදනම යටතේ නිෂ්පාදන ලබා දීමේදී කිසිදු සුරැකුම් සහතිකයක් ලබා නොගනී. කිසියම් සේවාදායකයෙක් තම ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට අපොහොසත් වුයේ නම් හෝ ඔවුන් විසින් ගෙවිය යුතු ණය ගෙවීම් පමා කරන්නේ නම් එය සංස්ථාවේ මුදල් ප්‍රවාහය වෙත (ද්‍රවශීලතාවයට) ණය අවදානමක් එල්ල කරමින් ලාභදායීතාවයටද සෘණ බලපෑමක් එල්ල කරයි. ලැබිය යුතු ණය ප්‍රමාණයෙන් 90% ක්ම විදුලිබල ක්ෂෙත්‍රයෙන් සහ ගුවන් තෙල් ක්ෂෙත්‍රයෙන් වේ. මෙම අංශ දෙකේ ක්‍රියාකාරීත්වය සංස්ථාවේ ණය තත්වය වෙත පීඩනයක් එල්ල කරමින් සංස්ථාවේ ලාභදායීතාවය සහ මූල්‍ය තත්වය වෙත අවසාන වශයෙන් බලපෑමක් එල්ල කරයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • ගෙවිය යුතු බදු රජයේ ආයතන වලින් ලැබිය යුතු ණය සමග හිලව් කිරීම.<br>• හිඟ මුදල් නැවත අය කර ගැනීම සඳහා රජය මැදිහත් වීම.<br>• හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීම.<br>• ණය ප්‍රතිපත්තිය නියාමනය කිරීම. |
| උපාය මාර්ග | • සුරැකුමක් යටතේ හෝ ගිවිසුමකට එළඹීමෙන් පසු රජයේ ආයතන වෙත ණය පදනම යටතේ නිෂ්පාදන අළෙවි කිරීම.<br>• ණය ප්‍රතිපත්තිය වැඩි දියුණු කර නියාමනය කිරීම.<br>• රජයේ හිඟ ලැබීම් මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමෙන් පියවා ගැනීම. |

## විනිමය අනුපාත අවදානම

විකුණුම් ආදායමෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල් වලින් ජනනය වන අතර ඛනිජ තෙල් නිෂ්පාදනවල ආනයන පිරිවැය සහ පොලී ආපසු ගෙවීම ඇතුළු ණය බොහෝ දුරට එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලැබේ. ඒ අනුව, වන විට සංස්ථාව විසින් USD බිලියන 2 කට වැඩි ණය සහ ගෙවිය යුතු ණය ලිපි සහ බිල්පත් USD බිලියන 1 කට වඩා වැඩි බැවින් සංස්ථාව විනිමය අනුපාත අවදානම් වලට බෙහෙවින් නිරාවරණය වේ. විනිමය අනුපාතිකයේ චලනය රු. 1/- සංස්ථාව හි මූල්‍ය ක්‍රියාකාරිත්වයට බිලියන ගණනින් බලපෑම් ඇති කරයි. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම ලාභදායිත්වය, මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහය මත විනිමය අනුපාත අලාභයේ අමතර බරක් ඇති කරයි.

| | |
|---|---|
| අවම කරනු ලබන මෙවලම් | • බැංකු විසින් ලබා දෙන විනිමය අනුපාතය, වෙළඳපල හැසිරීම සහ ඇ.ඩොලර් මිලදී ගැනීම පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය.<br>• සාධාරණ විනිමය අනුපාතයකට ඩොලර් මිලදී ගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම.<br>• බැංකු විසින් ඇ.ඩො. අලෙවි කිරීමේ අනුපාතය සඳහා රාජ්‍ය මැදිහත්වීම ලබා ගැනීම සහ ඒ සඳහා ආන්තිකයක් සැකසීම. |
| උපාය මාර්ග | • ඕනෑම ලියාපදිංචි වෙළඳ බැංකුවකින් තරඟකාරී මිල ගණන් යටතේ ඇ.ඩොලර් මිලදී ගැනීමට ස්වාධීනත්වය ලබා දීම.<br>• ඇ.ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කිරීම.<br>• බැංකු වෙත පවත්නා ණය ගෙවීම සඳහා සහන මිල සහනාධාර කොටස රජයෙන් ලබා ගැනීම. |


# සංස්ථායික පාලනය

කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ බාහිර ප්‍රාග්ධනයට ඔවුන්ගේ ප්‍රවේශය වැඩි කිරීම සහ උපාය මාර්ගික වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යහ පාලනය තිරසාර සංවර්ධනයට දායක වේ. අපගේ සංස්ථායික පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය, හිමිකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර සබඳතා ගැන සැලකිලිමත් වේ.

අපගේ පාලන මූලධර්ම ආයතනික සාර්ථකත්වය සහ ආර්ථික වර්ධනය සහතික කරන විනිවිදභාවය, වගවීම ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කරයි.

අපගේ සංස්ථායික පාලන රාමුව අභ්‍යන්තර සහ බාහිර උපකරණවල අඩංගු මූලධර්ම සහ අවශ්‍යතා මගින් මෙහෙයවනු ලැබේ.

| |
|---|
| **අභ්‍යන්තර මෙවලම්** |
| 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත |
| අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන උප කමිටුවල කාර්ය භාරය. |
| අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ. |
| මූල්‍ය අධිකාරය පවරා දීම |
| චර්යාධර්ම සංග්‍රහය |
| **බාහිර මෙවලම්** |
| 1971 අංක 28 දරන මුදල් පනත |
| යහපාලනය සඳහා පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ |
| මහා භාණ්ඩාගාර / රාජ්‍ය චක්‍රලේඛ |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථායික පාලනය මත වන සංග්‍රහය |
| ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව |
| ජාත්‍යන්තර වාර්තාකරණ ආයතනය (Global Reporting Initiative) විසින් නිකුත් කරන ලද තිරසාර වාර්තාකරණය සඳහා GRI ප්‍රමිති |



## අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රමෝපායික, මූල්‍ය සහ කීර්තිනාමය සඳහා වන කරුණු සම්බන්ධයෙන් තීරණ ගන්නා සංස්ථාවේ ප්‍රධාන ගාමක බලවේගය අධ්‍යක්ෂ මණ්ඩලයයි. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක වීමට අවශ්‍ය නිර්නායකයන් සහ යහපත් ආයතනික පාලනයක් සහතික කරයි. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය සහ වගකීම් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ධූර කාලය පිළිබඳ එම පනත මඟින් විධි විධාන සලසා ඇත.

| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ ධූරයේ ස්වාභාවය | පත්වීමේ/ නැවත පත්වීමේ දිනය |
|---|---|---|
| W.W.D. සුමිත් විජේසිංහ මහතා. | සභාපති | 03.01.2020 |
| බුද්ධික ආර්. මඩිහහේවා මහතා. | කළමනාකාර අධ්‍යක්ෂ | 16.01.2020 |
| R.M.D.K රත්නායක මහත්මිය. | අධ්‍යක්ෂ | 13.01.2020 |
| තරිඳු එච් එක්නැන්දගෙදර මහතා. | අධ්‍යක්ෂ | 17.01.2020 |
| චාමින්ද හෙට්ටිආරච්චි මහතා. | අධ්‍යක්ෂ | 17.01.2020 |
| බුද්ධික ඉද්දමල්ගොඩ මහතා. | අධ්‍යක්ෂ | 17.01.2020 |
| තිලංග එන් පොල්වත්තගේ මහතා. | අධ්‍යක්ෂ | 17.01.2020 |

සංස්ථාවේ දැක්ම සහ මෙහෙවර වෙත ළඟා වීමට තනි තනිව මෙන්ම සාමූහිකව දායක වන විශේෂඥ දැනුම සහ ව්‍යාපාරික ඥානය පිළිබඳ පුළුල් ක්ෂේත්‍රවලින් අධ්‍යක්ෂ මණ්ඩලය මනාව සන්නද්ධ වේ. අධ්‍යක්ෂවරුන්ගේ සාරාංශගත විශේෂඥතාව ඔවුන්ගේ සුදුසුකම් සහ අත්දැකීම් මෙම වාර්තාවේ පිටු 21 සිට 24 දක්වා ඇතුළත් කර ඇත.

## පත්වීම්

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ බලශක්ති අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතරින් එක් අධ්‍යක්ෂවරයෙකු මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු වන අතර එක් අධ්‍යක්ෂවරයෙකු බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයෙකු වේ. 2020 වර්ෂය තුළ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ හැර අනෙකුත් සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අය විය. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතට අනුව අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීමට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ වසර තුනක් නොඉක්මවන ආරම්භක ධූර කාලයක් ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී කැඳවනු ලැබේ. ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙති. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවත්වනු ලබන අතර රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තීරණ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වන ලදී. පහත වගුවෙන් එම රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම දක්වා ඇත.

| අධ්‍යක්ෂ | පැමිණීම |
|---|---|
| W.W.D. සුමිත් විජේසිංහ මහතා. | 12/12 |
| බුද්ධික ආර්. මඩිහහේවා මහතා. | 12/12 |
| R.M.D.K රත්නායක මහත්මිය. | 11/12 |
| තරිඳු එච් එක්නැන්දගෙදර මහතා. | 11/12 |
| චාමින්ද හෙට්ටිආරච්චි මහතා. | 12/12 |
| බුද්ධික ඉද්දමල්ගොඩ මහතා. | 8/12 |
| තිලංග එන් පොල්වත්තගේ මහතා. | 12/12 |

ඵලදායී තීරණ ගැනීම පිණිස අවශ්‍ය සෑම තොරතුරක්ම සංස්ථායික කළමනාකාරීත්වය විසින් හෝ අවශ්‍ය වූ විට බාහිර විශේෂඥයන්ගෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ උප කමිටු වෙත ලබා දෙනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තම තීරණ කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබා ගනිමින් තම වගකීම මනාව ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින තොරතුරු නිසි වේලාවට සපයා දීමට සංස්ථායික කළමනාකාරීත්වය වගකිය යුතු වේ.

## අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් විධායක නොවන සාමාජිකයන්ගෙන් සමන්විත වන අතර, ඔවුන් ස්වාධීන සාමාජිකයන් වේ. විධායක නොවන අධ්‍යක්ෂවරු කළමනාකාරණ ක්‍රියාවලියෙන් ස්වාධීන වූ, අධ්‍යක්ෂ මණ්ඩලයේදී ගනු ලබන තීරණ වෙත බලපෑ හැකි ව්‍යාපාර හෝ වෙනත් සම්බන්ධතාවයන්ගෙන් තොර වූ ස්වාධීන තීරණ වෙත එළඹිය හැකි අධ්‍යක්ෂවරු වේ. මූල්‍ය ප්‍රකාශනයේ වාර්තාකරණ දිනට සෑම අධ්‍යක්ෂවරයෙක්ගෙන්ම තම ස්වාධීනත්වය හෝ ස්වාධීන නොවන බව පිළිබඳ ප්‍රකාශන ලබා ගනු ඇත. පිටු අංක 171 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 31 යටතේ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසාරභාවය පිළිබඳ සමස්ත වගකීම සහ වගවීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව වඩා යහපත් නායකත්වයක් දරමින් සංස්ථාවේ ක්‍රමෝපායික දිශාවන් වෙත සහ සමස්ථ කාර්ය සාධනය වෙත මූලික වශයෙන් දිශාගතව පවතින අතර අදාළ පාර්ශවයන්ගේ රුචිකත්වයන් ආරක්ෂා කරමින් ක්‍රියාකරවීම ද ඔවුන්ගේ මූලික වගකීමකි.

සංස්ථාවේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ද වගකිව යුතුය. මෙම වගකීම ඉටු කිරීමේදී, සංස්ථාව හි උපායමාර්ගය සාක්ෂාත් කර ගැනීම, එහි මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය කිරීම මෙන්ම සංස්ථාව හි ආයතනික පාලන රාමුවේ අවසාන භාරකරු වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවසාන වගවීම ඇත. තවද, ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුගත වීම සඳහා ඔවුන් වගකිව යුතුය.

වෙන් කර ඇති වගකීම ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට එහි බලතල හෝ රාජකාරි ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයෙකුට පැවරිය හැක. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ ඒවා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මගින් සංස්ථාව කෙරෙහි ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය උත්සාහ කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායමේ සියලුම සාමාජිකයින් සමඟ සෘජුවම සන්නිවේදනය කරයි. තවද, අවදානම් කළමනාකරණය සහ නීතිරීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම සඳහා මණ්ඩලයක් පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. එමගින් සංස්ථාව ගුණාංග සහ ඵලදායී හා කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම් සහ භාවිතයන් ආරක්ෂා කිරීමට හැකි වේ.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය, ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම සහ මූල්‍ය කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කිරීමට අනුමැතිය ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ද වගකිව යුතුය. මීට අමතරව, ප්‍රධාන පත්වීම්, කාර්ය මණ්ඩල උසස්වීම්, ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන, ණය ගැනීම් සහ පාරිභෝගිකයින්ට ණය පහසුකම් සඳහා මණ්ඩලය අනුමැතිය ලබා දෙයි.

## සභාපතිවරයාගේ භූමිකාව

සියළුම අධ්‍යක්ෂවරුන් තම වගකීම කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා ඵලදායී ලෙස දායක වන බව සහතික කරමින් සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාදාමයන් නිසි ආකාරයෙන් සිදු වන බවට වග බලා ගැනීම, රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂවරුන් වෙත තොරතුරු ඉදිරිපත් කිරීම සහ නිසි වාර්තා පවත්වාගෙන යාම, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විවිධ අදහස් ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම සහ සාකච්ඡා අතරතුර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම ඔහුගේ වගකීම් අතර වේ. අදාළ සියළු නීති රෙගුලාසි වෙත අනුගත වීම සහතික කිරීම සහ සංස්ථාව නියෝජනය කිරීමද ඔහුගේ වගකීම් අතරට අයත් වේ.

## කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාව

කළමනාකාර අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දෙන තීරණ ක්‍රියාත්මක කරයි. ඔහු සංස්ථාව කළමනාකරණය භාරව සිටී. කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් සංස්ථාවේ සමස්ත මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරනුයේ සංස්ථාව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහාය.

කළමනාකාර අධ්‍යක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට, කර්මාන්තය තුළ සිදුවන වර්ධනයන් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට සහ සමාගමේ මෙහෙවර සහ අරමුණු සපුරාලීමට සහ අදාළ සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ඒවාට අනුකූලව සුදුසු ප්‍රතිපත්ති සකස් කර ඇති බව සහතික කිරීමට උපායමාර්ගික මඟ පෙන්වීම ලබා දෙයි.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතන

සභාපතිතුමාගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු වේතන මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව සිදු කරයි. කළමනාකාරීත්වය වෙත ගෙවනු ලබන ගාස්තු හා වේතන පිටු අංක 172 මුල්‍ය ප්‍රකාශනවල සටහන 31 යටතේ දක්වා ඇත.

## අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය දායකත්වය ලබා දීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උප කමිටු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් බොහොමයක් ඉටු කිරීම සඳහා කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව පත් කර ඇත. තොග සමාලෝචන කමිටුව පත්කර ඇත්තේ රටේ ඉන්ධන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා ඊට අදාළ අනෙකුත් පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහාය. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද නිර්නායක අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය පාරදෘෂ්‍ය ලෙස සිදු කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ ප්‍රසම්පාදන කමිටුව පවත්වයි.

## විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීම සමඟ කළමනාකාරිත්වයෙන් ස්වාධීන කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම වාර්ෂික වාර්තාවේ 97 සහ 98 පිටුවල විගණන කමිටු වාර්තාවේ සංයුතිය, රැස්වීම් ගණන, ඉටු කළ කාර්යභාරය සහ පැමිණීම විස්තර කර ඇත.

## කළමනාකරණ කමිටුව

කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් එක් අයෙක් කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළේය. එම කමිටු රැස්වීම්වලට කාර්යාංශ භාර ප්‍රධානීන් ද සහභාගී වේ. කමිටුවේ සංයුතිය, ඉටු කළ කාර්යභාරය, රැස්වීම් ගණන සහ කළමනාකරණ කමිටුවේ පැමිණීම 96 පිටුවේ කළමනාකරණ කමිටු වාර්තාවේ දක්වා ඇත.

## තොග සමාලෝචන කමිටුව

තොග සමාලෝචන කමිටුව වත්මන් තොග තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසු ඉදිරි මාස තුන සඳහා තෙල් තොග අවශ්‍යතාවය තක්සේරු කරයි. එය CPSTL, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංවීම හි නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් සතිපතා රැස්වේ. රට තුළ පුරෝකථනය කර ඇති ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාවන් සහ ගබඩා කිරීමේ ධාරිතාව කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පසු ආනයනය කිරීමට සහ නැව්ගත කිරීමට ප්‍රමාණයන් සැලසුම් කෙරේ. ජාතියට අඛණ්ඩව ඉන්ධන සැපයීම මෙම කමිටුව මගින් සහතික කෙරේ.

## ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටු

රාජ්‍ය ආයතන සඳහා නිෂ්පාදන, භාණ්ඩ, සේවා සහ වැඩ මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය (NPA) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, ප්‍රසම්පාදන කමිටු (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) වාර්ෂිකව හෝ ප්‍රසම්පාදනය කිරීමට අවශ්‍ය වූ විට පිහිටුවනු ලැබේ.

විනිවිදභාවය සහතික කිරීම, ප්‍රමාදයන් අවම කිරීම සහ මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක සහ ගුණාත්මකව හොඳම සේවා සහ සැපයුම් සංස්ථාව වෙත ලබා ගැනීම සඳහා NPA විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ යටතේ PC සහ TEC ක්‍රියා කරයි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීම්වල තාක්ෂණික අංශ කෙරෙහි අවධානය යොමු කරන අතර, මිලදී ගැනීමක අනෙකුත් අංගයන් ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලයි. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව, කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව මිලදී ගැනීමේ වටිනාකම් මත ක්‍රියාත්මක වේ.

## පාලන සමාගම සමඟ සම්බන්ධතාව

සියළුම සම්බන්ධ ආයතන සමඟ සුහඳ සහ අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම මත සංස්ථාවේ අඛණ්ඩතාවය රඳා පවතී. සංස්ථාව සහ එහි අදාල කණ්ඩායම් අතර සුහඳ අවබෝධය වැඩි දියුණු කිරීම් වැදගත්කම සංස්ථාව අවබෝධ කර ගෙන සිටී. අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සංස්ථාවේ අවසාන තීරණ ගැනීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා රජයට හිමි අධිකාරියකි. සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා සංස්ථාව විසින් බලශක්ති අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වනු ලබයි.

ප්‍රධාන ව්‍යාපෘති වැඩසටහන් සඳහා සංස්ථාව විසින් එම ආයතන මඟින් උපදෙස් මාර්ගෝපදේශ සහ අරමුදල් ලබා ගනී. රජය සමඟ ගනුදෙනු කිරීම සඳහා වන ප්‍රධාන නිලධාරීන් සභාපතිතුමා/ කළමනාකාර අධ්‍යක්ෂතුමා වන අතර එවැනි සන්නිවේදනය වාචිකව සහ ලිඛිතව සිදු කරයි.

## අභ්‍යන්තර පාලන

සංස්ථාව සුමටව ක්‍රියාත්මක වීමට ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. මෙම පද්ධතිය සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සහ නිසි වාර්තා පවත්වාගෙන යාම සහ විශ්වාසනීය තොරතුරු කාලීන පදනමින් ඉදිරිපත් කිරීම සහතික කිරීම අපේක්ෂා කරයි. අභ්‍යන්තර පාලන පද්ධතිය අවදානම් කළමනාකරණය සමඟින් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනය ඇතුළු සියලු වර්ගවල පාලන ආවරණය කරයි. අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අසමත් වීමේ අවදානම ඉවත් කිරීම වෙනුවෙන් සංස්ථාවෙ හි ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රයන් පිළිගත හැකි අවදානම් පැතිකඩක් තුළ අදාළ අවම කිරීමේ සාධක සමඟ කළමනාකරණය කරයි. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය තොරතුරු වලින් තොර බවට අභ්‍යන්තර පාලන පද්ධතිය සාධාරණ සහතිකයක් සපයයි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය මෙහෙයවනු ලබන්නේ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයෙකු විසිනි. විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම් අභ්‍යන්තර පාලන තක්සේරු කිරීමට, අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීමට සහ ගනුදෙනුවල සම්පූර්ණත්වය තහවුරු කිරීමට ක්‍රියාත්මක විය. කළමනාකාරීත්වයට නිරීක්ෂණ සහ නිර්දේශ ලබාදීමේ අරමුණින් අභ්‍යන්තර විගණන කාර්යයට විශේෂ විගණන පවරනු ලැබේ. නිෂ්පාදන අලාභ හා ආදායම් අලාභ යන ක්ෂේත්‍රවලට අදාළ අවදානම් හඳුනා ගැනීම, වත්කම් ආරක්ෂා කිරීම සහ විගණන විමසුම්වලට පිළිතුරු සමඟ විගණකාධිපති වාර්තාව සාකච්ඡා කිරීම අභ්‍යන්තර විගණනය මඟින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් වේ.

## සංස්ථායික කළමනාකරණය

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ගික මඟ පෙන්වීම, සකස් කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මත පදනම්ව සංස්ථාවේ නිත්‍ය කටයුතු කළමනාකරණය කරයි.

සංස්ථාව හි මෙහෙයුම් සහ ප්‍රධාන පරිපාලනය පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු ප්‍රධාන කාර්යාල මෙහෙයුම් යන ප්‍රධාන කාණ්ඩ දෙකෙහි සිදු කෙරේ.

පිරිපහදු මෙහෙයුම් මෙහෙයවනු ලබන්නේ පිරිපහදු කළමණාකරු වන අතර ඔහුට විදුලි සහ උපකරණ, නිෂ්පාදන සහ මෙහෙයුම්, නඩත්තු සහ ව්‍යාපෘති සහ තාක්ෂණික සේවා වැනි විවිධ මූලික තාක්ෂණික ක්ෂේත්‍රවල නියෝජ්‍ය පිරිපහදු කළමණාකරුවන්ගේ සහාය හිමිවේ.

ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් කාර්යංශ කිහිපයකට වෙන් කර ඇති අතර එක් එක් කාර්යංශය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු හෝ කළමනාකරුවෙකු විසින් මෙහෙයවනු ලබන අතර ඔහු සංස්ථාවේ දෛනික ක්‍රියාකාරිත්වය සඳහා සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාට සහාය වේ. පිරිපහදුව සහ ප්‍රධාන කාර්යාලය යන දෙකෙහිම ආයතනික කළමනාකරුවන් කුසලතා, පළපුරුද්ද සමඟ හොඳින් සමතුලිත වන අතර ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රවල අධ්‍යයන උපාධි සහ අදාළ වෘත්තීය සුදුසුකම් සමඟ මනා සුදුසුකම් වලින් පොහොසත් වේ. සංස්ථායික කළමනාකාරිත්වයේ සාරාංශගත සුදුසුකම් මෙම වාර්තාවේ පිටු 25 සිට 28 දක්වා ඇතුළත් කර ඇත.

## අනුකූලතාවය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය සියලු කටයුතුවල විනිවිදභාවයක් පවත්වා ගැනීමට කැපවී සිටී. අදාළ සියලුම නීති සම්පාදනය, රෙගුලාසි, ප්‍රමිතීන්, යහපත් භාවිතයන් සහ කේතයන්ට අනුකූල වීම සංස්ථාවේ සාර්ථකත්වයට සහ තිරසාරභාවයට අත්‍යවශ්‍ය අංගයකි. සංස්ථාව හි සංස්ථායික පාලනය ව්‍යුහගත කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථායික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහයේ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශ සහ 2003 වසරේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ නිර්නායක අනුව වේ. ශක්තිමත් සංස්ථායික පාලන භාවිතයන් ආරක්ෂා කරමින් එම අවශ්‍යතාවලට අනුකූල වීමට අධ්‍යක්ෂවරුන් කැපවී සිටී. 1971 අංක 38 දරන මුදල් පනතට සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතට අනුව සංස්ථාවේ දෛනික මෙහෙයුම් කටයුතු තුළට අභ්‍යන්තර පාලන පද්ධතිය ඒකාබද්ධ වී ඇත.

# කළමනාකරණ කමිටු වාර්තාව

## පාලනය

කළමනාකරණ කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වන අතර කමිටුවේ සාමාජිකයින් පත් කරනු ලැබුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. කමිටුවේ මූලික කාර්යභාරය වනුයේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම, අභියෝග ජය ගැනීමට ක්‍රියා කළ හැකි යාන්ත්‍රණයක් ගැනීම සහ සංස්ථාවල වත්කම් ආරක්ෂා කිරීමයි. කමිටුවේ වගකීම් පහත දක්වා ඇත.

- ව්‍යාපාර මෙහෙයුම් නිරීක්ෂණය කිරීම.
- සංස්ථාව නිරාවරණය වන අවදානම් සමාලෝචනය කිරීම සහ පිළිගත හැකි මට්ටමට අවදානම අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ඉදිරිපත් කෙරෙන මෙහෙයුම් කරුණු අධීක්ෂණය කිරීම.
- මානව සම්පත් සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් ලබා දීම.

## කමිටුවේ සහ රැස්වීම්වල සංයුතිය

කළමනාකරණ කමිටුව සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ සහ සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරුන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් පහළොවක් පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද වගකීම්, අධිකාරීන් සහ විශේෂිත රාජකාරි විෂය පථය ආවරණය වන පරිදි කමිටුවේ ප්‍රඥප්තිය සකස් කර ඇත.

## කළමනාකරණ කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන්

කළමනාකරණ කමිටුව සිය වගකීම් ඉටු කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන උපායමාර්ගික ගැටළු සමාලෝචනය කරන ලදී.
- SAP මොඩියුලවල අවශ්‍යතා සහ වෙනස් කිරීම් පිළිබඳව සාකච්ඡා කරන ලදී.
- අදාළ කාර්යංශයන් විසින් ඉදිරිපත් කරන ලද කමිටු පත්‍රිකා සඳහා අනුමැතිය සහ උපදෙස් සාකච්ඡා කර ලබා දීම.
- නිශ්චිත උපායමාර්ගික ගැටළු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- වරින් වර පැන නගින මෙහෙයුම් ගැටළු සමාලෝචනය කර උපදෙස් ලබා දීම.

## නිගමනය

ක්‍රමෝපාය ගැටළු සඳහා නිර්දේශ සහිත කළමනාකරණ කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී.

සුමිත් විජේසිංහ
සභාපති - කළමනාකරණ කමිටුව

# විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති විධායක නොවන අධ්‍යක්ෂවරුන් විගණන කමිටුවට පත් කරන ලද අතර එම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. මූල්‍ය වාර්තාකරණයේ සහ විගණන ක්‍රියාවලීන්ගේ අඛණ්ඩතාව සහතික කිරීම සහ හොඳ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති පවත්වාගෙන යාම විගණන කමිටුවේ මූලික කාර්යභාරය වන අතර නිර්දේශ සමඟින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සොයාගැනීම් විගණන කමිටුව වාර්තා කරයි. කමිටුවේ වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ ඒවායේ අඩංගු සැලකිය යුතු වාර්තාකරණ විනිශ්චයන් අධීක්ෂණය කිරීම.
- ව්‍යාපාර මෙහෙයුම් වල අනුකූලතා නිරීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාකාරකම් සහ සඵලතාවය පරීක්ෂා කිරීම.
- අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල සඵලතාවය පරීක්ෂා කිරීම..
- සංස්ථාව නිරාවරණය වන අවදානම්, අවදානම අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම.
- වර්ෂය සඳහා විගණන සැලැස්ම සාකච්ඡා කර අනුමත කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව සාකච්ඡා කිරීම.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු සාමාජිකයන් ලෙස පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් විගණන කමිටු රැස්වීම් පහක් (05) පවත්වා ඇත.

2020 වසර සඳහා කමිටු සාමාජිකයන් ලෙස ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය (සභාපති), වමින්ද හෙට්ටිආරච්චි මහතා (සාමාජික) සහ තරිඳු එක්නැන්දගෙදර මහතා (සාමාජික) යන මහත්ම මහත්මීන් පත් කරන ලදී. ඔවුන්ගේ වගකීම් නිසි ලෙස ඉටු කිරීම සඳහා මූල්‍ය, මෙහෙයුම් සහ පාලන කටයුතු පිළිබඳ ඔවුන්ගේ පුද්ගලික මෙන්ම සාමූහික ප්‍රවීණත්වය යොදාගනු ලැබේ.

රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි විගණන කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම්, අධිකාරීන් සහ විශේෂිත රාජකාරි විෂය පථය ආවරණය වන පරිදි කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

## රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ, ඉහත සඳහන් කළ පරිදි ඔවුන් වෙත පැවරී ඇති රාජකාරි සහ වගකීම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටු රැස්වීම් පහක් (05) පවත්වා ඇත.

| රැස්වීම් අංකය | දිනය | සහභාගී -ත්වය | සහභාගී වූ සාමාජිකයන් |
|---|---|---|---|
| 87 | 14.02.2020 | 3/3 | ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය<br>වමින්ද හෙට්ටිආරච්චි මහතා<br>තරිඳු එක්නැන්දගෙදර මහතා |
| 88 | 22.05.2020 | 3/3 | ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය<br>වමින්ද හෙට්ටිආරච්චි මහතා<br>තරිඳු එක්නැන්දගෙදර මහතා |
| 89 | 24.07.2020 | 3/3 | ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය<br>වමින්ද හෙට්ටිආරච්චි මහතා<br>තරිඳු එක්නැන්දගෙදර මහතා |
| 90 | 18.09.2020 | 3/3 | ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය<br>වමින්ද හෙට්ටිආරච්චි මහතා<br>තරිඳු එක්නැන්දගෙදර මහතා |
| 91 | 21.12.2020 | 3/3 | ආර්.එම්.ඩී.කේ රත්නායක මහත්මිය<br>වමින්ද හෙට්ටිආරච්චි මහතා<br>තරිඳු එක්නැන්දගෙදර මහතා |

## විගණන කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කරන ලද මූල්‍ය වාර්තාකරණ ක්‍රමය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. අනාවරණය කිරීම් සහ අනෙකුත් නියාමන අවශ්‍යතා ඇතුළු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එස්.එල්.එෆ්.ආර්.එස්. / එල්.කේ.ඒ.එස් ඇතුළු මූල්‍ය වාරතාකරණ ප්‍රමිත ගළපා ඊට අනුකූලව සකස් කර ඇති බවට සහතික වීමද, මෙම කමිටුවේ කර්තව්‍යයකි. සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව, කාලය සහ පැවැත්ම විගණන කමිටුව සමාලෝචනය කරයි.

ඉහත කරුණු හැරුණු විට කමිටුව සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- සංස්ථාව නිරාවරණය වන අවදානම් සහ අවදානම අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාව සමාලෝචනය කරන ලදී.
- කොවිඩ් -19 වසංගතය හේතුවෙන් මෙහෙයුම් වලට ඇති බලපෑම සහ අභියෝග අවම කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලදී.
- 2019 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ථාවට අදාලව වත්මන් තත්වය සමඟ සාකච්ඡා කරන ලදී.
- 2020 වර්ෂයේ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවල සාරාංශය සහ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනය සමාලෝචනය කරන ලදී.
- 2021 වසර සඳහා විගණන සැලැස්ම සාකච්ඡා කර අනුමත කරන ලදී.
- අපේක්ෂිත විනය ක්‍රියාමාර්ගවල වත්මන් තත්වය සහ නොවිසඳුණු නිවාස ණයවලට අදාළ ගැටලු සාකච්ඡා කෙරිණි.
- සංස්ථාව සහ CPSTL අතර අන්තර් සමාගම් ශේෂවල වෙනස්කම් සාකච්ඡා කරන ලදී.

## අභ්‍යන්තර විගණන කාර්යාංශය

අභ්‍යන්තර විගණනයේ කාර්යභාරයට අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලනවල සඵලතාවය තක්සේරු කිරීම, අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ගනුදෙනුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීම ඇතුළත් වේ.

අභ්‍යන්තර විගණනය විසින් සකස් කරන ලද විගණන සැලැස්මක් වසර ආරම්භයේදී විගණන කමිටුව විසින් අනුමත කරනු ලබන අතර සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා විගණන වාර්තාවේ සාරාංශය විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

ඉහත කරුණු හැරුණු විට, අභ්‍යන්තර විගණන කාර්යය විශේෂිත විමර්ශනවල නිරත වන අතර ඒ පිළිබඳව කළමනාකාරිත්වයට නිරීක්ෂණ සහ නිර්දේශ සැපයීම. විගණන නිර්දේශ ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීම සඳහා වරින් වර සමාලෝචන සැලසුම් කෙරේ.

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය.

- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරන ලද අතර නිවැරදි කිරීම සඳහා දුර්වලතා සන්නිවේදනය කිරීම.
- 2020 මාසික මූල්‍ය ප්‍රකාශන සාකච්ඡා කරන ලදී.
- 2019 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කරන ලදී.
- අනුමත විගණන සැලැස්මට අනුව විගණන 113 ක් සිදු කරන ලදී.
- විගණන කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන වාර්තා සාකච්ඡා කරන ලදී.
- ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට කළමනාකරණ විගණනයක් සිදු කරන ලදී.

## නිගමනය

සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නියමිත ප්‍රතිපත්තිවලට අනුකූලව කළමනාකරණය කරන බවටත් සංස්ථාවේ වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර ඇති බවටත් සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සාධාරණ සහතිකයක් ලබා දෙන බව විගණන කමිටුවේ අදහසයි.

R.M.D.K රත්නායක
සභාපතිනිය - විගණන කමිටුව

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය ප්‍රකාර, 2019 දෙසැම්බර 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ සභාපතිතුමාගේ පණිවිඩය, කළමනාකර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය, කළමනාකරණ සමාලෝචනය, අගය එකතු කිරීම, සංස්ථායික යහපාලනය, විගණන කමිටු වාර්තාව, විගණකාධිපති වාර්තාව ආදිය සතුටින් ඉදිරිපත් කරමු.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත වූ රාජ්‍ය ව්‍යාපාරික ආයතනයකි. සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලැබේ. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 හි පිහිටා ඇත.

මෙම වාර්තාවේ අන්තරගත කර ඇති විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (එස්.එල්.එෆ්.ආර්.එස්. / එල්. කේ.ඒ.එස්.), 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ විධිවිධාන සහ 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ ඒ සඳහා පසුව සිදු කරන ලද සංශෝධන ප්‍රකාර සිදු කර ඇත.

## මූලික ක්‍රියාකාරකම්

සංස්ථාවේ මූලික ක්‍රියාකාරකම් වනුයේ ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය පිරිපහදු කිරීම සහ අළෙවි කිරීමයි. සංස්ථාව විසින් ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ද කරයි.

## ආශ්‍රිත සමාගම

2/3 ක කොටස් අයිතියක් සතු ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සංස්ථාවේ එකම ආශ්‍රිත සමාගම වේ. තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට ඉන්ධන ගබඩාකරණ පහසුකම්, බෙදාහැරීම් සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම් අයිති වේ.

## සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය තුළ, කල්බදු සඳහා ගිණුම් ප්‍රතිපත්තිය සහ විලම්භිත බදු වගකීම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' මගින් නියම කර ඇති පරිදි පෙර ගිණුම් වර්ෂයේදී අනුගමනය කරන ලද ඒවාට අනුකූල වූ අතර ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවීය. ඉහත ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමේ බලපෑම සහ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත.

## විගණක වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව 106 සිට 130 දක්වා පිටුවේ දක්වා ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

2020 මූල්‍ය වර්ෂය තුළදී සංස්ථාවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සමාලෝචනය සහ කාර්ය සාධනය පිටු අංක 13 සිට 15 දක්වා සභාපතිතුමාගේ සමාලෝචනයේ ද, පිටු අංක 16 – 19 දක්වා වන කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනයයේද, පිටු අංක 37 – 48 දක්වා සංස්ථාවේ කාර්ය සාධනය ද දක්වා ඇත.

## අධ්‍යක්ෂවරු

2020.12.31 දිනට කාර්යාලය දරමින් සිටි අධ්‍යක්ෂවරුන්ගේ නම්;

| අධ්‍යක්ෂ | ධූරය |
|---|---|
| ඩබ්.ඩබ්.ඩී. සුමිත් විජේසිංහ මහතා | සභාපති |
| බුද්ධික මඩිහහේවා මහතා | කළමනාකාර අධ්‍යක්ෂ |
| ආර්.එම්.ඩී.කේ.රත්නායක මිය | අධ්‍යක්ෂ |
| තරිඳු එච්. එක්නැන්දගෙදර මහතා | අධ්‍යක්ෂ |
| චාමින්ද හෙට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ |
| බුද්ධික ඉද්දමල්ගොඩ මහතා | අධ්‍යක්ෂ |
| නිලංග නදීර පොල්වත්තගේ මහතා | අධ්‍යක්ෂ |

## රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන කමිටුව සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් පිළිබඳ විස්තර වාර්ෂික වාර්ථාවේ 91 සිට 104 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත.

වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ 92 පිටුවේ දක්වා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතනය

වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වේතනය පහත පරිදි වේ.

| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 5.547 | 7.658 |

## කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සංස්ථාව සමඟ අධ්‍යක්ෂවරුන්ගේ ඍජු සහ වක්‍ර රුචිකත්වයන්/බැඳියාවන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන 31 හි දක්වා ඇත.

## අභ්‍යන්තර පාලන පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව තුළ ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇත. අභ්‍යන්තර ක්‍රියා පටිපාටි, අවදානම් විශ්ලේෂණය, අනුකූලතා සහ අනෙකුත් පාලනයන් සමාලෝචනය කිරීම, ඇගයීම සහ සත්‍යාපනය කිරීම සඳහා සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයකුගේ ප්‍රධානත්වයෙන් වෙනම අභ්‍යන්තර කාර්යංශයක් ක්‍රියාත්මක වන අතර නිරීක්ෂණ වරින් වර විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. ඊට අමතරව, නිරීක්ෂණ නිවැරදි කිරීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරීත්වය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

## අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සම්බන්ධව සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මේ සඳහා ඵලදායී සහ විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් අධ්‍යක්ෂවරුන් විසින් ඇති කර ඇත. අවදානම් කළමනාකරණයේදී සංස්ථාව විසින් ගනු ලැබූ විශේෂිත පියවර පිටු අංක 89 සිට 90 දක්වා අවදානම් කළමනාකාරණ වාර්තාවේ දක්වා ඇත.

## මූල්‍ය ක්‍රියාකාරීත්වය

2020 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය සංසන්ධනාත්මකව පහත දක්වා ඇත.

| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| ශුද්ධ අලෙවි ආදායම | 510,131 | 630,859 |
| අලෙවි පිරිවැය | (454,880) | (626,599) |
| දළ ලාභය | **55,251** | **4,260** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 818 | 529 |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | (15,781) | (17,981) |
| පරිපාලන වියදම් | (6,353) | (5,869) |
| මූල්‍ය ගෙවීම් | (20,911) | (14,698) |
| මූල්‍ය ආදායම් | 11,188 | 13,526 |
| විනිමය අනුපාත විචල්‍යතා | (21,841) | 8,397 |
| ලාභය / (අලාභය) බදු පෙර | **2,371** | **(11,836)** |

## ආදායම

2019 වසරට සාපේක්ෂව සංස්ථාවේ ආදායම රු. බිලියන 519 ක් දක්වා 19.75% කින් පහළ ඇත. කොවිඩ් -19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා මාර්තු සහ අප්‍රේල් මාසවල රට අගුලු දැමීම සහ සංචරන සීමා කිරීම නිසා සියලුම අංශවල විකුණුම් ප්‍රමාණයන් අඩු විය.

## ලාභ

ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම සහ හිතකර උපාය මාර්ග ස්ථානගත කිරීමත් සමඟ 2020 වසරේ දළ ලාභය රු. මිලියන 4,260 සිට රු. මිලියන 55,251 දක්වා වර්ධනය විය. ජාත්‍යන්තර මිල ගණන්වල ඉහත හිතකර හැසිරීම් හේතුවෙන් සංස්ථාව හි ශුද්ධ ලාභය රු. මිලියන 2,371 කි.

## ආංශික කාර්ය සාධනය

ප්‍රවාහන අංශයෙන් මුළු ආදායමට වැඩිම දායකත්වය ලෙස රු. බිලියන 377.5 (2019 දී රුපියල් බිලියන 430.4) ක දායකත්වයක් ලබාදෙන ලදි. කොවිඩ් -19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා මාර්තු සහ අප්‍රේල් මාසවල රට අගුලු දැමීම සහ සංචරන සීමා කිරීමත් සමඟ 2020 වර්ෂයේදී ආදායම 12.29% කින් පහත වැටීමක් වාර්තා විය. ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම නිසා වසර තුළ මෙම අංශයෙන් ජනනය වන පාඩුව රු. බිලියන 25.9 සිට රු. බිලියන 3.5 දක්වා අඩු විය. කෙසේ වෙතත්, සහන මිලට නිෂ්පාදන සැපයීම මෙන්ම ආදායමෙන් 29%ක් රජයට බදු වශයෙන් ලබා දීමෙන් සංස්ථාව ආර්ථික හා සමාජ සුබසාධනයට දායක වන බව අපගේ අදහසයි.

| කාණ්ඩය | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| ප්‍රවාහන අංශය | 377,536 | 430,425 |
| බලශක්ති උත්පාදන | 81,147 | 118,675 |
| ගුවන්තෙල් අංශය | 19,486 | 58,990 |
| කර්මාන්ත | 11,308 | 13,497 |
| ගෘහස්ත අංශය | 17,563 | 20,211 |
| කෘෂි රසායන | 570 | 457 |
| අපනයන | 11,261 | 4,336 |
| **එකතුව** | **518,871** | **646,591** |

විදුලිබල උත්පාදන සඳහා ඉන්ධන සැපයීමේ අංශය තුලින් වසර තුල රු. බිලියන 81.1 (2019-රු. බිලියන 118.6) ක ආදායමක් වාර්තා කරන ලදි. බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන ඉල්ලුමේ සංයුතිය දැවි තෙල්වලින් 75.81% ක්, ඔටෝ ඩීසල්වලින් 24.19% ක් වන අතර වසර තුළ ලංවිම විසින් නැප්තා මිලදී ගෙන නොමැත.

ගුවන් සේවා අංශය මගින් ජනනය වූ ආදායම රු. බිලියන 19.4 (2019- රුපියල් බිලියන 58.9) කි. සමාලෝචිත වර්ෂය තුළ ගුවන් ඉන්ධන සඳහා ඇති ඉල්ලුම 60.15% කින් තියුනු ලෙස පහත වැටී ඇති අතර එම නිසා ආදායම 66.97% කින් පහත වැටී ඇත.

කර්මාන්ත අංශයෙන් උපයාගත් ආදායම රු. බිලියන 13.4 සිට රු. බිලියන 11.3 දක්වා පෙර වසරට වඩා 16.22 % කින් ආදායම අඩු වී ඇත. මාර්තු සහ අප්‍රේල් මාසවල රට අගුලු දැමීමේ බලපෑම සහ කොවිඩ් -19 වසංගතය මැඩපැවැත්වීම සඳහා වෙනත් සංචරන සීමා කිරීම් හේතුවෙන් ඉල්ලුම් ප්‍රමාණය 15.47% කින් පහත වැටී ඇත.

වර්ෂය තුළ නැප්තා සඳහා විදුලිබල අංශයෙන් ඉල්ලුමක් නොතිබූ බැවින් හා ගබඩා ධාරිතාව සීමිත බැවින් ඒවා අපනයනය කිරීමට සිදු වූ අතර සෘජු අපනයන අංශයෙන් රු. බිලියන 4.3 සිට රු. බිලියන 11.3 දක්වා වර්ධනය විය. කෘෂිරසායන නිෂ්පාදන හරහා උපයන විකුණුම් ආදායම 2019 දී රු. මිලියන 456 සිට 2020 දී රු. මිලියන 570 දක්වා 24.78% ක වර්ධනයක් වාර්තා විය.

## බදු අය කිරීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන අනුව ආදායම් බදු වියදම් ගෙවා ඇත. සංස්ථාව අලාභ ලැබීම හේතුවෙන් සහ ඉදිරියට ගෙන එන ලද සමුච්චිත බදු අලාභයක් දරනු ලැබූ හෙයින් මෙම වර්ෂය සඳහා බදු ගෙවීමක් සිදු නොවිණි. සවිස්තරාත්මක බදු වගකීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන 149 පිටුවේ සටහන 07 හි දක්වා ඇත.

## විශේෂ ගාස්තුව

2014 වර්ෂයේ, රු.බිලි. 10 ක් විශේෂ ගෙවීම් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලෙස උපදෙස් දෙන ලද අතර 2014 වර්ෂය සඳහා රු.මිලි 250 ක් ගෙවීම් ලෙස නිදහස් කිරීමට ඉල්ලා සිටින ලදී. එසේම 2015 වර්ෂය සඳහා රු.මිලි. 750 ක් ද, 2016 සිට 2024 දක්වා කාල පරිච්ඡේදයට වාර්ෂිකව රු.මිලි. 1,000 ක් ද මූල්‍ය ප්‍රකාශන වියදම් ලෙස දක්වා ඇත. ඒ අනුව රු. 2020 වසර සඳහා මිලියන 1,000 ක් ක්‍රමක්ෂය කර ඇත.

## දේපළ, පිරියත සහ උපකරණ

සංස්ථාවේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ මෙන්ම ආයෝජන දේපළ පිළිබඳව විස්තර පිටු අංක 150 මූල්‍ය ප්‍රකාශනවල සටහන 08 දක්වා ඇත.

## දායක ප්‍රාග්ධනය

2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මුළු දායක ප්‍රාග්ධනය රු. මිලියන 28,487.125 (2019 -රු. 28,487.125).

## ප්‍රාග්ධනය සංචිත

2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ප්‍රාග්ධන සංචිත ප්‍රමාණය රු. මිලියන 4,992.686 (2019 - රු. මිලියන 4,992.686).

## මානව සම්පත්

සංස්ථාවේ ක්‍රමෝපාය වත්කම් වල ඒකාබද්ධ කොටසක් ලෙස මානව සම්පත් හැඳින්විය හැකි අතර සංස්ථාවේ ව්‍යාපාර දැක්ම සහ මෙහෙවර වෙත ළඟා වීම සඳහා අගය එකතු කිරීම පිණිස එහි සේවකයන්ගෙන් මනා රුකුලක් ලැබේ. මානව ප්‍රාග්ධනය වැඩි දියුණු කිරීම සඳහා විවිධ පියවර ගන්නා ලද අතර තිරසාර අනාගතයක් උදෙසා ඔවුන්ගේ දායකත්වය ප්‍රශස්ථ කිරීමට කටයුතු කෙරේ. තිරසාර මානව ප්‍රාග්ධනයක් ගොඩනැගීම උදෙසා වෘත්තීය ප්‍රවර්ධනය වෙනුවෙන් පුහුණුව සහ සංවර්ධනය දිරිමත් කිරීම මානව සම්පත් ප්‍රතිපත්තිය වේ. මානව ප්‍රාග්ධන විස්තරය පිටු අංක 66 – 72 දක්වා අගය එකතු කිරීම යටතේ දක්වා ඇත.

## කැපී පෙනෙන නඩු

අධ්‍යක්ෂවරුන්ගේ සහ සංස්ථාවේ නීතිඥයින්ගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශනවල 27 වැනි සටහන යටතේ හෙළිදරව් කර ඇති තවමත් අවසන් වී නොමැති නඩු විභාග සංස්ථාවේ මූල්‍ය ස්ථායීතාවයට හෝ එහි අනාගත මෙහෙයුම් කටයුතුවලට කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරනු ඇත.

## නීති රෙගුලාසි වලට අනුකූල වීම

අදාළ නීති රෙගුලාසිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක් සංස්ථාව විසින් සිදු කර නොමැත

## පාරිසරික ආරක්ෂාව

අදාළ පාරිසරික නීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සංස්ථාව සිය උපරිම උත්සාහය භාවිතා කර ඇති අතර පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවන බවට කිසිදු වාර්තාවක් නොමැත.

## පරිත්‍යාග

සංස්ථාව සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් රුපියල් රු. මිලියන 5.35 ක් වියදම් කර ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

තම දැනුම සහ විශ්වාසය අනුව සියළුම අදාළ නීතිමය සහ ව්‍යවස්ථාපිත බලධාරීන් වෙත සිදු කළ යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් පවත්නා මූල්‍ය ශක්‍යතාවය මත කාලීනව ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරු තෘප්තියට පත් වේ.

## රජය වෙත දායකත්වය

ශ්‍රී ලංකා රේගු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත තීරුබදු, බදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අයකිරීම් වශයෙන් සංස්ථාව විසින් වර්ෂය තුළ රුපියල් මිලියන 152,311 (2019 රු. මිලියන 126,351) ක් රජයට දායකත්වයක් ලබාදී කර ඇත.

## වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා වන ගැළපීම්, පිටු අංක 169 සඳහන් මූල්‍ය ප්‍රකාශනවල සටහන 28 අනාවරණය කර ඇති කරුණු හැර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට පසු කිසිදු භෞතික සිදුවීමක් සිදු වී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ ඉදිරි දැක්ම වැඩිදියුණු කිරීම, මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ අනාගතය සඳහා ශක්තිමත් වාණිජ ශක්‍යතාවක් සහතික කිරීම අරමුණු කර ගනිමින් ආයතනික සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව, සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඉදිරිපත් කර ඇත.

## විගණකවරුන්ගේ පත්වීම

සංස්ථාවේ විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යාවස්ථාවේ 154 වන වගන්තිය මගින් දක්වා ඇති විධි විධාන ප්‍රකාර ඔහුව පත් කර ඇත. විගණනය සඳහා විගණකවරයාගේ වේතනය 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වැනි වගන්තියට අනුව තීරණය කරනු ලබයි.

## විගණකවරුන්ගේ වේතන සහ සංස්ථාවේ කොන්ත්‍රාත් සම්බන්ධ රුචිකත්වය


සංස්ථාව විසින් 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4.0 (2019 - රු. මිලියන 3.5) ක් වන විගණන ගාස්තු ලෙස දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම ප්‍රකාර, සංස්ථාව හෝ එහි ආශ්‍රිත සමාගම සමඟ විගණකවරු විසින් කිසිදු සම්බන්ධතාවයක් හෝ ගිවිසුම්ගත වීමක් නොමැත.

## වාර්තාවේ අන්තර්ගතය පිළිගැන්වීම

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තියෙන් දක්වා ඇති පරිදි, මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් පිළිගන්වයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්තාව අත්සන් තබා ඇත.



සභාපති



කළමනාකාර අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

සංස්ථාව විසින් සියළුම ගණුදෙණු වල නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ වර්ෂය සඳහා පවතින තත්වය සහ ලාභ/අලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කරන අතර ඒ සඳහා සංස්ථාව හි අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇත.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ නිරන්තර රැස්වීම සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණය සඳහා කළමනාකාරිත්වයේ වගකීම් අධීක්ෂණය කරයි. විගණන කමිටු වාර්තාව පිටු 97 සිට 98 දක්වා දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායි සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතා සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලන සමාලෝචනයක් සිදු කර ඇති අතර ඒවායේ කාර්යක්ෂමතාවය සහ ව්‍යාපාර කටයුතු විධිමත්ව කරගෙන යාමට සහ එහි වත්කම් ආරක්ෂා කිරීමට සාර්ථක ලෙස පිළිපැදීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ ආයතනික / ව්‍යාපාර සැලසුම් සමාලෝචනය කර ඇති අතර, ඉදිරි කාලය සඳහා ව්‍යාපාර කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව ඇති බවට සෑහීමකට පත්වේ.


අධ්‍යක්ෂ මණ්ඩලය සලකන්නේ ඔවුන් ස්ථාවර පදනමක් මත සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර, සංස්ථාව සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 131 සිට 173 දක්වා පිටුවල ඇති බව සහතික කරයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද SLFRSs / LKASs සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධාන සහ ඊට පසුව සිදු කරන ලද සංශෝධන අනුව විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

සංස්ථාව රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වන අතර, යම් ප්‍රමාණාත්මක නොගැලපීම් පවතී නම් ඒවා නිවැරදි කිරීමට පියවර ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති.

කළමනාකාර අධ්‍යක්ෂක
04.01.2022

# මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව



# විගණකාධිපති වාර්තාව

2021 දෙසැම්බර් 14

සභාපති
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

**1 මූල්‍ය ප්‍රකාශණ**

**1.1 තත්වාගණනය කළ මතය**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි පරිපාලිතයෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශණය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණය, මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශණ වලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ප්‍රකාරව මාගේ වාර්තාව නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මුදල් ප්‍රවාහයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වය පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය ලෙස 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 2,371 ක බදු පසු ලාභයක් සහ සංස්ථා විස්තීරණ ආදායම රු.මිලි. 20,562 වාර්තා කලද සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 275,561 ක ඍණ ශුද්ධ වත්කම් ප්‍රමාණයක් පෙන්නුම් කෙරේ. පසුගිය වර්ෂ තුළ සංස්ථාව විසින් ලැබූ අධික පාඩුවට විදේශ විනිමය වෙනස්වීමේ අඛන්ඩ අහිතකර බලපෑම, නුසුදුසු මිල ප්‍රතිපත්ති සහ පෙර වසර වලදී සිදු කළ හෙජින් ගනුදෙනුව හා සම්බන්ධ වියදම හේතුවෙන් ලැබූ විශාල අලාභයේ ඍණ බලපෑම වැනි කරුණු හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් තවදුරටත් ක්ෂයවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එසේ හෙයින් රාජ්‍ය මූල්‍ය සහාය නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගෙන යාම ගැටළු සහගත වේ.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) **අන්තර් සමාගම් ශේෂ**

i. සංස්ථාවේ වාර්තාවලට අනුව, අනුබද්ධිත, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) වෙත ගෙවිය යුතු ශුද්ධ මුදල රු. මිලියන 5,965.04 ක් වන අතර එය CPSTL වෙත ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 6,565.79 ක් සහ රු. මිලියන 600.75 කින් සමන්විත වී තිබුණි. කෙසේ වෙතත්, 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිතා කරන ලද CPSTL හි කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව, සංස්ථාවෙන් ලැබිය යුතු ශුද්ධ මුදල රු. මිලියන 7,668.03 ක් වන අතර එය සංස්ථාවට ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 8,017.94 ක් සහ රු. මිලියන 349.92 කින් සමන්විත වී තිබුණි. එබැවින්, ආයතන දෙකෙහි අන්තර් සමාගම් ශේෂයන්හි රු. 1,702.99 ක (පිළිවෙලින් රුපියල් මිලියන 1,452.16 සහ රුපියල් මිලියන 250.83) වෙනසක් නිරීක්ෂණය කරන ලදී.

ii. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සංස්ථාවෙන් ලැබිය යුතු ශුද්ධ මුදල රු. මිලියන 6,958.93 ක් වන අතර එය සංස්ථාවට ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 7,308.85 ක් සහ රු. මිලියන 349.92 කින් සමන්විත වන අතර එය දැනටමත් සමූහ ගිණුම්වල තහවුරු කර ඇති සංඛ්‍යාවලට පටහැනි ය.

iii. සමාලෝචිත වර්ෂය තුළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද CPSTL හි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු රු. මිලියන 782.76 කින්, ආදායම් බදු ලෙස ගෙවිය යුතු රු. මිලියන 182.20 කින්, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු රු. මිලියන 60.24 කින්, අනෙකුත් මෙහෙයුම් වියදම් රු. මිලියන 12.12 කින්, දේපල පිරියත සහ උපකරණ රු. මිලියන 26.67 කින් සහ ආදායම් බදු වියදම රුපියල් මිලියන 3.31 කින් වෙනස් වී තිබුනි.

iv. 2021 ජූලි 22 දිනැති අංක 02/1552 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, මතභේදයට තුඩු දී ඇති හිඟ ණය පොළිය රුපියල් මිලියන 637.04 CPSTL වෙත ගෙවීමටත් සහ පර්යන්ත ගාස්තුවලින් සියයට 5ක් රු. මිලියන 1,226.38 ක් රඳවා ගැනීමටත් අනුමත කරන ලද අතර, එය පසුගිය වසර දෙක සඳහා ද්විගුණ කරන ලද බවුසර් ගාස්තු වලට ආසන්න වශයෙන් සමාන ප්‍රමාණයකි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එවැනි ගනුදෙනු ගැලපීම් කර හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ආ) භූමිතෙල් සහනාධාරය**

2015 නොවැම්බර් 24 දිනැති FP/06/100/02/2016 සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ 2014/12/04 දිනැති අංක TTIP/1/83/(1)T ලිපිය පරිදි කිසියම් මිල අඩුවීමකින් සංස්ථාවට සිදුවන පාඩුව රජයේ සහනාධාරය ලෙස ගෙවා අවසන් කිරීමේ එකඟතාවයක් ඇතිව රජය තීරණය කළ මිලට සංස්ථාව භූමිතෙල් අලෙවි කරයි. 2014 සිට 2020 දක්වා කාලය සඳහා ලැබිය යුතු මුළු සහනාධාර මුදල රු. මිලියන 39,587ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට මහා භාණ්ඩාගාරය ප්‍රතිපූරණය කර ඇත්තේ රුපියල් මිලියන 4,459 කි. සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු සහනාධාරය රු. මිලියන 35,129 ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයේ රු. මිලියන 5,097.72 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු සහනාධාරය රුපියල් මිලියන 30,031 ක් අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන 2,122 ක් සහ පෙර වර්ෂවලට අදාලව (2017 වර්ෂයේ සිට) රුපියල් මිලියන 27,909 ක් අඩු වටිනාකමකින් පෙන්වයි. තවද, එම ආදායම මත ඇති සියලුම සෘජු සහ වක්‍ර බදු ද ගිණුම්ගත කර ගෙවා නොතිබුණි.

(ඇ) සංස්ථාව සතුව එක් එක් ණය සඳහා වෙන වෙනම පොලී ගණනය කිරීමට අදාල විස්තර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා විදේශ විනිමය ණය සඳහා වූ පොලී වියදමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පිළිබඳව සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට විගණනයේදී නොහැකි විය. විගණනයේ දී සිදුකල ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පොලී වියදම් හා සසඳන විට රුපියල් මිලියන 948.9 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, සංස්ථාව ලබා දුන් විනිමය අනුපාතිකය මත විගණනයේ දී සිදු කරන ලද ගණනය කිරීම් හා සංස්ථාවේ ගිණුම්වල දක්වා ඇති ණය පියවීමේ වටිනාකම අතර රුපියල් මිලියන 92.6 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, සංස්ථාව විසින් එක් එක් ණය සඳහා හිඟ මුදල, විස්තරාත්මක පොලී ගණනය කිරීම්, ගිවිසුම් ඇතුළු ණය ලියකියවිලි යනාදී වාර්තා නිසි ලෙස යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) මාසික උපයෝගීතා ගාස්තු එකතු කිරීම.
2013 ඔක්. 29 දිනැති අංක 38/1140 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සංස්ථාව සතු පිරවුම්හල් (CODO) සහ භාණ්ඩාගාරය සතු කාණ්ඩයේ පිරවුම්හල් (TODO) වලින් 2014 ජනවාරි 01 දින සිට මාසික උපයෝගීතා ගාස්තු අය කිරීමට ලබාදී තිබුණි. කෙසේ වෙතත්, මෙම තීරණය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොමැති අතර, එම ගාස්තු පිරවුම්හල් එකොලහකින් පමණක් අයකරගෙන තිබුණි. එසේ හෙයින්, 2014 වසරේ සිට වාර්ෂිකව රු. මිලි. 300 ට වඩා වැඩි අලාභයක් සංස්ථාවට සිදු වී තිබුණු අතර 2014 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුළ සංස්ථාවට දළ වශයෙන් රු.මිලි. 2,300 ට වැඩි සමුච්චිත අලාභයක් සිදුවී තිබුණි. පසුගිය වර්ෂයේ විගණන වාර්තා වල මේ සම්බන්ධයෙන් කරුණු දක්වා තිබුණද, ඉහත දක්වා ඇති පරිදි අදාළ පිරවුම්හල් වලින් මෙම මුදල් අයකර ගැනීමට කිසිදු ඵලදායී පියවරක් මේ වන තෙක් ගෙන නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් සිදු කර නොතිබුණි.

### 1.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 වන දේපළ, පිරියත හා උපකරණ අනුව රු. මිලි. 2,526 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් නැවත ඇස්තමේන්තු කිරීමකින් තොරව අඛණ්ඩව භාවිතා කර තිබූ අතර, ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව සතු ඉඩම් කට්ටි 22 ක් ප්‍රත්‍යාගණන කර නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර එහෙයින් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම සැලකිය යුතු අඩු වටිනාකමක් දක්වා තිබුණි.

### 1.2.4 පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත වන විගණන මතය

සංස්ථාවේ සහ සමූහයේ අනුරූපී ශේෂයන් / ගණුදෙනු සමඟ එකඟ නොවීම සඳහා වන පහත දක්වා ඇති කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කරන ලදී. තවද, 2019 ජූනි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා සංස්ථාව වෙතින් යලිත්වරක් ප්‍රවාහන ගාස්තු වැඩිපුර හෝ අඩුවෙන් අයකර ගැනීම සම්බන්ධව අවිනිශ්චිතභාවය විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල 2.5.2 (අ) සටහනට අදාළව කරුණු පිළිබඳ අවධාරණයක් ඇතුළත් වේ.

**(අ) දේපල, පිරියත සහ උපකරණ**

(i) 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2019 වසරේ නිම කර තිබූ ඉන්ධන ටැංකියක් ඉදිකිරීමට අදාළ රඳවා ගැනීමේ මුදල වූ රු. 31,446,395 ක් ඉන්ධන ටැංකිවල පිරිවැයට ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම ප්‍රමාණයෙන් ඉන්ධන ටැංකිවල වටිනාකම අඩුවෙන් තක්සේරු කර තිබූ අතර, ක්ෂයවීම් ප්‍රමාණයද 2019 වර්ෂයේදී අඩුවෙන් තක්සේරු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා සමුච්චිත ක්ෂයවීම් අඩුවෙන් දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වත්කම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

(ii) LKAS 16 ප්‍රකාරව දළ වශයෙන් රු. මිලියන 7,727.6 ක වටිනාකමකින් යුත් අයිතම 15,148 කින් සමන්විත සම්පූර්ණ ක්ෂය වූ වත්කම් එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි. තවද, 2003 වර්ෂයේ සමාගම ආරම්භයේ සිටම තම වත්කම් නැවත තක්සේරු කිරීමට සමාගම නිසි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.

(iii) SLFRS 16 හි 47 වැනි ඡේදයට අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් කල්බදු පදනම මත 2017 වර්ෂයේදී අත්පත් කරගත් මෝටර් වාහන 6කට අදාළ වත්කම් භාවිත කිරීමේ අයිතිය සහ අදාළ බදු වගකීම් සමාගම විසින් හඳුනාගෙන නොතිබුණි.

**(ආ) අන්තර් සමාගම් ශේෂයන්**

සමාගම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC) අතර අන්තර් සමාගම් ශේෂවල නිරවද්‍යතාවය, පැවැත්ම, තක්සේරුව සහ සම්පූර්ණත්වය පහත සඳහන් හේතු නිසා විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(i) සමාගමේ වාර්තාවලට අනුව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම පිළිවෙලින් රු. මිලියන 7,308.85 ක් සහ රු. මිලියන 349.92 කි. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, සමාගමට ගෙවිය යුතු සහ ලැබිය යුතු අනුරූප මුදල පිළිවෙලින් රු. මිලියන 6,565.79 ක් සහ රු. මිලියන 600.75 කි. ඒ අනුව, එහි නොසැසඳුණු ශුද්ධ වෙනස රු. මිලියන 993.89 ක් වූ අතර, එය රු. මිලියන 743.06 ක් සහ රු. මිලියන 250.83 ක් ආයතන දෙකක් අතර පිළිවෙළින් අන්තර් සමාගම් වෙත ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වේ. කෙසේ වෙතත්, සංස්ථාව විසින් 2021 ජූලි 22 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මතභේදයට තුඩු දී ඇති හිඟ ණය පොලී මුදල වන රුපියල් මිලියන 637.04 ක මුදල CPSTL වෙත ගෙවීමට තීරනය කර තිබුණි.

(ii) සමාගමේ වාර්තාවලට අනුව, LIOC වෙතින් ලැබිය යුතු වටිනාකම රු. මිලියන 655.64 ක් වූ අතර, LIOC වෙතින් ලැබුණු ශේෂ තහවුරු කිරීම අනුව සමාගමට ගෙවිය යුතු මුදල රු. මිලියන 695.82 කි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතන දෙක අතර අන්තර් සමාගම් ශේෂයන් රු. මිලියන 40.18 කින් නොසැසඳෙන බව නිරීක්ෂණය විය.

(iii) සමාගමේ පොදු ලෙජරයේ දක්වා ඇති වටිනාකම සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල (සටහන අංක 19) CPC සම්බන්ධයෙන් සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාලව හෙළිදරව් කිරීම් අතර වෙනස, 2020 දෙසැම්බර් 31 සහ 2019 අවසන් වූ වසර සඳහා පිළිවෙලින් රු. මිලියන 70.87 ක් සහ රු. මිලියන 374.69 ක් බව නිරීක්ෂණය විය.

**(ඇ) පොලී ආදායම සහ නල මාර්ග ආදායම සම්බන්ධ පෙර වසර වලට අදාල ගැලපීම්.**

(i) සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලට අනුව, පසුගිය වසරවල වැරදි ලෙස සටහන් වූ පොලී ආදායම සහ නල මාර්ග ආදායම් අතීතයට බලපාන පරිදි නිවැරදි කර ඇති බව සඳහන් විය. කෙසේ වෙතත්, CPC සහ LIOC වෙතින් පර්යන්ත ආදායමේ පොලී සංරචකය අධික ලෙස අය කිරීමේ දෝෂය රු. 579,805,642 (VAT සහ NBT ඇතුළුව) සහ නල මාර්ග ආදායම රු. 100,220,058 ක් වන අතර LKAS 08 හි 42 ඡේදයට අනුකූලව ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශවල සමුච්චිත බලපෑම් ගැලපීම වෙනුවට 2019 ට පෙර වසරවලට සම්බන්ධ අගයන් පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු යටතේ "කපාහරින ලද වියදම්" ලෙස පෙන්වා ඇත.

(ii) වැඩිපුර අය කරන ලද නල මාර්ග ආදායම රු. 26,789,209 ක් සමාලෝචිත වර්ෂය සඳහා වැඩිපුර අයකරන ලද නල මාර්ග ආදායම යටතේ පෙර වසරට අදාළව වැරදි ලෙස ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. පසුගිය වසරේ (2019) වැඩිපුර අය කළ නල මාර්ගයේ ආදායම රු. 103,920,895 ක් පෙර වසරේ දී කපා හරින ලද අතර, එම වසරේ (2019) වැඩිපුර අය කරන ලද නල මාර්ග ආදායම රු. 30,490,045 කි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරේ ලාභය රු. 73,430,849 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී වැරදි ලෙස වැඩිපුර අය කරන ලද නල මාර්ග ආදායමේ කපා හැරීමේ මුදලට එරෙහිව දිර්ග කාලීන හිඟ ගෙවිය යුතු ශේෂය නැවත ගැලපීම ලෙස රුපියල් 59,510,180ක් කපා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඈ) මුදල් සහ මුදල් සමාන දෑ**

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ විදේශ මුදල් බැංකු ගිණුම්වල ශේෂය රු. 338,378,355 කි. කෙසේ වෙතත්, ලංකා බැංකුව විසින් සපයන ලද ශේෂය තහවුරු කිරීම මත පදනම්ව විගණනයේ දී සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂය රු. 410,613,825 කි. ඒ අනුව, රු. 72,235,470 ක පැහැදිලි කළ නොහැකි වෙනසක් එම සංඛ්‍යා දෙක අතර නිරීක්ෂණය විය. තවද, ලංකා බැංකුවේ ඩොලර් ඉතුරුම් ගිණුමක් වසර කිහිපයක් පුරා නොවෙනස්ව පැවතුණි.

**(ඊ) වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂයන්**

(i) සමාලෝචිත වර්ෂය අවසානයේදී වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 07 ක එකතුව රු. 2,675,710 ක හර ශේෂයන් ඉතිරිව පැවතුණි. එයින් එකතුව රු. 178,610 ක් වූ ශේෂ දෙකක් වසර 05ක් පුරා ඉතිරිව පැවතුණි. තවද, එකතුව රු. 2,497,100 වූ හර ශේෂයන් 5ක් වසර 01 සිට 05 දක්වා නොගෙවා පැවතුනි. කෙසේ වෙතත්, සමාගම ඔවුන්ගේ හර ශේෂ පියවීමකින් තොරව විකුණුම්කරුවන් සමඟ පසුකාලීන ගනුදෙනු කිහිපයක් සිදු කර තිබුණි. එබැවින්, එම ශේෂවල පැවැත්ම සහ නිරවද්‍යතාවය විගණනයේදී සැක සහිත විය.

(ii) වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් හිඟව පැවති එකතුව රු. 15,748,981 ක් වූ ගෙවිය යුතු ශේෂයන් 21 ක් තිබූ අතර එකතුව රුපියල් 56,566,358 ක් වූ ගෙවිය යුතු ශේෂයන් 40ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 01 සිට 05 දක්වා හිඟව පැවතුණි. කෙසේ වෙතත්, ඒවා නිරවුල් කිරීමට CPSTL කළමනාකාරිත්වය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව එම ශේෂවල පැවැත්ම සහ නිරවද්‍යතාවය සැක සහිත විය.

(iii) 2021 අප්‍රේල් 08 දිනැති 21/210 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, සමාගම විසින් ගෙවිය යුතු දිගු කාලීන ශේෂය ක් වූ රු 59,510,180 ක් සමාලෝචිත වර්ෂය තුල ආපසු ගලපා ඇත. කෙසේ වෙතත්, ඒ සඳහා වන පදනමට අදාළ සාක්ෂි විගණනය සඳහා ලබා දී නොතිබිණි.

**(උ) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයන්**

අනෙකුත් ලැබිය යුතු රු. මිලියන 7.2 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ වසර 5 කට වැඩි කාලයක් අයකර නොගෙන පැවතුනි. කෙසේ වෙතත්, එම මුදල අයකර ගැනීමේ හැකියාව පිළිබඳව ප්‍රමාණවත් තහවුරු කිරීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඖ) බදු අය කිරීම

(i) විගණනයට සපයා ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) ගෙවිය යුතු ආදායම් බදු මුදල රු. 383,213,359 කි. එහෙත් ආදායම් බදු ගෙවිය යුතු ශේෂයේ සංයුතියට අදාළ විස්තර විගණනයට ලබා දී නොතිබිණි. කෙසේ වෙතත්, IRD වෙතින් ලැබුණු ශේෂ තහවුරු කිරීමට අනුව, IRD වෙත පියවිය යුතු ශුද්ධ මුදල (ගෙවිය යුතු සහ ලැබිය යුතු) රු. 541,461,671 කි. ඒ අනුව, එම ශේෂ දෙක අතර රු. 158,248,312 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) 2019 වසරේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව ආදායම් බදු වියදම් සඳහා ප්‍රතිපාදනය රු. 1,045,291,808 ක් වන අතර, එම වර්ෂය සඳහා සැබෑ බදු ගෙවීම රු. 1,005,993,161 කි. ඒ අනුව පසුගිය වසරේ ආදායම් බද්ද සඳහා වෙන් කර තිබූ අධිප්‍රතිපාදන රු. 39,298,647 සමාලෝචිත වර්ෂයේදී ගැලපිය යුතුව තිබුනද, ගැලපුම් කරන ලද මුදල රු. 36,441,226 කි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආදායම් බදු ප්‍රතිපාදනවල සමාලෝචිත වර්ෂය තුළ රු. 2,857,421 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) විගණනයට ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති වටිනාකම සහ ප්‍රාග්ධන දීමනා සඳහා හිමිකම් නොලබන ගිණුම්කරණයේදී සලකා බැලූ දේපල, පිරියත සහ උපකරණවල (සින්නක්කර ගොඩනැගිලි සහ මෝටර් රථ) ශුද්ධ පොත් වටිනාකම (NBV) අතර රු. 66,931,834 වෙනසක් නිරීක්ෂණය විය.

(iv) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා IRD වෙත ගෙවිය යුතු එකතු කල අගය මත බදු (VAT) මුදල රු. 53,278,154 කි. කෙසේ වෙතත්, IRD වාර්තා වලට අනුව, IRD වෙත ලැබිය යුතු ශුද්ධ මුදල (ලැබිය යුතු සහ ගෙවිය යුතු) රු. 138,747,556 කි. ඒ අනුව, එම ශේෂ දෙක අතර රුපියල් 85,469,402 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) සමාගමේ වාර්තා පරිදි 2020 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ආදායම රු. 3,140,630,614 කි. කෙසේ වෙතත්, IRD වෙත ඉදිරිපත් කරන ලද එකතු කල අගය මත බදු (VAT) වාර්තාවට අනුව, VAT බදු ගණනය කිරීම සඳහා සලකා බැලූ ආදායම් මුදල රු. 3,120,446,154 කි. එබැවින්, එම වාර්තා දෙක අතර රු. 20,184,460 ක වෙනසක් නිරීක්ෂණය විය.

(vi) IRD වෙතින් ලැබුණු ශේෂය තහවුරු කිරීම අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ IRD වෙත ගෙවිය යුතු උපයනවිට බදු ශේෂය රු. 109,449,724 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව IRD වෙත ගෙවිය යුතු කිසිවක් නොතිබුණි. ඒ අනුව, එම වාර්තා දෙක අතර රුපියල් 109,449,724 ක වෙනසක් නිරීක්ෂණය විය.

(vii) සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වසර අවසානයේදී IRD වෙතින් ලැබිය යුතු WHT මුදල රු. 24,838,931 ක් වන අතර IRD වෙතින් ලැබුණු ශේෂය තහවුරු කිරීම අනුව, IRD වෙත ගෙවිය යුතු WHT මුදල රු. 31,499,999. ඒ අනුව, එම වාර්තා දෙක අතර රුපියල් 56,338,930 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.5 **විගණනය සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවීම**

(අ) ඉන්ධන පර්යන්තවල පෙට්‍රෝලියම් නිෂ්පාදන පරිමාව ටැංකි තුළදී මනිනු ලබන අතර එය සෙල්සියස් අංශක 15 හෝ පැරන්හයිට් අංශක 60 සම්මත උෂ්ණත්වයකදී සමාන පරිමාවකට පරිවර්තනය කළ යුතුය. උෂ්ණත්වයේ උච්චාවචනය තෙල් නිෂ්පාදන ප්‍රසාරණය වීමට හෝ හැකිලීමට හේතු වන අතර එමඟින් මනින ලද පරිමාවේ වෙනස්කම් ඇති වේ. මෙය උණුසුම් හා සිසිල් ටැංකි ගබඩා කිරීමේකදී විශේෂයෙන් වැදගත් වේ. ටැංකි ක්‍රමාංකනය කිරීමේදී හෝ ටැංකි මැනීමේදී උෂ්ණත්ව බලපෑම සැලකිල්ලට නොගැනීමෙන් සාධාරණ නොවූ මැනීමක් සිදු වන අතර විශේෂයෙන්ම වසර අවසන් තොග මට්ටම සහ සත්‍ය නිෂ්පාදන අලාභය/ලාභ තීරණය කිරීමේදී මෙය බලපානු ලබයි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී සංස්ථාව විසින් වාර්ෂික භෞතික තොග සත්‍යාපනය සිදු නොකර පොත්වල ඇති අගයන් සමාලෝචිත වර්ෂයේ අවසාන තොග ලෙස මූල්‍ය ප්‍රකාශන තුළට ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉහත සඳහන් කළ පරිදි සත්‍ය අවසාන තොග ප්‍රමාණය, වටිනාකම සහ නිෂ්පාදන අලාභය/ලාභය ප්‍රමාණාත්මක වශයෙන් වැරදි විය හැකිය. තවද, තොග ගණන් කිරීම සහ අදාළ තොග ගණන් කිරීමේ ලියකියවිලි නොමැති වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවසන් ඉන්ධන තොගයේ පැවැත්ම සහ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුවෙන් 2012 සිට ලැබිය යුතු ශේෂයන් ලෙස රු.මිලි. 1,135.8 ක ශේෂයක් අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පවතී. තවද, මෙම ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිදු වෙන්කිරීමක් (Provision) සිදුකර නොමැත. කෙසේ වෙතත්, එවැනි ශේෂයන් මෙවැනි දීර්ඝ කාලයක් පුරා ඉදිරියට ගෙන ඒමට හේතු වූ කරුණු විගනනයේදී පැහැදිලි වී නොමැත.

(ඇ) රු.මිලි. 30.13 ක ගෙවිය යුතු ශේෂයක් සහ රු.මිලි. 1.02 ක අයිතිය පැවරු දේපළ අඛණ්ඩව දීර්ඝ කාලයක් පුරා ඉදිරියට ගෙන එමින් පැවතුණි. කෙසේ වෙතත්, ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි නොමැතිකම හේතුවෙන් එම ශේෂවල පැවැත්ම, නිරවද්‍යතාවය සහ වටිනාකම විගණනයේදී සහතික නොවීය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් යටතේ "RF Dummy හා HO Dummy" යන ගිණුම් දෙකක් අඛන්ඩව දක්වා තිබුණු අතර එම ශේෂවල නිරවද්‍යතාවය සහ සාක්ෂි පිළිබඳව විගණනයේදී සැක සහිතය.

(ඉ) ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගෙවිය යුතු මුදල් සහ සේවක ගිණුම්වලට අදාළ ශේෂයන් පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන දීර්ඝ කාලයක් පවතී. කෙසේ වෙතත්, මෙම ශේෂයන් දිගු කාලයක් නොපියවීමට හේතු විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු සහ අත්තිකාරම් යටතේ රු.මිලි. 455.53 ක් එකතු කළ අගය මත බදු (VAT) ලෙස දක්වා ඇති අතර එම ශේෂයෙන් රු.මිලි. 326.4 ක් 2011 සිට අඛණ්ඩව ඉදිරියට ගෙනවිත් තිබුණි. තවද, මේ සම්බන්ධයෙන් විගණනය වෙත බදු ඉන්වොයිස්පත් සහ අනෙකුත් අදාළ ලේඛණ ලබාදී නොතිබුණි. එබැවින් එම ගිණුම්වල පැවැත්ම සහ නැවත අයකර ගැනීමේ හැකියාව පිළිබඳව සැක සහිතය.

(උ) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බදු වාර්තා කිසිවක වැඩිපුර ගෙවීම් හෝ ඉදිරියට ගෙන ආ බදු ශේෂ පෙන්වා නොමැති වුවද, එකතුව රු.මිලි. 376 ක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් 2010 වසරේ සිට ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වෙතත්, පැහැදිලි තාර්කික හෝ සාක්ෂි නොමැතිව සමාලෝචිත වර්ෂයේදී ආදායම් බදු මුදල සඳහා බදු ප්‍රතිපාදනවලට එරෙහිව මෙම මුදල කපා හැර තිබුණි.

(ඌ) පෙර වාර්තාවල දක්වා ඇති පරිදි ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි නොතිබීම හේතුවෙන් වෙළඳ සහ අනෙකුත් ගෙවීම් යටතේ දක්වා ඇති රු.මිලි. 749.66 ක ණය ශේෂය නිවැරදි කොට හඳුනා ගැනීමට විගණනයේදී හැකියාව නොලැබිණි. ඒ අනුව විගණනයේදී එම ශේෂයේ පැවැත්ම හා නිවැරදිභාවය තහවුරු කිරීමට නොහැකි විය.

(එ) 2017 සිට පැවත එන රු. 7,651,679 ක් කෘෂි නිෂ්පාදන මාර්ගස්ථ තොගය සම්බන්ධයෙන් ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවායේ නිරවද්‍යතාවය සහ පැවැත්ම පිළිබඳව විගණනයට සැක සහිතය.

(ඒ) පෙර වාර්තාවල දක්වා ඇති පරිදි, SAP පද්ධතියේ වාර්තා වලට අනුව ශේෂ පත්‍ර දිනට කිලෝ ලීටර 7,718.7 ක ඛනිජ තෙල් නිෂ්පාදන (පෙට්‍රල් 92 ඔක්ටේන්) පවතින බවට පෙන්වා ඇත. මෙම තොගය වාර්ෂික භෞතික තොග සත්‍යාපනයේදී අගය කොට හෝ භෞතික වශයෙන් පැවැත්ම සනාථ කිරීම ද සිදුකර නොතිබුණි.

(ඔ) ශේෂය තහවුරු කිරීම

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු වටිනාකමින් ශේෂය තහවුරු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අදාළව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) නියැදි පරීක්ෂණයට අනුව, ගනුදෙනුකරුවන් 96 දෙනෙකුට අදාළ වෙළඳ ලැබිය යුතු ශේෂය, මූල්‍ය ප්‍රකාශනවල ශේෂය සහ ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු සෘජු ශේෂය තහවුරු කිරීම්වල දැක්වෙන ප්‍රමාණයන්ට වඩා වෙනස් විය. ඒ අනුව, සමස්ථ වෙනස රු. මිලියන 2,032 ක් වූ අතර ගනුදෙනුකරුවන් 47 දෙනෙකුගේ ලැබිය යුතු ශේෂය රු. මිලියන 1,528 ක් සහ ගනුදෙනුකරුවන් 49 දෙනෙකුගන් ශේෂය රුපියල් මිලියන 504 ක් ලෙස ලෙජර් ගිණුම්වල පෙන්වා ඇති මුදල හා සසඳන විට මෙම වෙනස දක්නට ලැබේ.

(ii) ගනුදෙනුකරුවන් 12 දෙනෙකු ලෙජර ගිණුම් වලට අනුව රු. 1,638,032 ක බැර ශේෂයන් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානයේදී ගනුදෙනුකරුවන් විසින් රු. 536,922 ක හර ශේෂයක් තහවුරු කර ඇත. ඒ අනුව, රු. 2,174,954 ක හඳුනා නොගත් වෙනසක් නිරීක්ෂණය විය.

(iii) ගනුදෙනුකරුවන් වෙත යවන ලද තහවුරු කිරීමේ ඉල්ලීම් ලිපියේ ඇතුළත් හිඟ ශේෂයේ ප්‍රමාණය, පාරිභෝගිකයාගේ නම ආදී තොරතුරු සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා සමඟ නොගැලපෙන අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. තවද, විවිධ අගයන් සහිතව එකම පාරිභෝගිකයෙකුට තහවුරු කිරීමේ ඉල්ලීම් ලිපි දෙකක් යවන අවස්ථා නිරීක්ෂණය විය.

**1.2.6 නොසැසඳුණු පාලන ගිණුම්**

(අ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු සහ ශුද්ධ ආදායම් බදු ගෙවීම් පිළිවෙලින් රු. මිලි. 3,242.5 ක් සහ රු.මිලි. 351.6 ක් වේ. කෙසේ වෙතත්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව එම ගෙවීම් පිළිවෙලින් රු.මිලි. 560.8 ක් සහ රු.මිලි. 9,272.3 ක් වේ. ඒ අනුව රු.මිලි. 2,681.60 ක සහ රු.මිලි. 8,920.6 ක වෙනසක් නිරීක්ෂණය කරන ලදී.

(ආ) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු උපයනවිට ගෙවීමේ බදු රු. මිලි. 46.9 ක් වන අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී සංස්ථා ගිණුම්වල රු. 139,132 ක් පවතී. ඒ අනුව රු.මිලි. 46.8 ක වෙනසක් නිරීක්ෂණය කරන ලදී.

(ඇ) විගණනයට සපයා ඇති වයස් විශ්ලේෂණයට අනුව, එකතුව රු. 930,193,687 ක් වන හර ශේෂයන් 74 ක් සහ රු. 5,048,644 ක බැර ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ලැබිය යුතු වට්ටනාකම් වලට අදාළව වසර 05ක් පුරා ආපසු අයකර නොගෙන/ නොවිසඳී පවතී. තවද, මෙම ණයගැතියන් සමඟ පෙර සිදු කරන ලද ගනුදෙනු වලට අදාල ශේෂයන් පියවීමකින් තොරව පසුව ගණුදෙනු සිදු කර ඇත.

(ඈ) සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 154.587ක හර ශේෂ 20 ක් වසර 5ක් තුළ සහ රු. මිලියන 1,448.285 ක හර ශේෂ 27ක් වසර 01 සිට 5 දක්වා කාලය තුළ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වට්නාකම් වල නොපියවී පැවතුනි. තවද, පවතින හර ශේෂ පියවා ගැනීමකින් තොරව හර ශේෂයන් ඇති මෙම ගණුදෙනුකරුවන් සමඟ සංස්ථාව පසුව ගනුදෙනු කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින් එම ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී ප්‍රමානාත්මක ලෙස සැක සහිත විය.

(ඉ) විගණනයට සපයා ඇති වයස් විශ්ලේෂණයට අනුව, රුපියල් මිලියන 35,590.133 ක සැපයුම්කරුවන් 76 දෙනෙකුගේ ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේදී වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් ශේෂය යටතේ වසර 05 කට වැඩි කාලයක් නොවිසඳී තිබූ අතර රුපියල් මිලියන 12,240.66 ක ගෙවිය යුතු ශේෂයන් 739 ක් වසර 01 සිට 05 දක්වා කාලය තුළ වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් යටතේ නොවිසඳී පැවතුනි. කෙසේ වෙතත්, ශේෂය පියවීමට සංස්ථාව ගෙන ඇති ක්‍රියාමාර්ග වලට අදාළ ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් එම ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී සැක සහිතය.

(ඊ) ප්‍රමාණවත් සහ අදාල විගණන සාක්ෂි නොමැතිකම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් දරන ලද සැබෑ ප්‍රමාද ගාස්තු වටිනාකම විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව මාගේ විගණනය සිදු කරන ලදී. මාගේ වාර්තාවේ "මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිවරයාගේ වගකීම " යන කොටසේ මාගේ වගකීම් තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කරන ලද මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

### 1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ මගේ විගණක වාර්තාව ඇතුළත් නොවන අතර, මෙම විගණක වාර්තාවේ දිනයෙන් පසුව මා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ඒවා කියවීම සහ එසේ කිරීමේදී, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේදී ලබාගත් මගේ දැනුම හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න සලකා බැලීම සහ ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස ප්‍රකාශිත වේද යන්න සලකා බැලීමයි.

මම සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා එම කාරණය පාලනය සම්බන්ධයෙන් වග කියනු ලබන අයට අයට දැනුම් දීමට ක්‍රියා කරනු ලැබේ. තව දුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ පවතී නම්, ඒවා ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරන ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සංස්ථාවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකයේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරන තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරන සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මකව අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගණු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.

මා විසින් වෘත්තීය හා වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගනන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවධානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවධානම් මඟ හරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ මඟ හැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම, වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදිරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙලිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙලිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය තත්වාගණනය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශණ වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇඟයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් වෙත දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂිත ප්‍රතිපාදනඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන්ට අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ ඉකුත් වර්ෂ සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 1.2.2(අ,ආ) 1.2.3, 1.2.5(අ,ආ,ඇ,ඈ), 1,2,6 (අ,ආ,ඇ,ඈ) වගන්ති යටතේ විගණන නිරීක්ෂණයන්ට හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) අවශ්‍යතා අනුව පෙර වර්ෂ සඳහා මාගේ නිගමනයන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබීම.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක අධිකාරිය විසින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් පරිබාහිර ඇතුළත් වූ කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් කුමන සෘජු හෝ වක්‍ර සබඳතාවක් නොමැති බව සඳහන් කිරීම.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂිත විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳව 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | 5.2.2 මාර්ගෝපදේශය | ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා විධිමත් සක්‍යතා අධ්‍යයනයකින් තොරව ක්‍රියාත්මක කර ඇත. |
| (i) | 7.2 මාර්ගෝපදේශය | ලිහිසි තෙල් ව්‍යාපාරය, තාර ව්‍යාපාරය, නැව් තෙල් ව්‍යාපාරය සහ කෘෂි ව්‍යාපාරය සඳහා අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් අන්තර්ගත ක්‍රියාපටිපාටි අත්පොත් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. |
| (v) | 9.3 මාර්ගෝපදේශ | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සංස්ථාව සතුව නොතිබුණි. |
| (ආ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රෙල්ඛය. | යම් තනතුරක වැඩ ආවරණය කිරීම මාස 03 පමණක් සීමා විය යුතුය. නමුත්, ඒ ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළුව නිලධාරීන් මාස 03 කට වැඩි කාලයක් රාජකාරී ආවරණය කර තිබුණි. |
| (ඉ) | මුල්‍ය රෙගුලාසි 396 | නිකුත් කළ දින සිට මාස හය ඉක්මවන ලද චෙක්පත් එම දිනය පසු වූ විට අවලංගු චෙක්පත් ලෙස සළකා මූලික ගනුදෙනුව ආපසු ගැලපිය යුතුය. කෙසේ වෙතත්, රු. මිලි. 34,911,295 ක් වටිනා චෙක්පත් 64ක් අවලංගු කර ගිණුම්ගත කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) තොග ගබඩා පර්යන්ත සමාගම් විසින් හඳුන්වා දෙනු ලැබූ ඊ.ආර්,පී. (ERP) පද්ධතිය භාවිතය සම්බන්ධයෙන් සංස්ථාව, තොග ගබඩා පර්යන්ත සමාගම සහ ඉන්දියානු තෙල් සමාගම විසින් එකිනෙකාගේ වගකීම් හා භාවිතය සම්බන්ධව කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹ නොමැති බව නිරීක්ෂණය විය. එම පද්ධති ප්‍රමාණවත් ලෙස භාවිතා නොවන බව නිරීක්ෂණය විය. ඉන්ධන තොග සමාලෝචනය සහ පිරිපහදු කාර්යයන් සඳහා ද එම පද්ධති ප්‍රමාණවත් පරිදි භාවිතා නොකරන බව නිරීක්ෂණය විය.

(ආ) පෙර විගණන විර්තා වල පෙන්වා දුන්නද පොදු පරිශීලක පහසුකම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණයන් සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) ශ්‍රී ලංකා රජය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් 2003 දෙසැම්බර් 30 දින එළඹෙන ලද පොදු පරිශීලක පහසුකම් සම්බන්ධ කොටස්කරුවන්ගේ ගිවිසුමේ 15 වන වගන්තිය අනුව 2008 දෙසැම්බර් 31 දිනෙන් ගිවිසුම කල් ඉකුත්වී තිබුණි. එබැවින්, ආයතනයන්ගේ පාලන ක්‍රියාපටිපාටිය සහ පර්යන්ත ගාස්තු සහ ප්‍රවාහන වියදම් මෙන්ම ස්ලැබ් ගාස්තු (2011 වසරේ අවසන් වරට සංශෝධනය කළ) සඳහා භාවිතා කරන මිල සූත්‍රය ඇතුළුව මෙම ගිවිසුමෙන් ආවරණය වන පොදු පරිශීලක පහසුකම් අදාළ සියළුම පාර්ශවයන්ගේ එකඟතාවය මත සංශෝධනය කර නොතිබුණි.

(ii) සංස්ථාව සහ තොග ගබඩා පර්යන්ත සමාගම විසින් 2019 මැයි 13 ලංකා ඉන්දියානු තෙල් සමාගම නොමැතිව ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම අනුව, ඛනිජ තෙල් ගබඩාකරණය සහ ප්‍රවාහනය මෙන්ම සංස්ථාව සහ තොග ගබඩා පර්යන්ත සමාගම අතර මෙහෙයුම් ගාස්තු තීරණය කිරීම පිළිබඳ එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක කොටස්කරුවන්ගේ ගිවිසුමේ පාර්ශවයක් වූ ඉන්දියානු තෙල් සමාගමට බලපාන කොන්දේසි එමඟින් නිර්වචනය කර නොතිබුණි. එබැවින්, සංස්ථාව සහ තොග ගබඩා පර්යන්ත සමාගම සමඟ අත්සන් තබන ලද ගිවිසුමේ කොන්දේසි ඉන්දියානු තෙල් සමාගම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඇතිවිය හැකි අවාසිදායක තත්වය සහ පිරිවැය සංස්ථාව විසින් දැරිය යුතු බවට නිරීක්ෂණය විය.

(iii) 2019 මැයි 03 දිනැති අංක 43/1227 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාර 2019 අප්‍රේල් 01 දින සිට පර්යන්ත ගාස්තුව ඉහළ දැමීමට අනුමැතිය ලබා දී ඇත. මෙම සංශෝධනයේ ක්‍රියාත්මක දිනය පෙරදාතම කිරීම හේතුවෙන් රු.මිලි. 173.77 ක අමතර ගෙවීමක් කිරීමට සංස්ථාවට සිදුවිය. කෙසේ වෙතත් මේ දක්වා එම මුදල අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(iv) 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක කොටස්කරුවන්ගේ ගිවිසුම ප්‍රකාර (සංස්ථාව, ඉන්දියානු තෙල් සමාගම සහ ශ්‍රී ලංකා රජය අතර) සහ 2019 මැයි 13 දිනැති සංස්ථාව සහ තොග ගබඩා පර්යන්ත සමාගම සමඟ එළඹී ගිවිසුම අනුව නල මාර්ගයේ හෝ එහි කොටසක් පිළිගත් ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම සහ මාස දෙකකට අවශ්‍ය ඉන්ධන තොග පවත්වාගෙන යාමට ගබඩාකරන පහසුකම් සැපයීම තොග ගබඩා පර්යන්ත සමාගමේ වගකීමකි. කෙසේ වෙතත්, නල මාර්ගයේ අවහිරතා සහ ගබඩාකරන පද්ධතියේ අකාර්යක්ෂමතා හේතුවෙන් නෞකාවකින් තෙල් ගොඩබෑමේදී සිදුවන ප්‍රමාදයන් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සංස්ථාවට සිදු වේ. ඒ අනුව එකතුව ඇ.ඩො. මිලි. 2.7 ක මුදලක් මේ වන විට ප්‍රමාද ගාස්තු ලෙස පසුගිය වසර 06 තුල ගෙවා ඇති නමුත්, එම පිරිවැය සේවා සැපයුම්කරු වෙත මාරු කර නොමැත.

(v) සංස්ථාව විසින් රු. 2019 වර්ෂයේදී කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා අඟල් 12 ක විෂ්කම්භය සහ දිග මීටර් 5,500ක නල මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව නාගරික සංවර්ධන අධිකාරියට රු. මිලියන 250ක් ගෙවන ලදි. පවත්නා තොරතුරු අනුව ගෙවූ මුදල අනාගතයේදී අයකර ගැනීම සඳහා CPSTL සමඟ කිසියම් ගිවිසුමක් හෝ කිසියම් සාකච්ඡාවක් සිදු කර නැත. එබැවින්, වෙනත් කොටස් හිමියන්ගේ දායකත්වයකින් තොරව සංස්ථාව විසින් අනුබද්ධිත CPSTL හි ප්‍රාග්ධන වැඩිදියුණු කිරීමට සම්පූර්ණ පිරිවැය දැරීම විගණනයට ගැටලුකාරී විය.

(vi) ගිවිසුම් ප්‍රකාරව, පර්යන්ත ගාස්තුව ගබඩාකරන පර්යන්ත පිරිවැය සහ ලාභාන්තිකය යන අංග දෙකෙන් සමන්විත වේ. ගබඩාකරන පර්යන්ත පිරිවැය අතරට පුද්ගල පිරිවැය, පොදු කාර්ය පිරිවැය සහ නඩත්තු පිරිවැය මෙන්ම තොග ගබඩා පර්යන්ත සමාගමේ වත්කම් ක්ෂයවීම අන්තර්ගත වේ. තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ගෙවනු ලබන ප්‍රවාහන ගාස්තු එකඟ වූ පර්යන්ත ගාස්තු වලින් ව්‍යුත්පන්න බව අදහස් වේ. කෙසේ වෙතත් මෙහෙයුම් ගාස්තු සඳහා ගඩබා පර්යන්ත ගාස්තු පිරිවැය තීරණය කිරීමේදී තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රවාහනය සම්බන්ධ පිරිවැය බැහැර කර ඇත්දැයි තහවුරු කර ගැනීමට විගණනයේදී හැකියාවක් නොලැබිණි. එම හේතුවෙන් තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රවාහන ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම ද්විගුණ වීමක් විය හැකියි. පවත්නා තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලි. 2,506 ක ප්‍රමාණයක් ප්‍රවාහන ගාස්තු ලෙස ගෙවා තිබුණි.

(vii) 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක කොටස්කරුවන්ගේ ගිවිසුමේ (සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ ශ්‍රී ලංකා රජය අත්සන් තබන ලද) ගබඩාකරන පර්යන්ත ගාස්තුව නිර්වචනය කර ඇත්තේ " වාර්ෂිකව 12% පොළී අනුපාතයක් යටතේ සමාගමට ලබාදී ඇති ණය සඳහා පොළිය, ගඩබා වත්කම් හා වගකීම් වලින් කොටසක් මෙන්ම මුදල් හිඟය පියවා ගැනීමට ගනු ලබන ණය සඳහා පොළිය" ලෙසය. මෙම ගිවිසුම 2008 දෙසැම්බර් 31 දින කල්ඉකුත් විය. කෙසේ වෙතත් 2009 වසරේ තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද ණය සම්බන්ධයෙන් 2009 සිට 2016 කාල පරිච්ඡේදය සඳහා, ගිවිසුමේ කල් ඉකුත්වීමෙන් පසුවද සංස්ථාව විසින් රු.මි.ලි. 2,183 ක් ගෙවා ඇත. කිසිදු විධිමත් ඇගයීමකින් තොරව සහ ගිවිසුම ප්‍රකාර ගෙවිය යුතු සැබෑ ප්‍රමාණය සනාථ කර ගැනීමකින් තොරව මෙවැනි මුදලක් ගෙවා ඇති බවට නිරීක්ෂණය වී ඇත.

(viii) පරිපාලිත සමාගමේ ප්‍රධාන භූමිකාව වන්නේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව නලමාර්ගය නඩත්තු කිරීම සහ ප්‍රමාණවත් ගබඩාකරන පහසුකම් සැපයීමයි. ඒ අනුව ගබඩාකරන සහ පර්යන්ත පහසුකම් සම්බන්ධ යටිතල පහසුකම් දියුණුකිරීම සඳහා මෙහෙයුම් ගාස්තු ලෙස සැලකිය යුතු ප්‍රමාණයක අරමුදල් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී, රු.මි.ලි. 1,000 ක මුදලක් ක්ෂය වීමේ ගාස්තු ලෙස තොග ගබඩා පර්යන්ත සමාගම විසින් අයකර ඇති අතර, පසුගිය වසර 11 සඳහා එය රු.මි.ලි. 11,000 කි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී රු.මි.ලි. 2,738 ක් ලාභ ආන්තිකය ලෙස අයකර ඇති අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් රු.මි.ලි. 43,540 ක මුදලක් පසුගිය වසර 11 සඳහා අයකර තිබුණි. කෙසේ වෙතත්, නව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ පවත්නා පහසුකම් නඩත්තු කිරීම පිණිස CPSTL ආයතනය විසින් ඵලදායී සහ සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන ඇති බව විගණනයේදී සහතික නොවිය.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන කාර්යාල පනතේ අංක 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සංස්ථාවේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

a). සමාලෝචිත වර්ෂය තුළ විදේශ විණිමය ණය පියවීම ප්‍රමාද වීම හේතුවෙන් සංස්ථාවට අමතර පොලී වියදම ලෙස රුපියල් මිලියන 699 ක් දැරීමට සිදු වී තිබුණි.

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2013 වර්ෂයේදී සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධයෙන් ටෙහෙරානයේ ජාතික ඉරාන සංස්ථාව වෙත ගෙවිය යුතු මුළු මුදල USD 250,925,169 ක් වන අතර එය රුපියල් මිලියන 32,344 කි. ලබා දී ඇති තොරතුරුවලට අනුව, එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධක හේතුවෙන් එවැනි හිඟ ශේෂයක් ගෙවීම නතර වී ඇත. එම ශේෂය ආරම්භයේ සිටම ගෙවිය යුතු මුදලක් ලෙස පෙන්වමින්, එක් එක් වර්ෂය අවසානයේ විනිමය අනුපාතිකය සහ අදාළ වර්ෂයේ විනිමය බලපෑම ලාභයට හෝ අලාභයට මාරු කරන ලදි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු ශේෂය සහ සමුච්චිත විනිමය අනුපාත විචල්‍යතා අලාභය (2012 සිට 2020 දක්වා) පිළිවෙලින් රු. මිලියන 47,933 ක් සහ රු. මිලියන 15,193 කි. සමාලෝචිත වර්ෂය සඳහා විනිමය අනුපාත විචල්‍යා අලාභය රු. මිලියන 2,122 කි. තවද, පාලනය කළ නොහැකි බාහිර සාධක හේතුවෙන් මෙම ශේෂය ගෙවීම සිදු කර නොමැති බව ද නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම මුදල විකල්ප ආකාරයක් ලෙස පියවීමට සංස්ථාව උත්සාහ ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීමටත්, දීර්ඝ කාලයක් තිස්සේ ඩොලරයට ට වඩා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වන තත්වයක් තුළ නිරවුල් නොවූ ශේෂයක් තබා ගැනීමේ මූල්‍ය ශක්‍යතාව තක්සේරු කිරීමටත් ප්‍රමාණවත් සහ සුදුසු සාක්ෂි නොතිබුණි.

(ආ) ඉන්දියන් ඔයිල් කෝපරේෂන් ලිමිටඩ් (IOC) 2020 ජූනි 26 වැනි දින සිට සංස්ථාව විසින් වසරක කාලයක් සඳහා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සැපයීම සඳහා සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී ඇති අතර IOC සමාගම මාස 05ක් සඳහා සංස්ථාවේ ටෙන්ඩර් සඳහා ඉල්ලුම් කර ඇත. කෙසේ වෙතත්, LIOC යනු IOC හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර LIOC සංස්ථාවේ අනුබද්ධිත CPSTL හි 1/3 හිමිකාරිත්වය දරයි. එමෙන්ම, LIOC යනු CPSTL හරහා සංස්ථාවේ සහ සම්බන්ධිත පාර්ශවයක් සහ එකම තරඟකරුවා වේ. එබැවින්, එකම තරඟකරුවෙකුට වසරක කාලයක් සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමට ඉඩ දීමට හේතුව සාධාරණීකරණය කිරීමට විගණනයට නොහැකි විය. තවද, සංස්ථාවේ පවත්නා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ යෝග්‍යතාවය සහතික කිරීමට විගණනයට නොහැකි විය.

(ඇ) ඉකුත් වර්ෂවල විගණන වාර්තාවල සඳහන් පරිදි, සමාලෝචිත වර්ෂය අවසානයේදී ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු ප්‍රධාන සේවාදායකයින් සමඟ ඉන්ධන සැපයීම සඳහා වන විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඈ) **බදු සහ තීරුබදු අය කර ගැනීම**

ඉකුත් විගණන වාර්තාවල පෙන්වා දී ඇති ආකාරයට, ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ තොගයක් ගෙඩබෑමට පෙර රු.මිලි. 1,617.2 ක් රේගු බදු සහ අනෙකුත් බදු ලෙස ගෙවා ඇති අතර, එහි රු.මිලි. 648 ක් වන නිෂ්පාදන බදු ඇතුලත්ව තිබුණි. එය නැවත අය කර ගැනීමට හෝ ඊලඟ භාණ්ඩ තොගය සඳහා ගෙවීමේදී හිලව් කර ගැනීමට හෝ 2017 වසරේ සිට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) **ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම**

දැනට ශ්‍රී ලංකාව තුළ භාවිතා කරනු ලබන පවත්නා ඛනිජ තෙල් ගබඩාකරණ ධාරිතාවයේ ප්‍රමාණවත් බව ගණනය කරන ලද මාගේ විශේෂ වාර්තාවේ ඉන්ධන ප්‍රවාහන නල පද්ධතියේ සහ දැනට ලංකාවේ භාවිතා වන බවුසර් ප්‍රවාහන පද්ධතියේ අදාළත්වය සහ ඵලදායිතාවය පිළිබඳ ඇගයීමක් කර සුමටව හා ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් එම වාර්තා බාගත කළ හැකිය.

(ඊ) **ත්‍රිකුණාමල ටැංකි සංකීර්ණය**

මෙම තෙල් ටැංකි සංකීර්ණය 1930 දී ඉදිකරන ලද ඝන මීටර 12,500(ml) (10,000 මෙට්‍රික් ටොන්) න් යුත් ටැංකි 100 ක් සහ ආශ්‍රිත පහසුකම් වලින් සමන්විතය. ගබඩා සංකීර්ණයට අයත් හෙක්ටයාර් 358.553 ක ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකාව නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍ය රජයේ ඉහළ අද්මිරල් තනතුරට මෙම ඉඩම් 999 අවුරුදු බදු ක්‍රමයේ යටතේ බද්දට දෙන ලදී. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි 1961 දී ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික තුනකින් ගෙවා 1964 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම, ටැංකි සංකීර්ණය, ගොඩනැගිලි සහ අනෙකුත් උපකරණ වල අයිතිය සංස්ථාව ලබා ගෙන ඇත. කෙසේ වෙතත්, එම ඉඩම සම්බන්ධයෙන් අදවන විටත් කිසිදු නීතිමය ලේඛණයක් රජයෙන් ලබාගෙන නොතිබුණි.

2003 වර්ෂයේදී, ශ්‍රී ලංකා රජය විසින් සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම සමඟ ගිවිසුමකට එළඹෙන ලද අතර, එම ගිවිසුමේ දින සිට මාස 06ක් ඇතුළත ගබඩා සංකීර්ණය සහ ඉඩම ලංකා ඉන්දියානු තෙල් සමාගම වෙත වසර 35ක කාලපරිච්ඡේදයක් සඳහා ලබා දීමට එකඟ වී ඇත. සංස්ථාව විසින් මේ වන විටත් කිසිදු බදු ගිවිසුමකට එළඹ නොමැති අතර, ටැංකි සංකීර්ණය භාවිතා කිරීම ද සිදු කර නොමැත. කෙසේ වෙතත්, 2003 වසරේ සිට ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් මෙම වත්කම් භාවිතා කරමින් සිටියි.

**(උ) දඩ මුදල් ගෙවීම**

පෙර විගණන වාර්තාවල පෙන්වා දී ඇති පරිදි, නැව්තෙල් ව්‍යාපාරය සම්බන්ධයෙන් 2002 වසරේ සිට හිඟ මුදලක් වන රු.මිලි. 57.7 ක් රේගු දෙපාර්තමේන්තුව වෙත මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම යටතේ ගෙවා ඇත. නමුත් මෙම වාර්තාවේ දින වන විටත් එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**(ඌ) හෙජින් ගනුදෙනුව**

2007 සිට 2009 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධව සිදු වූ හෙජින් ගනුදෙනුවට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණය අනුව, 2020 දෙසැම්බර් 31 දිනට මෙම ගනුදෙනුව හේතුවෙන් රටට රු.මිලි. 14,028 ක අලාභයක් සිදුවී තිබුණි. එසේම, ඇ.ඩො. 8,648,300 ක් ඉල්ලා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වානිජ මහාධිකරණයේ නඩුවක්ද ගොනු කර ඇත.

**(එ) සපුගස්කන්ද තෙල් පිරිපහදුව**

පෙර විගණන වාර්තාවල දැක්වූ පරිදි, පවත්නා තෙල් පිරිපහදුව දැනට දශක පහකට පෙර ඉදි කරන ලද්දක් වන අතර, ( 1969 වසරේදී ආරම්භ කරන ලදි.) එමඟින් රටේ වැඩිවන තෙල් ඉල්ලුම සපුරා ලීමට තරම් ප්‍රමාණවත් තෙල් ප්‍රමාණයක් පිරිපහදු කිරීමට හැකියාවක් නොමැත. ඛනිජ තෙල් නිෂ්පාදන අඩු පිරිවැයක් යටතේ නිෂ්පාදනය කිරීම, අතුරු නිෂ්පාදන පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ අගයක් සහිත නිෂ්පාදන දක්වා වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම වැනි හැකියාවන් සහිත උසස් තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන අනෙකුත් පිරිපහදු සමඟ සැසඳමේදී මෙම පිරිපහදුව අඩු ශක්‍යතාවයකින් ක්‍රියාත්මක වෙයි.

කෙසේ වෙතත්, තම නිෂ්පාදන ඵලදායී ආකාරයට වෙළඳපොළට සැපයීම තහවුරු කිරීම පිණිස යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව විස්තීරණය කිරීමේ සහ දියුණු කිරීමේ ව්‍යාපෘතිය (SOREM) හෝ විකල්ප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මේ වන තෙක් හැකියාවක් ලැබී නොමැත. එසේම මෙම වාර්තාකරණ දිනය වන විටත් එම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද රු.මි. 1,003 ක ඉඩම භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුන බව නිරීක්ෂණය විය.

**(ඒ) වත්කම් කළමනාකරණය**

පහත දක්වා ඇති වත්කම් අත්පත් කර ගත් දින සිට භාවිතයකින් තොරව පවතී.

(i) වනාතමුල්ල, හල්ගහ කුඹුර ඉඩම - මෙම ඉඩම එල්.පී. වායු ව්‍යාපෘතියක් සහ ක්‍රීඩා පිටියක් සැකසීමේ අරමුණින් රු.මිලි. 10.6 ට අත්පත් කර ගෙන ඇත. එසේ වුවත් එම ඉඩම අපේක්ෂිත අරමුණ සඳහා මේ වන තෙක් භාවිතා කර නොමැති අතර, අනවසර පදිංචිකරුවන් 700 ට අධික ප්‍රමාණයක් එම ඉඩම තම අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි.

(ii) මහහේන ඉඩම - ලබා දී ඇති ලේඛණ අනුව, සංස්ථාව මෙම ඉඩම මිලදී ගෙන ඇත්තේ රු.මිලි. 0.625 ට වන අතර, එය භාවිතා කර නොමැත. නමුත්, 1986 වර්ෂයේ සිට මෙම ඉඩම පෙර අයිතිකරු විසින්ම එතැන් පටන් මේ දක්වාම තවමත් භාවිතා කරමින් පවතින බව නිරීක්ෂණය වී ඇත. එසේම මෙම ඉඩම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
**විගණකාධිපති**

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සංස්ථාව 2020 රු. මි. | සංස්ථාව 2019 යළි ප්‍රකාශිත* රු. මි. | සමූහය 2020 රු. මි. | සමූහය 2019 යළි ප්‍රකාශිත* රු. මි. |
|---|---|---|---|---|---|
| ආදායම | ***2*** | 510,131.005 | 630,859.713 | 510,353.178 | 631,015.609 |
| විකුණුම් පිරිවැය | | (454,880.140) | (626,599.056) | (462,019.238) | (634,716.632) |
| **දළ ලාභය / (අලාභය)** | | **55,250.865** | **4,260.657** | **48,333.939** | **(3,701.023)** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | ***3*** | 818.670 | 529.415 | 1,145.615 | 1,225.198 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | | (15,781.776) | *(17,981.314)* | (2,937.933) | (3,259.363) |
| පරිපාලන වියදම් | | (6,352.608) | *(5,869.335)* | (10,808.827) | (10,870.013) |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | ***4*** | **33,935.151** | **(19,060.577)** | **35,732.795** | **(16,605.200)** |
| විනිමය අනුපාත විචලනය | | (21,840.759) | 8,397.549 | (21,840.759) | 8,397.549 |
| මූල්‍ය ආදායම් | ***5*** | 11,187.890 | 13,525.966 | 11,497.173 | 13,848.996 |
| මූල්‍ය වියදම් | ***6*** | (20,911.327) | *(14,698.539)* | (20,911.327) | (14,698.539) |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | **2,370.955** | **(11,835.600)** | **4,477.882** | **(9,057.194)** |
| ආදායම් බදු වියදම | ***7*** | - | *(21.000)* | (208.809) | (1,183.529) |
| **වසර සඳහා ලාභය / (අලාභය)** | | **2,370.955** | **(11,856.600)** | **4,269.073** | **(10,240.722)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| ලාභය හෝ අලාභය සඳහා වර්ගීකරණය නොකෙරෙන අයිතම | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සම්බන්ධ ලාභ/(අලාභ) නැවත ඇගයීම | ***18*** | 99.573 | 84.038 | (51.416) | (51.764) |
| දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධ නැවත තක්සේරුකරනය | | 17,675.906 | 21.470 | 17,675.906 | 21.470 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | | 415.689 | (6.011) | 451.926 | 32.013 |
| **වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)** | | 18,191.168 | 99.496 | 18,076.417 | 1.719 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ අදායම/ (වියදම) බදු පසු** | | **20,562.123** | **(11,757.103)** | **22,345.490** | **(10,239.003)** |
| **මුළු විස්තීර්ණ ආදායම සම්බන්ධිත** | | | | | |
| ආයතනයේ හිමිකරුවන් | | 20,562.123 | (11,757.103) | 21,668.860 | (10,774.181) |
| පාලනය කළ නොහැකි අයිතිය | | - | - | 676.630 | 535.178 |
| | | **20,562.123** | **(11,757.103)** | **22,345.490** | **(10,239.003)** |

* මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2019 මූල්‍ය ප්‍රකාශන වලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.

135 සිට 173 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2019 යලි ප්‍රකාශිත* | 2020 | 2019 යලි ප්‍රකාශිත* |
| | | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | 43,541.537 | 26,436.412 | 59,586.486 | 42,451.172 |
| ආයෝජන වත්කම් | 8.3 | 53.703 | 54.179 | 53.703 | 54.179 |
| අස්පෘශ වත්කම් | 8.4 | - | - | 75.525 | 101.433 |
| පරිපාලිත සමාගම් ආයෝජනය | 9 | 5,000.000 | 5,000.000 | - | - |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | 10 | 239.981 | 333.221 | 239.981 | 333.221 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 7,519.518 | 8,895.364 | 9,153.749 | 10,535.528 |
| | | 56,354.739 | 40,719.176 | 69,109.444 | 53,475.533 |
| ජංගම වත්කම් | | | | | |
| තොගය | 13 | 52,507.840 | 65,757.216 | 53,206.909 | 66,432.827 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 151,053.605 | 164,152.545 | 156,721.988 | 170,080.427 |
| කෙටි කාලීන ආයෝජන | 14 | 92.590 | 25,093.723 | 92.590 | 25,093.723 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 64,563.572 | 32,559.409 | 68,005.593 | 36,559.120 |
| | | 268,217.607 | 287,562.893 | 278,027.080 | 298,166.097 |
| **මුළු වත්කම්** | | **324,572.346** | **328,282.069** | **347,136.524** | **351,641.630** |
| ස්කන්ධය හා වගකීම් | | | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | | | | |
| දායකත්ව ප්‍රාග්ධනය | 16 | 28,487.125 | 28,487.125 | 28,487.125 | 28,487.125 |
| ප්‍රාග්ධන හා සංචිත | 17.1 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |
| මූල්‍ය වත්කම් මත සංචිතය | | (38.000) | (38.000) | (38.000) | (38.000) |
| නැවත තක්සේරුකරන සංචිතය | 17.2 | 28,068.124 | 10,392.218 | 28,068.124 | 10,392.218 |
| රඳවාගත් ඉපැයුම් | | (337,071.081) | (339,957.298) | (323,462.147) | (327,484.989) |
| පාලන කළ නොහැකි අයිතිය | | - | - | 9,307.844 | 8,736.270 |
| මුළු ස්කන්ධය | | (275,561.146) | (296,123.269) | (252,644.368) | (274,914.690) |
| ජංගම නොවන වගකීම් | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 18 | 1,702.435 | 1,686.148 | 3,718.078 | 3,392.246 |
| විලම්භිත බදු | 19 | 2,494.132 | 2,909.821 | 4,090.682 | 4,995.736 |
| ණය හා ණය ගැනීම්වල ජංගම නොවන කොටස | 20 | 4,776.927 | 3,928.702 | 4,776.927 | 3,928.702 |
| | | 8,973.494 | 8,524.671 | 12,585.687 | 12,316.684 |
| ජංගම වගකීම් | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 21 | 200,120.453 | 305,869.933 | 196,155.660 | 304,228.902 |
| ණය හා ණය ලබාගැනීම්වල ජංගම කොටස | 20.1 | 289.397 | 75.959 | 289.397 | 75.959 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | 22 | 390,750.148 | 309,934.775 | 390,750.148 | 309,934.775 |
| | | 591,159.998 | 615,880.667 | 587,195.205 | 614,239.636 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **324,572.346** | **328,282.069** | **347,136.524** | **351,641.630** |

* මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2019 මූල්‍ය ප්‍රකාශන වලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත. 135 සිට 173 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් 2020 දෙසැම්බර් 31 දින වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන අතර එම අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභයද මෙයින් පෙන්වයි.

වී.එන්.වීරසූරිය මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලද්දේ,

සුමිත් විජේසිංහ
සභාපති
2021 පෙබරවාරි 24, කොළඹ

බුද්ධික මඩිහහේවා
කළමනාකාර අධ්‍යක්ෂක

චාමින්ද හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ

# ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

| සංස්ථාව | දායක ප්‍රාග්ධනය | නැවත තක්සේරු කරන ලද සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවා ගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| **2019 ජනවාරි 1 වන විට** | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38.000)** | **(325,274.915)** | **(281,462.356)** |
| පූර්ව කාල ගැලපුම | - | - | - | - | (2,903.810) | (2,903.810) |
| **ජනවාරි 1 වන විට සංශෝධිත ශේෂය** | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38.000)** | **(328,178.725)** | **(284,366.166)** |
| වසර සඳහා වන පාඩුව | - | - | - | | (11,856.600) | (11,856.600) |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | - | - | 78.027 | 78.027 |
| නැවත ඇගයීමේ අතිරික්තය | - | 21.470 | - | - | - | 21.470 |
| **2019 දෙසැ 31 වන විට** | **28,487.125** | **10,392.218** | **4,992.686** | **(38.000)** | **(339,957.298)** | **(296,123.269)** |
| වසර සඳහා වන ලාභය | - | - | - | - | 2,370.955 | 2,370.955 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | - | - | 515.262 | 515.262 |
| නැවත ඇගයීමේ අතිරික්තය | - | 17,675.906 | - | - | - | 17,675.906 |
| **2020 දෙසැ. 31 වන විට** | **28,487.125** | **28,068.124** | **4,992.686** | **(38.000)** | **(337,071.081)** | **(275,561.146)** |

| සමූහය | දායක ප්‍රාග්ධනය | නැවත තක්සේරු කරන ලද සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවා ගත් ඉපැයුම් | කොටස් හිමියන්ගේ අරමුදල් | පාලනය කළ නොහැකි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| 2019 ජනවාරි 1 වන විට | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38.000)** | **(313,764.857)** | **(269,952.297)** | **8,255.421** | **(261,696.877)** |
| පූර්ව කාල ගැලපුම | - | - | - | | (2,903.810) | | | (2,903.810) |
| ජනවාරි 1 වන විට සංශෝධිත ශේෂය | **28,487.125** | **10,370.748** | **4,992.686** | **(38.000)** | **(316,668.667)** | **(269,952.297)** | **8,255.421** | **(264,600.687)** |
| වසර සඳහා වන පාඩුව, ලාභය | - | - | - | - | (10,829.164) | (10,829.164) | 588.442 | (10,240.722) |
| වෙනත් විස්තීර්ණ අදායම | - | - | - | - | 12.842 | 12.842 | (32.593) | (19.751) |
| නැවත ඇගයීමේ අතිරික්තය | - | 21.470 | - | - | | 21.470 | | 21.470 |
| ගෙවා ඇති ලාභාංශ | - | - | - | - | | | (75.000) | (75.000) |
| 2019 දෙසැ. 31 වන විට | **28,487.125** | **10,392.218** | **4,992.686** | **(38.000)** | **(327,484.989)** | **(280,747.149)** | **8,736.270** | **(274,914.690)** |
| වසර සඳහා වන ලාභය | - | - | - | - | 3,554.193 | 3,554.193 | 714.880 | 4,269.073 |
| ගැලපුම | - | - | - | - | 29.888 | 29.888 | 14.944 | 44.833 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | 438.761 | 438.761 | (38.251) | 400.510 |
| නැවත ඇගයීමේ අතිරික්තය | - | 17,675.906 | - | - | - | 17,675.906 | | 17,675.906 |
| ගෙවා ඇති ලාභාංශ | - | - | - | - | - | - | (120.000) | (120.000) |
| 2020 දෙසැ 31 වන විට | **28,487.125** | **28,068.124** | **4,992.686** | **(38.000)** | **(323,462.147)** | **(259,048.401)** | **9,307.844** | **(252,644.368)** |

* මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2019 මූල්‍ය ප්‍රකාශන වලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.

135 සිට 173 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සංස්ථාව 2020 රු. මි. | සංස්ථාව 2019 යලි ප්‍රකාශිත* රු. මි. | සමූහය 2020 රු. මි. | සමූහය 2019 යලි ප්‍රකාශිත* රු. මි. |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | **24** | (53,979.424) | (75,037.350) | (52,300.947) | (73,008.312) |
| | | | | | |
| ගෙවන ලද පොළිය | | (20,361.566) | (14,182.746) | (20,361.566) | (14,182.746) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂිතය | **18** | (137.855) | (170.527) | (269.182) | (317.349) |
| ගෙවන ලද බදු / රැඳවුම් බදු | | (3,778.620) | (7,030.536) | (5,014.899) | (7,239.083) |
| **මෙහෙයුම් ක්‍රියාකරකම් වෙතින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්** | | (78,257.465) | (96,421.159) | (77,946.593) | (94,747.490) |
| | | | | | |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහ | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 1.707 | 2.832 | 1.707 | 42.048 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | **8** | (805.159) | (1,574.592) | (1,863.004) | (2,555.438) |
| ලාභාංශ ආදායම | | 0.122 | 129.001 | 0.122 | 0.001 |
| ලැබූ පොළිය | | 8,276.846 | 7,145.090 | 8,586.129 | 7,468.120 |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 25,094.373 | 4,289.779 | 25,094.373 | 4,289.779 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කළශුද්ධ මුදල්** | | 32,567.889 | 9,992.110 | 31,819.326 | 9,244.509 |
| | | | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | | | | |
| ගෙවන ලද ලාභාංශ | | - | - | (120.000) | (75.000) |
| ලබාගත් අලුත් ණය | | 407,387.132 | 541,907.914 | 407,387.132 | 541,907.914 |
| ණය ආපසු ගෙවීම | | (330,106.638) | (531,647.853) | (330,106.638) | (531,647.853) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්** | | 77,280.494 | 10,260.061 | 77,160.494 | 10,185.061 |
| | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | 31,590.919 | (76,168.988) | 31,033.228 | (75,317.920) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 27,501.266 | 103,670.252 | 31,500.978 | 106,818.898 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **15** | **59,092.185** | **27,501.266** | **62,534.206** | **31,500.978** |

* මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2019 මූල්‍ය ප්‍රකාශන වලට අනුරූප නොවන අතර සටහන 26 හි විස්තරාත්මකව දක්වා ඇත.

135 සිට 173 දක්වා පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1.1 ආයතනික තොරතුරු

### පොදු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව සංස්ථාපිත කර, පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සංස්ථාවකි.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයෙහි පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

| ආයතනය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආයතනය, පිරිපහදුව සහ අළෙවිය |
| **අනුබද්ධ ආයතනය**<br>ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම |

### මූලික සමාගම සහ බලාධිකාරය

සංස්ථාව, ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යාංශය යටතට අයත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයට අනුව සංස්ථාවේ අවසන් පාලන පාර්ශවය ශ්‍රී ලංකා රජය වේ.

### නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි මස 24 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය මඟින් ප්‍රකාශයට පත් කිරීමට අවසර දී ඇත.

### අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහන ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ඇතුළත් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/LKASs) සහ 1971 අංක 38 මුදල් පනතේ විධිවිධාන හා ඊට පසුව සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව සකස්කර ඇත.

## 1.2 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අන්තරගත SLFRS සහ LKAS (මෙතැන් පටන් SLFRS යනුවෙන් හඳුන්වනු ලැබේ.) වලට අනුකූලව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ආයෝජන දේපළ සහ ඇතැම් කාර්යාල දේපළ හැර (දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති) මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ උපචිත පදනම සහ ඓතිහාසික පදනමටයි. මූල්‍ය වත්කම් අගය කර තිබෙන්නේ සාධාරණ වටිනාකම් සහ හඳුනාගත් වර්තමාන ප්‍රතිලාභ වගකීම් වටිනාකම අනුව වේ.

### ගිණුම් ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය ලංකාව තුළ භාවිතා වන ව්‍යාවහාර මුදල් වේ. වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථාවන් හැර සෙසු සියලු අගයන් ආසන්නතම මිලියනය දක්වා වටයා ඇත.

### ප්‍රමාණාත්මක සහ සමූහනය

මූල්‍ය ප්‍රකාශන තුළ සමාන අයිතම වල සෑම ද්‍රව්‍ය පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසාමාන්‍ය ස්වභාවයක් හෝ ක්‍රියාකාරිත්වයක් ඇති අයිතම ඒවා වැදගත් නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

### ඒකාබද්ධ කිරීමේ පදනම

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන,සංස්ථාව සහ එහි අනුබද්ධිත සමාගම් වලින් සමන්විත වේ. (සමූහය ලෙස හැඳින්වේ)

අනුබද්ධ ආයතනය යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය නිරාවරණය වූ වට හෝ අයිතිවාසිකම් ඇති විට, ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සහ ආයෝජකයා කෙරෙහි ඇති බලය තුළින් එම ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ඇති විට පාලනය ලබා ගත හැකිය.

නිශ්චිතවම, සමූහය ආයෝජකයෙකු විසින් පාලනය කරන්නේ පමණක්ම වේ නම්, කණ්ඩායමට :

- ආයෝජකයා කෙරෙහි බලය (එනම්, ආයෝජකයාගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව ලබා දෙන පවත්නා අයිතිවාසිකම්)

- ආයෝජකයා සමඟ සම්බන්ධවීමෙන් ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ සඳහා නිරාවරණය හෝ අයිතිවාසිකම්
- එහි ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමට ආයොජකයාට වඩා එහි බලය භාවිතා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

පොදුවේ ගත් කළ, ඡන්ද අයිතියෙන් බහුතරයක් පාලනය කිරීමට හේතු වේ යැයි උපකල්පනයක් ඇත. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) හි කොටස් වලින් 2/3 ක් සංස්ථාව සතුව ඇති අතර, CPSTL එහි අනුබද්ධිත ආයතනය ලෙස සලකයි.

ඉහත පාලන අංග තුනෙන් එකක් හෝ වැඩි ගණනක වෙනස්කම් ඇති බව කරුණු සහ තත්වයන් පෙන්නුම් කරන්නේ නම් සමූහය එය ආයෝජකයෙකු පාලනය කරන්නේද නැද්ද යන්න නැවත තක්සේරු කරයි. අනුබද්ධිත ආයතනයක් ඒකාබද්ධ කිරීම ආරම්භ වන්නේ සමූහය අනුබද්ධිතයා මත පාලනය ලබාගත් විට සහ සමූහයට අනුබද්ධිත පාලනය අහිමි වූ විට නතර වීමෙනි. වර්ෂය තුළ අත්පත් කර ගත් හෝ බැහැර කරන ලද අනුබද්ධිත ආයතනයක වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් සහ අනුබද්ධිතයාගේ මූල්‍ය ප්‍රකාශන සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සකස් කර ඇති අතර, ඒවා දෙසැම්බර් 31 වනදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර කණ්ඩායම් ශේෂයන් සහ ගනුදෙනු, ආදායම සහ වියදම් ඉවත් කරනු ලැබේ.

#### පාලනය නොකරන අවශ්‍යතා

ලාභය හෝ අලාභය සහ අනුබද්ධිත අනෙකුත් විස්තීර්ණ ආදායම්වල (OCI) එක් එක් අංගයන් සමූහයේ මූලූ කොටස් හිමියන්ට සහ පාලනය නොකිරීමේ අවශ්‍යතාවන්ට ආරෝපණය කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්**

සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් පෙර වර්ෂවල භාවිත කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

#### සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර, වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර, වත්මන් වර්ෂයේ ප්‍රකාශ සමඟ සැසඳිය හැකිය.

#### අඛන්ඩ පැවැත්ම

මෙම මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සමූහය අඛන්ඩ පැවැත්මෙන් ව්‍යාපාර කටයුතු සිදු කරන්නේය, එනම් පුරෝකථනය කළ හැකි අනාගතයක් උදෙසා මෙහෙයුම් කටයුතු සිදු කරන්නේය යන උපකල්පනය මත පදනම්වය. එබැවින්, 2020 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සකසන ලද මූල්‍ය වාර්තාවන්ට අනුව සංස්ථාවට හා සමූහයට පිළිවෙළින් රු. මිලියන 275,561 ක සහ රු. මිලියන 252,644 ක ඍණාත්මක ස්කන්ධ තත්වයක් ඇති විට වුවද, සිය මෙහෙයුම්වල ප්‍රමාණාත්මක අඩු කිරීමේ හෝ භෞතික වශයෙන් සීමාකිරීමේ අදහස හෝ අවශ්‍යතාවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නැතැයි උපකල්පනය කෙරෙයි.

#### තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය වේ. සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියේදී එහි විනිශ්චය ක්‍රියාත්මක කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ යටින් පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරෙන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයේදී හඳුනා ගැනේ. ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වයක් ඇති ක්ෂෙත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර අදාළ සටහන් වල පහත පරිදි විස්තර කෙරේ.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය : සටහන අංක 1.4.12
- මූල්‍ය වත්කම් හානි කිරීම : සටහන අංක 1.4.14
- දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ආයුකාලය : සටහන අංක 1.4.6
- විලම්භිත බදුකරණය : සටහන 1.4.2

## 1.4 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 1.4.1 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා එනු ඇති බව සහ ආදායම මෙන්ම දැරීමට සිදුවූ හෝ සිදු වන වියදම් විශ්වාසදායී අයුරින් මැනගත හැකි යැයි යන උපකල්පනයේ පිහිටා ආදායම හඳුනාගනු ලැබෙයි. ලැබී ඇති හෝ ලැබීමට නියමිත ගෙවීම්වල සාධාරණ වටිනාකම සැලකිල්ලට ගනිමින්, ගිවිසුම් ප්‍රකාරව අර්ථ නිරූපණය කරන ලද ගෙවීම් පිළිබඳ වගන්ති හා වෙළෙඳ බදුවල ශුද්ධ අගය අවධානයට ලක් කරමින් ආදායම තීරණය කරනු ලැබේ. සිය සමස්ත ආදායම් සැකසීම්වලදී මුලික වගකීමෙන් බැඳී සිටින්නා මෙන්ම, තොග ලැයිස්තු සහ ණය අවදානම් සඳහා මුහුණ දීමට එයට සිදුවන බැවින්ද සිය සමස්ථ ආදායම් සැකසීම් සම්බන්ධයෙන් මුලිකත්වය දරන්නේ තමන්ය යන අවසන් නිගමනයට සමුහය පැමිණ ඇත. ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක සපුරාලිය යුතු අතර, එය SLFRS 15 වේ.

#### භාණ්ඩ විකිණීම

භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සම ප්‍රතිලාභ ගැනුම්කරු වෙත ලබා දුන් විට, සලකා බැලීම යථා තත්වයට පත් කිරීම, ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ ආපසු පැමිණීම විශ්වාසදායක ලෙස තක්සේරු කිරීම, භාණ්ඩ සමඟ අඛණ්ඩ කළමනාකරණ සම්බන්ධතාවයක් නොමැති අතර, ආදායමේ ප්‍රමාණය විශ්වාසනීයව මැනිය හැකි වීම යන කරුණු මත භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබයි.

භාණ්ඩ යැවීමේදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ. නැතහොත් භාණ්ඩ පාරිභෝගිකයාට භාර දීමේදී නෛතික හිමිකාරිත්වය පැවරෙන්නේ පාරිභෝගිකයාට භාණ්ඩ ලබා දීමෙන් පසුව පමණි. එවැනි සෑම අවස්ථාවකදීම, භාණ්ඩ බෙදාහරින විට හෝ බෙදාහරින විට සහ බෙදාහරින්නන් / ගනුදෙනුකරුවන් විසින් පිළිගත් විට සමූහය විසින් ආදායම හඳුනාගනු ලබන අතර, එය SLFRS 15 ට අනුව ආදායම් හඳුනා ගැනීම කළ විට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොවේ.

#### පොලී ආදායම සහ වියදම

ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මුල්‍ය උපකරණ සඳහා. ඵලදායී පොලී අනුපාතය භාවිතා කරමින් පොලී වියදම් සහ ආදායම සටහන් කරනු ලැබේ. එය ඇස්තමේන්තුතගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මුල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලයක් තුළ ශුද්ධ ධාරක වටිනාකමට වට්ටම් කරන අනුපාතයයි. මුල්‍ය වත්කම් හෝ වගකීම්වල ශුද්ධ ධාරක වටිනාකමට එකතු කිරීමේ හැකියාව සැක සහිත නොවේ නම් මිස පොලී ආදායම උපචිත පොළිය ලෙස හඳුනා ගැනේ. පොළී ආදායම මුල්‍ය ආදායම යටතේ ඉදිරිපත් කෙරෙන අතර පොළී වියදම මුල්‍ය වියදම යටතේ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ඉදිරිපත් කෙරෙන අතර මුල්‍ය වියදම් යටතේ පොළී වියදම් ඉදිරිපත් කෙරේ.

#### ලාභාංශ

ගෙවීම් කොටස් කරුවන්ට ලැබීමේ අයිතිය තහවරු වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

#### කුලී ආදායම

කුලී ආදායම කල්බදු කාල සීමාව සඳහා රේඛීය පදනමක් මත ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුළත් වේ.

#### දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභය / අලාභය

දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ඇතිවන ලාභය (අලාභය) විකිණීම සිදුවන කාල සීමාව තුළ හඳුනාගෙන ඇති අතර, වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කර ඇත.

**ආයෝජන සුරැකුම්පත් වලින් ඇතිවන ලාභ හෝ අලාභ**
ගනුදෙනුව සිදු වූ දිනය වන විට කොටස් සහ මුල්‍ය උපකරණ විකිණීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ

#### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 1.4.2 වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීම සඳහා දරන ලද සියලු වියදම් මෙම කාල සීමාව සඳහා ආදායම් ප්‍රකාශයට අයකර ඇත.

#### බදුකරණය

මෙම කාල සීමාව සඳහා වන බදු වියදම් වර්තමාන හා විලම්භිත බද්දෙන් සමන්විත වේ.

#### වර්තමාන බදු

වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන් සඳහා පවත්නා ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ මුල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි සහ ආදායම් හා වියදම්වල සංරචක මත පදනම්ව බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන අනුව ය.

කොටස් වලින් හෝ වෙනත් පුළුල් ආදායමකින් සෘජුවම හඳුනාගෙන ඇති අයිතම වලට අදාළ වර්තමාන ආදායම් බද්ද කොටස් හෝ වෙනත් පුළුල් ආදායමකින් හඳුනාගෙන ඇති අතර එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ නොව වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

**ii. විලම්භිත බදුකරණ**

වත්කම් හා වගකීම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඒවා රැගෙන යන මුදල් අතර වාර්තා කිරීමේ දිනය තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුලින් හඳුනා ගැනීමෙන් විලම්භිත ආදායම් බදු වගකීම් පැන නගින විට හැර, බදු අය කළ හැකි සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත ආදායම් බදු වගකීම් හඳුනාගෙන ඇත.

අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන යාම සඳහා බදු අයකළ හැකි ලාභයක් ලබා ගත හැකිතාක් දුරට, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතයට නොගත් බදු වත්කම් ඉදිරියට ගෙනයාම සහ භාවිතයට නොගත් බදු අලාභයන් සඳහා විලම්භිත ආදායම් බදු වත්කම් හඳුනාගෙන තිබේ. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුලින් හඳුනා ගැනීමෙන් සහ ගනුදෙනුවේදී හැරෙන්නට භාවිතා නොකළ බදු වත්කම් සහ භාවිතයට නොගත් බදු අලාභ භාවිතා කළ හැකිය. එම වටිනාකම් ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

විලම්භිත ආදායම් බදු වත්කම්වල රැගෙන යන මුදල සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර, කල්තබා ඇති ආදායම් බදු වත්කම් වලින් කොටසක් හෝ කොටසක් භාවිතා කිරීමට ඉඩ දීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් ලැබෙනු ඇතැයි සිතිය නොහැකිය. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය මඟින් විලම්භිත බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩ සැලසෙන තරමට හඳුනාගෙන ඇත.

විලම්භිත ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ වත්කම අලෙවිකරණ හෝ වගකීම් පියවන වසරට අදාළ අපේක්ෂිත බදු අනුපාතය අනුව වන අතර, එය පදනම්ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශන දිනයට බලපත්වන හො ප්‍රමාණාත්මකව බලපවත්වන බදු අනුපාත හා (බදු නීතීන්) මතය. ස්කන්ධය සෘජුවම හඳුනාගනු ලැබ ඇති අයිතමයන්ට අදාළ විලම්භිත ආදායම් බදු හඳුනාගෙන ඇත්තේ ආදායම් ප්‍රකාශනයේ නොව, ස්කන්ධයටය.

**iii. විකුණුම් බදු**

වත්කම් හෝ සේවාවක් මිල දී ගැනීමේදී ඇති විකුණුම් බද්ද බදු බලධාරීන්ගෙන් අයකර ගත නොහැකි අවස්ථාවන්හිදී හැර, ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බද්දෙහි ශුද්ධ බව හඳුනාගෙන තිබේ නම් විකුණුම් බද්ද පිරිවැයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ. වත්කම් හෝ වියදම් අයිතම විලින් කොටසක් අදාළ වේ. විකුණුම් බද්ද සමඟ ප්‍රකාශ කළ යුතු ලැබිය යුතු හා ගෙවිය යුතු දේවලින් අයකර ගත හැකි හෝ ගෙවිය යුතු ශුද්ධ විකුණුම් බද්ද ඇතුළත් වූ විට, බදුකරණ බලධාරීන් ලැබිය යුතු දේ සහ ගෙවිය යුතු දේවල කොටසක් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුළත් වේ.

**ණයට ගැනීමේ පිරිවැය**

සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන සාමාන්‍ය සහ නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, ඒවා අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම් වන අතර එම වත්කම්වල පිරිවැයට එකතු වේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලය තුළ වියදම් කරනු ලැබේ.

## 1.4.3 විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වේ. විදේශ විනිමය ගනුදෙනු මුලින් සටහන් වන්නේ ගනුදෙනුවේ දිනයේ ක්‍රියාකාරී මුදල් අනුපාත තීන්දුව අනුව ය.

විදේශ විනිමය නම් කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කිරීමේ දිනයේ දී විනිමය තීන්දුවේ ක්‍රියාකාරී මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් ආදායම් ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ. විදේශ මුදල් වර්ගයක ඓතිහාසික පිරිවැය අනුව මනිනු ලබන මුදල් නොවන භාණ්ඩ මුලික ගනුදෙනු සිදුකරන දිනට අනුව විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.

සාධාරණ වටිනාකම තීරණය කරන දිනයේ විනිමය අනුපාත භාවිතා කරමින් විදේශ මුදල්වල සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය නොවන භාණ්ඩ පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ වටිනාකමින් මනිනු ලබන මුදල් නොවන භාණ්ඩ පරිවර්තනය කිරීමෙන් පැන නගින ලාභය හෝ අලාභය සලකනු ලබන්නේ භාණ්ඩයේ සාධාරණ වටිනාකමෙහි වෙනසෙහි ලාභය හෝ අලාභය හඳුනා ගැනීමෙනි. (එනම්. සාධාරණ වටිනාකමක් හෝ අලාභයක් ඇති අයිතමවල පරිවර්තන වෙනස්කම් OCI හි හඳුනාගෙන ඇති අතර ලාභය හෝ අලාභ පිළිවෙලින් OCI හෝ ලාභය හො අලාභය ලෙස හඳුනාගෙන ඇත.)

## 1.4.4 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

ජංගම / ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ව ප්‍රකාශ පිළියෙල කිරීමේදී සමූහය වත්කම් හා වගකීම් ඉදිරිපත් කරයි. වත්කමක් ජංගම ලෙස වර්ගීකරණය කිරීමට නම්,

සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.

මූලික වශයෙන් වෙළඳාමේ අරමුණු සඳහා තබාගත් විට

වාර්තාකරණ කාලයෙන් මාස දොළහක් ඇතුළත එය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ නම් හෝ වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක්වත් හුවමාරු කර ගැනීම හෝ වගකීමක් පියවීම සඳහා භාවිතා කිරීම සීමා නොකළහොත් මුදල් හෝ මුදල් සමාන දෑ

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

වගකීමක් පවතින විට එය,

සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ නිරවුල් කිරීමට අපේක්ෂා කෙරේ.

මූලික වශයෙන් වෙළඳාමේ අරමුණු සඳහා තබාගත් විට වාර්තා කිරීමේ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට නියමිතයිනම්,

හෝ

වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම පියවීම කල් දැරීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත.

සමූහය අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

විලම්භිත වූ බදු වගකීම් වර්තමාන නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 1.4.5 සාධාරණ අගය මැනීම

සමූහය මූල්‍ය උපකරණ වාර්තා කිරීම සහ ඉඩම් වැනි මූල්‍ය නොවන වත්කම් වැනි උපකරණ සෑම වාර්තාකරණ දිනයකදීම සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. සාධාරණ වටිනාකමකින් මනිනු ලබන හෝ සාධාරණ වටිනාකම් හෙළිදරව් කරනු ලබන මූල්‍ය උපකරණ සහ මූල්‍ය නොවන වත්කම් සඳහා සාධාරණ වටිනාකම් සම්බන්ධ අනාවරණයන් පහත සටහන් වල සාරාංශ කොට ඇත.

- දේපළ, පිරියත සහ උපකරණ (සටහන 8)
- ආයෝජන දේපළ (සටහන 8.3)
- මූල්‍ය උපකරණ (ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගෙන යන උපකරණ ඇතුළුව) (සටහන 12.1)

සාධාරණ වටිනාකම යනු වත්කම් විකිණීම සඳහා ලැබිය යුතු හෝ මිනුම් දිනයේදී වෙළඳපොළ සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීම පදනම් වන්නේ වත්කම විකිණීම හෝ වගකීම පැවරීම යන ගනුදෙනුව සිදු වේ යන උපකල්පනය මතය.

වත්කම් හෝ වගකීම් සඳහා වන ප්‍රධාන වෙළඳපොලේ හෝ

ප්‍රධාන වෙළඳපොළක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත් වාසිදායක වෙළඳපොල සමූහයට ප්‍රවේශ විය යුතුය.

වත්කම් හෝ වගකීම්වල සාධාරණ වටිනාකම මනිනු ලබන්නේ වෙළඳපළ සහභාගිවන්නන් ඔවුනගේ ආර්ථික යහපත වෙනුවෙන් ක්‍රියා කරයි යැයි උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිළ නියම කිරීමේදී සහභාගීවන්නන් භාවිතා කරනු ඇති උපකල්පන භාවිතා කරමිනි.

මූල්‍යමය නොවන වත්කමක සාධාරණ වටිනාකමක් මැනීම, වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතයෙන් භාවිතා කිරීමෙන් හෝ වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතයට භාවිතා කරන වෙනත් වෙළඳපළ සහභාගීවන්නෙකුට විකිණීමෙන් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට වෙළඳපොළ සහභාගීවන්නෙකුට ඇති හැකියාව සැලකිල්ලට ගනී.

සමූහය විසින් තක්සේරුකරණ ක්‍රමවේදයන් භාවිතා කරනු ලබන අතර, සාධාරණ වටිනාකම මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකිය. අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කිරීම සහ පාලනය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම. ඉඩම් සහ ආයෝජන දේපළ සහ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් වැනි සැලකිය යුතු වගකීම් වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ.

සාධාරණ වටිනාකම් අනාවරණය කිරීම් සඳහා, වත්කම් හෝ වගකීම්වල ස්වභාවය, ලක්ෂණ සහ අවදානම් මත පදනම්ව සමූහය විසින් වත්කම් හා වගකීම් කාණ්ඩ තීරණය කර ඇත.

## 1.4.6 දේපළ, පිරියත සහ උපකරණ

එදිනෙදා සේවා පරිවැය, අඩු සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකම්වල සමුච්චිත හානිය හැරුණු විට ඉඩම් හැර දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය අනුව සඳහන් වේ.

### මිණුම්

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසුකම් ලබන දේපළ, පරියත සහ උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ වත්කම් අත්පත් කර ගැනීම හෝ ඉදිරිකිරිම සඳහා සෘජුවම ආරෝපණය වන මිලදී ගැනීමේ පිරිවැය සහ ඒ සඳහා වන ඕනෑම අහඹු වියදම් සමහය.

ස්ව ඉදිකිරිමේ වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය හෝ වත්කම් එහි අපෙක්ෂිත භාවිතය සඳහා වැඩ කරන තත්වයකට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් වියදම් සහ භාණ්ඩ ඉවත් කිරීම සහ ඒවා ඇති වෙබ් අඩවිය ප්‍රතිෂ්ඨාපනය කිරීම යන වියදම් ඇතුළත් වේ.

සුදුසුකම්ලත් වත්කම්වල පිරිවැය සහ ණය ගැනීමේ පිරිවැය පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම්, එම පිරිවැය දැරූ විට දේපළ, පරියත සහ උපකරණවලින් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් වේ.

### පිරිවැය ආකෘතිය

ඉඩම් හැර දේපළ, පිරියත සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතියක් සමුහය අදාළ වන අතර මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය පිළිබඳ වාර්තා සහ ඒ සඳහා වන ඕනෑම අහඹු වියදම් තුළින් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම් පාඩු අඩු කරනු ලැබේ.

### ප්‍රතිතක්සේරුකරන ආකෘතිය

නැවත තක්සේරු කළ දිනට පසුව හඳුනාගත් අඩු හානියක් පාඩු සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. තක්සේරු කරන ලද වත්කමක සාධාරණ වටිනාකම එහි රැගෙන යන ප්‍රමාණයට වඩා ප්‍රමාණාත්මක වශයෙන් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා තක්සේරු කිරීම් නිතර සිදු කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙ ඇති එම වත්කමෙහි නැවත ඇගයීමේ අඩුවීමක් ආපසු හැරෙන තරමට හැර, ඕනෑම නැවත ඇගයීමේ අතිරික්තයක් කොටස්වල වත්කම් නැවත තක්සේරු කිරීමේ සංචිතයට බැර කරනු ලැබේ. වත්කම් නැවත තක්සේරු කිරීමේ සංචිතයේ හඳුනාගෙන ඇති එම වත්කම මත පවත්නා අතිරික්තයක් පියවා ගන්නා ප්‍රමාණය හැර, ආදායම් ප්‍රකාශයේ නැවත ඇගයීමේ හිඟයක් හඳුනා ගැනේ.

බැර කිරීමෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කම්වලට අදාළ ඕනෑම තක්සේරුකිරීමේ සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

### පසු පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එම භාණ්ඩය රැගෙන යන ප්‍රමාණයෙන් හඳුනාගෙන තිබේ නම්, එම කොටස තුළ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමුහය තුළට ගලා ඒමට ඉඩ ඇති අතර එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිය.

### ප්‍රතිස්ථාපන පිරිවැය

අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්වයට පත් කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා වන පිරිවැය ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

### හඳුනාගැනීම ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් රැගෙන යාමේ ප්‍රමාණය බැහැර කිරීමේදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනාගෙන ඇත. දේපළ, පිරියත සහ උපකරණ හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගත් විට ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ.

### ක්ෂයවීම

නිශ්චිත නොවූ ජීවිත කාලයක් ඇතැයි සැලකෙන බැවින් ඉඩම් ක්ෂය නොවේ. භාවිතා කිරීමට ලබා ගත හැකි දින සිට ආරම්භ වන විවිධ වර්ගයේ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිතවලට සුදුසු කාල සීමාවන් තුළ සමුහය සරල රේඛිය පදනමින් ක්ෂය කිරීම් සපයයි. වත්කම හඳුනා නොගත් දිනයේ ක්ෂයවීම නතර වේ.

ව්‍යාපාර සැලැස්ම සහ උපාය මාර්ග අපේක්ෂිත භාවිත මට්ටම සහ කළමනාකාරණ විනිශ්චය භාවිතා කරමින් අනාගත සංවර්ධනයන් වැනි සාධක මත පදනම්ව ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත, අවශේෂ වටිනාකම් සහ දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ ක්‍රමය සමුහය වාර්ෂිකව සමාලෝචනය කරයි. වත්කම්වල ඇතමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

| වත්කම් | වසර |
|---|---|
| ගොඩනැගිලි | වසර 35 - 50 |
| ටැංකි | වසර 20 - 40 |
| නල මාර්ග | වසර 5 - 40 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | වසර 5 - 10 |
| ගැන්ට්‍රි සහ පොම්ප | වසර 10 - 15 |
| වාහන | වසර 4 - 5 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | වසර 3 - 10 |
| බෝයාව | වසර 10 |
| එස්පීඑම් පහසුකම - ටැංකි ගොවිපල | වසර 40 |
| ගුවන් සේවා පහසුකම් මත්තල | |
| ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය | **වසර 40** |
| අභ්‍යන්තර මාර්ග ජාලය | **වසර 20** |
| මීනුම් සහ විදුලි පද්ධතිය | **වසර 10** |
| ගිනි නිවීමේ පද්ධතිය | **වසර 10** |
| වෙනත් වත්කම් | **වසර 8** |
| මුතුරාජවෙල - PLEM | **වසර 10** |

වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීවිත සහ ක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කර සුදුසු පරිදි සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සකස් කරනු ලැබේ.

#### කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යන්

කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ කිරීමේ ප්‍රගතිය පිරිවැය අනුව ප්‍රකාශ කෙරේ. මෙම්වා ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රධාන කර්මාන්තශාලා සහ යන්ත්‍රෝපකරණ සහ පද්ධති සංවර්ධනය සඳහා සෘජුවම දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

#### මූල්‍ය නොවන වත්කම් හානි කිරීම

සිදුවීම් හෝ තත්වයන්හි වෙනස්වීම් පෙන්නුම් කරන විට ධාරක මුදල ආපසු අයකර ගත නොහැකි විය හැකි සෑම අවස්ථාවකම වත්කම් හානිය සඳහා සමාලෝචනය කෙරේ. වත්කම් ධාරක මුදල ආපසු අයකර ගත හැකි මුදල ඉක්මවා යන ප්‍රමාණයට හානිකර අලාභයක් හඳුනා ගැනේ. අයකර ගත හැකි මුදල යනු වත්කමක සාධාරණ වටිනාකම විකිණීමට අඩු පිරිවැයක් සහ භාවිතයේ වටිනාකමයි.

හානිය තක්සේරු කිරීමේ අරමුණ සඳහා, වෙන වෙනම හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් උත්පාදන ඒකක) ඇති අවම මට්ටම්වල වත්කම් කාණ්ඩගත කර ඇත. එක් එක් වාර්තාකරණ දිනයේදී හානිය ආපසු හැරවීම සඳහා හානියට ලක් වූ මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ.

## 1.4.7 ආයෝජන දේපළ

#### හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපළ යනු කුලී උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය කිරීම සඳහා හෝ දෙකම තබා ඇති නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීම සඳහා නොවන වත්කම් වේ.

#### මැනීම

ආයෝජන දේපළ මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය ක්‍රමය යටතේ ගණනය කෙරේ. ඒ අනුව, වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු, දේපළ එහි පිරිවැය, සමුච්චිත ක්ෂයවීම් හා හානිකර පාඩු අඩු කිරීමෙන් පෙන්වනු ලබයි.

#### ක්ෂයවීම

වත්කම් පන්තියේ ඇස්තමේන්තුගත ආයු කාලය මිළට ගත් දින සිට බැහැර කරන දිනය දක්වා සරල රේඛීය පදනමක් මත ක්ෂය කිරීම සපයනු ලැබේ.

#### ඉවත් කිරීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන හෙයින් ආයෝජන දේපළ බැහැර කළ පසු හෝ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කරනු ලැබේ. ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන ප්‍රමාණය අතර වෙනස හඳුනා නොගත් කාල සීමාව තුළ ලාභය හො අලාභය ලෙස හඳුනාගෙන ඇත. SLFRS 15 හි ගනුදෙනු මිල තීරණය කිරීම සඳහා වන අවශ්‍යතාවයන්ට අනුකූලව ආයෝජන දේපළ අවලංගු කිරීමෙන් පැන නගින වාසි හෝ අලාභයට ඇතුළත් කළ යුතු කරුණු තීරණය වේ.

ආයෝජන දේපළ වෙත සහ ඉන් ස්ථාන මාරුවීම් සිදු කරනු ලබන්නේ භාවිතයේ වෙනසක් සිදු වූ විට පමණි.

## 1.4.8 අස්පෘශ්‍ය වත්කම්

#### හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 38 ට අනුකූලව වත්කම් වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා යා හැකි අතර වත්කම්වල පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනේ.

මූලික හඳුනාගැනීමෙන් පසු, අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂය කිරීමක් සහ සමුච්චිත හානියක් සිදුවුවහොත් අඩු කරන ලද අගයට ගෙන යනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන මුදල අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ.) ලාභය හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් වේ.

## 1.4.9 අනුබද්ධ සමාගමේ ආයෝජනය

අනුබද්ධ සමාගමේ පිරිවැයෙන්, හානි ඇත්නම් අඩුකර දක්වා ඇත.

## 1.4.10 තොගය

යල්පැනගිය හා මන්දගාමී චලනය වන අයිතම සඳහා නිසි වෙන් කිරීම් ලබා දීමෙන් පසුව, තොග අගය  කරනු ලබන්නේ පිරිවැය හා ශුද්ධ විකිණීම වටිනාකම යන අගයන්ගෙන් අඩු අගයට වේ. ශුද්ධ උපලබ්ධිත වටිනාකම (NRV) යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී තොග අලෙවි කළ හැකි ඇස්තමේන්තුගත විකුණුම් මිල වන අතර,  එය සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය හා විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු වේ.

NRV තක්සේරු කරනු ලබන්නේ වාර්තාකරණ දිනයේ සහ මෑත කාලීන වෙළඳපල තත්වයන් සහ මිළ ගණන් පිළිබඳව අවධානය යොමු කිරීමක්ය.

තොග වර්තමාන ස්ථානයට ගෙන ඒම සඳහා වන පිරිවැය පහත සඳහන් පිරිවැය සූත්‍ර භාවිතා කර ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිළ |
| නිමි භාණ්ඩ | |
| අ. පිරිපහදු කළ නිෂ්පාදන | සෘජු ද්‍රව්‍ය වල පිරිවැය අනුව, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව නිෂ්පාදන පොදු කාර්ය සඳහා සුදුසු අනුපාතයක්, නමුත් ණය ගැනීමේ පිරිවැය හැර. |
| ආ. ආයතන | පෙර පිවිසි පෙර නිකුත් පදනම මත ගැනුම් මිළ |
| වැඩ කරමින් පවතින භාණ්ඩ | |
| අ. පිරිපහදු කළ නිෂ්පාදන | සෘජු ද්‍රව්‍ය වල පිරිවැය අනුව, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරතාව මත පදනම්ව නිෂ්පාදන පොදු කාර්ය සඳහා සුදුසු අනුපාතයක්, නමුත් ණය ගැනීමේ පිරිවැය හැර. |
| ආ. ආනයන | පෙර පිවිසි පෙර නිකුත් පදනම මත ගැනුම් මිළ |
| වෙනත් නිමි භාණ්ඩ | බර තැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනීමේ පිරිවැය යටතේ |
| පරිභෝජන සහ අමතර කොටස් | බර තැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනීමේ පිරිවැය යටතේ |

## 1.4.11 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතේ ඇති මුදල්,  ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ආයෝජන, පවතින මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම් වෙනස් වීමේ සුළු අවදානමක් ඇති වත්කම් වේ.  මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා,  මුදල් හා මුදල් සමාන දෑ අතේ ඇති මුදල් සහ බැංකු අයිරා වල බැංකු ශුද්ධ තැන්පතු වලින් සමන්විත වේ. කෙටි කල්පිරීම් සහිත ආයෝජන, එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් මුදල් සමාන ලෙස සලකනු ලැබේ.

## 1.4.12 ප්‍රතිපාදන සහ වගකීම් ප්‍රතිපාදන

### ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිපලයක් ලෙස සමූහයට වර්තමාන වගකීමක් (නෛතික හෝ ලාභදායි) ඇති විට ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර,  එහිදි වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ලගා ඒම අවශ්‍ය වන අතර විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය.  වගකීම් ප්‍රමාණය කිසියම් ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීම සමූහය අපේක්ෂා කරන විට, ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනාගෙන ඇති නමුත් ප්‍රතිපූර්ණය කිරීම පාහේ නිශ්චිත වූ විට පමණි.  ඕනෑම ප්‍රතිපාදනයකට අදාළ වියදම ඕනෑම ප්‍රතිපූරණයක ආදායම් ප්‍රකාශන කාලයේ ඉදිරිපත් කෙරේ.  මුදල්වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමානාත්මක නම්, ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් බදු ගෙවීමට පෙර අනුපාතයකට වට්ටම් කිරීමෙනි,  එමඟින් මුදල්වල කාල වටිනාකම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු වන අතර සුදුසු අවස්ථාවල දී වගකීම් සඳහා විශේෂිත අවදානම් වට්ටම් භාවිතා කරන විට, කාලය ගතවීම හේතුවෙන් ප්‍රතිපාදන වැඩි කිරීම පොළී වියදමක් ලෙස හඳුනා ගැනේ.

### නිශ්චිත ප්‍රතිලාභ බැඳිම - පාරිතෝෂිකය

පාරිතෝෂිකය සම්බන්ධයෙන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම වන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වාර්තාකරණ කාලය අවසානයේ ඇති බැඳීමේ වර්තමාන වටිනාකමයි.  අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම රඳා පවතින්නේ උපකල්පන ගණනක් භාවිතා කරමින් ක්‍රියාකාරී පදනමක් මත තීරණය වන සාධක ගණන මතය.  පාරිතෝෂිකය සඳහා පිරිවැය තීරණය කිරීමේදී මෙම උපකල්පනවලට වට්ටම් අනුපාතය, අපේක්ෂිත කාර්ය මණ්ඩල පිරිවැටුම සහ වැටුප් වර්ධක අනුපාතය ඇතුළත් වේ. මෙම උපකල්පනයන්හි කිසියම් වෙනසක් සිදුවුවහොත් එය පාරිතෝෂික බැඳීම් ප්‍රමාණයට බලපායි.

සෑම වසරකම අවසානයේ සුදුසු වට්ටම් අනුපාතය කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම පියවීම සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කරන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය මෙයයි. වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ ආයතනික බැඳුම්කර සඳහා ගැඹුරු වෙළඳපොලක් නොමැති විට, රජයේ බැඳුම්කරවල පොළී අනුපාත කළමනාකරණය විසින් සලකාබලයි. අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වෙනත් ප්‍රධාන උපකල්පන වාර්තමාන වෙළඳපල තත්වයන් මත පදනම් වේ.

LKAS 19 - සේවක ප්‍රතිලාභ වලට අනුකූලව සියලුම ස්ථිර සේවකයින් සඳහා සේවයේ ආරම්භයේ සිටම විශ්‍රාමික පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිකය ගෙවීමේ පනත යටතේ සේවකයෙකුට වගකීම පැන නගින්නේ වසර 5ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම බාහිරින් අරමුදල් සපයන අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්මක් නොවේ. වාසි සහ අලාභ ඒවා පැන නගින කාල සීමාව තුළ වෙනත් පුළුල් ආදායමක් සඳහා අය කරනු ලැබේ.

**නිර්වචනය කරන ලද දායක සැලසුම් - සේවකයින්ගේ අර්ථ සාධක සහ සේවකයින්ගේ භාරකාර අරමුදල**

අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරඅරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. සේවකයින්ගේ අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා පිළිවෙලින් සේවකයින්ගේ දළ දීමනාවෙන් 15% සහ 3% ක් සංස්ථාව දායක වන අතර සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදයන්හි ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වාර්තා කරයි.

## 1.4.13 ප්‍රාග්ධන සංචිතය

රජයේ ඒකාබද්ධ අරමුදලෙන් ලැබෙන නිශ්චිත මුදල් සහ විකුණුම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ශුද්ධ වටිනාකම අවසානයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සංචිතයට බැර කරයි.

## 1.4.14 මූල්‍ය වත්කම්

**i.** මූල්‍ය වත්කම්
මූලික හඳුනා ගැනීම සහ මැනීම

මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය රඳා පවතින්නේ මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා සමූහ ව්‍යාපාර ආකෘතිය මත ය.

සැලකිය යුතු මූල්‍ය සංරචකයක් අඩංගු නොවන හෝ සමූහය ප්‍රායෝගික ප්‍රයෝජනවත් කර ඇති වෙළඳ ලැබීම් හැරුණු විට, සංස්ථාව මුලින් මූල්‍ය වත්කමක් එහි සාධාරණ වටිනාකමට අනුව මනිනු ලැබේ. මූල්‍ය වත්කමක් සාධාරණ වටිනාකමක් නොමැති අවස්ථාවක ලාභය හෝ අලාභය, ගනුදෙනු පිරිවැය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් අඩංගු නොවන හෝ සමූහය ප්‍රායෝගික ප්‍රයෝජනවත් කර ඇති වෙළඳ ලැබීම් ගනුදෙනු මිළ අනුව මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් පුළුල් ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම මනිනු ලැබේ.

මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර ක්‍රමානුකූල පිරිවැය හෝ සාධාරණ වටිනාකමකින් OCI හරහා ගණනය කිරීම සඳහා එය ගෙවිය යුතු ප්‍රධාන මුදල මත තනිකරන මූලික හා පොළී ගෙවීම් (SPPI) වන මුදල් ප්‍රවාහයන් ඇති කළ යුතුය.

මෙම තක්සේරුව SPPI පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන අතර එය උපකරණ මට්ටමින් සිදු කෙරේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමූහයේ ව්‍යාපාර ආකෘතිය යනු මුදල් ප්‍රවාහයන් උත්පාදනය කිරීම සඳහා එහි මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරයයි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ දෙකම නිසා මුදල් ප්‍රවාහයන් සිදුවන්නේද යන්න ව්‍යාපාරික ආකෘතිය තීරණය කරයි. වෙළඳපල තුළ නියාමනය හෝ සම්මුතිය මඟින් ස්ථාපිත කර ඇති කාල රාමුවක් තුළ වත්කම් බෙදා හැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිළට ගැනීම හෝ විකිණීම (නිත්‍ය ක්‍රම වෙළඳාම්) වෙළඳ දිනය, එනම් සමූහය වත්කම් මිළදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටින දිනයේදී හඳුනා ගැනේ. සමූහය සිය මූල්‍ය උපකරණ පහත දැක්වෙන කාණ්ඩ යටතේ වර්ගීකරණය කරයි.

**A. ක්‍රමක්ෂය වියදමෙන් මූල්‍යමය වත්කම්**
පහත කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමූහය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයකින් මනිනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම්
- රඳවා ගැනීමේ අරමුනින් මූල්‍ය ආකෘතිය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇත.

මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවල මුදල් ප්‍රවාහයන් සඳහා හේතු වන අතර ඒවා ප්‍රධාන වශයෙන් ගෙවිය යුතු ප්‍රධාන මුදල සහ පොළිය ගෙවිය යුතු ප්‍රධාන මුදල ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් පසුව පොළී (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර එය හානිවලට යටත් වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කරන ලද හෝ දුර්වල වූ විට ලාභය හෝ අලාභය තුල වාසි සහ අලාභ හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය පිරිවැයකින් සමූහයේ මූල්‍ය වත්කම්වලට වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු දේ ඇතුළත් වන අතර සේවකයින්ට ණය දීම සහ භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත්, ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය කිරීම ඇතුළත් වේ.

### B. OCI හරහා සාධාරණ වටිනාකමින් සැලසුම් කරන ලද මූල්‍ය වත්කම්

මූලික පිළිගැනීම මත, සමූහයට LKAS 32 මූල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම සහ වෙළඳාම සඳහා නොපැවැත්වීම යන කරුණු යටතේ OCI හරහා සාධාරණ වටිනාකමින් නම් කරන ලද කොටස් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගත හැකිය. වර්ගීකරණය තීරණය කරනු ලබන්නේ උපකරණ අනුව ය.

මෙම මූල්‍ය වත්කම්වල ලාභ හා අලාභ කිසි විටෙකත් නැවතත් ගැලපීම නොකෙරේ. ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ඇති විට ලාභාංශ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර, මූල්‍ය වත්කම් වල පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් ලෙස සමූහයට ලැබෙන ආදායමෙන් හැර, එවැනි වාසි OCI හි සටහන් වේ.

මෙම කාණ්ඩය යටතේ සිය මිළ ගණන් සහ ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන වර්ගීකරණය කිරීමට සමූහය තොරා ගන්නා ලදි.

### ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන විට, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) මූලික වශයෙන් හඳුනාගෙන ඇත්නම්. සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශයෙන් ඉවත් කරනු ලැබේ.

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇත. හෝ
- වත්කම් වලින් මුදල් ප්‍රවාහයන් ලබා ගැනීම සඳහා සමූහය සිය අයිතිවාසිකම් මාරු කර ඇති අතර හෝ ලැබුනු මුදල් ප්‍රවාහයන් ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට විධිවිධානයක් යටතේ ගෙවීමට බැඳී සිටී. (අ) සමූහයට වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇත. හෝ (ආ) සමූහය වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නැත, නමුත් වත්කම් පාලනය මාරු කර ඇත.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා සමූහය සිය අයිතිවාසිකම් මාරු කර ඇති විට හෝ සමත් වීමේ විධිවිධානයකට අවතීර්ණ වූ විට. එය තක්සේරු කරන්නේ, සහ එය කොතෙක් දුරට හිමිකාරිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගෙන ඇත්ද යන්නයි. වත්කම්වල සියලු අවදානම් සහ විපාක සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නොමැති විට හෝ වත්කම් පාලනය කළ විට සමූහය විසින් මාරු කරන ලද වත්කම එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට අඛණ්ඩව හඳුනා ගනී. එවැනි අවස්ථාවකදී, සමූහය ආශ්‍රිත වගකීමක් ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම සහ ඒ ආශ්‍රිත වගකීම මනිනු ලබන්නේ සමූහය විසින් රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත ය.

### මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල වී ඇති බවට විෂයබද්ධ සාක්ෂි තිබේද යන්න සමූහය සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි. වත්කම් මූලික හඳුනාගැනීමෙන් පසුව සිදු වූ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුවී ඇති බවට සාක්ෂි තිබේ නම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල යැයි සලකනු ලැබේ, සහ එම අලාභ සිදුවීම මූල්‍ය වත්කම් වල ඇත්සමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට හෝ විශ්වාසදායක ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කම් සමූහයට බලපෑමක් ඇති කරයි. අපේක්ෂිත ණය පාඩු (ඊසිඑල්) පදනම් වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් සහ සමූහය ලැබීමට අපේක්ෂා කරන සියලු මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත වන අතර, එය මුල් ඵලදායී පොළී අනුපාතයට ආසන්න වශයෙන් වට්ටම් කරනු ලැබේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්ට ගිවිසුම්ගත නියමයන්ට අනුකූල වන ඇපකරයක් විකිණීම හෝ වෙනත් ණය වැඩි දියුණු කිරීම් ඇතුළත් වේ.

ECL අදියර දෙකකින් හඳුනාගෙන ඇත. මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදු නොවූ ණය නිරාවරණ සඳහා ඊසිඑල් ලබා දී ඇත්තේ ඉදිරි මාස 12 තුළ (මාස 12 ක ඊසිඑල්) සිදුවිය හැකි පෙරනිමි සිදුවීම්වල ප්‍රතිඵලයක් වන ණය පාඩු සඳහා ය. මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදු වී ඇති ණය නිරාවරණ සඳහා, පැහැර හැරීමේ වේලාව නොලසකා ජීවිත කාලය පුරාම ECL නිරාවරණයේ ඉතිරි කාලය තුළ අපේක්ෂා කරන ණය පාඩු සඳහා අලාභ දීමනාවක් අවශ්‍ය වේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ සඳහා, ණයගැතියන් හෝ න්‍යාය ගැතියන් කාණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුලික ගෙවීම් පැහැර හැරීම හෝ අඩුපාඩුකම්, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනෙත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළු වීමේ සම්භාවිතාව සහ නිරීක්ෂණය කළ හැකි දත්ත හිඟ වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහ සම්බන්ධ වන ආර්ථික තත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩුවීමක් ඇති බව පෙන්නුම් කර ඇත. සමූහය එහි ඓතිහාසික ණය අලාභ අත්දැකීම් මත පදනම් වූ ප්‍රතිපාදන අනුකෘතියක් පිහිටුවා ඇති අතර, එය ණය ගැතියන්ට විශේෂිත වූ ඉදිරි සාධක සඳහා සකස් කර ඇත.

ගිවිසුම්ගත ගෙවීම් දුරස්ථ වූ විට සමූහය මූල්‍ය වත්කමක් පෙරනිමියෙන් සලකයි. කෙසේ වෙතත්, ඇතැම් අවස්ථාවල දී සමූහය විසින් දරනු ලබන ණය වැඩි දියුණු කිරීමේ සැලකිල්ලට ගැනීමට පෙර සමූහයට හිඟ කොන්ත්‍රාත් මුදල් සම්පූර්ණයෙන්ම ලැබිය නොහැකි බව අභ්‍යන්තර හෝ බාහිර තොරතුරු මඟින් පෙන්නුම් කරන විට සමූහය මූල්‍ය වත්කමක් පෙරනිමියෙන් සලකනු ඇත. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් අයකර ගැනීම පිළිබඳ සාධාරණ අපෙක්ෂාවක් නොමැති විට මූල්‍ය වත්කමක් කපා හරිනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ දුර්වලතා පාඩුව හඳුනාගත යුතු ද යන්න තක්සේරු කිරීම සඳහා එක් එක් වර්තා කිරීමේ දිනයේදී සමූහය විසින් තනි තනිව සැලකිය යුතු වෙළඳ ලැබිය යුතු දේ සමාලෝචනය කරයි. සමූහය විසින් ලැබිය යුතු වෙළඳාම තනි තනිව තක්සේරු කරන අතර අතිරේකව දුර්වල නොවන බව සොයා ගෙන ඇත.

## ii. මූල්‍ය වගකීම්

### මූලික හඳුනා ගැනීම සහ මැනීම

මූලික පිළිගැනීමේදී මූලය වගකීම් වර්ගීකරණය කර ඇත්තේ ලාභය හෝ අලාභය, ණය සහ ණය ගැනීම් හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වගකීම් සඳහා වෙළඳ හා වෙනත් ගෙවීම් සුදුසු පරිදි ඇතුළත් වේ.

සියළුම මූල්‍ය වගකීම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර, ණය සහ ණය ගැනීම් සහ ගෙවිය යුතු අවස්ථා වලදී. සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයේ ශුද්ධය වේ.

සමූහයේ මූල්‍ය වගකීම් අතර වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ, බැංකු අයිරා ඇතුළු ණය සහ ණය ගැනීම් ඇතුළත් වේ.

.

### පසුව මැනීම

ණය සහ ණය ගැනීම් සහ වෙළඳාම සහ වෙනත් ගෙවීම් ක්‍රමාක්ෂය පිරිවැය යටතේ මූලික හඳුනාගැනීමෙන් පසුව, පොළී දරණ ණය සහ ණය ගැනීම් පසුව EIR ක්‍රමය භාවිතා කර ක්‍රමාක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. වගකීම් හඳුනාගෙන ඇති විට මෙන්ම EIR ක්‍රමාක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ආදායම් ප්‍රකාශයේ වාසි සහ අලාභ හඳුනා ගැනේ.

ක්‍රමාක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කර ගැනීම සහ ගාස්තු හෝ පිරිවැය සඳහා වන වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් EIR ක්‍රමාක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් ලෙස ඇතුළත් කර ඇත.

### අවලංගු කිරීම

වගකීම යටතේ ඇති වගකීම නිහදස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා ගැනේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් වෙනත් අයෙකු විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කළ විට හෝ පවත්නා වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා ගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ රැගෙන යන ප්‍රමාණයන්හි වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

## iii. මූල්‍ය උපකරණ හිලව් කිරීම

පිළිගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමටත්, වත්කම් සාක්ෂාත් කර ගැනීමටත් සහ මූල්‍යමය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා ඇති අතර ශුද්ධ තත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයේ ශුද්ධ මුදල වාර්තා වේ.

### සාධාරණ වටිනාකම තීරණය කිරීම

වාර්තාකරණ දිනයේ සක්‍රීය වෙළඳපලවල වෙළඳාම් කරන මූල්‍ය උපකරණ සඳහා වන සාධාරණ වටිනාකම පදනම් වන්නේ ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමකින් තොරව ඒවායේ මිල කළ වෙළඳපල මිල මත යි.

සක්‍රීය වෙළඳපලක වෙළඳාම් නොකරන අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ සඳහා සාධාරණ වටිනාකම තීරණය වන්නේ සුදුසු තක්සේරුකරණ ක්‍රම භාවිතා කිරීමෙනි. තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් අතර වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය, වෙළඳපල නිරීක්ෂණය කළ හැකි මිල පවතින සමාන උපකරණ හා සැසඳීමේදී වෙනත් අදාළ තක්සේරු ආකෘති ඇතුළත් වේ.

වර්තමාන වෙළඳපල ගනුදෙනු හෝ නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත ලබා ගත නොහැකි තක්සේරුකරණ ක්‍රමවේදයන් භාවිතා කරමින් ඇතැම් මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකමකින් සටහන් වේ. වඩාත් සාධාරණ ආකෘති උපකල්පන සමූහයේ හොඳම තක්සේරුව සමඟ තක්සේරු ආකෘති භාවිතා කරමින් ඔවුන්ගේ සාධාරණ වටිනාකම තීරණය වේ.

මූල්‍ය උපකරණවල සාධාරණ අගයන් විශ්ලේෂණය කිරීම සහ ඒවා මනින ආකාරය පිළිබඳ වැඩිදුර විස්තර සටහන 12.1 හි දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය LFRS 09 මූල්‍ය උපකරණ නිකුත් කළ අතර එය මූල්‍ය උපකරණ පිළිබිඹු කරන අතර, LFRS 39 මූල්‍ය උපකරණ, පිළිගැනීම සහ මිනුම් ආදේශ කරයි. හානිය හා හෙජිං ගිණුම්කරණය වර්ගීකරණය හා මැනීම සඳහා නව අවශ්‍යතා ප්‍රමිතිය හඳුන්වා දෙයි.

## 1.4.15 කල්බදු සඳහා ගිණුම්කරණය

කොන්ත්‍රාත්තුවක් කල්බදුවක්ද, නැතහොත් එහි කල්බදුවක් අඩංගුද යන්න කොන්ත්‍රාත්තුව ආරම්භයේදීම සමූහය විසින් තක්සේරු කරයි. එනම්, යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ප්‍රකාශ කරයි නම් කොන්ත්‍රාත්තුව හඳුනා ගැනීම සඳහාසලකා බලයි.

### (a) භාවිතයේ අයිතිය වත්කම

කල්බදු ආරම්භක දිනයේ දී (එනම්, වත්කම භාවිතය සඳහා පවත්නා දිනය) සමූහය භාවිතා කිරීමේ අයිතිය වත්කම් හඳුනා ගනී. භාවිතයේ අයිතිය වත්කම් මනිනු ලබන්නේ පිරිවැය, සමුච්චිත ක්ෂයවීම් සහ හානිවීම් පාඩු අඩු කිරීම සහ කල්බදු වගකීම්වල ඕනෑම ප්‍රතිඅගයකිරීමක් ගැලපීම මගිනුයි. භාවිතයේ අයිතිය වත්කම්වල පිරිවැයට හඳුනාගෙන ඇති කල්බදු වගකීම් ප්‍රමාණය, දරන ලද මූලික ඍජු පිරිවැය සහ ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරන ලද කල්බදු ගෙවීම් වලින් බදු දිරිගැන්වීම් ලදහොත් ඒවා අඩුකර වටිනාකම හඳුනාගනු ලබයි. භාවිතයේ අයිතිය වත්කම් කල්බදු කාල සීමාවේ සහ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය යන අගයන්ගෙන් අඩු අගය සහිත කාලය තුළ සරල රේඛා පදනමක් මත ක්ෂය කෙරේ.

කල්බදු කාලය අවසානයේ කල්බදු වත්කම්වල හිමිකාරිත්වය සමාගමට පැවරීම හෝ පිරිවැයට මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි නම්, වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය භාවිතයෙන් ක්ෂයවීම් ගණනය කරනු ලබයි. භාවිතා කිරීමේ අයිතිය වත්කම් ද හානිකරණයට යටත් කෙරේ.

### (b) බදු වගකීම්

සමූහය විසින් කල්බදු ආරම්භක දිනයේ දී, කල්බදු කාල සීමාව තුළ සිදු කළ යුතු කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගනු ලබයි. කල්බදු ගෙවීම්වලට ස්ථාවර ගෙවීම් (ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම් ඇතුළුව) අඩුවෙන් ලැබිය හැකි කල්බදු දිරිගැන්වීම්, දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම් සහ අවශේෂ වටිනාකම් සහතික යටතේ ගෙවීමට බලාපොරොත්තු වන මුදල් ඇතුළත් වේ. කල්බදු ගෙවීම්වලට සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස නිශ්චිතව පවතින මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල සහ කල්බදු කාලසීමාව මගින් සමූහය අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක කරන බව පිළිබිඹු කරන්නේ නම්, කල්බදු කාලය අවසන් කිරීම සඳහා ගෙවීමද ඇතුළත් වේ.

විස්තර අනාවරණය සටහන 8.6 යටතේ දක්වා ඇත.

## 1.4.16 අඛණ්ඩ වගකීම්, නීති කටයුතු සහ කැපවීම්

අවිනිශ්චිත වගකීම් යනු පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් පමණි. අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදුවිය නොහැකි හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් අඛණ්ඩ වගකීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන නැති නමුත් ඒවා දුරස්ථ නොවේ නම් අනාවරණය කෙරේ.

## 1.5 නිකුත් කළ එහෙත් තවමත් ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති නිකුත් කර ඇති අතර ඒවා අනාගතයේ දී ඵලදායී දිනයක් ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ කර නොමැත. එම ප්‍රතිපත්ති සමූහය විසින් දැනට අනුගමනය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇති අතර මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක වූ විට සංස්ථාව අනුගමනය කරනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයක් සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති බැවින්, මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන දිනට මූල්‍යමය බලපෑම සාධාරණ ලෙස තක්සේරු කළ නොහැක.

**SLFRS 17 රක්ෂණ ගිවිසුම**

මෙම ගිණුම්කරණ ප්‍රමිතිය වෙතින් ඇතිවිය හැකි බලපෑම කළමනාකාරණය තමවත් ගණනය කර නොමැත. මෙම ප්‍රමිතිය 2021 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරච්ඡේද සඳහා ක්‍රියාත්මක වේ.

## 2. ආදායම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| දේශීය | 488,464.589 | 583,821.170 | 488,464.589 | 583,821.170 |
| අපනයන | 30,406.336 | 62,770.368 | 30,406.336 | 62,770.368 |
| පර්යන්ත ගාස්තුව හා වෙනත් | - | - | 222.173 | 155.896 |
| මුළු ආදායම | 518,870.925 | 646,591.538 | 519,093.098 | 646,747.434 |
| අඩු කළා - නිෂ්පාදන බදු හා ජා.ගො.බ. | (8,739.920) | (15,731.825) | (8,739.920) | (15,731.825) |
| ශුද්ධ ආදායම | **510,131.005** | **630,859.713** | **510,353.178** | **631,015.609** |

## 3. වෙනත් මෙහෙයුම් ආදායම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>යලිප්‍රකාශිත<br>රු. මි. |
| ආයෝජන දේපළ මත ආදායම | 41.898 | 45.869 | 41.898 | 45.869 |
| සේවක ණය පොළී | 194.673 | 239.194 | 623.136 | 885.907 |
| කුලී ආදායම | 9.889 | 10.861 | 13.879 | 14.676 |
| දේ.පි.උ.ඉවත් කිරීම මත ලාභය /(පාඩුව) | 1.707 | 2.617 | 1.274 | 32.062 |
| පිරවුම්හල් උපකරණ අලවියෙන් ලාභය | 21.350 | 20.474 | 21.350 | 20.474 |
| ලාභාංශ ආදායම | 240.122 | 150.001 | 0.122 | 0.001 |
| විවිධ ආදායම | 309.031 | 60.401 | 443.957 | 226.210 |
| | **818.670** | **529.415** | **1,145.615** | **1,225.198** |

## 4. මෙහෙයුම් ලාභය

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>යලිප්‍රකාශිත<br>රු. මි. |
| පහත සඳහන් වියදම් ගෙවීමෙන් පසු ප්‍රකාශිත මෙහෙයුම් ලාභය | | | | |
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 5.547 | 7.658 | 10.082 | 8.282 |
| විගණකවරුන්ගේ වේතන | 4.000 | 3.500 | 5.696 | 5.480 |
| ක්ෂයවීම් | 715.664 | 722.568 | 1,742.887 | 1,543.531 |
| ප්‍රචාරණ වියදම් | 18.800 | 28.002 | 18.800 | 28.002 |
| නීති ගාස්තු හා වෙනත් වෘත්තීය ගාස්තු | 188.193 | 79.427 | 188.193 | 79.427 |
| අවසර නොදුන් වැට් | 1,127.177 | 2,308.966 | 1,127.177 | 2,308.966 |
| මහා භාණ්ඩාගාරයට විශේෂ ගාස්තු | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 |

## 5. මූල්‍ය ආදායම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. | 2020 රු. මි. | 2019 යලිප්‍රකාශිත රු. මි. |
| භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු වලින් ලද පොළී ආදායම | 2,574.185 | 3,240.940 | 2,883.468 | 3,563.970 |
| ණය ඉන්වොයිස් සහ කල් ඉකුත් වූ වෙළඳ ණය මත පොළී ආදායම | 13.117 | 12.339 | 13.117 | 12.339 |
| ලංවිම/ පෞ.විදුලි සමාගම්/ ගුවන් තෙල් ණය වෙතින් පොළී ආදායම | 6,285.950 | 7,674.846 | 6,285.950 | 7,674.845 |
| භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලද පොළී ආදායම | 2,313.080 | 2,596.986 | 2,313.080 | 2,596.985 |
| නේවාසික විදේශ මුදල් ගිණුම් වෙතින් පොළී ආදායම | 1.558 | 0.856 | 1.558 | 0.856 |
| | **11,187.890** | **13,525.966** | **11,497.173** | **13,848.996** |

## 6. මූල්‍ය වියදම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. | 2020 රු. මි. | 2019 රු. මි. |
| දිගු කාලීන ණය සඳහා පොළී | 7.976 | 18.610 | 7.976 | 18.610 |
| විදේශ විනිමය බැංකු ණය පොළී | 20,874.180 | 14,671.758 | 20,874.180 | 14,671.758 |
| වෙනත් මූල්‍ය පිරිවැය | 29.171 | 8.172 | 29.171 | 8.172 |
| | **20,911.327** | **14,698.539** | **20,911.327** | **14,698.539** |

## 7. බදු වියදම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. | 2020 රු. මි. | 2019 යලිප්‍රකාශිත රු. මි. |
| ජංගම බදු | | | | |
| ජංගම ආදයම් බදු | - | - | 734.615 | 1,045.291 |
| පෙර වසර වල ඌන / (අධි) ප්‍රතිපාදන | - | - | (36.441) | (9.076) |
| ලාභාංශ මත - WHT | - | 21.000 | - | 21.000 |
| විලම්භිත බදු | | | | |
| තාවකාලික වෙනස්කම් ඇති වීම සහ ප්‍රත්‍යාවර්තනය - ආදායම් ප්‍රකාශය | - | - | (489.365) | 126.313 |
| **ආදායම් බදු වියදම් - ආදායම් ප්‍රකාශය** | **-** | **21.000** | **208.809** | **1,183.529** |
| **ආදායම් බදු වියදම් - වෙනත් විස්තීර්ණ ආදායම්** | **(415.689)** | **6.011** | **(451.926)** | **(32.013)** |
| **මුළු ආදායම් බදු වියදම්** | **(415.689)** | **27.011** | **(243.118)** | **1,151.515** |

වර්තමාන බදු අය කිරීම සහ බදු වලට පෙර ලාභය අතර සංසන්දනය පහත දැක්වේ:

| | | | | |
|---|---|---|---|---|
| බදු වලට පෙර ගිණුම්කරණ ලාභය | **2,370.955** | **(11,835.600)** | **4,477.882** | **(9,057.194)** |
| එකතු කළා : ඉඩ නොදුන් වියදම් | 36,221.384 | 29,989.461 | 37,822.391 | 31,641.212 |
| අඩු කළා : ඉඩ දිය හැකි වියදම් සහ නිදහස් කරන ආදායම් | (1,285.978) | (1,350.122) | (1,907.602) | (2,047.094) |
| **ගැලපුම් කළ වෙළඳ ලාභය** | **37,306.361** | **16,803.739** | **40,392.671** | **20,536.924** |
| අඩු කළා : බදු අලාභ | (37,306.368) | (16,803.739) | (37,306.368) | (16,803.739) |
| එකතු කළා : වසරේ බදු අලාභ | | - | - | |
| **බදු අය කළ හැකි ආදායම** | **-** | **-** | **3,086.303** | **3,733.185** |
| ආදායම් බදු | | | | |
| 2020-24%(2019-28%) | - | - | 734.615 | 1,045.291 |
| පෙර වසරේ ඌන / (අධි) ප්‍රතිපාදන | - | - | (36.441) | (9.076) |
| ලාභාංශ මත - WHT | - | 21.000 | - | 21.000 |
| ආදායම් ප්‍රකාශය සඳහා විලම්භිත බදු | - | - | (489.365) | 126.313 |
| තාවකාලික වෙනස්කම් නිර්මාණය කිරීම සහ ආපසු හැරවීම | (415.689) | 6.011 | (451.926) | (32.013) |
| **ආදායම් බදු වියදම** | **(415.689)** | **27.011** | **(243.118)** | **1,151.515** |

2013/14, 2014/2015, සහ 2015/16 බදු වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 100, රු.මි. 723. සහ රු. මිලියන 55 තක්සේරු නිකුත් කර ඇති අතර සංස්ථාව විසින් එම තක්සේරු කිරීම් සඳහා වලංගු අභියාචනා ඉදිරිපත් කර ඇත. 1997/98 සහ 2002/03 වර්ෂය සඳහා වූ ආදායම් බදු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

2013/14 තක්සේරුඅ වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තීන්දුව ලබා ඇති අතර 2013/14 තකසේරු වර්ශය සඳහා ලබා දී ඇති තීරණයට එරෙහිව බදු අභියාචනා කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

## 8. දේපළ පිරියත හා උපකරණ - සංස්ථාව

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.මි. | පැවරු දේපළ රු.මි. | පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ රු.මි. | SPM සංකීර්ණය රු.මි. | මෝටර් වාහන රු.මි. | ගෘ./ සවිකිරීම්, කා.උප සහ වෙනත් වත්කම් රු.මි. | නොනිමි ප්‍රාග්ධන වැඩ රු.මි. | එකතුව රු.මි. |
|---|---|---|---|---|---|---|---|---|
| 8.1. පිරිවැය | | | | | | | | |
| 01/01/2020 දිනට | 16,233.852 | 1.016 | 12,322.913 | 2,430.976 | 1,327.198 | 2,371.225 | 3,346.799 | 38,033.979 |
| එකතු කිරීම් | 99.358 | - | 88.621 | 101.731 | 18.500 | 43.515 | 1,745.389 | 2,097.116 |
| මාරු කිරීම් | (52.229) | - | 22.893 | - | 25.217 | 4.119 | - | - |
| නැවත තක්සේරුකරණය | 341.661 | - | 17,030.882 | 303.133 | - | 0.230 | - | 17,675.906 |
| ඉවත් කිරීම් | - | - | (42.679) | - | - | (0.066) | - | (42.745) |
| **31/12/2020 දිනට** | **16,622.643** | **1.016** | **29,422.630** | **2,835.841** | **1,370.915** | **2,419.024** | **5,092.189** | **57,764.257** |
| 8.2 ක්ෂය | | | | | | | | |
| 01/01/2020 දිනට | 1,034.653 | 0.397 | 6,427.104 | 1,371.035 | 968.716 | 1,795.661 | - | 11,597.567 |
| වර්ෂය සඳහා අය කිරීම | 141.705 | - | 2,249.668 | 93.895 | 105.904 | 76.726 | - | 2,667.897 |
| මාරු කිරීම් | (34.945) | - | 6.796 | - | 25.217 | 2.932 | | - |
| ඉවත් කිරීම | - | - | (42.679) | - | - | (0.066) | - | (42.745) |
| **31/12/2020 දිනට** | 1,141.413 | 0.397 | 8,640.890 | 1,464.930 | 1,099.837 | 1,875.253 | - | 14,222.720 |
| 31.12.2020 දිනට ශු.පො.ව | **15,481.230** | **0.619** | **20,781.740** | **1,370.911** | **271.078** | **543.771** | **5,092.189** | **43,541.537** |
| 31.12.2019 දිනට | 16,233.852 | 1.016 | 12,322.913 | 2,430.976 | 1,327.198 | 2,371.225 | 3,346.799 | 38,033.979 |
| 31.12.2019 දිනට සමුච්චිත කෂය | 1,034.653 | 0.397 | 6,427.104 | 1,371.035 | 968.716 | 1,795.661 | - | 11,597.567 |
| **31.12.2019 දිනට ශු.පො.ව** | **15,199.199** | **0.619** | **5,895.808** | **1,059.941** | **358.482** | **575.564** | **3,346.799** | **26,436.412** |

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සපුගස්කන්ද පිරිපහදුව සහ සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තයේ දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කර ඇති අතර නැවත තක්සේරු කළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ වටිනාකම ඉන්දියාවේ R. K. පටෙල් සහ සමාගම (ඉන්දියාවේ රජයේ ලියාපදිංචි තක්සේරුකරු) විසින් තීරණය කරන ලදී.

නැවත තක්සේරු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම | මැණුම් ප්‍රවේශය | නැවත තක්සේරුකරන බලපැවැත්වෙන දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සඳහා සාධාරණ වටිනාකමේ සංවේදීතාව | සාධාරණ වටිනාකම් ධුරාවලියේ මට්ටම |
|---|---|---|---|---|---|
| **ගොඩනැගිලි** | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | වර්ග මීටරයකට Plinth ප්‍රදේශයේ පදනම සහ වර්ග මීටරයකට රුපියල් 4000 සිට වර්ග මීටරයකට රුපියල් 15000 දක්වා වෙනස් වේ. | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| ගබඩා ටැංකි | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | ටැංකියේ පරිමාව (ලෝහ) මානයන්ගෙන් මනිනු ලබන අතර පසුව බර මනිනු ලබන්නේ සනත්වයෙනි. කිලෝග්‍රෑම් වල ලෝහ බර මත පදනම්ව සලකා බලන ලද ප්‍රතිඅගය කි.ග්‍රෑ. එකකට රුපියල් 500 සිට රු. 1000 දක්වා වෙනස් වේ | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| නල පද්ධතිය | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | උපකරණවල BOM, නල මාර්ගයේ දිග සහ පයිප්පවල විෂ්කම්භය, විවිධ වැල්ව් සහ ෆ්ලැන්ජ් මේෂ අනුව ධාවන මීටරයකට රුපියල් 5000 සිට ධාවන මීටරයකට රුපියල් 20000 දක්වා නල මාර්ග නැවත ඇගයීම ගණනය කෙරේ. | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| SPBM බෝයාව | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | උපකරණවල BOM, නල මාර්ගයේ දිග සහ විෂ්කම්භය, පාවෙන හෝස් සහ විවිධ කපාට සහ ෆ්ලැන්ජ් සහ සම්බන්ධතා මත පදනම්ව ගණනය කරන ලද SPBM Buoy නැවත තක්සේරුව ධාවන මීටරයකට රු. 3500 සිට ධාවන මීටරයකට රු. 25000 දක්වා වෙනස් වේ. | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| ගැන්ට්‍රි හා පොම්ප | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | අ) ව්‍යුහයේ බර සහ සංඛ්‍යාව මත පදනම්ව Gantries නැවත ඇගයීමට ලක් කෙරේ<br>(ආ) මෝටර් වල තඹ බර සලකා බැලීමෙන් පසු නැවත තක්සේරු කරන ලද පොම්ප සහ පොම්ප වල MS (එනම් කිලෝග්‍රෑමයකට පදනම) කි.ග්‍රෑමයකට රුපියල් 500 සිට 2000 දක්වා වෙනස් වේ. | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| **යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ** | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | අයිතමය අනුව නැවත ඇගයීම සිදු කෙරේ | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |
| විද්‍යුත් | පිරිවැය ප්‍රවේශය | 01.01.2020 | අයිතමය අනුව නැවත ඇගයීම සිදු කෙරේ | ධනාත්මකව සහසම්බන්ධ වේ. | මට්ටම 3 |

2020.01.01 දිනට මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නැවත තක්සේරුකරන ලද වත්කම් වටිනාකම පහත පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | 31.12.2019 දිනට පිරිවැය රු. මි. | 31.12.2019 දිනට සමුච්චිත ක්ෂය රු. මි. | 31.12.2019 දිනට ශුද්ධ ධාරක අගය රු. මි. | වත්කම් පිරිවැයට ගෙන ගතහොත් ක්ෂය වීම රු. මි. | වත්කම් පිරිවැයට ගෙන ගතහොත් ශුද්ධ ධාරක අගය රු. මි. |
|---|---|---|---|---|---|
| **ගොඩනැගිලි** | 316.566 | 123.039 | 193.527 | 12.320 | 181.207 |
| ගබඩා ටැංකි | 3,006.709 | 1,756.138 | 1,250.571 | 104.557 | 1,146.014 |
| නල පද්ධතිය | 865.052 | 846.424 | 18.628 | 0.684 | 17.944 |
| SPBM බෝයාව | 508.359 | 300.206 | 208.153 | 47.833 | 160.320 |
| ගින්ට්‍රි හා පොම්ප | 24.299 | 11.228 | 13.071 | 0.243 | 12.828 |
| **යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ** | 3,376.904 | 2,371.409 | 1,005.495 | 172.311 | 833.184 |
| විද්‍යුත් | 36.430 | 27.681 | 8.749 | 0.211 | 8.538 |

31.12.2020 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපළ, පිරියත හා උපකරණ වල අගය රුපියල් මිලියන 2,526.381 (2019- රුපියල් මිලියන 5,098.894 ) කි.

වසර තුළ සංස්ථාව විසින් රුපියල් මිලියන 2,097.116 (2019-රු. 3,990.952) ලෙස දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගත් අතර ඒ සඳහා රුපියල් මිලියන 805.159 (2019 රුපියල් මිලියන 1,574.592) ගෙවා ඇත.

## දේපළ පිරියත හා උපකරණ - සමූහය

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.මි. | පැවරූ දේපළ රු.මි. | පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ රු. මි. | SPM සංකීර්ණය රු.මි. | මෝටර් වාහන රු.මි. | ගෘ./ සවිකිරීම්, කා.උප සහ වෙනත් වත්කම් රු.මි. | නොනිමි ප්‍රාග්ධන වැඩ රු.මි. | එකතුව රු.මි. |
|---|---|---|---|---|---|---|---|---|
| 8.1. පිරිවැය | | | | | | | | |
| 01/01/2020 දිනට | 22,774.515 | 1.016 | 22,254.449 | 5,231.386 | 3,197.557 | 11,421.603 | 3,534.873 | 68,415.399 |
| එකතු කිරීම් | 157.172 | - | 219.404 | 283.949 | 18.500 | 135.223 | 2,340.712 | 3,154.960 |
| මාරු කිරීම් | (52.229) | - | 22.893 | - | 25.217 | 4.119 | - | - |
| නැවත තක්සේරුකරණය | 341.661 | - | 17,030.882 | 303.133 | - | 0.230 | - | 17,675.906 |
| ඉවත් කිරීම් | (0.751) | - | (42.679) | - | - | (1.552) | - | (44.982) |
| **31/12/2020 දිනට** | **23,220.368** | **1.016** | **39,484.949** | **5,818.468** | **3,241.274** | **11,559.622** | **5,875.585** | **89,201.284** |
| 8.2 ක්ෂය | | | | | | | | |
| 01/01/2020 දිනට | 1,715.040 | 0.397 | 11,745.837 | 3,847.600 | 2,389.206 | 6,266.148 | - | 25,964.228 |
| වර්ෂය සඳහා අය කිරීම | 192.100 | - | 2,742.510 | 302.320 | 271.047 | 187.143 | - | 3,695.120 |
| මාරු කිරීම් | (34.945) | - | 5.609 | - | 25.217 | 4.119 | - | - |
| ඉවත් කිරීම | (0.366) | - | (42.679) | - | - | (1.504) | - | (44.549) |
| 31/12/2020 දිනට | 1,871.829 | 0.397 | 14,451.278 | 4,149.920 | 2,685.470 | 6,455.906 | - | 29,614.799 |
| | | | | | | | | |
| 31.12.2020 දිනට ශු.පො.ව | **21,348.539** | **0.619** | **25,033.671** | **1,668.548** | **555.804** | **5,103.717** | **5,875.585** | **59,586.486** |
| | | | | | | | | |
| 31.12.2019 දිනට | 22,774.515 | 1.016 | 22,254.449 | 5,231.386 | 3,197.557 | 11,421.603 | 3,534.873 | 68,415.399 |
| 31.12.2019 දිනට සමුච්චිත කෂය | 1,715.040 | 0.397 | 11,745.837 | 3,847.600 | 2,389.206 | 6,266.148 | - | 25,964.228 |
| **31.12.2019 දිනට ශු.පො.ව** | **21,059.474** | **0.619** | **10,508.612** | **1,383.785** | **808.351** | **5,155.455** | **3,534.873** | **42,451.172** |

2020.12.31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණවල දළ අගය රුපියල් මිලියන 10,254.024 කි.

වසර තුළ සංස්ථාව විසින් රුපියල් මිලියන 3,154.96 (2019-රු. 4,971.798) ලෙස දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගත් අතර ඒ සඳහා රුපියල් මිලියන 1,863.004 (2019 රුපියල් මිලියන 2,555.438 ) ගෙවා ඇත.

## 8.3 ආයෝජන දේපළ

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2020** රු. මි. | **2019** රු. මි. | **2020** රු. මි. | **2019** රු. මි. |
| පිරිවැය | | | | |
| වසර මුල ශේෂය | 75.118 | 57.891 | 75.118 | 57.891 |
| එකතු කළා : එක් කිරීම් / මාරු කිරීම් | 1.400 | 17.236 | 1.400 | 17.227 |
| වසර අවසානයේ ශේෂය | 76.518 | 75.118 | 76.518 | 75.118 |
| ක්ෂය වීම | | | | |
| වසර මුල ශේෂය | 20.939 | 19.210 | 20.939 | 19.210 |
| එකතු කළා :වසර සඳහා අය කිරීම් | 1.876 | 1.729 | 1.876 | 1.729 |
| වසර අවසානයේ ශේෂය | 22.815 | 20.939 | 22.815 | 20.939 |
| ශුද්ධ පොත් අගය | **53.703** | **54.179** | **53.703** | **54.179** |

ආයෝජන වත්කම් වල කොළඹ තර්ස්ටන් පාරේ දේපළ, මල් පාර දේපළ, සහ කුළියට ලබා දුන් පිරවුම්හල් අයත් වේ.

| විස්තරය | සාධාරණ වටිනාකම රු. මි. |
|---|---|
| අංක.80, මල් පාර, කොළඹ 07 | 40.000 |
| අංක22/1, තර්ස්ටන් පාර, කොළඹ 07 | |
| පිරවුම්හල් | 36.518 |

ආයෝජන දේපළවල සාධාරණ වටිනාකම් පදනම් වී ඇත්තේ සංස්ථාව හා සම්බන්ධ නොවන ස්වාධීන තක්සේරුකරුවන් වන තක්සේරු දෙපාර්මේන්තුව විසින් 2012 සහ 2016 වර්ෂවල සිදු කරන ලද තක්සේරු කිරීම් මතය.

## 8.4 අස්පෘශ්‍ය වත්කම්

| | සමූහය | | | |
|---|---|---|---|---|
| | **ERP පද්ධතිය** රු. මි. | **SAP බලපත්‍රය** රු. මි. | **ස්වයංක්‍රීය පද්ධතිය** රු. මි. | **එකතුව** රු. මි. |
| පිරිවැය/ධාරක අගය | | | | |
| වසර ආරම්භයේ ශේෂය | 542.039 | 9.380 | 37.794 | 589.212 |
| එක් කිරීම්/මාරු කිරීම | | - | - | - |
| වසර අවසානයේ ශේෂය | **542.039** | **9.380** | **37.794** | **589.212** |
| ක්‍රමක්ෂය කිරීම | | | | |
| වසර ආරම්භයේදී ශේෂය | 440.605 | 9.380 | 37.794 | 487.779 |
| වසරේ අය කිරීම | 25.908 | - | | 25.908 |
| වසර අවසානයේ ශේෂය | 466.514 | 9.380 | 37.794 | 513.687 |
| ධාරක අගය | | | | |
| 31.12.2020 දිනට | **75.525** | **-** | **-** | **75.525** |
| 31.12.2019 දිනට | **101.433** | **-** | **-** | **101.433** |

### 8.5 ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීයකරණය කිරීම

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි නව ගුවන්යානා ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය සහ පවතින ඉන්ධන හයිඩ්‍රජන් පද්ධතිය සංවර්ධනය කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන හයිඩ්‍රජන් පද්ධතිය ස්ථාපනය කිරීමේ ඉදිකිරීම් කටයුතු දෙදහස් දහ අට ජනවාරි මාසයේ ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය බාහිරින් ලබාගත් ණය පහසුකම් දෙකෙන් (මහජන බැංකුවෙන් ලබාගත් වාණිජ ණයෙන් 15% ක් සහ කොන්ත්‍රාත්කරු විසින් ස්වයං මූල්‍ය පදනම මත ඉතිරි 85%) මූල්‍ය පහසුකම් සපයයි.

2020 වසර සඳහා ප්‍රාග්ධනීකරණය කරණ ලද ණය ගැනීමේ පිරිවැය ප්‍රමාණය රුපියල් මිලියන 208.042 කි. (2019 - රුපියල් මිලියන 152.558 කි) ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කිරීමේ නීර්ණය සඳහා වන අනුපාතය 4.62% විය.

### 8.6 බදු වත්කම්

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, නගර සභා යනාදී රජයේ ආයතනවලින් ඉඩම් ලබාගෙන දැනට අදාළ පාර්ශව සමඟ ඇති සාකච්ඡා අනුව බදු කුලී ගෙවනු ලැබේ. කල්බදු විධිවිධාන සඳහා විධිමත් කොන්ත්‍රාත්තුවට එළැඹීමට අදාළ පාර්ශව සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. 2020 වසර සඳහා බදු කුලිය රු. මිලියන 24.16 කි. (2019 - රු. මිලියන 43.12) සහ හිඟ කුලිය වර්ෂය තුළරු. මිලියන 80.88 කි.

## 9. පරිපාලිත සමාගම් වල ආයෝජන

| | සංස්ථාව | | | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | 2020 හිමිකාරත්වය % | 2019 හිමිකාරත්වය % | 2020 රු. මි. | 2019 රු. මි. | 2020 රු. මි. | 2019 රු. මි. |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 66.67% | 66.67% | 5,000.000 | 5,000.000 | - | - |
| | | | **5,000.000** | **5,000.000** | **-** | **-** |

### 9.1. අනුබද්ධ සමාගමේ සාරාංශගත මූල්‍ය තොරතුරු

| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 2020 රු. මි. | 2019 රු. මි. |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 17,754.705 | 17,756.356 |
| ජංගම වත්කම් | 15,781.264 | 14,448.998 |
| මුළු වත්කම් | **33,535.969** | **32,205.354** |
| ස්කන්ධය හා සංචිත | 27,923.531 | 26,208.810 |
| ජංගම නොවන වගකීම් | 3,612.193 | 3,792.013 |
| ජංගම වගකීම් | 2,000.245 | 2,204.531 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | **33,535.969** | **32,205.354** |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** | **2020 රු. මි.** | **2019 රු. මි.** |
| ආදායම | 13,567.876 | 15,339.876 |
| වියදම් | (12,097.029) | (13,587.398) |
| වෙනත් ආදායම් | 882.601 | 1,175.379 |
| බදු පෙර ලාභය | 2,353.448 | 2,927.856 |
| ආදායම් බදු වියදම | (208.808) | (1,162.529) |
| වසර සඳහා ලාභය | 2,144.640 | 1,765.327 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (114.752) | (97.778) |
| මුළු විස්තීර්ණ ආදායම | 2,029.888 | 1,667.549 |
| පාලනයකල නොහැකි පාර්ශවයට ගෙවන ලද ලාභාංශ | 120.000 | 75.000 |

# 10. ජංගම නොවන මූල්‍ය වත්කම්

| | සටහන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| ලැයිස්තුගත ස්කන්ධය ආයෝජන | 10.1 | 12.500 | 12.500 | 12.500 | 12.500 |
| ලැයිස්තුගත නොකල ස්කන්ධය ආයෝජනය | 10.2 | 0.540 | 0.540 | 0.540 | 0.540 |
| ස්කන්ධය නොවන ආයෝජන | 10.3 | 226.942 | 320.181 | 226.942 | 320.181 |
| | | **239.981** | **333.221** | **239.981** | **333.221** |

## 10.1. ලැයිස්ගත ස්කන්ධ ආයෝජන

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| ලංකා සිමෙන්ති සමාගම | | | | |
| සාමාන්‍ය කොටස් සඳහා රු. 10/ බැගින් 5,000,000 ගෙවන ලදි | 12.500 | 12.500 | 12.500 | 12.500 |
| සාධාරණ අගය ස්කන්ධය වෙත මාරු කිරීම | - | | - | - |
| | **12.500** | **12.500** | **12.500** | **12.500** |

## 10.2. ලැයිස්ගත නොවු ස්කන්ධ ආයෝජන

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| එක්සත් ප්‍රවෘත්ති පත්‍ර ලංකා සමාගම | | | | |
| රු. 10/ බැගින් වු සාමාන්‍ය කොටස් 61,206 | 0.539 | 0.539 | 0.539 | 0.539 |
| ලංකා ලේලන්ඩ් සමාගම | | | | |
| රු.10/ බැගින් වු සාමාන්‍ය කොටස් 100 | 0.001 | 0.001 | 0.001 | 0.001 |
| ජාත්‍යන්තර සමුපකාර ඛනිජ තෙල් සංගමය | | | | |
| සම්පූර්ණයෙන්ම ගෙවු ඇඩො 100/ කොටස් 5499 | | | | |
| ඇ.එ.ජනපදයේ පිහිටුවන ලද | 5.086 | 5.086 | 5.086 | 5.086 |
| අඩුකලා  අපහායන සඳහා ප්‍රතිපාදන | (5.086) | (5.086) | (5.086) | (5.086) |
| | **0.540** | **0.540** | **0.540** | **0.540** |

විස්තීරණ ආදායම් මත මුල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත නොවු ආයෝජන පිරිවැය මත ඉදිරියට ගෙන යන ලදි.

වාර්තා කරන දිනයේදී ණය අවදානමට උපරිම නිරාවරණය වීම ඇති කොටස් /සුරැකුම්පත් OCI හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කර අගයයි වාර්තා කරයි.

ජාත්‍යන්තර සමුපකාර ඛණිජ තෙල් සංගමයට හානි ප්‍රතිපාදන සලසාඇති අතර එයට හැර සියලු කොටස් ආයෝජන හානිකරනය වී නොමැත.

## 10.3.ස්කන්ධ නොවන ආයෝජන

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| භාණ්ඩාගාර බැඳුම්කර අයෝජනය | 226.942 | 320.181 | 226.942 | 320.181 |
| | **226.942** | **320.181** | **226.942** | **320.181** |

## 11. වෙළඳ සහ අනෙකුත් ලැබීම්

| | සංස්ථාව | | | |
|---|---|---|---|---|
| | 2020 | | 2019 | |
| | ජංගම රු. මි. | ජංගම නොවන රු. මි. | ජංගම රු. මි. | ජංගම නොවන රු. මි. |
| වෙළඳ ලැබීම් | 140,767.094 | 287.599 | 152,890.749 | 281.790 |
| ලැබීම් - දේශීය ආදායම් සහ රේගු දෙපාර්තමේන්තුව | 1,756.156 | - | 1,949.609 | - |
| වෙනත් ලැබීම් | 6,509.924 | 3,250.607 | 6,091.252 | 4,250.607 |
| නැත්පතු සහ පූර්ව ගෙවීම් | 367.422 | 51.534 | 335.879 | 442.664 |
| අත්තිකාරම් | 1,602.923 | - | 2,842.316 | - |
| සේවකයින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම | 50.086 | 3,929.777 | 42.740 | 3,920.303 |
| එකතුව | **151,053.605** | **7,519.518** | **164,152.545** | **8,895.364** |

දෙසැම්බර් 31 වන විට, ලැබිය යුතු වෙළඳ හා වෙනත් දෑ පිළිබඳ වයස් විශ්ලේෂණය පහත දක්වා ඇත.

| | සංස්ථාව | |
|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. |
| දින 30 ට අඩු | 15,267.481 | 14,650.479 |
| දින 30 – 90 | 8,262.726 | 13,733.710 |
| දින 91 – 180 | 11,543.035 | 29,396.827 |
| දින 181 – 365 | 26,401.446 | 54,438.542 |
| දින 365 ට වැඩි | 79,629.784 | 41,002.387 |
| එකතුව | **141,104.471** | **153,221.945** |
| හානිය සඳහා ප්‍රතිපාදන | (49.778) | (49.405) |
| | **141,054.693** | **153,172.539** |

වෙළඳ ලැබිය යුතු දේ හානිය සඳහා ප්‍රතිපාදනවල චලනය පහත පරිදි වේ.

| | සංස්ථාව | |
|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. |
| ජනවාරි 1 වන විට ශේෂය | 49.405 | 475.476 |
| අඩු : අයකර ගත් මුදල | (0.998) | (0.648) |
| අඩු: මුදල කපා හැරීම | (9.123) | (425.424) |
| එකතු කළා: වසර සඳහා වෙන්කිරීම | 10.494 | - |
| 31 වන දිනට ශේෂය | **49.778** | **49.405** |

| | සමූහය | | | |
|---|---|---|---|---|
| | 2020 | | 2019 යලි ප්‍රකාශිත* | |
| | ජංගම රු. මි. | ජංගම නොවන රු. මි. | ජංගම රු. මි. | ජංගම නොවන රු. මි. |
| වෙළඳ ලැබීම් | 143,519.127 | 287.599 | 155,739.044 | 281.790 |
| ලැබීම් - දේශීය ආදායම් සහ රේගු දෙපාර්තමේන්තුව | 1,756.156 | - | 2,017.958 | - |
| වෙනත් ලැබීම් | 6,849.372 | 3,250.607 | 6,351.541 | 4,250.607 |
| නැත්පතු සහ පූර්ව ගෙවීම් | 1,445.086 | 51.534 | 1,561.027 | 442.664 |
| අත්තිකාරම් | 1,602.923 | - | 2,842.316 | - |
| සේවකයින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම | 1,549.324 | 5,564.010 | 1,568.541 | 5,560.467 |
| එකතුව | **156,721.988** | **9,153.748** | **170,080.427** | **10,535.528** |

වෙළඳ ලැබිය යුතු දේ පහත සඳහන් මුදල් වලින් දැක්වේ.

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. |
| ශ්‍රී ලංකා රුපියල් | 87,959.967 | 104,772.259 | 90,712.000 | 107,620.554 |
| ඇමරිකානු ඩොලර් | 53,094.726 | 48,400.280 | 53,094.726 | 48,400.280 |
| | **141,054.693** | **153,172.539** | **143,806.726** | **156,020.834** |

## 12 මූල්‍ය උපකරණ

| වර්ගය අනුව මූල්‍ය වත්කම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 156,816.966 | 171,098.301 | 163,041.917 | 178,597.997 |
| භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ආයෝජනය කිරීම | 314.532 | 25,408.904 | 314.532 | 25,408.904 |
| බැංකු තැන්පත් කිරීම් | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 64,563.572 | 32,559.409 | 68,005.593 | 36,559.120 |
| OCI හරහා සාධාරණ වත්කම් සහිත මූල්‍ය වත්කම් | | | | |
| කොටස් නොවන ආයෝජනය | 0.540 | 0.540 | 0.540 | 0.540 |
| කොටස් ආයෝජනය | 12.500 | 12.500 | 12.500 | 12.500 |
| එකතුව | **221,713.109** | **229,084.653** | **231,380.081** | **240,584.061** |

| වර්ගය අනුව මූල්‍ය වගකීම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වගකීම් | | | | |
| ණය ගැනීම් | 395,816.472 | 313,939.437 | 395,816.472 | 313,939.437 |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් | 185,358.742 | 286,117.829 | 181,393.949 | 283,358.424 |
| එකතුව | **581,175.214** | **600,057.266** | **577,210.422** | **597,297.861** |

## 12.1. මුල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය

පහතින් දැක්වෙන්නේ මුල්‍ය ප්‍රකාශනවල මුල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙන සමූහයේ මුල්‍ය උපකරණවල ධාරණීය වටිනාකම් සහ සාධාරණ අගය පිළිබඳ වර්ග අනුව සිදු කරන ලද සැසඳුමකි.

| දෙසැම්බර් 31 දිනට | සටහන | ධාරණීය වටිනාකම් 2020 රු. මි. | ධාරණීය වටිනාකම් 2019 රු. මි. | සාදාරණ අගය 2020 රු. මි. | සාදාරණ අගය 2019 රු. මි. |
|---|---|---|---|---|---|
| මූල්‍ය වත්කම් | | | | | |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | | | | | |
| ලැයිස්ගත ස්කන්ධ ආයෝජන | 12.1.1 | 12.500 | 12.500 | 12.500 | 12.500 |
| ලැයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන | 12.1.2 | 0.540 | 0.540 | 0.540 | 0.540 |
| භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ආයෝජන | 12.1.1 | 226.942 | 320.181 | 226.942 | 320.181 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 12.1.4 | 156,866.918 | 171,148.079 | 156,816.966 | 171,098.301 |
| කෙටි කාලීන ආයෝජන | | | | | |
| බැංකු තැන්පතු | 12.1.3 | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| රජයේ බැඳුම්කර | 12.1.1 | 87.590 | 25,088.723 | 87.590 | 25,088.723 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12.1.4 | 64,563.572 | 32,559.409 | 64,563.572 | 32,559.409 |
| **එකතුව** | | **221,763.062** | **229,134.432** | **221,713.110** | **229,084.653** |
| | | | | | |
| මූල්‍ය වගකීම් | | | | | |
| ණය සහ ණය ගැනුම් | 12.1.3 | 5,066.324 | 3,928.702 | 5,066.324 | 3,928.702 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 12.1.4 | 185,358.742 | 286,117.829 | 185,358.742 | 286,117.829 |
| කෙටි කාලීන ණය ගැනුම් | 12.1.4 | 390,750.148 | 310,010.734 | 390,750.148 | 310,010.734 |
| **එකතුව** | | **581,175.214** | **600,057.266** | **581,175.214** | **600,057.266** |

## 12.2. සාධාරණ වටිනාකම නිර්ණය කිරීම

තක්සේරු ආකෘතිය

බාහිරව ප්‍රකාශිත මිල ගණන් හෝ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් සිට ආකෘති වලට අදාළව සාධාරණ මිළ නිර්ණය කරන්නාවූ සියලුම මුල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිලක් නිර්ණය කිරීම හෝ තක්සේරුකරණය සිදු කරනු ලබයි. ක්‍රියාකාරී වෙළඳපලක මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වය යටතේ, සමූහය විසින් මුල්‍ය උපකරණයේ සාධාරණ වටිනාකම වලංගු කිරීම සඳහා විකල්ප වෙළඳපල තොරතුරු සහ වට්ටම් මුදල් ප්‍රවාහයන් භාවිතා කරන අතර වඩාත් අදාළ සහ විශ්වාසදායක යැයි සැලකෙන තෙරතුරු සඳහා වැඩි බරක් ලබා දේ.

12.2.1 ප්‍රකාශිත කොටස් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන වල සාධාරණ වටිනාකම පදනම් වන්නේ වාර්තා කරන දිනයේදී වෙළඳපලේ සඳහන් මිල මතය.

12.2.2 පිරිවැය සටතේ සිදු කරනු ලබන ලැයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන වල වටිනාකම ආයෝජනයේ ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගනිමින් එහි සාධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ.

12.2.3 පොළී අනුපාතය, බැංකුවක ණය ගෙවීමේ හැකියාව, උපකරණයේ අවදානම් ලක්ෂණ යන ප්‍රමිතීන්ට අනුකූලව තැන්පතු වල ආයෝජන සහ ණය සහ ණය ගැනුම් මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරනු ලබයි. 2020.12.31 වන විට තැන්පතු ණය සහ ණය ගැනීම් වල ඉදිරියට ගෙන යන අගය ප්‍රමාණවත්ව ලෙස ඒවායේ සාධාරණ මිලෙහි වෙනස් නොවේ.

12.2.4 මුදල් සහ මුදල් සමානකම්, වෙළඳ සහ වෙනත් ලැබීම්, වෙළඳ සහ වෙනත් ගෙවීම් සහ කෙටි කාලීන ණය ගැනුම් ප්‍රධාන ලෙස මෙම උපකරණ වල කෙටි කාලීන කල් පිරිම හේතුවෙන් ඒවායේ ඉදිරියට ගෙන යන අගය හා සමාන වේ.

## 12.3 සාධාරණ මිල ක්‍රමවේදය

තක්සේරුකරණ ක්‍රමවේදයන් මඟින් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම තීරණය කිරීම සහ අනාවරණය කිරීම සඳහා සමූහය පහත දැක්වෙන ධූරාවලිය භාවිතා කරයි.

| | |
|---|---|
| මට්ටම 1 | සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොලවල මිළ ගණන් (සකස් නොකළ) මිළ ගණන් |
| මට්ටම 2 | වාර්තාගත සාධාරණ වටිනාකමට සැලකිය යුතු බලපෑමක් ඇති කරන සියලු යෙදවුම් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි වෙනත් ශිල්පීය ක්‍රම |
| මට්ටම 3 | නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවන වාර්තාගත සාධාරණ වටිනාකමට සැලකිය යුතු බලපෑමක් ඇති යෙදවුම් භාවිතා කරන තාක්ෂණික ක්‍රම. |

තක්සේරු කරන ක්‍රමවේදයක් මඟින් මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම තීරණය කිරීම පහත පරිදි වේ:

| දෙසැම්බර් 31 දිනට | සංස්ථාව—2020 | | | |
|---|---|---|---|---|
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| | මට්ටම 1 | මට්ටම 2 | මට්ටම 3 | එකතුව |
| OIC හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් | | | | |
| ලැයිස්ගත කොටස් ආයෝජන | 12.500 | - | - | 12.500 |
| ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන | - | - | 0.540 | 0.540 |
| | 12.500 | - | 0.540 | 13.040 |

# 13. තොගය

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| බොරතෙල් | 11,346.036 | 18,033.942 | 11,346.036 | 18,033.942 |
| වෙනත් අමු ද්‍රව්‍ය | 580.440 | 815.066 | 580.440 | 815.066 |
| නිමි නිෂ්පාදන | 37,374.897 | 43,684.312 | 37,405.335 | 43,692.014 |
| අන්තර් මධ්‍ය නිෂ්පාදන | 436.767 | 746.347 | 436.767 | 746.347 |
| වෙනත් ද්‍රව්‍ය සහ සැපයුම් | 3,130.932 | 2,838.782 | 3,815.683 | 3,523.111 |
| අඩුකලා මන්දගාමී ලෙස චලන අයිතම සඳහා ප්‍රතිපාදන | (361.232) | (361.232) | (377.352) | (377.653) |
| | **52,507.840** | **65,757.216** | **53,206.909** | **66,432.827** |

# 14. කෙටි කාලීන ආයෝජන

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| බැංකු තැන්පතු | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 87.590 | 25,088.723 | 87.590 | 25,088.723 |
| | **92.590** | **25,093.723** | **92.590** | **25,093.723** |

## 15. මුදල් හා මුදල් සමාන දෑ

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>යලි ප්‍රකාශිත<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>යලි ප්‍රකාශිත<br>රු. මි. |
| මුදල් හා මුදල් සමාන දෑ සඳහා අදාළ අයිතම | | | | |
| බැංකුවේ සහ අතැති මුදල් | **64,563.572** | **32,559.409** | **68,005.593** | **36,559.120** |

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට පහත දේ අයත් වේ.

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>යලි ප්‍රකාශිත<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>යලි ප්‍රකාශිත<br>රු. මි. |
| මුදල් සහ මුදල් සමාන දෑ | 64,563.572 | 32,559.409 | 68,005.593 | 36,559.120 |
| බැංකු අයිරා (සටහන 22) | (787.658) | (1,941.762) | (787.658) | (1,941.762) |
| | **63,775.914** | **30,617.646** | **67,217.935** | **34,617.358** |
| එකතු කළා/ අඩු කළා විදේශ මුදල් පරිවර්තනය සඳහා ගැලපුම් | (4,683.729) | (3,116.380) | (4,683.729) | (3,116.380) |
| | **59,092.185** | **27,501.266** | **62,534.206** | **31,500.978** |

## 16. දායක ප්‍රාග්ධනය

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | **28,487.125** | **28,487.125** | **28,487.125** | **28,487.125** |

බලයලත් ප්‍රාග්ධනයක් පාර්ලිමේන්තුව විසින් නියම කර නොමැත

## 17. සංචිත

### 17.1. ප්‍රාග්ධන සංචිත

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| දෙසැම්බර් 31 දිනට වන ශේෂය | **4,992.686** | **4,992.686** | **4,992.686** | **4,992.686** |

2003 දී සිපිඑස්ටිඑල් වෙත වත්කම් පැවරීම පොත් වටිනාකම් අනුව සිදු කර ඇත. පසුව පුද්ගලීකරණ ක්‍රියාවලියේදී එකඟ වූ අගයන් මත පදනම්ව ඉහත ගනුදෙනුව සටහන් කිරීමට තීරණය විය. ප්‍රාග්ධන සංචිත යටතේ මෙහි බලපෑම සකස් කර ඇත.

## 17.2. නැවත තක්සේරු කරන සංචිත

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| ජනවාරි 1 වන දින විට ශේෂය | 10,392.218 | 10,370.748 | 10,392.218 | 10,370.748 |
| නැවත ඇගයීමෙන් අතිරික්තය (සටහන 8) | 17,675.906 | 21.470 | 17,675.906 | 21.470 |
| 31 වන දිනට ශේෂය | 28,068.124 | 10,392.218 | 28,068.124 | 10,392.218 |

නැවත ඇගයීමේ සංචිතය යනු ඉඩම්වල සාධාරණ වටිනාකමෙහි වැඩිවීමක් වාර්තා කිරීම සඳහා වන අතර, එම අඩුවීම කොටස්වල කලින් හඳුනාගෙන ඇති එම වත්කමෙහි වැඩිවීමකට සම්බන්ධ වන තරමට අඩු වේ.

## 18. විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| ජනවාරි 01 වන දිනට ශේෂය | 1,676.122 | 1,670.933 | 3,382.221 | 3,122.904 |
| අඩු කළා : වර්ෂය තුළ ඉවත් වූ අයට ගෙවිය යුතු අගය | (6.615) | (5.102) | (6.615) | (5.102) |
| වර්ෂය තුළ ගෙවීම් | (137.855) | (170.527) | (269.182) | (317.349) |
| | 1,531.653 | 1,495.304 | 3,106.423 | 2,800.453 |
| එකතු කළා : වර්තමාන සේවා පිරිවැය | 93.558 | 94.214 | 272.187 | 266.418 |
| පොළී පිරිවැය | 166.772 | 170.643 | 278.028 | 263.585 |
| ආයුගණක (ලාභ) /අලාභය | (99.573) | (84.038) | 51.416 | 51.765 |
| | 1,692.410 | 1,676.122 | 3,708.054 | 3,382.221 |
| එකතු කළා : වීන වරාය එල් එල් එල්/ නයිලෝන්/සීපීඑස්ටීඑල් සේවක ප්‍රතිලාභ | 10.025 | 10.025 | 10.025 | 10.025 |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **1,702.435** | **1,686.148** | **3,718.078** | **3,392.246** |
| | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වියදම | | | | |
| ආදායම් ප්‍රකාශය | | | | |
| වර්තමාන සේවා පිරිවැය | 93.558 | 94.214 | 272.187 | 266.418 |
| පොළී වියදම | 166.772 | 170.643 | 278.028 | 263.585 |
| | **260.331** | **264.857** | **550.214** | **530.003** |
| | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | |
| ආයුගණන (ලාභ) / අලාභය | (99.573) | (84.038) | 51.416 | 51.764 |
| | **(99.573)** | **(84.038)** | **51.416** | **51.764** |

LKAS 19 - සේවක ප්‍රතිලාභ විසින් නැවත නිර්දේශ කරන ලද පරිදි ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වෘත්තීය ක්‍රියාකාරී ආයතනයක් වන දයානන්ද සමරවික්‍රම වරලත් ගණකාධිකාරීවරු විසින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් තක්සේරු කිරීම 2020 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලදි.

පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරී උපකල්පන භාවිතා කරන ලදි.

| | 2020 | 2019 |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වැඩිවීම | වසර 3 කට වරක් 30% | වසර 3 කට වරක් 30% |
| අපේක්ෂිත කාර්ය මණ්ඩල පිරිවැටුම | 3.90% | 4.69% |
| පොළී/ වට්ටම් අනුපාතය | 9.90% | 10.2% |
| විශ්‍රාම යන වයස | අවුරුදු 60 | අවුරුදු 60 |
| සේවකයින් ගණන | 2,334 | 2,366 |
| මරණ අනුපාතය | A 67/70 Mortality වගුව | A 67/70 Mortality වගුව |

**18.1** භාවිතා කරන ක්‍රියාකාරී උපකල්පන වල සංවේදීතාව

පහත දැක්වෙන වගුව මඟින් 2020 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මිනුම්වල නියතව පවත්වාගෙන යන අනෙකුත් සියළු විචල්‍යයන් සමඟ භාවිතා කළ හැකි ප්‍රධාන උපකල්පනයන්හි ඇති විය හැකි වෙනස පිළිබඳ සංවේදීතාවය පෙන්නුම් කරයි. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සංවේදීතාව හා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බලපෑම් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත වට්ටම් අනුපාතය සහ වැටුප් වැඩිවීම් උපකල්පනය කර ඇත.

| උපකල්පනය | සංස්ථාව | | |
|---|---|---|---|
| | උපකල්පනයේ වෙනස | ආදායම් ප්‍රකාශය මත සංවේදීතා | විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත සංවේදී බලපෑම |
| | | 2020<br>රු. මි. | 2020<br>රු. මි. |
| වට්ටම් අනුපාතය @9.9% | 1% කින් වැඩිවීම | 121.483 | (121.483) |
| | 1% කින් අඩුවීම | (111.405) | 111.405 |
| | | | |
| වැටුප් වර්ධකය | 1% කින් වැඩිවීම | (109.621) | 109.621 |
| | 1% කින් අඩුවීම | 121.654 | (121.654) |

# 19. විලම්භිත බදු - සංස්ථාව

සංස්ථාව විසින් රුපියල් මිලියන 255,193 (2019 රු. මිලියන 286,537) ක බදු අලාභයක් ඉදිරියට ගෙන ගොස් ඇති අතර ඒවා අනාගත බදු ලාභයට එරෙහිව කපා හැරිය හැකිය. මෙම බදු අලාභයක් මත ගණන් නොගත් කල් විලම්භිත බදු වත්කම් රු. මිලියන 61,246 (2019 රු. මිලියන 80,230) කි.

ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම බද්දට යටත් වන බැවින්, ඉඩම් විකිණීමෙන් ලැබෙන ප්‍රතිලාභ සඳහා විලම්භිත බදු වගකීම් පහත සඳහන් වේ.

**19.1.** විලම්භිත බදු - සංස්ථාව

| | 2020<br>රු. මි. | 2019<br>යලි ප්‍රකාශිත<br>රු. මි. |
|---|---|---|
| කාලපරිච්ඡේදයේ ආරම්භයේ දී ශේෂය | 2,909.821 | 2,903.810 |
| තාවකාලික වෙනස ආරම්භය සහ ආපසු ගැලපීම - ආදායම් ප්‍රකාශය | - | - |
| - වෙනත් විස්තීර්ණ ආදායම් | (415.689) | 6.011 |
| කාලය අවසානයේ ශේෂය | **2,494.132** | **2,909.821** |
| විලම්භිත බදු වත්කම් | - | - |
| විලම්භිත බදු වගකීම් | 2,494.132 | 2,909.821 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම් | **2,494.132** | **2,909.821** |

### 19.2 හඳුනාගත් විලම්භිත බදු වත්කම් සහ වගකීම්

| | 2020 රු. මි. | | 2019 රු. මි. | |
|---|---|---|---|---|
| | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) |
| විලම්භිත බදු වගකීම් | | | | |
| ඉඩම් | (415.689) | 2,494.132 | 6.011 | 2,909.821 |
| | **(415.689)** | **2,494.132** | **6.011** | **2,909.821** |

24% ක එලදායි බදු අනුපාතයක් භාවිතා කරමින් විලම්භිත බදු ගණනය කර ඇත. විවිධ මට්ටම්වල බදු අය කළ හැකි ආදායම් තනි බදු අනුපාත හේතුවෙන් අනුපාතය 28% සිට 24% දක්වා අඩු වී ඇති අතර, එහි ප්‍රතිඵලය ලෙස රු. 2020 දෙසැම්බර් 31 දිනට විලම්බිත බදු වගකීම් රු. මිලියන 415.689 කින් අඩුවී ඇත.

### 19.1. විලම්භිත බදු සමූහය

| | 2020 රු. මි. | 2019 යලි ප්‍රකාශිත රු. මි. |
|---|---|---|
| කාලපරිච්ඡේදයේ ආරම්භයේ දී ශේෂය | 4,995.736 | 4,901.436 |
| තාවකාලික වෙනස ආරම්භය සහ ආපසු ගැලපීම - ආදායම් ප්‍රකාශය | (453.128) | 126.313 |
| - වෙනත් විස්තීර්ණ ආදායම් | (451.927) | (32.013) |
| කාලය අවසානයේ ශේෂය | **4,090.682** | **4,995.736** |
| විලම්භිත බදු වත්කම් | (489.494) | (484.428) |
| විලම්භිත බදු වගකීම් | 4,580.175 | 5,480.164 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම් | **4,090.682** | **4,995.736** |

### 19.2 හඳුනාගත් විලම්භිත බදු වත්කම් සහ වගකීම්

| | 2020 රු. මි. | | 2019 රු. මි. | |
|---|---|---|---|---|
| | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) |
| විලම්භිත බදු වගකීම් | | | | |
| දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් | (484.298) | 2,086.043 | 212.463 | 2,570.343 |
| ඉඩම් | (415.689) | 2,494.132 | 6.011 | 2,909.821 |
| විලම්භිත බදු වත්කම් | | | | |
| තොගය | 0.729 | (3.869) | (0.768) | (4.598) |
| ප්‍රතිපාදන | 0.251 | (1.871) | (0.271) | (2.123) |
| සේවක ප්‍රතිලාභ සැලසුම් | 30.190 | (483.755) | (85.111) | (477.708) |
| බදු අලාභය | - | - | - | - |
| | **(868.817)** | **4,090.682** | **132.324** | **4,995.736** |

24% ක එලදායි බදු අනුපාතයක් භාවිතා කරමින් විලම්භිත බදු ගණනය කර ඇත. විවිධ මට්ටම්වල බදු අය කළ හැකි ආදායම් තනි බදු අනුපාත හේතුවෙන් අනුපාතය 28% සිට 24% දක්වා අඩු වී ඇති අතර, එහි ප්‍රතිඵලය ලෙස රු. 2020 දෙසැම්බර් 31 දිනට කල් දැමූ බදු වගකීම් මිලියන 905.073 කින් අඩුවී ඇත.

## 20. ණය සහ ණය ගැනීම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| භාණ්ඩාගාර (A.D.B) ණය | - | 37.980 | - | 37.980 |
| මහජන බැංකුව - BIA ව්‍යාපෘතිය | 1,402.518 | 1,410.994 | 1,402.518 | 1,410.994 |
| ස්වයං මූල්‍ය පහසුකම් (CNCEC - 14) - BIA ව්‍යාපෘතිය | 3,374.409 | 2,479.728 | 3,374.409 | 2,479.728 |
| | **4,776.927** | **3,928.702** | **4,776.927** | **3,928.702** |
| **20.1** ණය සහ වාරිකයන්ගේ වර්තමාන කොටස | | | | |
| භාණ්ඩාගාර (A.D.B) ණය | 37.980 | 75.959 | 37.980 | 75.959 |
| මහජන බැංකුව - BIA ව්‍යාපෘතිය | 73.817 | 0.000 | 73.817 | 0.000 |
| ස්වයං මූල්‍ය පහසුකම් (CNCEC - 14) - BIA ව්‍යාපෘතිය | 177.600 | 0.000 | 177.600 | 0.000 |
| | **289.397** | **75.959** | **289.397** | **75.959** |

1.ඛනිජ තෙල් නීතිගත සංසථාව වෙනුවෙන් මහජන බැංකුවට නිකුත් කරන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 7.725ක භාණ්ඩාගාර ඇපකරයක් මඟින් මහජන බැංකු ණය සහතික කෙරේ.

2.ව්‍යාපෘති ඉදිකිරීම් හවුල් ව්‍යාපාරයෙන් හවුල්කරු චයිනා ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගමෙන් ලබා ගත් ස්වයං මූල්‍ය ණය පහසුකම සහ ණය මුදල සහතික කරනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 43.775ක භාණඩාගාර ඇපකරයක් මගිනි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙම ණය මුදල හරහා මුදල් ප්‍රවාහයක් නොමැති අතර ණය පහසුකම් ගිවිසුමට අනුව වැඩ කරන ප්‍රගතිය මත පදනම්ව ව්‍යාපෘති ණය මුදල මූල්‍ය ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

### 20.2.දෙසැම්බර් 31 වනදා සිට වසර පහකින් ගෙවිය හැකි ණය පහත පරිදිය.

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. මි. | 2019<br>රු. මි. | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
| වසර 2 ක් තුළ ගෙවිය යුතු මුදල | 792.231 | 75.959 | 792.231 | 75.959 |
| වසර 3-5 ක් තුළ ගෙවිය යුතු මුදල | 1,508.503 | 995.203 | 1,508.503 | 995.204 |
| වසර 5 කින් පසුව ගෙවිය යුතු මුදල | 2,765.590 | 2,933.499 | 2,765.590 | 2,933.499 |
| | **5,066.324** | **4,004.662** | **5,066.324** | **4,004.662** |

ණය ගැනීම්වල වටිනාකම් සාධාරණ වටිනාකම ලෙස සැලකේ.

(a). භාණ්ඩාගාරය (A, D, B) ණය - (පොළිය 14.0% p.a.) ද්විවාර්ෂික වාරික හතළිහකින් ආපසු ගෙවිය යුතු වාරික මුදල රු.37.977කි.

(b). මහජන බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 7,725කි. ණය - (පොළිය මාස 06 LIBOR + 5% p. a.) 2022 දෙසැ 30 සිට ඇරඹෙන ද්විවාර්ෂික වාරික වලින් ආපසු ගෙවිය යුතුය.

(c). ස්වයං මූල්‍ය පහසුකම ඇමෙරිකානු ඩොලර් මිලියන 43.775 කි. ණය - (පොළිය මාස 06 LIBOR + 3.55% p. a.) 2021 ජූලි 19 සිට ඇරඹෙන ද්විවාර්ෂික වාරික වලින් ආපසු ගෙවිය යුතුය.

## 21. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 රු. මි. | 2020 රු. මි. | 2019 යලි ප්‍රකිශිත රු. මි. |
| | | | | |
| ගෙවිය යුතු විදේශ බිල්පත් | 175,564.683 | 278,740.318 | 175,564.683 | 278,740.318 |
| අනෙකුත් ණය හිමියන් | | | - | - |
| - දේශීය ආදායම් හා රේගු දෙපාර්මේන්තුව | 14,761.711 | 19,752.104 | 14,816.097 | 20,870.478 |
| - උපචිත වියදම් | 8,101.276 | 5,094.256 | 2,493.504 | 1,317.674 |
| - වෙනත් ගෙවි යුතු | 1,692.783 | 2,283.255 | 3,281.377 | 3,300.431 |
| | **200,120.453** | **305,869.933** | **196,155.660** | **304,228.902** |

2012 වසරේ බොරතෙල් නැව්ගත කිරීම් දෙකක් මිලදී ගැනීමේදී ඉරානයේ ජාතික ඉරාන සංස්ථාවට ගෙවිය යුතු ඩොලර් මිලියන 250.812 (2020.12.31 දිනට රුපියල් මිලියන 47,933) ක මුදල වෙළෙඳාමෙන් ගෙවිය යුතු මුදලට ඇතුළත් වේ. ඉරානයට සම්බාධක පැනවීම නිසාවෙන් මෙම මුදල සඳහා ගෙවීම් කර නැත. සංස්ථාව විසින් විනිමය අලාභ ලෙස රු. මිලියන 2,122 ක් 2020 වසර සඳහා සහ 2012 සිට 2020 දක්වා කාලය සඳහා රුපියල් මිලියන 15,193 ක් ගලපා ඇත.

දේශීය ආදායම් හා රේගු දෙපාරමේන්තුවට  ගෙවිය යුතු මුදලට නිෂ්පාදන බදු, එන්බීටී සහ ගෙවිය යුතු ආදායම් බදු ඇතුලත් වේ. ආපසු ලැබිය යුතු වැට් බදු වෙනත් ලැබිය යුතු දේ යටතේ ඇතුලත් වේ.

## 22. කෙටි කාලීන ණය ගැනීම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. මි. | 2019 යලි ප්‍රකිශිත රු. මි. | 2020 රු. මි. | 2019 යලි ප්‍රකිශිත රු. මි. |
| බැංකුව සහ වෙනත් ණය | | | | |
| - වසරක් ඇතුලත සම්පූර්ණයෙන් ගෙවිය යුතු ණය | 389,962.490 | 307,993.013 | 389,962.490 | 307,993.013 |
| - බැංකු අයිරා | 787.658 | 1,941.762 | 787.658 | 1,941.762 |
| | **390,750.148** | **309,934.775** | **390,750.148** | **309,934.775** |

ඛනිජ තෙල් නීතිගත සංසථාව වෙනුවෙන් ලංකා බැංකුවට හා මහජන බැංකුවට නිකුත් කරන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 1,800ක භාණ්ඩාගාර ඇපකරය බැංකු ණය ගැනීම් සහතික කෙරේ.

සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ආනයන බිල්පත් සඳහා කෙටිකාලීන ණය ලබා ගනී.

වාර්ෂික පොළී අනුපාතය 5.5%.

## 23. සේවකයින්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2020**<br>රු. මි. | **2019**<br>රු. මි. | **2020**<br>රු. මි. | **2019**<br>රු. මි. |
| **23.1** කාර්ය මණ්ඩල පිරිවැය | | | | |
| වැටුප් හ වේතන | 4,944.554 | 5,101.997 | 10,715.059 | 10,856.362 |
| නිර්වචනය කරන ලද දායක සැලැස්ම | 514.347 | 498.580 | 1,015.774 | 1,016.147 |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම (සටහන් 18) | 260.331 | 264.857 | 550.214 | 530.003 |
| | **5,719.232** | **5,865.435** | **12,281.048** | **12,402.513** |

## 24. මෙහෙයුම් මඟින් උපදවන ලද මුදල්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2020**<br>රු. මි. | **2019**<br>රු. මි. | **2020**<br>රු. මි. | **2019**<br>යලි ප්‍රකිශිත<br>රු. මි. |
| අඛණ්ඩ මෙහෙයුම් මඟින් බදු පෙර ලාභය/(අලාභය) | **2,370.955** | **(11,835.600)** | **4,477.882** | **(9,057.194)** |
| ගැලපීම් | | | | |
| ක්ෂය වීම | 2,669.773 | 983.593 | 3,696.996 | 1,986.765 |
| ක්‍රමක්ෂය කිරීම | 390.810 | 390.810 | 416.718 | 25.908 |
| විදේශ මුදල් පරිවර්තන මත උපලබ්ධි නොවූ විනිමය | 6,967.224 | 4,409.203 | 6,967.224 | 4,409.203 |
| ලාභාංශ ආදායම | (0.122) | (150.001) | (0.122) | (0.001) |
| පොළි ආදායම | (11,187.890) | (13,525.966) | (11,497.174) | (13,848.997) |
| හානිකරන සඳහා දීමනා | - | - | (0.087) | 11.978 |
| පොළි | 20,911.327 | 14,698.539 | 20,911.327 | 14,698.539 |
| විශ්‍රාමික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 260.331 | 264.857 | 550.214 | 530.003 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම | 15.969 | | 15.969 | |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් (ලාභය)/ අලාභය) | (1.707) | (2.617) | (1.274) | (32.062) |
| විශේෂ ගාස්තු ක්‍රමක්ෂය කිරීම | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහයුම් ලාභය /(අලාභය) | **23,396.669** | **(3,767.181)** | **26,537.674** | **(275.857)** |
| | | | | |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | | | |
| තොග (වැඩිවීම) / අඩුවීම | 13,249.376 | (4,837.009) | 13,226.218 | (4,867.758) |
| වෙළඳාම සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම)/ අඩුවීම | 16,103.509 | (60,595.505) | 14,249.250 | (61,276.798) |
| වෙළඳාම සහ අනෙකුත් ගෙවීම්වල (වැඩිවීම)/ අඩුවීම | (106,728.977) | (5,837.655) | (106,314.088) | (6,587.899) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදන වන /(භාවිතා වන) මුදල් | **(53,979.424)** | **(75,037.350)** | **(52,300.947)** | **(73,008.312)** |

## 25. මෙහෙයුම් අංශය

| | ප්‍රවාහන<br>රු. මි. | විදුලිබල උත්පාදන<br>රු. මි. | ගුවන්තෙල්<br>රු. මි. | කර්මාන්ත<br>රු. මි. | ගබඩා කිරීම සහ ප්‍රවාහනය<br>රු. මි. | වෙනත්<br>රු. මි. | ඉවත් කිරීම්/ ගැලපීම්<br>රු. මි. | එකතුව<br>රු. මි. |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | | | | | | | | |
| බාහිර ගනුදෙනුකරුවන් | 369,201.749 | 80,740.629 | 19,486.571 | 8,813.522 | 222.173 | 31,888.534 | - | **510,353.178** |
| අන්තර් කොටස | | | | | 13,345.703 | | (13,345.703) | - |
| **මුළු ආදායම** | **369,201.749** | **80,740.629** | **19,486.571** | **8,813.522** | **13,567.876** | **31,888.534** | **(13,345.703)** | **510,353.178** |
| ප්‍රතිඵල | | | | | | | | |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | 21,011.599 | 13,784.682 | 277.030 | 2,813.460 | 2,044.166 | (3,951.620) | (246.522) | **35,732.795** |
| විනිමය අනුපාත විචලනය | (17,372.660) | (3,380.709) | - | (294.360) | - | (793.030) | - | **(21,840.759)** |
| ශුද්ධ මූල්‍ය වියදම් | (7,172.301) | (1,395.726) | (385.907) | (121.526) | - | (338.694) | | **(9,414.154)** |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **(3,533.362)** | **9,008.247** | **(108.877)** | **2,397.574** | **2,044.166** | **5,083.345)** | **(246.522)** | **4,477.882** |
| ආදායම් බදු වියදම | | | | | (208.809) | | - | **(208.809)** |
| **වසර සඳහා ලාභය/(අලාභය)** | (3,533.362) | 9,008.247 | (108.877) | 2,397.574 | 1,835.358 | (5,083.345) | (246.522) | **4,269.073** |

## 26. මූල්‍ය ප්‍රකාශන ප්‍රතිස්ථාපනය

1. සංස්ථාව සතු ඉඩම් 2017, 2018 සහ 2019 වර්ෂවල නැවත තක්සේරු කර ඇති අතර නැවත තක්සේරු කිරීමේ ලාභය මූල්‍ය ප්‍රකාශන වල ගලපා ඇත. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ප්‍රතිලාභ බද්දට යටත් වේ. ඒ අනුව, ඉඩම් නැවත තක්සේරු කිරීමේදී විලම්භිත බදු වගකීම් පූර්ව කාලසීමාව සඳහා හඳුනාගෙන ඇත.

2. පසුගිය වසරේ අනුබද්ධිත සමාගමෙහි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්වීම්වලට අදාල බලපෑම පසුගිය වසරේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය සඳහා ගලපා ඇත.

3. බැංකු ශේෂ මුදල් සහ මුදල් සමාන දෑ සහ කෙටි කාලීන ණය ගැනීම් යටතේ නැවත වර්ගීකරණය කර ඇත.

පහත වගුව මගින් සංස්ථාව සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇති බලපෑම සාරාංශ ගතව ඉදිරිපත් කරයි.

### 26.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| **2019 ජනවාරි 1 දිනට** | සංස්ථාව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | කලින් වාර්තා කළ පරිදි<br>රු.මිලියන | ගැලපීම්<br>රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි<br>රු.මිලියන | කලින් වාර්තා කළ පරිදි<br>රු.මිලියන | ගැලපීම්<br>රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි<br>රු.මිලියන |
| මුළු වත්කම් | 333,257.100 | - | 333,257.100 | 354,870.306 | - | 354,870.306 |
| විලම්භිත බදු | - | 2,903.809 | 2,903.809 | 1,997.626 | 2,903.809 | 4,901.435 |
| වෙනත් | 614,719.456 | - | 614,719.456 | 614,569.557 | - | 614,569.557 |
| මුළු වගකීම් | **614,719.456** | **2,903.809** | **617,623.265** | **616,567.183** | **2,903.809** | **619,470.992** |
| රඳවාගත් ඉපැයුම් | (325,274.915) | (2,903.809) | (328,178.724) | (313,764.857) | (2,903.809) | (316,668.667) |
| ප්‍රාග්ධනය සහ වෙනත් සංචිතය | 43,812.559 | - | 43,812.559 | 52,067.980 | - | 52,067.980 |
| මුළු ස්කන්ධය | **(281,462.356)** | **(2,903.809)** | **(284,366.166)** | **(261,696.877)** | **(2,903.809)** | **(264,600.686)** |

| 2019 දෙසැම්බර් 31 දිනට | සංස්ථාව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | කලින් වාර්තා කළ පරිදි රු.මිලියන | ගැලපීම් රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි රු.මිලියන | කලින් වාර්තා කළ පරිදි රු.මිලියන | ගැලපීම් රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි රු.මිලියන |
| මුදල් හා මුදල් සමාන දෑ | 30,617.646 | 1,941.762 | 32,559.408 | 34,617.358 | 1,941.762 | 36,559.120 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 173,047.909 | - | 173,047.909 | 180,606.173 | 9.782 | 180,615.955 |
| වෙනත් වත්කම් | 122,674.75 | - | 122,674.752 | 134,466.56 | | 134,466.555 |
| **මුළු වත්කම්** | **326,340.307** | **1,941.762** | **328,282.069** | **349,690.086** | **1,951.544** | **351,641.630** |
| විලම්භිත බදු | - | 2,909.820 | 2,909.820 | 2,083.176 | 2,912.559 | 4,995.736 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 305,869.933 | - | 305,869.933 | 304,283.873 | (54.971) | 304,228.902 |
| කෙටි කාලීන ණය | 307,993.013 | 1,941.762 | 309,934.775 | 307,993.013 | 1,941.762 | 309,934.775 |
| වෙනත් | 5,690.809 | - | 5,690.809 | 7,396.907 | - | 7,396.907 |
| **මුළු වගකීම්** | **619,553.755** | **4,851.583** | **624,405.338** | **621,756.969** | **4,799.351** | **626,556.320** |
| රඳවාගත් ඉපැයුම් | (337,047.477) | (2,909.820) | (339,957.297) | (324,616.510) | (2,868.478) | (327,484.989) |
| පාලනය කල නොහැකි අයිතිය | - | - | - | 8,715.598 | 20.672 | 8,736.270 |
| ප්‍රාග්ධනය සහ වෙනත් සංචිතය | 43,834.029 | - | 43,834.029 | 43,834.029 | - | 43,834.029 |
| **මුළු ස්කන්ධය** | **(293,213.448)** | **(2,909.820)** | **(296,123.268)** | **(272,066.883)** | **(2,847.807)** | **(274,914.690)** |

## 26.2 විස්තීරණ ආදායම් ප්‍රකාශය

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සංස්ථාව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | කලින් වාර්තා කළ පරිදි රු.මිලියන | ගැලපීම් රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි රු.මිලියන | කලින් වාර්තා කළ පරිදි රු.මිලියන | ගැලපීම් රු.මිලියන | යළි ප්‍රකාශිත පරිදි රු.මිලියන |
| විකුණුම් ආදායම | 630,859.713 | - | 630,859.713 | 631,015.609 | - | 631,015.609 |
| විකුණුම් පිරිවැය | (626,599.056) | - | (626,599.056) | (634,716.632) | - | (634,716.632) |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 529.415 | - | 529.415 | 1,148.850 | 76.348 | 1,225.198 |
| පරිපාලන වියදම් | (5,869.335) | - | (5,869.335) | (10,879.795) | 9.782 | (10,870.013) |
| වෙනත් | (10,756.338) | - | (10,756.338) | 4,288.643 | - | 4,288.643 |
| වර්ෂය සඳහා බදු පෙර ලාභය /අලාභය | (11,835.600) | - | (11,835.600) | (9,143.324) | 86.131 | (9,057.194) |
| ආදායම් බදු | (21.000) | - | (21.000) | (1,159.412) | (24.117) | (1,183.529) |
| **වර්ෂය සඳහා ලාභය /අලාභය** | **(11,856.600)** | **-** | **(11,856.600)** | **(10,302.736)** | **62.014** | **(10,240.722)** |
| වෙනත් විස්තීර්ණ ආදායම | 105.508 | (6.011) | 99.496 | 7.730 | (6.011) | 1.719 |
| **සම්පූර්ණ විස්තීර්ණ ආදායම** | **(11,751.092)** | **(6.011)** | **(11,757.103)** | **(10,295.006)** | **56.003** | **(10,239.003)** |

# 27. අසම්භාව්‍ය වගකීම්, බැදීම් සහ නඩු කටයුතු

### අසම්භාව්‍ය වගකීම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) 2015 සිට 2017 දක්වා කාලය සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සඳහා රු. මිලියන 1,061.56 ක තක්සේරු නිකුත් කර ඇත. 2004 සිට 2018 දක්වා කාලසීමාවන් සඳහා IRD විසින් එකතු කළ අගය මත බදු මත තක්සේරු නිකුත් කර ඇති මුදල රු. මිලියන 1,249.083 ක් සහ 1996-2016 කාලසීමාව සඳහා පිරිවැටුම් බද්ද සහ ඔබ උපයන විට ගෙවන බද්ද මත තක්සේරු කිරීම් මිලියන 47.163 කි. සංස්ථාව විසින් මෙම තක්සේරු කිරීම් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනා ඉදිරිපත් කර ඇත. IRD විසින් ජාතිය ගොඩනැගීමේ බද්දට අදාලව රු. මිලියන 102.7 කට ලබා දුන් තීරණයට එරෙහිව සංස්ථාව බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ආදායම් බදු යටතේ නිකුත් කරන ලද තක්සේරු කිරීම් සටහන 07 - බදු වියදම් යටතේ අනාවරණය කර ඇත.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කරන දිනට වෙනත් ප්‍රමාණාත්මක අවිනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

### බැදීම්

2020 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාවෙහි ප්‍රමාණාත්මක බැදීම් පහත සඳහන් පරිදි වේ;

### බැංකු වෙත බැදීම

සංස්ථාව විසින් ණයවර ලිපි (L/C) ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ස්ථාපිත කරන ලද මුදල පිළිවෙළින් රු. මිලියන 32,039 කි. (2019- රු. මිලියන 55,335) සහ රු. මිලියන 33,766 (2019- රුපියල් මිලියන 94,844) කි. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සම්බන්ධයෙන් වසර අවසානයේ දී ප්‍රසම්පාදනය කරනු ලැබේ.

සංස්ථාව විසින් රාජ්‍ය බැංකු දෙකෙහි බැංකු සහ නාවික ඇපකර ලබාගෙන ඇති මුදල රු. මිලියන 89 ක් සහ ස්ථාපිත බිල්පත් එකතු කිරීමේ මුදල රු. මිලියන 86 කි.

### වාර්තාකරණ දිනය වන විට නිම නොවී පැවති නඩු

2020 දෙසැම්බර් 31 වැනි දිනට පහත සඳහන් පරිදි නොවිසඳුණු නීතිමය නඩු 197ක් (2019-187) තිබිණි.

| නඩු වර්ගය | නඩු ගණන | |
|---|---|---|
| | සංස්ථාව | සමූහය |
| කම්කරු උසාවියේ නඩු | 08 | 13 |
| මහේස්ත්‍රාත් අධිකරණ නඩු | 03 | 04 |
| දිස්ත්‍රික් අධිකරණ නඩු | 20 | 28 |
| මහාධිකරණ නඩු | 08 | 08 |
| අභියාචනාධිකරණ නඩු | 05 | 06 |
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 27 | 46 |
| මානව හිමිකම් කොමිසම | 34 | 44 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 39 | 48 |

ඉහත අවස්ථා අතුරින් පහත දැක්වෙන නඩුව සංස්ථාවට වැදගත් ලෙස සැලකේ;

හෙජින් ගණුදෙනුව සඳහා පොළිය සහ අනෙකුත් වියදම් සමඟ ඩොලර් මිලියන 8.5ක් ඉල්ලා කොමර්ෂල් බැංකුව සංස්ථාවට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

ඉහත සඳහන් කළ නඩු තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතින අතර ඒ සඳහා අදාළ ප්‍රතිපාදන පනවා නොමැත.

# 28. වාර්තා කරන දිනට පසු සිදුවීම

වාර්තා කරන දිනට සෘජු ප්‍රමාණාත්මක සිදුවීම් ඇතිනම් ඒ සියලුම සිදුවීම් අදාළ ලෙස සලකා බැලීම සහ මූල්‍ය ප්‍රකාශන වල සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදු කර ඇත.

# 29. කොවිඩ්-19 යේ බලපෑම

2020 මාර්තු සහ අප්‍රේල් මාසවලදී කොරෝනා වයිරස් රෝගය 2019 (“කොවිඩ්-19 ”) පැතිරීමෙන් පසුව, එම රෝගය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාමාර්ග මාලාවක් ගෙන ඇත. කොවිඩ්-19 තත්ත්වය සමඟ ආදායම් අඩුවීම, විනිමය අනුපාත විචලනය සහ ද්‍රවශීලතා ගැටලු අපගේ ව්‍යාපාරයට බලපෑවේය. රජය විසින් ගුවන් තොටුපල මෙහෙයුම් සීමා කිරීම නිසා ගුවන් සේවා අංශයෙන් ලැබෙන ආදායම සැලකිය යුතු ලෙස අඩු විය. ගුවන්තොටුපළ මෙහෙයුම් සාමාන්‍යකරණය වීමත් සමඟ ආදායම පෙර මට්ටමට ඉහළ යනු ඇතැයි සංස්ථාව අපේක්ෂා කරයි.

සංස්ථාව 2020 අප්‍රේල් සහ මැයි මාස සඳහා කාර්ය මණ්ඩල ණය අයකර ගැනීමේ වාරික සහ පොලී විලම්භනය කළ අතර ඒ අනුව මෙම කාලසීමාවන් සඳහා කාර්ය මණ්ඩල ණය පොලී ආදායම හඳුනාගෙන නොමැත.

රෝගයේ අවිනිශ්චිතතාවය හේතුවෙන්, සංස්ථාවට ඉහළ විශ්වාසයකින් යුතුව අපගේ ව්‍යාපාරයට කොවිඩ්-19 හි අනාගත බලපෑම පුරෝකථනය කිරීමට හැකියාවක් නොමැත.

## 30. මූල්‍ය අවදානම් කළමණාකරණය

සමූහයේ විවිධ ක්‍රියාකරකම් විවිධ මූල්‍ය අවධානම් වලට නිරාවරණය වේ. වෙළඳපල අවදානම (මුදල් අවදානම, පොළී අනුපාතය අවදානම ඇතුළත්ව) ණය අවදානම ද්‍රවශීලතා අවදානම සහ මිළ අවධානම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති යටතේ කළමනාකාරිත්වය විසින් අවදානම් කළමනාකරණය සිදු කරනු ලබයි. සමූහයේ ක්‍රියාකාරිත්වය මත පදනම්ව කළමනාකාරිත්වය විසින් මූල්‍ය අවදානම් හඳුනාගෙන සහ ඇගයීමට ලක් කරනු ලබයි. මණ්ඩලයේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීමට උත්සහ කරයි.

සමූහයේ ප්‍රධාන මූල්‍ය උපකරණ ස්ථාවර තැන්පතු, රජයේ සුරකුම්පත්, ඇමෙරිකානු ඩොලර් තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ ද්‍රව්‍යශීලතාව වැඩි දියුණු කිරීම සහ පවත්වාගෙන යාමත් ආයෝජනය කළ අරමුදල් වලින් උපරිම මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමත්ය. ඍජුවම ව්‍යාපාර කටයුතු වලින් හටගන්නා වෙළඳ ලැබිම් සහ වෙළඳ ගෙවීම් වැනි වෙනත් විවිධ මූල්‍ය උපකරණ සමූහය සතුව ඇත.

### (a). වෙළඳපළ අවධානම

#### (i) විදේශ විනිමය අවදානම

සංස්ථාව මඟින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන කිරීමේදී එය ප්‍රධාන වශයෙන් ඇමෙරිකානු ඩොලර් වලට අදාළව මුදල් නිරාවරණයෙන් පැන නගින විදේශ විනිමය අවදානමට නිරාවරණය වේ. සමූහයේ ක්‍රියාකාරී මුදල් ඒකකය බොහෝ දේශීය ගනුදෙනු සිදු කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වන අතර අනෙකුත් සියලුම මුදල් ඒකකයන් වාර්තා කිරීමේ අරමුණ සඳහා පමණක් විදේශ මුදල් ඒකක ලෙස සලකනු ලැබේ. ඇතැම් බැංකු ශේෂයන්, වෙළඳ ලැබිම් සහ වෙළඳ ලැබීම් සහ වෙළඳ ගෙවීම් විදේශ මුදල් වලින් දැක්වේ.

අනෙකුත් සියලුම විචල්‍යයන් සහිතව පවතින අතර ඇමෙරිකානු ඩොලරයේ විනිමය අනුපාතය සාධාරණ ලෙස වෙනස් වීමට ඇති සංවේදීතාවය සහ ඇමෙරිකන් ඩොලර් වලින් ගණනය කරන වගකීම් වල සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් නිසා සංස්ථාවෙහි බදු ගණනයට පෙර ලාභය වන බලපෑම පහත වගුවෙහි දැක්වේ.

| අයිතමය | 2020 දෙසැම්බර් 31 දිනට අගය ඇමරිකානු ඩොලර්. මිලියන | වසර අවසාන විනිමය අනුපාතය රු. | විනිමය අනුපාත යේ වෙනස්කම | බදුවලට පෙර ලාභය මත බලපෑම * රු. මි. මිලියන |
|---|---|---|---|---|
| ණය සහ ණය ගැනීම් | 2,066.810 | 191.1113 | 1% වැඩිවීම | (3,950) |
| වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දේ | 922.063 | 191.1113 | 1% වැඩිවීම | (1,762) |
| වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේ | 321.021 | 185.5677 | 1% වැඩිවීම | 596 |
| බැංකු ශේෂය | 2.134 | 185.5677 | 1% වැඩිවීම | **4** |
| **එකතුව** | | | | **(5,112)** |

* බදු වලට පෙර ලාභය මත බලපෑම ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන විට ඇමරිකානු ඩොලර් වලින් ගණනය කරනු ලබන ආශ්‍රිත වගකීම් වල සාධාරණ මිල වෙනස් වීමේ ප්‍රතිපලයකි.

ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සමූහයේ මූල්‍ය ප්‍රකාශන පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම හරහා වන විනිමය අනුපාත උච්චාවචනයේ බලපෑමට ලක් වී ඇත. විදේශ අනුපාතයේ සිදුවන වෙනස්කම් විදේශීය මුදල් වලින් නොයෙකුත් මාර්ග වලින් ලබා ගන්නා ලද ද්‍රව්‍යමය පිරිවැය මිළදී ගැනිම් සහ සේවා සඳහා බලපානු ලබයි. විශේෂයෙන්, ඇමරිකානු ඩොලරයට සහ අනෙකුත් විදේශීය මුදල් වලට සාපේක්ෂව අඛණ්ඩව සිදු වන ශ්‍රී ලංකාවේ රුපියලේ අවප්‍රමානය වීම ඍජුවම මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිපල කෙරෙහි බලපෑම් කරනු ලබයි. එය ආනයනය කරන ඛනිජ තෙල් නිෂ්පාදන සහ අනෙකුත් මිළදී ගැනීම් වල පිරිවැයට බලපෑම් කරනු ලබයි.

#### (ii) පොළී අනුපාත අවදානම

සමූහයේ පොළී අනුපාත අවදානම ප්‍රධාන වශයෙන් ඇති වන්නේ රජයේ සුරැකුම්පත් සහ තැන්පතු ස්වරූපයෙන් සිදු කරන ණය ගැනිම් සහ ආයෝජන හේතුවෙනි. සැපයුම්කරුවන්ගේ ණය සම්බන්ධයෙන් ගත් කළ පොළී අනුපාතය බොහෝ දුරට පවත්නා වෙළඳපල අනුපාතයන්ට වඩා වෙනස් වේ. රජයේ වාණිජ බැංකු දෙකකින් ලබා ගන්නා ලද විදේශීය මුදල් ණය වල පොළී අනුපාත සාකච්ඡා කරගත හැකි මට්ටමේ පවති. සමූහය අඛණ්ඩව සිදු වන පොළී නිරාවරණය විශ්ලේෂණය කරන අතර ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමීමේ අනුපාතය (LIBOR) සහ මුදල් වෙළඳපල අනුපාත අධීක්ෂණය කරයි.

**(b)** ණය අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවකු සිය ගිවිසුම් ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සමූහයට මූල්‍යමය අලාභයක් වීමේ අවදානමයි. සමූහයේ බොහෝ ගනුදෙණුකරුවන්ගේ ගණත්වය ස්වාධිනව ශ්‍රේණි ගත කර නොමැති අතර එවැනින් එහි මූල්‍ය තත්වය, අතීත අත්දැකීම් සහ වෙනත් ගුණාත්මක සාදක සැලකිල්ලට ගනිමින් ගණුදෙනුකරුන්ගේ ගුණාත්මකභාවය මනිනු ලබයි. සෑම නව ගනුදෙනු කරුවෙකුටම ණය සීමාව ලබා දීමට පෙර ණය ගෙවීමේ ණය ප්‍රතිපත්තියක් සංස්ථාව විසින් ස්ථාපනය කර ඇත. සංස්ථා ණය ප්‍රතිපත්තිය සපුරාලීමට අපොහොසත් වන ගණුදෙනුකරුවන්ට සංස්ථාව සමග ගනුදෙනු කළ හැක්කේ මුදල් පදනම මත පමණි.

ණය අවදානම පැන නගින්නේ මුදල් හා මුදල් සමානකම් සහ බැංකු හා මූල්‍ය ආයතන වල ඇති තැන්පතු, හිඟ ලැබිම් සහ කළයුතු ගනුදෙනු ඇතුළුව ගණුදෙනුකරුවන්ට ණය නිරාවරණය වීමෙනි.

| කාලය | 2020<br>රු. මි. | 2019<br>රු. මි. |
|---|---|---|
| දින 30 ට අඩු | 15,267.481 | 14,650.479 |
| දින 30 - 90 | 8,262.726 | 13,733.710 |
| දින 91– 180 | 11,543.035 | 29,396.827 |
| දින 181 - 365 | 26,401.446 | 54,438.542 |
| දින 365 ට වැඩි | 79,629.784 | 41,002.387 |
| එකතුව | **141,104.471** | **153,221.945** |

**(c)** ද්‍රවශීල අවදානම

මුදල් ප්‍රවාහ සැලසුම්කිරීම සහ පුරෝකථනය කිරිම සංස්ථාවේ මූල්‍ය අංශය විසින් සිදුකරනු ලැබේ. මූල්‍ය අංශය එහි විවිධ මූල්‍ය වගකීම් සපුරාලීම සඳහා පවතින අරමුදල් අඛණ්ඩව අධීක්ෂණ කිරීම සහ වඩා හොඳ ආදායමක් සඳහා අතිරික්ත කෙටි කාලීන මූල්‍ය සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සිදු කරයි. ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ශේෂයට වඩා ඉහළින් ඇති අතිරික්ත මුදල් පොළී අනුපාතයෙන් යුත් මූල්‍ය උපකරණ වන තැන්පතු, සඳහා ආයෝජනය කරනු ලබයි.

කාරක ප්‍රාග්ධන කළමනාකාරිත්වය සඳහා අවශ්‍ය ශේෂයට වඩා ඇති අතිරික්ත මුදල් කාලීන තැන්පත් කිරීම්, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන, ඇමතුම් තැන්පතු වැනි පොලී ලැබෙන මූල්‍ය උපකරණ වල ආයෝජනය කෙරේ. වාර්තා කරන දිනයේදී සංස්ථාව විසින් රු. මිලියන 64,563 මුදල් හා මුදල් සමාන ඇ ලෙසත්, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය රුපියල් මිලියන 88 සහ අනෙකුත් කෙටිකාලීන තැන්පතු ලෙස රු. මිලියන 5ක් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරිම සඳහා පවත්වාගෙන යන ලදි.

වාර්තාකරණ දිනයේදී ගිවිසුම් ගත කල් පිරීමේ දිනය අනුව අතිරික්ත කාල පරිච්ඡේදය මත පදනම්ව අදාළ කල්පිරීමේ කණ්ඩයන්ට වර්ගීකරණය කරන ලද සංස්ථාව සතු ව්‍යාත්පන්න නොවන වගකීම් පහත සඳහන් වගුවේ දැක්වේ.

දෙසැම්බර් 2020 (රු. මි.)

| | මාස 3කට අඩු | මාස 3 සිට මාස 12 දක්වා | අවුරුදු 1 සිට 2 දක්වා | අවුරුදු 3 සිට 5 දක්වා | අවුරුදු 5 ට වැඩි |
|---|---|---|---|---|---|
| බැංකු ණය ගැනීම් | 240,800 | 149,950 | - | - | - |
| දිගු කාලීන | 38 | 251 | 503 | 1,509 | 2,766 |
| එකතුව | **240,838** | **150,202** | **503** | **1,509** | **2,766** |

**(d).** මිල අවදානම

ඇමරිකානු ඩොලර් සහ අනෙකුත් විදේශීය මුදල් වටිනාකමින් විදේශයෙන් ආනයනය කරනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන (බොර සහ නිමි නිෂ්පාදන දෙවර්ගයම) සහ අනෙකුත් අමුද්‍රව්‍ය වල වෙළඳ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ජාත්‍යන්තර වෙළඳපලේ මිළ සංචලනයන්ට අනුකූලව ඛනිජතෙල් නිෂ්පාදන වල දේශීය සිල්ලර විකුණුම් මිළ නිර්ණය කිරීමේදී පිරිවැය පරාවර්තන මිළ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ. සංස්ථාව නිතිපතා සතිපතා තොග සමාලෝචන රැස්වීම් පවත්වනු ලබන අතර අනාගත නිෂ්පාදන අවශ්‍යතා සාකච්ඡා කර අවශ්‍ය අනාගත ආනයන සඳහා සැලසුම් කර ඇත. ඒ අතරම සුදුසු කාලෝචිත කළමනාකරණ තීරණ ගැනීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ මූල්‍ය තොරතුරු ලබා දීමෙන් සංස්ථාව මහා භාණ්ඩාගාරය සමඟ අඛණ්ඩව කටයුතු කරයි.

## 31. ගිවිසුම් සහ අදාළ පාර්ශව ගනුදෙනු තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස සැලකේ. පහත සඳහන් කරුණු හැර වෙනත් කිසිදු ඍජු හෝ වක්‍ර ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංසථාව හෝ සීමා සහිත ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ගිවිසුම් සම්බන්ධව කිසිදු ඍජු හෝ වක්‍ර සබඳතාවයක් නැත.

ජී එස් විතානගේ මහතා සංස්ථාවෙහි, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමහි සභාපතිවරයා වූ අතර ඔහු 2019.01.22 සිට සංස්ථාවෙහි සභාපතිවරයා වන අතර 2019.11.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය. ඒ අනුව 2020 වසර සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවයට අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොමැත.

බුද්ධික මඩිහහේවා මහතා සංස්ථාවෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා වන අතර ඔහු ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

## ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් වෙත ගෙවීම

| | සංස්ථාව | |
|---|---|---|
| | **2020**<br>රු. මි. | **2019**<br>රු. මි. |
| කෙටි කාලීන ප්‍රතිලාභ | 5.547 | 7.658 |

ප්‍රධාන කළමනාකාරණ පිරිස් හා සම්බන්ධ වාර්තාකරණ කාල සීමාව තුළ වියදමක් ලෙස හඳුනාගෙන ඇති මුදල් දක්වා ඇත.

අදාළ පාර්ශව සමඟ පහත ගනුදෙනු සිදු කෙරිණි.

| | **2020**<br>රු. මි. | **2019**<br>රු. මි. |
|---|---|---|
| අදාළ පාර්ශව වෙත අලෙවි කිරීම් සහ ලබාදුන් සේවා අනුබද්ධ ආයතනය | | |
| අනුබද්ධ ආයතනය | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 429.283 | 449.516 |
| අනෙකුත් අදාළ පර්ශව | | |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | - | 30,926.475 |
| බලශක්ති අමාත්‍යාංශය | 24.176 | 26.776 |
| | 453.459 | 31,402.767 |
| අදාළ පාර්ශය වෙතින් ලැබුණු පොළී | | |
| අනෙක් අදාළ පාර්ශය | | |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | - | 1,930.494 |
| | - | 1,930.494 |
| අදාළ පාර්ශව වෙතින් ලැබුණු සේවා | | |
| අනුබද්ධ ආයතනය | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 12,922.794 | 14,741.030 |
| | 12,922.794 | 14,741.030 |
| අදාළ පාර්ශව වෙතින් ලද ලාභාංශ | | |
| අනුබද්ධ ආයතනය | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 240.000 | 150.000 |
| අදාළ පාර්ශව වෙතින් ලැබිය යුතු මුදල් * | | |
| අනුබද්ධ ආයතනය | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 600.747 | 70.565 |
| අනෙක් අදාළ පාර්ශව | | |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | - | 47,905.673 |
| බලශක්ති අමාතයාංශය | 14.075 | 10.158 |
| | 614.822 | 47,986.395 |
| අදාළ පාර්ශව වෙත ගෙවිය යුතු මුදල් * | | |
| අනුබද්ධ ආයතනය | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 6,565.785 | 3,916.128 |

* මුදල් ප්‍රමාණයන් වර්ගීකරණය කර ඇත්තේ පිළිවෙළින් වෙළෙඳ සහ අනිකුත් ලැබීම් සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවීම් වශයෙනි.

### සම්බන්ධිත පාර්ශවයන් සඳහා කොන්දේසි

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් විකිණීම සහ මිළදී ගැනීම සිදු කරනු ලබන්නේ අතේ දුරින් කරන ගණුදෙනුවලට හා සමානවය. වර්ෂය අවසානයේ ඇති වන හිඟ ශේෂයන් අනාරක්ෂිත සහ පොළී රහිතය. සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ලැබීම් සහ ගෙවීම් සඳහා කිසිදු සහතිකයක් ලබා දී හෝ ලැබී නොමැත..

සංස්ථාව සෘජුව පාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය මඟින් බැවින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රජයට අයත් සමාගමක් ලෙස සලකනු ලබයි. අනෙකුත් රජයට අදාළ වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 24ට අනුකූලව සම්බන්ධිත පාර්ශව ලෙස ශ්‍රී ලංකා රජය මඟින් තනිව හෝ හවුල් වශයෙන් පාලනය හෝ සැලකිය යුතු ලෙස බලපෑම් සිදු කරනු ලබයි.

## 32. ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ ප්‍රධාන පාර්ශවකරුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන අතරම ප්‍රශස්ථ ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගෙන යාම සහ සැලකිලිමත් වීමෙන් තත්වය පවත්වාගෙන යෑමයි. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 වන විටද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව අතීතයේ සහ වත්මන් වසර තුළ එකතු වූ අලාභ හේතුවෙන් රු.මි. 275,561 සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණයක් පැවතිනි. බාහිර විගණකාධිවරුන් විසින් විගණන වාර්තාවේ ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාර නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාම සැක සහිත බව සඳහන් කර ඇත.

සංස්ථාවට සිදු වී ඇති විශාල පාඩු බොහෝමයකට බොහෝ දුරට හේතු වනුයේ ඛනිජ තෙල් නිෂ්පාදන ඉතා ඉහළ සහනාධාර මිළකින් යුතු වීමත්, සිල්ලර මිළ රජය විසින් පාලනය කිරීමත්ය. එහිදී පාඩු පියවා ගැනීමට 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 17 වන වගන්තියට අනුකූලව රජය විසින් සපයන සහනාධාර ලබා ගැනීමට සංස්ථාව අයිතිය තිබේ. එමඟින් එහි පවතින ශුද්ධ වත්කම් වල සෘණ තත්වය වෙනස් කරගත හැකිය.

# අතිරේක තොරතුරු



# දස වසරක සාරාංශය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිල්ලර අලෙවි මිළ | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෙට්‍රල් - ඔක්ටේන් 92 | 125 | 159 | 162 | 150 | 117 | 117 | 117 | 125 | 137 | 137 |
| ඔටෝ ඩීසල් | 76 | 115 | 121 | 111 | 95 | 95 | 95 | 101 | 104 | 104 |
| සුපර් ඩීසල් | 98.3 | 142 | 145 | 133 | 110 | 110 | 110 | 121 | 132 | 132 |
| භූමිතෙල් | 61 | 106 | 106 | 81 | 49 | 44 | 44 | 70 | 70 | 70 |
| දැව්තෙල් 800 | 52.2 | 92.2 | 92.2 | 92.2 | 80 | 80 | 80 | 92 | 96 | 96 |
| දැව්තෙල් 1500 | 50 | 65 | 90 | 90 | 80 | 80 | 80 | 96 | 96 | 96 |
| | | | | | | | | | | |
| මූල්‍ය ප්‍රතිඵල | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| ආදායම | 356,442 | 512,910 | 490,381 | 525,182 | 376,734 | 423,061 | 445,950 | 575,492 | 630,860 | 510,131 |
| අලෙවි පිරිවැය | -420,227 | -540,439 | -464,374 | -499,956 | -337,119 | -326,441 | -418,962 | -579,617 | -626,599 | -454,880 |
| දළ ආන්තිකය | -63,785 | -27,529 | 26,007 | 25,226 | 39,615 | 96,620 | 26,988 | -4,124 | 4,261 | 55,251 |
| ශුද්ධ මෙහෙයුම් වියදම් හා පොළි | -30,572 | -62,041 | -33,897 | -24,532 | -55,637 | -27,067 | -24,173 | -102,016 | -16,096 | -52,880 |
| බදුවලට පෙර ලාභය/(අලාභය) | -94,357 | -97,182 | -7,890 | 694 | -19,886 | 69,553 | 2,815 | -106,140 | -11,836 | 2,371 |
| | | | | | | | | | | |
| මූල්‍ය තත්වය | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| ප්‍රාග්ධනය | 3,500 | 3,500 | 3,500 | 3,500 | 28,487 | 28,487 | 28,487 | 28,487 | 28,487 | 28,487 |
| සංචිත | -134,736 | -232,045 | -239,967 | -236,791 | -257,472 | -214,334 | -205,479 | -309,949 | -324,610 | -304,048 |
| දිගුකාලීන වගකීම් | 27,646 | 1,998 | 1,351 | 703 | 342 | 266 | 190 | 1,539 | 6,838 | 7,271 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 626 | 547 | 538 | 664 | 861 | 754 | 1,708 | 1,681 | 1,686 | 1,702 |
| එකතුව | **-102,964** | **-226,000** | **-234,578** | **-231,924** | **-227,782** | **-184,827** | **-175,094** | **-278,242** | **-287,599** | **-266,588** |
| | | | | | | | | | | |
| ලාභදායිතා අනුපාතික | | | | | | | | | | |
| දළ ලාභ අනුපාතිකය | -17.90% | -5.40% | 5.30% | 4.80% | 10.50% | 22.80% | 6.05% | -0.72% | 0.68% | 10.83% |
| ශුද්ධ ලාභ අනුපාතිකය | -26.50% | -18.90% | -1.60% | 0.00% | -5.30% | 16.40% | 0.24% | -18.45% | -1.88% | 0.46% |
| මෙහෙයුම් අනුපාතික | | | | | | | | | | |
| තොග විකුණුම් අනුපාතිකය | 10.7 | 10.89 | 7.3 | 7.77 | 6.44 | 8.53 | 9.48 | 9.51 | 9.53 | 8.66 |
| පොළී ආවරණය | -9.48 | -3.88 | 0.57 | 1.05 | -0.32 | 7.1 | 1.32 | -2.1 | -1.3 | 1.62 |
| ද්‍රවශීලතා අනුපාතිකය | | | | | | | | | | |
| ජංගම වත්කම් අනුපාතිකය | 0.58 | 0.43 | 0.39 | 0.34 | 0.31 | 0.34 | 0.38 | 0.44 | 0.47 | 0.45 |
| ක්ෂණික වත්කම් අනුපාතිකය | 0.45 | 0.28 | 0.24 | 0.19 | 0.21 | 0.24 | 0.27 | 0.34 | 0.36 | 0.36 |

# සංස්ථායික තොරතුරු

| | |
|---|---|
| ආයතනයේ නම : | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| නීතිමය ස්වරූපය : | 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ නීතිගත කරන ලද රාජ්‍ය සංස්ථාවකි. |
| ලියාපදිංචි කාර්යාලය: | 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 |
| දුරකථන : | +94 11 5455455 |
| ෆැක්ස් : | +94 11 5455400 |
| විද්‍යුත් පණිවිඩ : | secratariat@ceypetco.gov.lk |
| වෙබ් අඩවිය : | www.ceypetco.gov.lk |
| මූල්‍ය වර්ෂය : | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා |
| අධ්‍යක්ෂ මණ්ඩලය: | ඩබ්.ඩබ්.ඩී. සුමිත් විජේසිංහ මහතා ( සභාපති )<br>බුද්ධික රුවන් මඩිහහේවා මහතා (කළමණාකාර අධ්‍යක්ෂ )<br>ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය<br>තරිඳු එක්නැන්දගෙදර මහතා<br>චාමින්ද හෙට්ටිආරච්චි මහතා<br>බුද්ධික ඉද්දමල්ගොඩ මහතා<br>තිලංග නදීර පොල්වත්තගේ මහතා |
| අනුබද්ධ සමාගම : | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, නිමාව, කොලොන්නාව. |
| විගණකවරු : | විගණකාධිපති |
| බැංකුකරුවෝ : | මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව<br>හැටන් නැෂනල් බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව |

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09 .

+94 11 54 55 455

SECRATARIAT@CEYPETCO.GOV.LK

WWW.CEYPETCO.GOV.LK